# සිත නිවන නිස්සරණ වන අරණ

## (මීතිරිගල නිස්සරණ වනය)



සංස්කරණය

**නාලිනී සුසිලා දිසානායක**

ප්‍රකාශනය හා ධර්මදානය

**ලෝලුවාගොඩ සහ ඇටඹේ**

**මීතිරිගල නිස්සරණ වන දාන දායක සමිතිය.**

# සිත නිවන
# නිස්සරණ වන අරණ
## (මීතිරිගල නිස්සරණ වනය)

සංස්කරණය
***නාලිනී සුසිලා දිසානායක***

ප්‍රකාශනය හා ධර්මදානය
***ලෝලුවාගොඩ සහ ඇටබේ***
***මීතිරිගල නිස්සරණ වන දාන දායක සමිතිය.***

බු. ව. 2547
ක්‍රි. ව. 2003

අක්ෂර සංයෝජනය හා මුද්‍රණය
**මහජන ප්‍රින්ටර්ස් - මීරිගම.**
දුරකථනය : 033-73230

*"රමණීයානි අරඤ්ඤානි*
*යත්ථ න රමතී ජනො*
*වීතරාගා රමෙස්සන්ති*
*න තෙ කාමගවෙසිනො"*

(ධම්ම පදය - අරහත් වර්ගය - 10)

*සාමාන්‍ය ජනයාගේ සිත් නොගන්නා රමණීය කැලෑ ඇත. වීතරාගීහු කම් සැප නො සොයන හෙයින් එබඳු තැන්වල සිත් අලවා වාසය කරත්.*

***පිහිටීම :***

ගම්පහ දිස්ත්‍රික්කය.

කිරිඳිවැල ප්‍රාදේශීය බල ප්‍රදේශය.

***ගමන් මාර්ගය :***

කොළඹ - නුවර පාර.

බැලුම්මහර හන්දියේ සිට සැ. 3 කින් වැලිවේරිය නගරය.

ඒ පසුකර වමට හැරී සැ. 8 කින් කිරිඳිවැල නගරය.

ඒ පසුකර තව සැ. 2 කින් පල්ලේගම හන්දිය.

වමට හැරී සැ. 3 ක් ගියවිට මීතිරිගලය.

***බසයෙන් :***

කොළඹ සිට කිරිඳිවැලට.

එතනින් රංවල බසයෙන් මීතිරිගලට.

ගම්පහ සිට රංවල බසයෙන් මීතිරිගලට.

***සැ. යු.***

සෙනසුනේ විශ්‍රාම ශාලාව ළඟටම පෞද්ගලික වාහනවලින් පැමිණිය හැක.

# පිළිගැන්වීම

සිරි ලක සසුන්'ඹර

ඒකලු කරන

සුපුන් සඳ වන්

අති පූජනීය


මහෝපාධ්‍යාය

## කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ

මාහිමිපාණන් වහන්සේ වෙත

පිදෙන

බැති කුසුමෙකි.





අතිපූජනීය රාජකීය පණ්ඩිත
කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශාභිධාන මාහිමිපාණන් වහන්සේ

# ලිපි වැල

| අනු අංකය | | පිටු අංකය |
|---|---|---|
| | පෙරවදන I | |
| | පෙරවදන II | |
| 01. | පොතේ කථාව | 08 |
| 02. | අනුමෝදනාව | 10 |
| 03. | නිවන් පිළිවෙත හා වන සෙනසුන් | 11 |
| 04. | නිස්සරණ වන තතු | 19 |
| 05. | නිස්සරණ වන ව්‍යවස්ථා | 26 |
| 06. | නිස්සරණ පටිපදා | 28 |
| 07. | නිස්සරණයේ නිර්මාතෘවරයානෝ | 39 |
| 08. | මීතිරිගල මිණි පහන | 52 |
| 09. | අපේ කුසල් පෙරහැර | 56 |
| 10. | අප ඇසූ නිස්සරණ බණ | 73 |
| 11. | ආශ්‍රිත ග්‍රන්ථ | 123 |

## පෙරවදන - I

## ධර්ම ප්‍රාතිහාර්යය

**ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ගරු සමුත්පාදක සහ ප්‍රධාන අනුශාසක වූද මීතිරිගල නිස්සරණ වන සංරක්ෂක සංඝ සභාවේ ප්‍රධාන වූද රාජකීය පණ්ඩිත අති පූජනීය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශාභිධාන මහා ස්ථවිර පාදයන් වහන්සේ විසිනි.**

අද අපට ලැබී තිබෙන්නේ ප්‍රාතිහාර්ය ජීවිත වාසනාවකි. ප්‍රාතිහාර්ය, සමාපත්ති ආදී ඇතැම් වචනවල ඉහළම තේරුම සලකා පැරණි කෞතුක වස්තු මෙන් අයින්කර ඇති සේ වැටහෙයි. ඇත්ත වශයෙන්ම අපත් මේ පවත්වන්නේ ධර්ම ප්‍රාතිහාර්ය නොවේදැයි සිතට දැනී යන්නේ එහි අච්ඡරිය රූපී ආධ්‍යාත්ම අනුස්මෘතියෙනි. අසිරිමත් ඇතුල් තතු සිහි කිරීමෙනි. භාවිත සිතේ විශ්මයාවහ ක්‍රියාකාරීත්වයයි ප්‍රාතිහාර්ය යන පදයෙන් පැහැදිලි වන්නේ.

මේ බුදු සස්නේ ප්‍රාතිහාර්ය පෑමෙන් අග්‍ර ස්ථානයට පත් උතුමා මුගලන් මහ රහතන් වහන්සේය. උන්වහන්සේ එක් දිනක් ප්‍රාතිහාර්ය ගමනක් වැඩියාහ. ඒ තව්තිසා දෙව් ලොවටය. සක් දෙවිඳුන් සමඟ ධර්ම සාකච්ඡාවකට වැඩිය ඒ ගමනේදී සිදු වූයේ පුදුම දෙයකි. මුගලන් මාහිමියන් වඩිනවිට සක් දෙවිඳු දිව්‍ය නෘත්‍යයකට සහභාගී වෙමිනි සිටියේ. එය නවතා මුගලන් හිමි පිළිගෙන වඩා හිඳුවා සාමීචි පවත්වා අනතුරුව සක් දෙවියෝ තම දිව්‍ය මාළිගයේ විසිතුරු දක්වන්නට පටන් ගත්හ. මෙය සක් දෙවිඳුන්ගේ පුණ්‍ය ශ්‍රී විභූතියකි. පොඩිත්තෙකුට සෙල්ලම් බඩු ලොකු වුවත් වැඩිහිටියෙකුට ඒවා සුළු දේය. සක් දෙවිඳුට වෛජයන්ති ප්‍රාසාදය ලොකු වුවත් මුගලන් හිමියන්ට එසේ නොවීය. උන්වහන්සේ ආපෝ කසිණ සමාපත්තියට සම වැදී එයින් නැගිට වතුරක් මවා දිව්‍ය මාළිගය වතුරේ පාවෙන්නට සලස්වා එහි මුදුන් කොතට පයේ මහපට ඇඟිල්ලෙන් ඇන්නේය. එවිට එය බඹරයක් සේ කැරකෙන්නට පටන් ගති. ශක්‍රයාත්, සෙසු දෙවියෝත් මේ ප්‍රාතිහාර්යයෙන් මවිතයට පත් වී බුදු සසුනේ සෘද්ධි මහිමය, දියුණු සිතක සෘද්ධි මහිමය කියමින් උදාන පළකළහ.

බුදු සසුන පිහිට කොට අපත් මේ පවත්වන්නේ ජීවිත ප්‍රාතිහාර්ය නොවේදැයි සිහිකළ මැනවි. අපි නිරතුරු නොනිවෙන පහන් බවට පත්වෙමු. ඒ නොනිවෙන පහන් බව ඉදිවන්නේ අපේ ඇඟේ නොවේ. අපට අයත් බාහිර දෙයක නොවේ. අපේ සිතේය. සසුන් ගුණ පිළිවෙතින් අපේ සිත එළිය වෙයි. විසිතුරු වෙයි. එසේ වන්නේ සිත අඳුරු කරන, සිත අවුල් කරන සිතට වධ දෙන කෙලෙස් ගති සංසිඳී යාම නිසාය. සිත අඳුරු කරන ප්‍රධානම චිත්ත ගතිය මෝහයයි. අවිජ්ජා යනු මෝහ පරියායට තවත් අර්ථානුගත නාමයකි. අඤ්ඤාණ (නොදැනීම), සංසය (සැකය) විපරීතගාහ (කරුණු වරදවා ගැනීම) යන තුන් විධියෙන් මෝහයේ ක්‍රියාකාරී ස්වරූපය දක්වා තිබේ. ලෝභ, පටිඝ දෙකින් සිත පෙළෙන්ට පටන් ගන්නේ අරමුණු වරදවා ගැනීම් සංඛ්‍යාත මෝහයේ මෙහයවීම් වශයෙනි. ධර්මය දැනීමෙන් විදර්ශනා ඥාන දියුණුවෙන් අරමුණු හරිහැටි දැක ගැනීමේ සිතේ එළිය වැඩෙයි. අප නොනිවෙන පහන් බවට පත් වන්නේ එලෙසිනි. මේ තමන්ගේම සැනසිලි ප්‍රාතිහාර්ය බව සලකන්න.

මීතිරිගල නිස්සරණ වනයේ (විසිපස් වසරක) ධර්ම ගමන, නොනිවෙන පහන් පෙරහැර මා සලකන්නේ ධර්ම ප්‍රාතිහාර්යයක් වශයෙනි.

***මේ අනුත්තර ධර්ම ගමන යාව නිබ්බාණ වේවා !***

මෙයට,
නිශ්ශරණාර්ථී
***කඩවැද්දුවේ ජිනවංශ ස්ථවිර.***

2535/1992 අප්‍රියෙල් 08 වෙනි දින.
ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානය,
ගල්දූව,
කහව.

# පෙරවදන - II

## ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සංඝා ලේඛකාධිකාරී
## අති පූජ්‍ය නාඋයනේ අරියධම්ම මහා ස්ථවිර පාදයන් වහන්සේ විසිනි.

සම්‍යක් සම්බුද්ධ ශාසනය ඒකාන්තයෙන් නෛර්යානිකය. එහෙයින්ම එය ස්වාක්ඛාතය. සන්දිට්ඨිකය. අකාලිකය. ඒහිපස්සිකය. ඕපනයිකය. නැණවතුන් විසින් ප්‍රත්‍යාත්මිකව දත යුතුය. ශාසනය නෛර්යානික වනුයේ ශාස්තෘන් වහන්සේ සර්වඥ බැවිනි. මහා කාරුණික ද බැවිනි. අර්හත් සම්‍යක් සම්බුද්ධ විජ්ජාචරණ සම්පන්න සුගත ලෝකවිදූ අනුත්තර පුරිස ධම්ම සාරථී සත්ථා බුද්ධ භාග්‍යවත් බැවිනි.

ශාසනය නෛර්යානික බැවින්ම එම ධර්මානුධර්ම ප්‍රතිපදාව අනුව යන කිංකර ශ්‍රාවක ශිෂ්‍ය පිරිස සුපටිපන්න, උජුපටිපන්න, ඤාය පටිපන්න, සාමීචි පටිපන්න, අහුනෙය්‍ය, පාහුනෙය්‍ය, දක්ඛිනෙය්‍ය, අඤ්ජලිකරණීය අනුත්තර පුඤ්ඤක්ඛෙත්ත බවට පත් විය. රත්නත්‍රයෙහි විද්‍යාමාන වන මෙම අසීමිත සූවිසි මහා ගුණස්කන්ධය නිසාම සම්‍යක් සම්බුද්ධ ශාසනය අවුරුදු පන් දහසක් තරම් කල් අවිච්ඡින්නව ගංගා ජල ප්‍රවාහය සේ නෛර්යානිකත්වයෙන් අනූනව පවත්නේය. ශාසන භාරධාරී සංඝ පීතෘන්වහන්සේලාගේත් රාජ රාජ මහා මාත්‍යාදි බෞද්ධ ජන ප්‍රධානින්ගේත් අප්‍රතිහත ධෛර්යයෙන් මෙතෙක් කල් බුදු සසුන රැකුනේ ද එහෙයිනි.

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව වනාහි නෛර්යානික සම්බුද්ධ ශාසනයේ ආරක්ෂාව, චිර ජීවනය සඳහාම සමාරම්භ වූ මහා සාසන කඳවුරකි. එහි නේතෘවර අති පූජනීය රාජකීය පණ්ඩිත මාතර සිරි ඤාණාරාමාභිධාන මහෝපාධ්‍යායාය මාහිමිපාණන් වහන්සේ සහ නිර්මාතෘවර අති පූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශාභිධාන මාහිමිපාණන් වහන්සේ ද සකල බෞද්ධ ලෝකයාගේ ගෞරවාදර භක්ති ප්‍රණාමයට සදා පාත්‍ර වන සේක් සම්බුදු සසුන රැකෙන ශාසනික කඳවුරෙහි අසාමාන්‍ය සේනාපතිත්වය නිසි සේ උසුලන බැවිනි.

**මීතිරිගල නිස්සරණ වන සෙනසුන** පටන් ගැනීමේ ශ්‍රේෂ්ඨ පරමාර්ථයත්, ඉන් කෙරෙන උදාර ශාසන සංරක්ෂණයත් ගැන මනා නුවණින් සැලකිය යුතු වනුයේ ශ්‍රී ලංකාවේ දැනට පවතින්නා වූ **අද්විතීය අග්‍රගණ්‍ය වූ ශාසනික යෝග භාවනා මූලස්ථානය** වශයෙනි. එහි ජීවය වනුයේ පූජනීය අතිගරු මහෝපාධ්‍යායාය මාහිමිපාණන් වහන්සේමය.

එහි සංවිධායක නිර්මාතෘවර පින්වත් අසෝක වීරරත්න මැතිතුමා පූජ්‍ය මීතිරිගල ධම්මනිසන්ති හිමි නමින් ජීවිත පූජාවෙන් යුතුව එහිම පැවිදි වී උට්ඨාන වීර්යයෙන් භාවනානුයෝගීව වැඩ වෙසෙනු දක්නට ලැබීම ආදර්ශවත් වූද, ආශ්චර්යමත් වූද, ජීවිත ප්‍රාතිහාර්යයකි. නිස්සරණ වන සංරක්ෂක දායක මණ්ඩලය වනාහි ශාසනය රැක ගැනීමේ මහා පුණ්‍ය නිධානය හිමිකර ගත් ශ්‍රී ලංකාවේ අද්විතීය බෞද්ධ සංරක්ෂක මණ්ඩලයකි. එමඟින් සැලසෙන උදාර ශාසන සේවය දැක ගැනීමට ලැබීම බොදු මහජනතාවට ධෛර්යයකි.

අතීතයේ වැඩ සිටි ආර්ය මහෝත්තමයන් වහන්සේලා සිහියට නැගෙන සේ දමිත සමිත සුසංයථ ඉරියාපථ සම්පන්න නේවාසික ගරුතර සඟ පිරිස වනාහි දස අත සිල් සුවඳ විහිදුවන අනුත්තර පුණ්‍යක්ෂේත්‍ර සඟ පිරිසකි.

මීතරිගල නිස්සරණ වන සෙනසුන පටන් ගෙන පස් විසි වසරක් පිරීම නිමිත්තෙන් නිකුත් කෙරෙන මෙම "**නිස්සරණ පටිපදා**" ව මේ ආත්ම භාවයේදීම ධ්‍යාන, අභිඤ්ඤා මාර්ග ඵල නිර්වාණ සංඛ්‍යාත උත්තර මනුෂ්‍ය ධර්ම ප්‍රතිලාභ කරමින් ප්‍රතිවේධ ශාසනයට නව ජීවයක් ගෙනදෙනු කැමති උදාර අධ්‍යාශ සම්පන්න උතුම් යෝගාවචරයන්හට ශාසන උද්යෝගය පිණිස උපනිශ්‍රය හේතුවක් වේවා.

"චිරං තිට්ඨතු ලෝකස්මිං
සම්මා සම්බුද්ධ සාසනං
තස්මිං සගාරවා නිච්චං
හොන්තු සබ්බේපි පාණිනො"

***නාඋයනේ අරියධම්ම ස්ථවිර***
ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානය,
ගල්දුව - කහව.

## 3. පොතේ කතාව

සම්බුදු සසුන පිහිට කරගෙන මොහොතක් පාසා අප සිදු කරන්නේ සන්තානගත අඳුර දුරු කර ගැනීමය. සිතේ එළිය වඩා ගැන්මය. සිත පිවිතුරු කර ගැනීමය.

අනන්ත දුක් අනුභව කරමින් ගෙවූ දිගු සසර ගමන තුළ අනන්තවත් ලොවුතුරා බුදුවරයන් වහන්සේලා අපට හමුවන්ට ඇත. ඇසින් දැක්කා විනා නුවණැසින් දැක ගෙන නැත. දේශනා කළ ආර්ය ධර්මය කණින් ඇසුවා විනා අවබෝධ කරගන්ට තරම් ප්‍රඥාව අවදි කරගෙන නැත. මේ බුද්ධෝත්පාද කාලයේ අපි සැබෑ සම්මා දිට්ඨිය තෝරාගෙන විවිධ උතුම් කුසල් දහම්හි යෙදෙන්ට වාසනාවන්ත වී සිටිමු. ආර්ය සත්‍යය අවබෝධ කරගන්ට අපේ චිත්ත සන්තාන තුළ වර්ධනය කරගත යුතු වන්නේ කුසල ධර්මයි. ආමිස හෝ ප්‍රතිපත්ති හෝ සියලු කුසල් දහම් නිබ්බාණ ගාමී - විවට්ටගාමී හැටියට සිදුකළ මනාය. එබඳු කුසල් කළ හැක්කේ සම්බුදු සසුනකදී පමණය. ධර්මයේ හැසිරෙන අයට අද අදම දැකගත හැකි අනුසස් ධර්ම සම්පත්තියේ ඇත. එනම් සිතේ සැනසිල්ලයි. නොකිළිටි නිවුණු බවයි.

මීතිරිගල නිස්සරණ වන සෙනසුන හා අපේ සසුන් සැබැඳියාවට වසර තිස් පහක යටගියාවකි. එදා මෙදා තුර නිස්සරණ සෙනසුන නිසා අප කළ කුසල් අති මහත්ය. ඒ හැම මිණි රුවන්වලට වඩා අගී. පස් පියුම් මෙන් සඳුන් තුවරලා මෙන් සුවඳවත්ය. මිණි කැට, මුතු ඇට හැඩට රුවට ගලපා මිණි වැලක්, මුතු පටක් අමුණුවා සේ, අපේ කුසල් පෙරහැර සිහි ගන්වන්ටයි මේ පොත.

අප තව තවත් නිවී සැනසී, ලෝකයත් නිවා සනසාලමින් කළ පින්කම්ය මේ. සැදැහැයෙන් කළ පින්කම්ය. මසුරු මලින් තොරව ඇප කැප වී කළ පින්කම්ය. සමගියෙන් තෙද ගැන් වී කළ පින්කම්ය. අසිරිමත්ය ඒවා. සෘද්ධි ප්‍රාතිහාර්ය වැනිය. එහෙම පිටින්ම නිවන් පතා කළ පින්කම්ය.

ඒ යටගියාව සිහියට නගා ප්‍රමෝදයට පත් වෙමු. උතුම් ආර්ය ධර්මය ලොව පහළ වන්නේ කල්ප කෝටි ගණනකිනි. **සම්බුදු සසුනකදී පමණක්ම කළ හැකිවන අති උතුම් අති දුර්ලභ වූ ධර්ම දානමය පින්කමයි** මේ කරන්නේ.

**"සබ්බ දානං ධම්ම දානං ජිනාති"**
සියලු දානයන් අතර ධර්ම දානයම උතුම් වේ.

මතු යම් දවසක ශාන්ත නිවනට පත්වීමට මේ මහනීය පින්කම් අපට මහත් උපකාර වනු ඒකාන්තය.

නිස්සරණයේ අපේ නිස්සරණ පින්කම් ගැන ලියන්ට පසුබිම සකස් කරන්ටයි, නිස්සරණ සෙනසුනේ තොරතුරු බිඳක් සොයන්ට පූජ්‍ය උඩඊරියගම ධම්මජීව හිමිපාණන් මුණ ගැසුනේ. උන් වහන්සේ මහ මෙත් කුළුණින් අපට සපයා දුන්නේ නිස්සරණ තොරතුරු බිඳක් නොව මහ රැසකි. එපමණක් නොව සුරැකිව රඳවාගෙන සිටි අති උතුම් ගත් රුවනක් අප අත තැබුයේ එය ද අප ගතට එක්කරන්ට කියායි. එය නම් අප ලද මහඟු තිළිණයකි. අප කළ පින්කම්වල අනුසස් අද අදම ලැබීමකි.

නිස්සරණ වන සෙනසුනේ වත්මන් නායක මාහිමි පූජ්‍යතම පානදුව ඛේමානන්ද හිමිපාණන් වහන්සේ විසින් රචිත 1992 දී හෝ ඇවැසි වූ පරිදි එළි දැක්වීමට නොහැකිවුණු "නිස්සරණ පටිපදා" අත් පිටපතයි ඒ. එයද අප ලද මහත් සම්පතක් සේ සලකා අපේ පොතට ඇතුල් කර ඇත. එපමණක් නොව 1992 දී නිස්සරණ පටිපදා එළි දක්වන අදහසින් අති පූජ්‍ය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ නාහිමිපාණන් වහන්සේ හා අති පූජ්‍ය නාඋයනේ අරියධම්ම හිමිපාණන් වහන්සේ විසින් සපයන ලද "පෙරවදන්" දෙක ද එලෙසම මෙහි යෙදීම ඉතා සුදුසු යයි පූජ්‍ය උඩඊරියගම ධම්මජීව හිමිපාණන් වහන්සේගෙන් අවසර ලැබුණි. එසේ වුව ඒ උතුමන් වහන්සේලාගේ අනුදැනුම නැතිවම පෙරවදන් පොතට යෙදීමෙන් කළ වරදට සමාවන සේක්වායි අයදිමු.

නිස්සරණ පටිපදා ලියවුනේ මුල් යුගයේ නිස්සරණ වන සංරක්ෂණ මණ්ඩලයේ ලේකම්ව සිට පරලෝ සැපත් පී. ඩී. සරණපාල මහත්මාගේ සමාරාධනයෙන් හා අපවත් වී වදාළ මහෝපාධ්‍යයාය මාහිමියන්ගේ මග පෙන්වීමෙන් බව සඳහන් වෙයි.

"නිස්සරණ පටිපදා" පිටපතට අයත් "නිස්සරණ වන ව්‍යවස්ථා" ලිපිය එසේම පොතට ඇතුල් කර ඇත. "විසිපස් වසරක නිස්සරණ වන තතු" එදා ලියවුනේ 1992 දක්වාය. ඒ නිසා එයින් ද කරුණු ගෙන අද දක්වා ගැලපෙන පරිදි "නිස්සරණ වන තතු" නව සටහනක් සකස් කළෙමි. "නිස්සරණ වන නිදානය" ද වෙනම ලිපියක් ලෙස ගැලපීම අඩු නිසා "නිස්සරණ වන තතු" ලිපියට ම ඇවැසි තොරතුරු ගොනු කර ඇත.

නිස්සරණ සේනාසනාධිපති පූජ්‍ය පානදුව ඛේමානන්ද හිමිපාණන් වහන්සේ විසින් රචිත **"නිස්සරණ පටිපදා"** ලිපිය කිසිදු වෙනස් කිරීමකින් තොරව එසේම ඉදිරිපත් කර ඇත. මේ අනුව, මෙම පොතෙහි ඇතුළත් වන 7, 8 පරිච්ඡේදයන් සම්පූර්ණයෙන් ම පූජ්‍ය පානදුව ඛේමානන්ද හිමිපාණන් වහන්සේගේ රචනයන් බව ගෞරවයෙන් සටහන් කරමි.

නිස්සරණ වනයේ බෙහෙත් පූජා පින්කම්වලදී අපලද ධර්ම ලාභයෙන් අපට ඔබ සඳහා ඉදිරිපත් කරන්ට හැකි වූයේ දහම් දෙසුම් කිහිපයක් පමණි. අපවත් වී වදාළ මහෝපාධ්‍යායය මාහිමිපාණන් වහන්සේගේ දහම් දෙසුම් වුව අප ළඟ නැතිවීම අප හැමගේ අලාභයක් යයි සිතේ.

විපත් කරදර අවිවේකය මැදින් දුකසේ උපයාගත් කාලයෙන් ය, ගතෙහි නිමාව දකින්නේ. නිහඬ රාත්‍රීන් රැසක් නිස්සරණ අදහසින් නිස්සරණය ගැන ලියන්ට කැප කිරීම ගැන මට මහත් සතුටක් දැනෙයි.

මෙහි යම් ගුණයක් ඇත්නම් එය අනුන් දකිනවා ඇත. එය ඇගයීම, මැනීම ඒ අය සතුය. මට අයිති නැත. වරද අතහැර නිවරද පමණක් ගත මැනව.

කියවන ඔබත් මහා සැනසිල්ල ලබන්න බුදුගුණ දකිමින්, බුදු ගුණ භාවනා කරමින් අපත් සමඟ බුදු පෙරහැරට එක්වන්න. බුදු පෙරහැරට එක් වූ පින්වතාගේ පැවතුම් මහිමය අපේ මහ පඬි රුවනක් වූ ගුරුළුගෝමීන් දුටු අයුරු බලන්න.

"බුදු ගුණ මුත් තෙපුල්
මෙත් බහාවුන් මුත්සිත්
නොවේවා කෙනෙක්හි දු
පර වැඩ මුත් පියෝ මා"

බුදු ගුණයෙන් තොර වචනයක් මෙත් බැවුමෙන් තොර සිතුවිල්ලක්, පර හිතයෙන් තොර ක්‍රියාවක් කිසිම මොහොතක නොවේවා !

***ඔබත් මේ සැනසිලි පෙරහැර විසිතුරු මුලු හදින්ම දකීවා!***

සංස්කාරක

අරිය පරියේසන දහම් මැදුර,
මැදිහේනවත්ත,
ලෝලුවාගොඩ.

2003. 04. 01

## 4. අනුමෝදනාව

**"සිත නිවන නිස්සරණ වන අරණ"** වෙනුවෙන් පිදෙන ආසිරි පැතුමයි මේ.

පළමුව පොත සකසන්ට මහ රැසක් කරුණු සොයා සපයා දී, දෙවනු අත් පිටපත කියවා අඩු ලුහුඬු සකසා උපදෙස් දී, මහ මෙත් කුළුණින් අපමණ උපකාරී වූයේ නිස්සරණ අරණෙහි **පූජ්‍ය උඩරිටියගම ධම්මජීව හිමිපාණන් වහන්සේය.**

යටගිය තොරතුරු රැසක් මතුකර ගත්තේ නිස්සරණ වනයේ **පූජ්‍ය මීතිරිගල ධම්මචාරී හිමිපාණන් වහන්සේ නිසාය.**

ත්‍රිපිටක පොත් ලබාදීමෙන් හා අත් පිටපත කියවා අවශ්‍ය උපදෙස් දීමෙන්, මීරිගම, මිණීඔලුව විද්‍යාවාස පරිවේනාධ්‍යක්ෂ **පූජ්‍ය මකුලෑවේ විමල හිමිපාණන් වහන්සේ** ද අපමණ උපකාරවත් වූ සේක.

සදුපදේශ දානයෙන් මහෝපකාරී වූ උතුමන් වහන්සේලාට කායික, මානසික නිරෝගී බව, සැනසීම, දිගාසිරි සැප වැඩේවා! ගැඹුරු නුවණැස පහළ වේවා!

**මීරිගම චන්ද්‍රදාස හතුරුසිංහ ගුරු උතුමාණන්** කළේද, අමිල උපකාර රැසකි. එයද සදුපදේශ දානයකි. එතුමාගේ සකල ධර්ම ප්‍රාර්ථනා සමෘද්ධිමත් වේවා!

මහ නාහිමි දෙනමගේ වටිනා පින්තූර දෙකෙන් පොතෙහි හැඩ, රුව, අගය බොහොමත්ම වැඩි වූ බව කිව යුතුය. **බ්‍රිගේඩියර් රංජිත් ද සිල්වා මැතිතුමාගේත්, මිත්‍ර වෙත්තමුණි මැතිතුමාගේත්** කාරුණික අනුග්‍රහයෙන් ඒ පින්කම කළේ **මහේෂ් යහම්පත්** හා **කමල් සමරනායක** මහතුන්ය.

නිස්සරණ වන අරණේ අපේ පින්කම් පිළිබඳ පින්තූර ඔබ දකින්නේ මීරිගම ජාතික පාසලේ **වජිර සිරිමාන්න ගුරුතුමාගේ** හපන්කම නිසාවෙනි.

මුද්‍රණ බර පැන දැරුවන් ගැන පොත අග සඳහන්ය.

මීරිගම මහජන ප්‍රින්ටර්ස් අධිපති මහතා ඇතුළු කාර්යය මඬුල්ල කලට වෙලාවට හැඩ රුවට පොත නිම කළෝය.

අපට සහාය දුන් මෙම සත් පුරුෂ උතුමන් සැම කෘතවේදීව සිහිපත් කරමින් පින් අනුමෝදන් කරමු. ඒ හැම ධර්මකාමීහු සකල ධාර්මික අභිමතාර්ථයන් සාධනය කර ගනිත්වා!

**සදේවක ලෝකයාම මෙම ධර්ම දානමය කුශලය අනුමෝදන් වෙත්වා!**
***සියලු සත්හට විදසුන් නුවණ හරි දැක්ම පහළ වේවා!***

මෙයට,

මෙත් සිතැති
**එන්. එස්. දිසානායක**

**5**

# නිවන් පිළිවෙත හා වන සෙනසුන්

## නිස්සරණ වැඩ පිළිවෙල

භාග්‍යවතුන් වහන්සේ නිස්සරණ පටිපදාව දේශනා කොට වදාළේ හුදෙක් භික්ෂූන් වහන්සේට පමණක් නොවේ. සංසාර දුකෙන් අත් මිදෙනු කැමති සියලු දෙනාම සඳහා ය. නිස්සරණ පටිපදාවට මිල මුදල් දේපල අවශ්‍ය නැත. ඒවා සිතින් අල්ලාගත් භික්ෂුවගේ නිස්සරණ පටිපදාව ඒකාන්ත අනිස්සරණ (අනිබ්බාන) පටිපදාවක් වෙයි. දේපල අත් නොහල ගිහි පින්වතුන්ගේ නිස්සරණ පටිපදාව නිස්සරණ හෝ අනිස්සරණ හෝ විය හැකිය. එය සිත්හි යෙදෙන චෛතසික අනුව සිදුවන්නකි.

### වන සෙනසුන් හා ප්‍රතිවේධ සාසනය

"ඉධ භික්ඛවෙ භික්ඛු අරඤ්ඤගතෝවා රුක්ඛ මූල ගතෝවා සුඤ්ඤාගාර ගතෝවා . . . ."

ආදී වශයෙන් සතිපට්ඨාන සූත්‍රය හා ත්‍රිපිටකයේ තවත් බොහෝ තැන්වල භාවනා සඳහා ගෝචර ස්ථාන සඳහන් කර ඇත.

"මේ සද්ධර්මය අවබෝධ කොට සසරින් එතෙර වනු කැමති පින්වත් මහණෙනි, එබඳු භික්ෂුව නිහඬ වන පෙදෙසකට හෝ සෙවන ඇති ගසක් යටට හෝ ජනයා නොගැවසෙන විවේක ස්ථානයකට හෝ ගොස් . . . ." භාවනා කළ යුතු බව ඉහත පාඨයෙන් කියවේ.

මේ අනුව බුද්ධ කාලයේ සිටම ධ්‍යාන මාර්ග-ඵල අවබෝධය සඳහා විශේෂයෙන් භික්ෂූන් වහන්සේ වන සෙනසුන් තෝරා ගත් බව පෙනේ. ඇතැම් විට රහතන් වහන්සේලා පවා චිත්ත විවේකය සඳහා ආරඤ්ඤගත විය. සිංසපා වනය, භග්ග ජනපදයේ සුංසුමාරගිරියෝ භේසකලා වනය, අම්බපාලි වනය, විසාලා පුර මහා වනය, කපිල වස්තුවෙහි මහා වනය, සාකේත නුවර තීකණ්ඩකී වනය, සීත වනය ආදී එදා යෝගාවචර සෙනසුන් බවට පත් වූ ස්ථාන රාශියක් ත්‍රිපිටකයෙන් අපට හමුවෙයි.

මුල් බුදු සසුන ආරම්භ වුනේම වන අරණ මුල්කර ගෙනයි. සම්බුදු සමිඳුන් සිය මඟුල් දම් දෙසුම කළේ බරණැස ඉසිපතන මිගදායෙහි ය. මුල්වරට දම්සක පෙරලූ මේ උතුම් පින් බිම සියලු අයුරින්ම වන අසපුවකි. අසිරිමත් වන සෙනසුනකි. සම්බුදු සසුන තුළ පළමු වස් කාලය ගත කළේද, මුල්ම රහතන් වහන්සේලා බිහිවුනේද මිගදා වන අසපුව පිළිසරණ කොටයි. වස් සමය අවසන් වූ පසුව බුදු සව්වන් ලෙස මහ රහත් උතුමන් හැට නමක්ම මිගදා

සෙනසුනෙන් පිටවූයේ සදහම් රස බෙදන්ට ගම් දනව් සැරිසරන්ටයි. එදා සෑම වස්සාන කාලයක ම බොහෝවිට භාග්‍යවතුන් වහන්සේගෙන්ම කමටහන් ලබාගත් භික්ෂූන් වහන්සේ සප්පාය වන සෙනසුන් සොයා ඈත එපිට පවා වැඩම කළහ. නිතරම වාගේ සාසන අර්ථය සලසාගෙනම වස් අවසානයේ අර්හත් උතුමන් ලෙසට බුදු පියාණන් වහන්සේ හමුවට උන් වහන්සේලා වැඩම කළහ. වන සෙනසුන් පාදක කරගත් හරවත් කතා පුවත් දහස් ගණනක් වුව බෞද්ධ සාහිත්‍යයෙන් සොයා ගත හැකිය.

ග්‍රන්ථ ධූරය විදර්ශනා ධූරය වශයෙන් හෝ ග්‍රාමවාසී, වන වාසී වශයෙන් හෝ භික්ෂූන් වහන්සේ කිසියම් වෙනසකින් හැඳින්වූයේ ශත වර්ෂ ගණනාවකට පසුව අටුවා යුගයේ බවට අදහසක් ඇත. පර්යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවේධ යන ත්‍රිවිධ ශාසනය ම එකම ගහේ මල් පල විය. වෙන් කළ හැකි දේ නොවීය. පර්යප්තියම ගරු කොටගත්, පර්යප්තියම මුඛ්‍ය කොටගත් පණ්ඩිතයන් බිහිවූයේ මෑත යුගයේදීය. බුදු පියාණන් වහන්සේ දේශනා කළ සද්ධර්මය නිවන ප්‍රත්‍යක්ෂ කර ගැනීමට උදව්වන **ප්‍රතිපත්ති මාර්ගයකි.** බුදු දහම සජීවී දහමකි. බුද්ධ දේශනාව කොයිතරම් සවිස්තරව හැදෑරුවත්, කට පාඩම් කරගත්තත් ශීල, සමාධි, ප්‍රඥා කියන ප්‍රතිපත්ති මාර්ගයේ ගමන් කරන්නේ නැත්නම් බුද්ධ දේශනාවේ පරමාර්ථය ඉෂ්ට වෙන්නේ නැත.

බුදු පියාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ වාසය කරන කාලයේ හිටිය පෝඨිල කියන තෙරුන් වහන්සේ ත්‍රිපිටකය පිළිබඳ විශාරදයෙකි. ත්‍රිපිටකය කටපාඩම් කරගෙන පන්සියයක් ගෝලයින්ට ධර්මය උගන්වපු ප්‍රසිද්ධ ආචාර්ය කෙනෙකි. අද කාලෙ විදියට නම් ත්‍රිපිටකාචාර්ය, ත්‍රිපිටක වාගිශ්වරාචාර්ය ආදී ලොකු සම්මානවලින් පිදිය හැකි කෙනෙකි. නමුත් සසරින් මිදීමේ වැඩ පිළිවෙලක නිරත නොවුනි. භාවනා ආදියක් නොකරන මේ හාමුදුරුවන්ට බුදු රජාණන් වහන්සේ ආමන්ත්‍රණය කළේ **"තුච්ඡ පෝඨිල"** කියලයි. ඒ කියන්නේ, **හිස් පෝඨිල** කියන එකයි. තමන්ගේ දුර්වලකම තේරුම් අරන් පසුව උන්වහන්සේ භාවනා මනසිකාරය යොදලා රහත් වුණු බව සඳහන් වෙන මේ කතාව අදට ඉතාම වැදගත් ආදර්ශ සම්පන්න එකකි.

**සසුන බැබලෙන්නේ ප්‍රතිපත්තියෙන් ප්‍රතිවේධ සසුන ග්‍රහණය කළොත් පමණි.** එදා මෙන් අදත් ප්‍රතිවේධ ශාසනය අප වැඩියෙන් දකින්නේ වන සෙනසුන් තුළින් නොවේද?

බුදු රජුන් දවස අපට හමුවන සිය ගණන් ආරාම නාමවලින් දැක්වෙන්නේ සප්පාය වන සෙනසුන් ගැනයි. මේ අතරින් මහා අසිරිමත් ධර්ම සමාගම්, සාසන ඉතිහාසයේ සුවිශේෂ සිදුවීම් ඇති වූ ස්ථාන බොහෝය. ශාක්‍ය ජනපදයෙහි **කපිලවස්තු නුවර මහා වනය** අසිරිමත් පින් බිමකි. භාග්‍යවතුන් වහන්සේ **මහා සමය සූත්‍රය** දේශනා කළේ එහි වූ දිව්‍ය බ්‍රහ්මාදීන්ගේ මහා සමාගමකදී ය. මේ මහා අසිරිමත් දිව්‍ය සමාගම ඇති වන්නේ ශාක්‍ය-කෝලිය දෙපාර්ශවයෙන් පැවිදි වූ සියළු දෙනාම රහත් පන්සියයක් පමණ වූ මහත් භික්ෂු සංඝයා මුල් කරගෙනයි.

**"මහා සමයො පවනස්මිං - දෙවකායා සමාගතා**
**ආගතම්හ ඉමං ධම්ම සමයං - දක්ඛිතායෙ අපරාජිත සඞ්ඝන්ති"**

**"මේ මහා වනයෙහි දිව්‍ය සමූහයා රැස් වූ මහා සමාගමයෙකි. කෙළෙසුන්ගෙන් නොපැරදුණු මහා සංඝයා දක්නට මේ සමාගමයට පැමිණියෙමු"**

පිරිසිදු වූ, නිර්මල වූ උතුම් රහතන් වහන්සේලා දකින්නට ඒ ඒ ස්ථානවලින් පැමිණි දේව සමූහයා ගැන මහත් විස්තරයක් මහා සමය සූත්‍රයේ එයි. ඒ හැම දෙව් රජකෙනෙකුම

කියන්නේ තමන් පිරිස සමඟ මහා වනයට පැමිණියේ මේ ශාක්‍ය වංශික **අපරාජිත භික්ෂු සමාගමය** දකින්නට බවයි.

සම්බුදු සිරිතෙහි අතිශය වැදගත් සිදුවීම් රාශියක් සිදු වූ තවත් වටිනා වන සෙනසුනකි, **ගිජුකුළු පව්ව.** දෙව්දත්තෙර ලොවුතුරා අමා මෑණියන් වහන්සේට විපතක් කරන්ට ගල් පෙරලා තමන් අපාගත වීමට මං පාදා ගත්තෙත් මෙහිදීය. නිසග කවිකම උරුම කරගත් වංගීස රහත් හිමියන් සොබා සුන්දරත්වයෙන් සංවේදී වූ මනසින් නිරාමිශ නිස්සරණ සිතුවිලි ඔස්සේ ගී පද බැන්දේ ගිජුකුළු පව්වේ බුදු හිමි වැඩ සිටියදීය. වීතරාගී නිකෙලෙස් හදවත්වල පහළවන කවි සිතිවිලි වලටත් තෝතැන්නක්ය, වන අරණ. ආටානාටිය සූත්‍රය දේශනා කිරීම සිදු වූයේ ද ගිජුකුළු පව්ව අසපුවේදී ය. බොජ්ඣඞ්ග සූත්‍ර දේශනා කිරීමට හේතු වුන මහා කාශ්‍යප තෙරුන්, මුගලන් මහ තෙරුන් හා බුදු පියාණන් වහන්සේ රෝගාතුර වූයේ ගිජුකුළු පව්වේ වැඩ සිටියදී ය. රෝගී වීමට හේතු වූයේ පව්ව පාමුල විෂ ගසක පිපුණු මල් ස්පර්ශ කරගත් වාතය ආඝ්‍රාණය කිරීම නිසා යයි අට්ඨකථාව සඳහන් කරයි. කොතෙක් නම් තපෝ ගුණ සුවඳ විහිඳුවන අසිරිමත් කතා පුවත් වන අසපු මුල්කොට ගොඩ නැගී තිබේද?

සඳහම් මිහිර ඉතිරී පැතිරී යන එබඳු රසවත් කතා පුවතකි, මේ.

**"එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං ආරඤ්ඤකානං යදිදං රෙවතො ඛදිරවනියො"**

මහණෙනි, කිහිරි වන වැසි යම් **රේවත නම් මහණෙක් වේද, අරණ්‍යවාසී මාගේ ශ්‍රාවක භික්ෂූන් අතරෙහි හේ අග්‍රවෙයි.**

දශබලධාරීන් වහන්සේ ඛදිරවනීය රේවත මහ රහතන් වහන්සේ එසේ ඒතදග්‍ර ස්ථානයක තබා වදාළ සේක. උන්වහන්සේ දම් සෙනෙවි සැරියුත් මහ රහතන් වහන්සේගේ බාල මලණුවන් ය. අරණ්‍ය වාසී බුද්ධ ශ්‍රාවකයන් ගැන විශේෂයෙන් ප්‍රශංසා කළ බවට ඛදිරවනීය රේවත කථා වස්තුව හොඳ නිදසුනකි.

උන්වහන්සේ ඉතාමත් දුර බැහැර විෂම භූමි ප්‍රදේශයක, ජල පහසුව, දාන මාන පහසුව ද අඩු කිහිරි වනයට වැඩම කළේ තමන්ට ඥාතීන්ගෙන් එතැයි සිතු කරදරවලින් බේරී යෝගාවචර ජීවිතයක් ගත කිරීමට ය.

සැරියුත් මහ රහතන් වහන්සේ රේවත හිමියන් සසුනෙහි සිත අලවා වසන්නේදැයි එහි ගොස් දැනගනු කැමැත්තෙමි'යි භාග්‍යවතුන් වහන්සේගෙන් අවසර ඉල්ලුවද දෙවාරයක්ම එය ප්‍රතික්ෂේප විය. තෙවන වරටත් එම ඉල්ලීම ම කළ අවස්ථාවේ රේවත හිමියන් රහත් වූ බව දැන,

"ශාරිපුත්‍රය, මම ද ඔබගේ සොහොයුරා දක්නට යන්නෙමි. භික්ෂූන්ට සැළ කරව'යි වදාළ සේක. ශාස්තෘන් වහන්සේ චාරිකාවෙහි හැසිරෙන කල්හි උන්වහන්සේ සමඟ නො යන්නා වූ භික්ෂුහු ස්වල්ප වෙති. බුදුරජාණන් වහන්සේගේ රන්වන් සිරුර දකින්නෙමු. ධර්ම දේශනා අසන්නෙමු, යයි චාරිකාවට එක්වන භික්ෂූහු බොහෝ වෙති.

කිහිරි වනය පිහිටියේ ඉතා දුරබැහැරය. එහි යාමට තිබූ මාර්ග දෙකින් දුර්භික්ෂ, අමනුෂ්‍යාදී උවදුරු බහුල නමුත් කෙටි මග බුදු රජාණන් වහන්සේ තෝරා ගත් සේක. "අප හා සමඟ සීවලී භික්ෂුව පැමිණේදැයි අසා, සීවලිගේ පුණ්‍ය මහිමය අද බලන්නෙමු'යි ද වදාළහ.

ශාස්තෘන් වහන්සේ භික්ෂු සංඝයා සමඟ මහ වන මගට ඇතුළු වූ තැන් පටන් දෙවියෝ යොදුනෙන් යොදුන නගර මැවූහ. බුදු පාමොක් මහ සඟනට දිවා, රාත්‍රී විවේක ගැනීමට විහාරයන් නිර්මාණය කළහ. දෙව්වරු මිනිසුන් මෙන් පෙනී සිටිමින් ඒ ඒ අවස්ථාවට ගැලපෙන

ආහාර පාන, ගිලන්පස රැගෙනවිත් සීවලී මහරහතන් වහන්සේ කොහිදැයි අසන්නාහ. ඒ සත්කාර සම්මාන ලබාගන්නා උන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේ සමීපයට ගොස් සියලුම භික්ෂූන් වහන්සේ ද සමඟ සුවසේ වළඳන සේක.

මෙසේ සුවසේ දවසට යොදුන බැගින් දුරු කතර තිස් යොදුන් මග ගෙවා ඛදිර වනයට පිවිස රේවත තෙරුන් වහන්සේ සමීපයට වැඩම කළ සේක. රේවත තෙරුන් වන්සේ ද ශාස්තෘන් වහන්සේගේ පැමිණීම දැන බුදු පාමොක් මහ සඟනට වැඩ සිටීමට ආවාස පහසුකම් මග පහසුකම් සෘද්ධියෙන් මවා පෙර ගමන් කළ සේක. අලංකාර මගින් වැඩම කළ බුදු රජාණන් වහන්සේ ගඳකිළියෙහි වැඩහුන් සේක. අනිකුත් භික්ෂූන් වහන්සේලා ද තම තමන්ට සුදුසු සෙනසුන් වලට පිවිසියහ.

සුදුසු පරිදි දානමාන, අෂ්ට විධ පාන ආදියෙන් සංග්‍රහ කළෝ දෙවිවරුය. ටික දිනක් ඛදිර වනයෙහි වැඩ වසන විට උඩඟු භික්ෂූහු බුදුරජාණන් වහන්සේගේත් රේවත මහ රහතන් වහන්සේගේත් අගුණ කථා ඇති කරන්ට වූහ.

ආරණ්‍යක භික්ෂූහු නම් විවේකයට කැමැත්තේය. දැන් ආපසු යාමට සුදුසු කලැයි සිතූ භාග්‍යවතුන් වහන්සේ රේවත හිමියන්ගේ දිවා ස්ථානයට වැඩම කළ සේක. සක්මනෙහි ආලම්බන පුවරුව අල්ලාගත සිටි උන්වහන්සේගෙන්, "රේවතයෙනි, මේ මහා වනයෙහි කොටි, ඇත් ආදී රෞද්‍ර සතුන්ගේ ශබ්ද ඇසෙන විට කුමක් කරන්නේදැ" යි විමසූ සේක.

"භාග්‍යවතුන් වහන්ස, ඒ ශබ්දයන් ඇසෙන විට මට ආරණ්‍යක ප්‍රීතිය උපදින්නේය" යයි වදාළ සේක. මෙහිදී ලොවුතුරා බුදුරජාණන් වහන්සේ ගාථා පන්සියයක්න් වන වාසයෙහි අනුහස් දෙසූ බව සඳහන් ය.

"රේවතයන්ගේ අගුණ කී අයගේ පාවහන්, සැරයටි, කුඩ, තෙල් භාජන ආදී පිරිකර අමතක වේවා"යි ඉටා බුදු පියාණන් වහන්සේ භික්ෂූන් පිරිවරා ආපසු වැඩම කළ සේක. මඳක් තැන් ගිය පසු අමතක වූ තම තමන්ගේ පිරිකර ගෙන ඒමට ආපසු ගිය භික්ෂූන්ට කිහිරි වනයේ මග සොයා ගැනීම ද දුෂ්කර විය. ඉතා දුකසේ යන්නේ කිහිරි කණුවල එල්වා තිබූ කුඩ, පාවහන්, සැරයටි, තෙල් ගුලා ආදිය දක්නට ලැබුණි. තම තමන්ගේ පිරිකර ගෙන රේවත හිමියන්ගේ සෘද්ධිමත් බව වර්ණනා කරමින් ආපසු වැඩම කළහ.

භික්ෂූන් වහන්සේ අතර ඇති වූ විෂම කතාබහ නිසා රේවත හිමියන්ගේ ආරාමය සිත්කළු වන්නේදැයි විශාඛා මහා උපාසිකාව භාග්‍යවතුන් වහන්සේගෙන් විචාළාය. "විශාඛාවෙනි, එය රමණීය වේවා හෝ නොවේවා. යම් තැනෙක්හි ආර්යයන්ගේ සිත ඇලේද, ඒ ස්ථානය රමණීයයි යනුවෙන් වදාළ සේක. එනම් ආර්යයන්ගේ විසීමෙන් රමණීය වන බවයි.

බුදුරජාණන් වහන්සේ විසින් වර්ණිත අරණ්‍ය වාසය ග්‍රාමවාසී භික්ෂූන් විසින් කළයුතු කාර්යයෙන් සම්පූර්ණයෙන්ම මුක්ත වූවක් නොවීය. අරණ්‍යවාසී භික්ෂුව විසින් පිළිපැදිය යුතු ආචාර ධර්ම රාශියක් **මජ්ඣිම නිකායේ ගුලිස්සානි සූත්‍රයේ** දැක්වේ.

"ඇවැත්නි, සඟ මැදට පැමිණි සඟ මැද වසන ආරණ්‍යක මහණහු සබ්‍රම්සරුන් කෙරෙහි ගෞරව සහිත වූවකු, ප්‍රතිෂ්ඨා සහිත වූවකු විය යුතුය"

ආදී වශයෙන් කරුණු රැසක් දක්වා ඇත.

- මජ්ඣිම නිකාය - 2 - බුද්ධ ජයන්ති ත්‍රිපිටක පිට 229 - 235

අරණ්‍ය වාසයේ ආනිසංස රාශියක් බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. නුසුදුසු රූපාදීන්ට වනවාසී භික්ෂුවගේ සිත වික්ෂිප්ත කළ නොහැකිය. විවේකයෙහි පුරුදු වූ නිසා

හෙතෙම නිර්භය ය. එයින් ජීවිත ආශාව ද දුරු කෙරේ. විවේක සුවයෙහි රස විඳියි. හුදකලාව අරණ්‍යයෙහි වසන භික්ෂුව විඳින සුවය ශක්‍රයා සහිත දෙවියන් පවා නොවිඳින බව විසුද්ධි මග්ගයේ සඳහන් වෙයි.

අමා මැණි බුදු පියාණන් වහන්සේටත්, එදා වැඩ සිටි උතුම් සඟ රුවනටත් නිස්සය වූයේම වන අසපු බව ඉතා පැහැදිලිය.

"මහණෙනි, භික්ෂූහු යම්තාක් කල් අරණ්‍ය සේනාසනවල අපේක්ෂා සහිත වන්නාහු ද, භික්ෂූන්ට අභිවෘද්ධියක් ම වන්නේය. පරිහානියක් නොවන්නේය" යයි බුදුරජාණන් වහන්සේ මහා පරිනිබ්බාන සූත්‍රයෙහි වදාළ සේක. භික්ෂූන්ගේ අභිවෘද්ධියට බෙහෙවින් අරණ්‍ය වාසය පසු බිම්වන බව මෙයින් පෙනේ.

අරණ්‍යයෙහි වාසය කිරීම ධූතාංග අතරින් අටවැන්නය. පාංශුකූලිකාදීඅංග සමාදානයෙන් කෙලෙස් කම්පා කරයි, සොලවයි යනුවෙන් අදහස් කෙරේ. ආරඤ්ඤකාංගය සමාදන්ව ආරක්ෂා කරන විට අනික් සියලු ධූතාංග පහසුවෙන් ආරක්ෂා කළ හැකිය. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ තෙළෙස් ධූතාංගම ආරක්ෂා කළ ධූතාංගධාරීන් අතරින් අග්‍ර වූ සේක. රාග, දෝෂ, මෝහ ත්‍රිවිධ චරිතයන්ට ම ගැලපීම ද විශේෂයකි.

භාග්‍යවතුන් වහන්සේ හුදකලාව පාරිලෙය්‍ය වනයට වඩින අතර මගදී බාලකලෝණකාර ගාමයට වැඩමවා එහි විසූ භගු තෙරුන්ට ද තනිව විසීමේ අනුසස් දෙසූ සේක.

පාරිලෙය්‍යය වනයේ වන සතුන්ගේ උවැටන් ලබමින් වැඩ සිටි වස් සමය විවේකී සුවයෙන් සිටි බව වදාරා ඇත.

රළු නීරස ආහාරයෙන් යැපීමට සිදු වූ වස් කාලයක් ගත කළ වේරඤ්ඤාව ද මහ වනයකි.

වරෙක ආනන්ද හිමියන් අමතමින්, "**රමණීයං ආනන්ද චාපාල චේතියං, රමණීයං ආනන්ද සාරාන්දද චේතියං**" ආදී වශයෙන් පරිසරයේ ඇති සුන්දරවත් බව පැසසුමට ලක් කළ සේක.

**"ගාමෙවා යදි වා රඤ්ඤෙ - නිනෙනවා යදි වා, ථලෙ,**
**යත්‍ථ අරහනෙතා විහරනති - තං භූමිං රාමණෙය්‍යකං"**

ගමක හෝ ආරණ්‍යයක හෝ වලෙක හෝ ගොඩ බිමෙක හෝ රහත්හු වෙසෙන්නේ නම් එතන සිත්කලුය.

පැවිදි ජීවිතයක අග්‍ර ඵලය වන මග-පල නිවන් ලබන්නට බවුන් වැඩීමට සුදුසුම තැන් වශයෙන් තෝරා ගනු ලැබුවේ වන සෙනසුන්ය. ආධ්‍යාත්ම සුවයට ප්‍රිය කළ අය එදත් අදත් තෝරා ගත්තේ නිහඬ නිසල ශාන්ත වන අරණක්මය.

ආධ්‍යාත්මික දියුණුව සඳහා කැප කළ ජීවිතයකට වන සෙනසුන නිත්‍ය වාසයට තෝරා ගැනීම දඹදිව ඉතා ඈත අතීතය දක්වා ම විහිදුණු හුරු පුරුද්දකි. අවුරුදු දහස් ගණනකට පෙර සිටම හිමාල අඩවිය එබඳු යෝගාවචරයන්ගේ ක්ෂේම භූමියක් වූ බවට සාධක ඇත.

**"අල්පේච්ඡතාව සඳහාම, සන්තුට්ඨිය සඳහාම කෙලෙස් නසාලීම සඳහාම, උතුම් විවේකය සඳහාම ඒ යහපත් ප්‍රතිපදාව සඳහාම වනවාසී වන්නා අග්‍රත්, ශ්‍රේෂ්ඨත්, මුඛ්‍යයත්, උත්තමත් ප්‍රවරත් වෙයි" යනුවෙන් ආරඤ්ඤක සූත්‍රයේ සඳහන් වෙයි.**
**(අඞ්ගුත්තර නිකාය - පංචක නිපාතය)**

කරණීය මෙත්ත සූත්‍රය දේශනා කිරීමට මුල්වූයේ ද මග-පල නිවන් සඳහා භාවනා වැඩීමට ආරණ්‍යගත වූ භික්ෂූන් වහන්සේලා පිරිසකට ඇති වූ බාහිර උපද්‍රව වලින් උන්වහන්සේලා මුදවා ගැනීම ය.

## හෙළ දිව වන සෙනසුන්

හෙළ දිව සම්බුදු සසුන ව්‍යාප්ත වන්නේ ද ප්‍රධාන වශයෙන් වන සෙනසුන් මුල් කරගෙනය. මුලින්ම ඉදි වූ වන සෙනසුන මිහින්තලේ බව ඉතා පැහැදිලිය. භාවනානුයෝගී භික්ෂූන් වහන්සේලා සඳහා මුලින්ම වාසස්ථාන වශයෙන් පිළියෙල වූයේ මිහින්තලේ "අට සැට ලෙන්" ය. ගල දිගේ වතුර ගලන්නේ නැතිව කෙළින්ම පහළට වැටෙන අන්දමට "කටාරම්" කොටා වාසයට සුදුසු පරිදි සකස් කළ ලෙන් 68 ක් මුලින්ම සඟ සතු කොට පූජා කරන්ට යෙදුන බව පෙනී යයි. බොහෝ විට ලෙන හැඳින් වූයේ පූජා කළ පුද්ගලයාගේ නම අනුවය. පුද්ගලික වශයෙන් තනි භික්ෂුවකටවත්, භික්ෂූන් කිහිප නමකටවත් මේ ගල් ලෙන් ප්‍රදානය කර නැත. පැමිණි නො පැමිණි සිව් දිගෙහිම වෙසෙන භික්ෂූන් වෙත ඒවා පිරිනමා ඇත. **"අගත අනගත චතුදිස සගස දිනෙ"** යනු ඒ අදහසයි. ඇතැම් ගල් ලෙන් පූජා කර ඇත්තේ භික්ෂූන් වහන්සේලා විසින්ම ය. ගිහි දායකයෙකු ගල් ලෙනක් කිසියම් භික්ෂුවකට පූජා කළ කල්හි විනය නීති කඩ කළැයි තමාට චෝදනා කළ නොහැකි වන සේ එම භික්ෂූන් වහන්සේ එය මුළු මහත් සංඝයාටම පූජා කළ බව සිතිය හැකිය.

සිව්වන මිහිඳු රජුගේ පුවරු ලිපි දෙකක් මිහින්තලේ "දළදාගේ" නමින් හැඳින්වෙන ස්ථානයේ පිහිටුවා ඇත. එයින් පළමුවන ලිපියේ 9 වන සහ 10 වන පේළිවල දැක්වෙන පරිදි මෙහි වැඩ වසන මහා සංඝයා වහන්සේලා ඉතා උදෑසන නැගී සිටිය යුතුය. චතුරාරක්ෂ භාවනා මෙනෙහි කළ යුතු වෙයි. දැහැටි කෘත්‍යය නිමවා සිඛකරණියෙහි කියූ ආකාරයෙන් සිවුරු හැඳ පෙරවිය යුතුය.

පැරණි රජ දවස භික්ෂූන් වහන්සේලා භාවනානුයෝගීව වැඩ සිටි අරණ්‍ය සේනාසන මහා රාශියක් පැවති බව පැහැදිලි වෙයි. වංශ කථාගත තොරතුරු හා අභිලේඛන (සෙල්ලිපි) සාධක වලින් ඒ බව පෙනී යයි.

**කුඩුම්බිගල** තපෝ වනය අති පුරාණ රෝහණ ජනපදයේ **"රුහුණු චේතියගිරිය"** නම් ඓතිහාසික ශුද්ධ භූමිය බව පූජ්‍ය එල්ලාවල මේධානන්ද ස්වාමීන් වහන්සේ සිය පර්යේෂණ මඟින් ඔප්පු කර ඇත. එහි මහා සුදර්ශන ලෙනෙහි කටාරමට පහළින් "ත්‍රිරත්න සංකේතය" හා බ්‍රාහ්මී ලිපියක් දැකිය හැක.

**"පරුමක නදික පුතශ පරුමක මිතශ ලෙණෙ මහ ශුදශනෙ ශගශ දිනෙ"**

ප්‍රමුඛ නන්දිකගේ පුත්‍ර වූ ප්‍රමුඛ මිත්‍රගේ මහා සුදර්ශන ලෙන සංඝයාට පූජා කරන ලදී. යනු එහි අදහසයි.

රුහුණු ගැටව් නමින් හඳුන්වන මිටි අලි රංචු මේ පෙදෙසේදී දැකිය හැක. බොහෝ අවස්ථාවල සේනාසන භූමියේ පවා වීර, පලු ගෙඩි කෑමට පැමිණ කිසිදු බියක් සැකයක් නැතිව නිදහසේ හැසිරෙන වලහා, දිවියා වැනි සතුන් අපට හමුවේ.

දුටුගැමුණු රාජ අවධියට දිවෙන පැහැදිලි සාක්ෂි ඇති මෙම සෙනසුනෙහි ශිලා ලේඛන රැසක් දැකිය හැක. අක්කර 10000 ක පමණ ප්‍රමාණයේ පැතිර ඇති ලෙන් බොහෝ විට එකිනෙකින් සැතපුම් භාගයක් පමණ දුරින් පිහිටා ඇත.

මෛත්‍රී පිණ්ඩයක් වැනි අපවත් වී වදාළ කුඩිම්බිගල සේනාසනාධිපතිව වැඩ විසූ පූජ්‍ය තාඹුගල ආනන්දසිරි ස්වාමීන් වහන්සේ විසින් ලියා ඇති තපෝවන ඉතිහාස පොත් ඉතා රසවත් හා ත්‍රාසජනක තොරතුරු වලින් පිරී ඇත. එදා කුඩිම්බිගල සෙනසුනේ බවුන් වඩන යෝගාවචරයන් වහන්සේලාගේ අපිස් බව ලෙනකට ගිය පසු මනාව ඔප්පු වෙයි. වන සතුන්ගෙන් උන්වහන්සේලාට කිසිදාක හිරිහැර සිදුවූයේ නැත. දෙපා සතුන්ගේ හිරිහැර නිසා කලක් අත්හැර දමා තිබූ වන සෙනසුන නැවතත් යෝගී බිමක් බවට පත්ව ඇත. වත්මන් සේනාසනාධිපති පූජ්‍ය සිවුරළුමුල්ලේ ධම්මසිරි ස්වාමීන් වහන්සේ මේ සෙනසුන යහපත්ව පවත්වාගෙන යාමට මහත් පරිශ්‍රමයක් දරණ බව ඉමහත් ගෞරවයෙන් සඳහන් කළ යුතුය.

## නිමලව වන සෙනසුන

දකුණු පළාතේ හම්බන්තොට දිසාවේ තිස්සමහාරාම උප දිසාපති කොට්ඨාශයේ කිරින්ද ග්‍රාම සේවා වසම තුළ නිමලව වන සෙනසුන පිහිටා ඇත. ලේඛනගත දිගු ඉතිහාසයක් ඇති මේ උතුම් පින් බිම නිමලව වන සෙනසුන බවට පත් කිරීමේ හැකියාව ලැබුණේ පූජ්‍ය කඩවැද්දුවේ ජිනවංශ ස්වාමීන් වහන්සේ ඇතුළු යෝධ කණ්ඩිය "සද්ධර්ම ප්‍රචාරක සමිතිය" ටයි. දිගු කලක් වන සතුන්ගේ රජ දහනක් ව තිබූ බව ඉතා පැහැදිලිය. හදිසියෙන්ම මේ උතුම් තපෝ බිම දැක ඇත්තේ දඩයමේ ගිය කෙනෙකු විසිනි.

අවුරුදු දෙදහසකට පමණ පෙර කාවන්තිස්ස, මහානාග, යටාලතිස්ස ආදී රජවරුන් රුහුණේ මාගම් පුරුයේ රජකළ කාලයෙහි සිතුල්පව්වටත්, තිස්ස මහාරාමයටත් අතර වූ මේ පෙදෙසෙහි දොළොස් දහසක් පමණ වූ මහ රහතන් වහන්සේලා වැඩ විසූහ. එම මහ රහතන් වහන්සේලා අතර, ගණපාමොක් ධම්මදින්න මහ රහතන් වහන්සේ වැඩ සිටියේ තිස්සමහාරාමයටත්, සිතුල්පව්වටත් අතර තලගුරු විහාරයෙහිය සද්ධර්මාලංකාරයෙහි ද මේ තොරතුරු සඳහන් වෙයි.

සියලු ආකාරයෙන් ම විශාල වන සෙනසුනක ලක්ෂණ පෙන්නුම් කරන අලුතින් හමු වූ මේ ස්ථානය පිළිබඳ පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමියන් ද පර්යේෂණ පවත්වා ඇත. පැරණි තලගුරු වෙහෙර ලෙස විශ්වාස කරන මේ ශුද්ධ භූමිය 1951 දී නිමලව ආරණ්‍ය සේනාසනය බවට පත් විය. නිමලව ඇති පර්වත ලිපිවල තලකර පවරන, තලකර පව් ආදී නම් සඳහන් වෙයි. ධම්මදින්න මහ රහතන් වහන්සේගේ නම හා බැඳුණු මේ ස්ථානය අද යෝගාවචරයන් වහන්සේලා පහළොස් නමක් පමණ වැඩ වසන උන්වහන්සේලාට වෙනම ගල් කුටි ආදී අවශ්‍ය අංගවලින් පරිපූර්ණ වන සෙනසුනකි.

මෙහි රුහබක නමින් දක්වා ඇති ලෙනෙහි ධම්මදින්න මහ රහතන් වහන්සේ විසූ බවත් උන්වහන්සේ පිරිනිවීමෙන් පසු ආදාහනය කරවා ධාතු රැස්කර එහිම කුඩා ස්තූපයක් බඳවා ඇති බවත් පිළිගැනී ඇත. ධම්මදින්න තෙරුන් දෙවියන්ට බොහෝ ප්‍රිය වූ මහ රහතන් වහන්සේ නමක් බව කියවේ.

## වෙනත් වන සෙනසුන්

දිඹුලාගල අති දීර්ඝ ඉතිහාසයක් ඇති වන සෙනසුනකි. එය පණ්ඩුකාභය රජුගේ ජීවිතය හා සම්බන්ධ විචිත්‍ර පුරාවෘත්ත හා අත්වැල් බැඳ ගත්තකි. දෙවනපෑතිස් රාජ අවදියේ සිටම අරණ්‍ය සේනාසනයක් සේ පැවති බව පෙනේ. දිඹුලාගල වනවාසී පරපුරක් විය. පළමුවරට ලක්දිව සංඝරාජ පදවිය ලැබුණේ පොළොන්නරු යුගයේදී වනවාසී සම්ප්‍රදායට අයත් දිඹුලාගල කාශ්‍යප මහා නායක ස්වාමීන් වහන්සේටය.

මලියදේව මහ රහතන් වහන්සේ වැඩිම කාලයක් වැඩසිටි බව කියන අරංකැලේ සේනාසනය ද අනුරාධපුර යුගයට අයත් ය. විශාල ප්‍රමාණයක් අතීත නටබුන් දක්නට ලැබේ.

අදත් යෝගාවචර භික්ෂූන් වහන්සේලාට කෙම් බිමක්ව පවතින මදුනාගල වන සෙනසුන දකුණු ලක ඉපැරණි තපෝ බිමකි. ගල් ලෙන් බොහොමයක් ඇති මෙහි අඩි 80 ක් දිග ගල් ලෙනක් ද දැකිය හැක.

## පරිහානිය හා පුනර්ජීවනය

වනවාසී ආරණ්‍ය සේනාසන සම්ප්‍රදාය පොළොන්නරුව, දඹදෙණිය, ගම්පොළ යුගවලදී ද යහපත් තත්ත්වයක පැවතුණි. නමුත් නුවර යුගයේ අවසාන කාලය වනවිට ග්‍රාමවාසී, වනවාසී සම්ප්‍රදායන් දෙකම පිරිහීමට පත් විය. පරසතුරු උවදුරු ඊට ප්‍රධාන ම හේතුව විය. එකම උපසම්පදා භික්ෂූන් වහන්සේ නමක්වත් නොසිටි අවදිය නිමාකළ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියන් ද වනවාසී පිරිසේ සාමණේර නමක් විය. අස්ගිරි පාර්ශවයත් වනවාසී නිකායෙන් පැවත එන බව ප්‍රකටය.

යටත් විජිත යුගයේ ක්‍රමයෙන් පරිහානියට පත් වූ වනවාසී සම්ප්‍රදාය බුද්ධ ජයන්ති යුගයේදී නැවතත් පුනර්ජීවයක් ලැබූ බව පෙනේ. තිහඬව ඒ ඒ ප්‍රදේශවල වන සෙනසුන්වල භික්ෂූන් වහන්සේලා වැඩ සිටියත් සංවිධානාත්මක වැඩ පිළිවෙලක් ඇති වූයේ බුද්ධ ජයන්තිය නිමිත්තෙනි. නූතන යුගයේ වනවාසී ආරණ්‍ය සේනාසන සම්ප්‍රදායට පුනර්ජීවයක් ලබාදීමට පුරෝගාමී වූයේ රාමඤ්ඤ නිකාය බව ඉතා පැහැදිලිය.

1950 දී ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව බිහිවීම ශාසන පුනර්ජීවයේ අතිශය වැදගත් සන්ධිස්ථානයකි. ගල්දුව යෝගාශ්‍රම මූලස්ථානයේ වැඩ සිටින අති පූජ්‍ය මහෝපාධ්‍යායාය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ මාහිමිපාණන් වහන්සේත්, මීතිරිගල නිස්සරණ වනයේ ප්‍රධාන කම්මට්ඨානාචාර්ය අපවත් වී වදාල අති පූජ්‍ය මහෝපාධ්‍යායාය මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන් වහන්සේත් මේ උතුම් කාර්යයෙහි මූලිකත්වය ඉසිලූ සේක. නිමලව වන සෙනසුන ද ඇතුළුව අද වනවිට ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවට අයත් වන සෙනසුන් 122 ක් පමණ වෙයි.

ගල්දුව ගුණවර්ධන යෝගාශ්‍රමය (අම්බලන්ගොඩ) නාඋයන (මඩහපොල) නාවිමන (වරකාපොල) මැල්ලගල (පල්ලේගම) කුඩිම්බිගල (නැගෙනහිර) සඳකැබැල්ල (මොණරාගල) නාගලකන්ද (මින්නේරිය) රුවන්ගිරි කන්ද (නාරම්මල) නාථගනේ (මාස්පොත) නාගන්සෝලේ (නිකවැරටිය) ආදිය ඉන් කිහිපයකි.

සියම් මහා නිකායේ ආරණ්‍ය සේනාසන රැසක් එකතුකර, පූජ්‍ය වතුරුවිල ශ්‍රී ඥාණානන්ද මාහිමිපාණන් වහන්සේගේ නායකත්වයෙන් 1968 දී මහා විහාර වංශික ශ්‍යාමෝපාලි වනවාස නිකාය ලේඛනගත කරන ලදී. බූන්දල තෙළුල්ලේ කරඹකැලේ තපෝ වනයෙහි වැඩ සිටි අපවත් වී වදාළ පූජ්‍ය තිරාණගම රතනසාර හිමියන්ගේ සහාය ද මේ සඳහා ලැබුණි. වතුරුවිල නාහිමිපාණන් වහන්සේ මහත් කැපවීමෙන් වතුරුවිල ආරණ්‍ය සේනාසනයේ සිය බුද්ධිය මෙහෙයවා සැලසුම් කළ දෙමහල් පිරිවෙන් ගොඩනැගිල්ල වනවාස සංඝයා පුහුණු කරන මධ්‍යස්ථානයක් ලෙස පවත්වා ගෙන යන ලදී.

වන සෙනසුන්වල සැනසිල්ලේ භාවනා වඩමින් ශීල, සමාධි, ප්‍රඥා සංඛ්‍යාත නිර්වාණ මාර්ගයේ ගමන් කිරීමට වීර්ය වඩන උතුම් යෝගාවචරයින් වහන්සේලා බොහෝ වෙති. උන්වහන්සේලා අතර උත්තරීතර ආර්ය භාවයට පත් රහතන් වහන්සේලා පවා වැඩ සිටිතැයි අපි විශ්වාස කරමු. තමන් ලද උතුම් ආර්ය තත්ත්වයන් ප්‍රකාශ කිරීම උතුමන්ගේ ගුණය නොවේ. බුද්ධ කාලයේ පවා එය එසේම විය.

6

# නිස්සරණ වන තතු

## උතුම් යෝගාවචර ජීවිතය

"කම්මංවිජ්ජාච ධම්මොච - සීලං ජීවිත මුත්තමං
එතෙන මච්චා සුජ්ඣන්ති - න ගොත්තෙන ධනේනවා"
(ජේතවන සූත්‍රය, සගාථ වග්ග, සංයුත්ත නිකාය)

මාර්ග චේතනා සංඛ්‍යාත කර්මය ද, මාර්ග ප්‍රඥා සංඛ්‍යාත විද්‍යාව ද, සමාධි පාක්ෂික ධර්මය ද සිල්වත්හුගේ ජීවිතයද උතුම් වෙයි. නොහොත් විජ්ජා සංඛයාත සම්මා දිට්ඨිය, සම්මා සංකප්පය, ධර්ම සංඛ්‍යාත, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධිය, සීල සංඛ්‍යාත සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා අජීවය යන මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් මනුෂ්‍යයෝ පිරිසිදු වෙති. ගෝත්‍රයෙන් හෝ ධනයෙන් පිරිසිදු නොවෙත්.

මෙය අනාථ පිණ්ඩික දිව්‍ය පුත්‍රයා බුදු රජාණන් වහන්සේ ඉදිරිපිට කළ ප්‍රකාශයකි.

## මීතිරිගල නිස්සරණ වනය

1967 ජූලි 22 වෙනි දින ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධානාචාර්ය හා ප්‍රධාන කර්මස්ථානාචාර්ය පූජ්‍ය පණ්ඩිත මාතර ශ්‍රී ඥානාරාමාභිධාන මාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ යෝගාවචරයන් වහන්සේලා හතර නමකගේ පෙර වස් එළඹීම මීතිරිගල නිස්සරණ වනයේ ආරම්භයයි. මෙය යෝගාශ්‍රම සංස්ථාවේ වන සෙනසුන්හි මුදුන් මල්කඩ වැනිය.



නිස්සරණ වනයේ එදා හා අද තතු අතර ලොකු පරතරයක් ඇත. එදා කුටියට පිවිසි යෝගවචරයා බිත්තියට හේත්තු නොවී සංවර වීමට වගබලා ගත යුතුව තිබුණි. හේතුව බිත්තිවලට ආලේප කොට තිබූ ගුරුපාට පස් ඇගේ හෝ සිවුරේ හෝ තැවරීමයි. එදා අද මෙන් මිදුල්, පාරවල්, ජලනල සකස් වී නොතිබුණි. මිදුලට, පාරට බැස්සොත් ඇඟට ගොඩ වී ලේ උරාබොන කුඩැල්ලන් ය. කුටියේ සක්මනේ හෝ ජල කරාමය වෙළාගත් හෝ සර්පයන් ය. කොට්ට, ඇඳ ඇතිරිලිවල වේයන්ය. උන්හිටි හැටියේ කුටියේ වතුර නැතිවෙයි. රබර් නළ දෙක මූට්ටු කර තිබූ බට පුරුක මහ වන මැද ගැලවී ගොස්ය.

නමුත් මේ දැක්වූ කිසිවක් යෝගාවචරයාගේ විවේකයට බාධා වූයේ නැත. එදා තිබුණු විවේකී ශාන්ත පරිසරය යෝගාවචරයෝ බෙහෙවින් අගය කළහ.

එදා මෙන් අදත්, වනතුරු අතු පතර රැඟුම් රඟන රිලවුන් ය. වඳුරන් ය. ග්‍රීෂ්මයේදී කොළ හැලී නිරුවත් වන ගස් කොළන් වසන්තයේදී නව දළු පලසින් සැරසෙන විට ඒ සොබාදම් සුන්දරත්වය යෝගාවචර හදවත සනසන දසුනකි. නගරයේ කණට වදදෙන කටුක ශබ්ද අම්හිරිය. නමුත් මහ රෑ බකමූණෙකු නගන පාලු හඬ, රෑහැයියන්ගේ තොරතෝන්චියක් නැති කතාව, වැස්සෙන් පසු මැඬියන් කරන විවාදය භාවනාවට පළිබෝධ නොවේ. ඇත්තෙන්ම ඔවුන් කියන්නේ වැදගත් කතාවකි. මිනිසාට මහ පොළොව අයිති නැත. මිනිසා ඇතුළු සියලු සතුන් හා ශාක ජීවීන් මහපොළොවට අයිති බවයි. ඒ වන සෙනසුන් නිසා අහිංසක සත්ත්ව ජීවිත හා අපරිමිත දයාව ඇති අපූර්ව ජීවියෙක් වන ගහකොළ ද රැකේ. එය බුදු දහමේ සජීවී ලක්ෂණයකි.

## ආරම්භයේ වැඩ පිළිවෙළ

ආරම්භයේ සිට කලක්ම දානමානාදි අවශ්‍යතා ද සැපයුනේ දානපති අසෝක වීරරත්න මහතාගේ ධනව්‍යයෙන් හා සංවිධායකත්වයෙනි. එදා බොජුන් හලේදී යෝගාවචරයෙකු දක්නට ලැබෙන්නේ දවසට දෙවරකි. ගිලන්පස කුටියට ම ලැබේ.

පැරණි යෝගවචරයෝ නායක මාහිමිපාණන් වහන්සේ අනුව ම පැවතුන සංවරශීලිහු වූහ. නවකයනට ආදර්ශ සම්පන්න විය. නාහිමිපාණන් භාවනා උපදෙස් දීමට අතිරේක වශයෙන් වත පිළිවෙත බුද්ධ වන්දනාව හා වත් පිරිත් කීමද පුහුණු කළ යුතු විය. ඒ සඳහා මාහිමිපාණන් වහන්සේ ඒ ඒ පුද්ගලයන්ගේ චරිතාධ්‍යාශයට ගැලපෙන පරිදි ත්‍රිපිටකය අළලා අටුවා ටීකා සහිතව **"දෛනික දේශනා"** නමින් දේශනා පෙළක් ආරම්භ කළහ. මේ අනුව නායක හිමියන් ආධුනික යෝගාවචරයන් උදෙසා කැප වූ ජීවිතයකින් කටයුතු කළ සේක. රාත්‍රී කාලයෙහිද ඔවුන් සමඟ බුද්ධ වන්දනා කොට මෙත්ත, මංගල, රතන, ධජග්ග, බොජ්ඣඞ්ග, ධම්මචක්ක, මහා සමය ආදී පිරිත් සූත්‍ර සජ්ඣායනා කළහ. මහා සතිපට්ඨාන සූත්‍රය ද කොටස් වශයෙන් සජ්ඣායනා කළහ. දෙවියන් සතුටු කොට අමනුෂ්‍ය උවදුරුවලින් යෝගාවචරයා සහ සේනාසනය ආරක්ෂා කිරීම මෙහි එක් බලාපොරොත්තුවක් විය.

මෙබඳු වූ දෛනික කටයුතු වලින් නාහිමිපාණන්වහන්සේ දැඩි වෙහෙසට පත්විය. ගිලන් විය. රෝහල් ගත විය. දෛනික දේශනා නැවතුනි.

පසුව නේවාසික යෝගාවචර භික්ෂූන් වහන්සේ නමක් ලවා පොහොය දිනට පමණක් පැවැත් වූ දේශනය **"නිස්සරණ දේශනා"** නමින් හැඳින් විය. **"නිස්සරණ පටිපදා"** නමින් වත්මන් සේනාසනාධිපති පූජ්‍ය පානදුවේ ඛේමානන්ද හිමිපාණන් වහන්සේ අතින් ලියවුනේ මේ "නිස්සරණ දේශනා" පොත යි. එය දෙවන වරට 1992 දී මුද්‍රණය කිරීමට ගත් උත්සාහය ද ව්‍යර්ථ විය. වත්මන් නායක හිමිපාණන් වහන්සේගේ අවසරය පරිදි පූජ්‍ය උඩර්රියගම

ධම්මජීව ස්වාමීන් වහන්සේගේ මැදිහත් වීමෙන් එම පොත "අපේ පොතට" සම්බන්ධ කර මුද්‍රණය කිරීමට ලැබීම කාගේත් මහා භාග්‍යයක් බව සිතිය හැක. ඒ අනුව මෙහි එන "නිස්සරණ පටිපදා" නම් 8 පරිච්ඡේදය හා "නිස්සරණ වන ව්‍යවස්ථා යන 7 පරිච්ඡේදය ද සම්පූර්ණයෙන් එලෙසම ඉදිරිපත් කිරීමකි. පෙරවදන I හා පෙරවදන II "නිස්සරණ පටිපදා" තනි ග්‍රන්ථයක් ලෙස 1992 දී මුද්‍රණය කිරීමට බලාපොරොත්තු වූ අවස්ථාවේ ඒ සඳහා ගරු කටයුතු එම ස්වාමීන් වහන්සේලාගෙන් ලබාගත් පෙරවදන් දෙකයි. එහි නිර්මලත්වය හා සර්වකාලීන අගය නිසා පූජ්‍ය ධම්මජීව හිමියන්ගේ ද අදහස පරිදි **"සිත නිවන නිස්සරණ වන අරණ"** නම් මෙම ග්‍රන්ථයට ඇතුළත් කරන ලදී. "විසිපස් වසරක නිස්සරණ වන තතු" නම් ලිපිය අදට අසම්පූර්ණ නිසා එහි එන තොරතුරු හා තවත් තොරතුරු එක් රැස් කොට "නිස්සරණ වන තතු" සකස් කරන්ට යෙදුණි.

"පියෝච ගරු භාවනීයො - වත්තා ච වචනක්ඛමො" යනාදීන් පැවසෙන පරිදි නායක හිමියෝ කල්‍යාණ මිත්‍ර ගුණ සමුදායෙන් පිරිපුන් වූ සේක. සිත් සතන් පුබුදුවන සුළු භාවනා උපදෙස් යෝගාවචරයනට ලැබුණි.

පූජ්‍ය මීතිරිගල ධම්මාලංකාර, පූජ්‍ය මීතිරිගල ධම්මාවාස, පූජ්‍ය මීතිරිගල ධම්මනිසන්ති, ඇමරිකන් ජාතික පූජ්‍ය කෝවිද, පූජ්‍ය උඩඊරියගම ධම්මජීව, පූජ්‍ය උඩුගම්පොල ධම්මරංසි, ප්‍රංශ ජාතික පූජ්‍ය ධම්ම පාලිත යන හිමිවරුන්ගේ පැවිදිවීම එතෙක් මෙතෙක් (1992 දක්වා) නිස්සරණ වනයේ සිදු වූ විශේෂ සිද්ධීන් අතරින් කිහිපයක් ලෙස "විසිපස් වසරක නිස්සරණ වන තතු" නම් ලිපියෙහි සඳහන් වෙයි. එහි සඳහන් වන පරිදි එම කාලය තුළ සිදුවුන තවත් සිහි කටයුතු පින්කම් කිහිපයකි.

බුදු මැඳුරෙහි බුදු පිළිමවහන්සේ කරවා ධාතු නිධන්කොට නෙත් තැබීම, සීමා සම්මතය සහ පොහෝ ගෙය කරවීම, නව බෝධි රෝපනය හා ප්‍රාකාරය කරවීම ඉන් කිහිපයකි. නව බොජුන් හල කරවීමත්, මහෝපාධ්‍යායාය හිමියන් උදෙසා විශේෂ පහසුකම් සහිත කුටියක් සෑදීමත් විසිපස් වසරක කටයුතුවල සුවිශේෂ තැනක් හිමිකර ගනී. එසේම අද නිස්සරණ වනයේ යෝගාවචර භික්ෂූන් උදෙසා කුටි 25 ක් පමණ ඉදි වී තිබේ.

විසිපස් වසරක නිස්සරණ වන තතු හෙළිකරන පූජ්‍ය පානදුව ඛේමානන්ද හිමියන්ගේ ලිපියෙහි එන සුවිශේෂ තොරතුරකි, එනම් ඉකුත් විසිපස් වසරක මුළු කාලය තුළම එකම කුටියේ වැඩ වාසය කරමින් භාවනා කළ යෝගාවචර උතුමෙකු සිටි බවයි.

## නිස්සරණ වනය පිළිබඳ අපේ දැක්ම

නිස්සරණ වනයෙදි හැම උදයකම නෙත ගැටෙන සිත පහදින කදිම දසුනකි, ආසන ශාලාවේ සිට සිවුරු ගැටවටු ගන්වා, පාත්‍රය අතැතිව සඟ මහලු පිළිවෙලින් සන්සුන් ඉඳුරන් ඇතිව පඩි පෙළ බසිමින් පිණ්ඩපාත ශාලාවට වැඩම කරන මහ සඟ රුවනේ දසුනයි ඒ.

මජ්ඣිම නිකායේ චූලගෝසිංහ සූත්‍රයේ සඳහන් වන ධර්ම ප්‍රවෘත්තියකි, බුදුරජාණන් වහන්සේ ගෝසිංහ සල් වනයට වැඩම කරති. එහි වැඩ සිටි අනුරුද්ධ හිමියන් අමතා සැප විහරණ ගැන විමසති. සුව දුක් අසති. අනුරුද්ධ මහ තෙරුන් දෙන පිළිතුර කෙතරම් කදිමද?

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, අපි සමඟි සම්පන්නව වසමු. සතුටු සිත් ඇතිව වාද - විවාද නැතිව වසමු. කිරි හා දිය මෙන් පැහී එකිනෙකා දෙස ප්‍රිය ඇසින් බලමින් වාසය කරමු.

"ස්වාමිනි, බුදුරජාණන් වහන්ස, මම එක්ව වසන මේ සබ්‍රහමචාරීන්හට ඇති තැන මෙන්ම නැති තැන ද කයින් මෙත් වඩ. වදනින් ද සිතින් ද මෙත් වඩමි. මම මගේ සිත අනුව නොව මේ හිමිවරුන්ගේ සිතින් වසමි"

නිස්සරණ වනයේ වැඩ වසන අපේ හිමිවරුන් ද මෙසේ වනැයි අපට සිතේ.

අනේපිඬු සිටුතුමාගේ දියණියක වූ චූලසුභද්‍රාව විසින් ඇයගේ මයිලනුවන් ඉදිරියේ බුද්ධශ්‍රාවක ගුණ වර්ණනා කර ඇති ආකාරයෙන් නියම සිල්වත් භික්ෂුවක් තුළ තිබිය යුතු ලක්ෂණ, ස්වභාව කෙබඳු දැයි පැහැදිලි වෙයි. ඒ මෙසේය.

1. **"සන්ත්‍රින්ද්‍රියා සන්තමානසා - සන්තං තෙසං ගතං ඨිතං**
   **ඔක්ඛිත්ත චක්ඛු මිත භාණී - තාදිසා සමණා මම"**

මාගේ බුද්ධ පුත්‍රයන් වහන්සේලා සන්සුන් ඉඳුරන් ඇත්තාහුය. කෙළෙස් සිත් නැති හෙයින් සන්සුන් සිත් ඇත්තෝය. උන්වහන්සේලා වඩින විටත් සිටින විටත් සන්සුන් ය. යටට හෙලන ලද ඇස් ඇත්තාහුය. දහම් කතාවක් ම කරන හෙයින් පමණට කතා කරන්නාහුය. මගේ ශ්‍රමණයන් වහන්සේලා එබඳුය.

2. **"කාය කම්මං සුචිතෙසං - වාචා කම්මං අනාවිලං**
   **මනො කම්මං සුවිසුද්ධං - තාදිසා සමණා මම"**

මාගේ ශ්‍රමණයන් වහන්සේලාගේ කාය කර්ම පිරිසිදුය. වාග් කර්ම පිරිසිදුය. මනෝ කර්ම පිරිසිදුය. එබඳුය, මාගේ ශ්‍රමණයන් වහන්සේලා.

3. **"විමලා සංඛ මුත්තා භා - සුද්ධා අන්තර බාහිරා**
   **පුණ්ණා සුද්ධෙහි ධම්මෙහි - තාදිසා සමණා මම"**

මාගේ ශ්‍රමණයන් වහන්සේලා ඇතුලතිනුත් පිටතිනුත් සක් සේ මුතු සේ ඉතා නිර්මලය. රුවන් පුරාලූ කරඬුව මෙන් පිරිසිදු වූ ගුණ ධර්මයන්ගෙන් පිරී සිටිනාහ. මාගේ ශ්‍රමණයන් වහන්සේලා එබඳුය.

4. **"ලාභෙන උන්නතොලොකෝ - අලාභෙනච ඔනතො**
   **ලාභා ලාභෙන එකට්ඨා - තාදිසා සමණා මම"**

ලෝ වැසියා ලාභය නිසා උඩඟු වේ. අලාභය නිසා බැගෑපත් වේ. මාගේ ශ්‍රමණයන් වහන්සේලා ලාභ අලාභ දෙක්හිම තරාදියක් මෙන් සමව සිටින්නාහු ය.

මේ අයුරින් සිල්වත් භික්ෂූන් වහන්සේ යස-අයස, ප්‍රශංසාව-නින්දාව, සැප-දුක යන කරුණු වලදීද සම අදහස් ඇතිව වසන්නාහු ය.
**(ධම්ම පදට්ඨ කථා - චූල සුභද්දාය වත්ථු) පිට 559**

අපවත් වී වදාළ මාහිමිපාණන් වහන්සේ අප දුටුවේ එලෙසමය. රහතන් වහන්සේ නමක් මෙබඳු විය හැකියයි අපට සිතුනු වාර අනන්තය. බොහෝ කලක් තිස්සේ උන්වහන්සේ දකින්ට අපේ නෙත් පින් කළ සේය. අපේ සවන්පත් ඒ අරුත්බර මිහිරි දම් දෙසුම් වලින් පිනා ගියේය. උන්වහන්සේගේ සිරිපා මුල වැටී වැතිරී දොහොත් නගා පසඟ පිහිටුවා වඳින්ට තරම් අපට පෙර පින් තිබුණි.

ධර්ම පුත්‍රයන් මිස බුද්ධ පුත්‍රයන් දුලබ මෙකල නිස්සරණ වනයේදී අපි ආර්ය වූ බුද්ධ පුත්‍රයන් වහන්සේලා දකින්නෙමු. වඳින්නෙමු. දන්පැන්, බෙහෙත්, සිවුරු පිරිකර, සේනාසන උපකරණ ඈ සිව් පසයෙන් පුදන්නෙමු.

කසළ ගොඩක වර්ණවත් සුවඳ මල් හටගත හැකිය. කසළ ගොඩක් වන් පුහුදුන් ලෝකයේ බිහිවන බුදු පුත්තු ප්‍රඥාවෙන් බබලති. නිස්සරණ වනයේදී උතුම් බුදු පුතුන් දැකීම පූජ්‍ය ධම්ම නිසන්ති හිමියන්ගේ උතුම් පැතුම විය. අපේ පැතුම ද එයමැයි. ඒ අදට පමණක් නොව උදා නොවුන හෙටටත් එසේමැයි.

## විදේශීය ස්වාමීන් වහන්සේලා - ඇමෙරිකන් කෝවිද හිමි

සසුන් පිළිවෙත් මගෙහි තැබූ පිය සටහන් පෙළෙහි ආදර්ශවත් බව, විසිතුරු බව නිසා සාධු චරිතාපදානයක් වූ කෝවිද හිමි චරිතය ලෝකයට දිරියකි. පූජ්‍ය මාතර ශ්‍රී ඥානාරාම මාහිමියන්ගේ සහ පූජ්‍ය කඩවැද්දුව ශ්‍රී ජිනවංශ මාහිමියන්ගේ ද ප්‍රථම **විදේශීය ශිෂ්‍ය රත්නය** වූයේ ඇමරිකන් ජාතික පූජ්‍ය කෝවිද ස්වාමීන් වහන්සේය.

ඇමරිකාවේ ලුසියානා ජනපදයේ 1958 මැයි 11 දින උපන් ක්‍රේග් ෆැන්ට් 1979 අගෝස්තු 25 වෙනිදා "කෝවිද" (දක්ෂ) නමින් පැවිදි ලාභය ලැබීය. 1980 නොවැම්බර් 26 වෙනි දින නිස්සරණ වනයේ බද්ධ සීමා මාලකයේදී සිදු කෙරුණු උපසම්පදා පින්කම කෝවිද හිමියන් උදෙසාම සිදුවූවකි. විරාගත සම්ප්‍රදායෙන් ඉවත්ව පැවැත්වුන උපසම්පදාවක් ලෙස "පළමුවන හා අවසාන අවස්ථාව" ද මෙය බව අති පූජ්‍ය ජිනවංශ හිමිපාණෝ පැවසූහ. උන්වහන්සේගේ යෝගාවචර දිවි පැවැත්ම පැරණි හෙලදිව යෝගාවචර ස්වාමීන් වහන්සේලාත්, අල්පේච්ඡ ප්‍රතිපදාව මහා කාශ්‍යප චරිතය, අරියවංශ ප්‍රතිපදාව සිහිපත් කරවන, දිරියෙන් පන ගන්වාගත් අති දුෂ්කර වූවක් විය.

කලක සිට පැවති පෙනහලු ආබාධය නිසා වයස 30 වීමටත් පෙර 1987 ඔක්තෝම්බර් 21 වෙනිදා ලග්ගල හෙට්ටිපොල රජයේ රෝහලේදී මනා සිහි නුවණින් යුතුව උන්වහන්සේ අවසන් හුස්ම හෙලූහ. උන්වහන්සේගේ අධ්‍යාත්ම සෘද්ධියක් බඳු පුණ්‍ය ජීවිතය ගැන යමක් තෙරුම් ගැනීමට මෙය සටහන් කරමි.

"අපවත් වීමෙන් පසු දින, කෝවිද හිමියන් අවසන් වරට වැඩ විසූ ඊරියගස්උල්පොත කුටිය බැලීමට එහි වැඩමකළ ස්වාමීන් වහන්සේලා දෙනමකට, නිසල ශාන්ත ආරණ්‍ය පරිසරයක පිහිටි, මැටි බිත්ති තුනකින් හා පැළලි දෙකකින් ආවරණය වූ, තවමත් තපෝ ගුණ උණුසුම නොනිවුනු යෝගී කුටිය දක්නට ලැබුණි. එහි එක් පසෙක සුදු හිමියන්ගේ බඹයකුත් දෑඟුලක් දිගු කෙසඟ සිරුර හරහට සැතැප්ප වූ කෙටි ඇඳ විය. පසෙක වැඩ දෙකක් තනිව පිරිමැසූ චාම් "මේස - පුටුව" විය. බිත්තියෙහි නිතර දෙනෙත් ගැටෙන තැනක එල්වා තිබුණු ආදර්ශ පාඨයක් ද විය.

"ඛණො වෙ මා උපච්චගා"
"ඛණාතීතා හි සොචන්ති"
"උතුම් මොහොත ඉක්මා යා නොදෙවූ"
"උතුම් මොහොත ඉක්මවූවාහු ශෝක කෙරෙත් මැයි"

. . . . . තෙරුවන් එකම ධනය කොටගෙනැ, වල් බිහි වූ පිළිවෙත් මග හෙළි කරනු වස් වල් වැදී, රුදුරු වන සතුන් මැද මෙත් ගුණෙන් සිත් සනහාගෙන, පිඬු සිඟා ලද කටුක ආහාර ලොවුතුරු මිහිරකින් හනා වළඳමින්, පවිවේක රස, උපසම රස, දහම් පීති රස - පී - කෙලෙස් ගිම් නිවාගෙන, අගමුල් නොපෙනෙන සසරෙකු කෙළවරක් දකින රිසින් දිවා - රෑ නොබලා, දිවි නොතකා වෙර දරා, මහණ දම් පුරා සසුන් කෙතු සිල් මල් පුබුදුවා, දැහැත් විදසුන් පලින් සරු කොට, සිහිසන් ඇතිව අවසන් හුස්ම හෙලා, "**වීරෝදාර යෝගාවචර චරිතාපදායක් ඉතිරි** කළ . . . . ."

## "පින් රුකක මහිම - මීතිරිගල නිස්සරණ වනය"

පූජ්‍ය ග්‍රීසියේ ඤාණදස්සන ස්වාමීන් වහන්සේ ද තවත් විදේශීය ශිෂ්‍ය රත්නයක් විය. එබඳු විදේශ වලින් පැමිණ පැවිදිව මීතිරිගල නිස්සරණ වනයේ වැඩ සිටි සුදු ස්වාමීන් වහන්සේලා කිහිප නමක් ම වූහ. ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය වැනි රටවල් මෙහිදී විශේෂ විය. නම් සඳහන් නොකළද මුහුදෙන් එතෙර සිට පැමිණ අපට මහා සම්පත් වූ ඒ හැමදෙනා වහන්සේ ඉමහත් ගෞරවයෙන් සිහිපත් කරමු.

## නාඳුනන තරුණයා පෙන් වූ දොළ

මීතිරිගල මහ වනය තම සිතැඟි ඉටුකරගත හැකි පරිදි යෝගාවචර කෙම් බිමක් කිරීමට අසෝක වීරරත්න මහතා හැම දෙයක් ගැනම දැඩි සේ විමසිලිමත් විය. මහ වනය සෝදිසි කරමින් යන මෙතුමාට තවමත් මහ වනය මැදින් ගලා බස්නා ඇළ දොළ ගංගා කිසිවක් ඇස ගැසී නොතිබුණි. දිනක් ඒ ගැනම කල්පනාකාරීව යන මෙතුමාට හදිසියෙන්ම මහ වනය මැදින් තමාට ඉදිරියෙන් එන කඩවසම් තරුණයෙකු දකින්ට ලැබුණි. වීරරත්න මහතා තම අරමුණ තරුණයාට පැවසීය. ඔහු තමා සමග එන්නැයි සංඥා කොට ඉදිරියෙන් ගමන් කළේය. ටික දුරක් ගොස් ඔහු පෙන්වූයේ කදිම පිරිසිදු ජලය පිරී ඉතිරී ගලා යන දොළ පාරකි. මහත් සතුටින් ඉපිලී ගිය අසෝක වීරරත්න මැතිතුමා දොළ පාරට වඩාත් ළං වීමට ඉදිරියට ගමන් කළේය. දොළ පාර අසලට ම ගිය එතුමා තමාට මේ උපකාරය කළ නාඳුනන තරුණයාට කෘතවේදිත්වය දැක්වීමට, ප්‍රශංසා කිරීමට සිතා ආපසු හැරී බැලුවේය. නමුත් ඔහු පෙනෙන මානයකවත් නොවීය. මේ අසිරිමත් සිදුවීම තමාගේ උතුම් ප්‍රාර්ථනාව ඉෂ්ඨ කර දීමට ඉදිරිපත් වූ ඉෂ්ට දේවතා ආකර්ෂණ බලවේගයක් ලෙස එතුමාට පසුව තේරුම් ගත හැකි විය.

මේ දොළ ඇසුරින් සකස් වූ ජලනල පද්ධතිය යෝගාවචරයින් වහන්සේලාගේ පරිභෝජනීය සියලු ජල අවශ්‍යතා සපුරාලයි.

## මිස්ටි ආතා ඔරුව කර පිටින් ගෙනා හැටි

මීතිරිගල නිස්සරණ වන අතීත කතාවේ වැදගත් තැනක් මිස්ටි ආතාට හිමි වෙයි. හෙතෙම මීතිරිගල ගමේ වැඩිහිටියෙකි. නිස්සරණ සෙනසුන ඇති වීමෙන් පසු ජීවිතයේ සන්ධ්‍යාභාගය ඔහු වැඩියෙන් ගත කළේ සෙනසුනේ කටයුතු වෙනුවෙනි.

දැන් වෙල් යාය මැදින් වැටී ඇති මහ පාර එදා නොතිබුණි. නිස්සරණ වන සීමාවේ වෙල් යාය එදා වැහි කාලයට සම්පූර්ණයෙන් ජලයෙන් යට වෙයි. එවිට සෙනසුන හා දාන දායකාදී පිරිස් සියලු සම්බන්ධකම් පවත්වන්නේ ඔරු පාරුවල පිහිටෙනි. මේ නිසා අත්‍යවශ්‍ය "වාහනයක්" ලෙස එදා නිස්සරණ වනය සතුව ඔරුවක් තිබුණි.එක් අවස්ථාවක කිසියම් පිරිසක් මේ ඔරුව සොරකම් කරගෙන ගොස් තිබුණි. සෙනසුනේ හැම දෙයක් ගැනම ඕනකමින් සොයා බලා කටයුතු කරන මිස්ටි ආතාට මෙය දැනගත් විට ඇති වූයේ බලවත් සිත් වේදනාවකි. කෙසේ හෝ ඔරුව සොයාගන එමි යි ඔහු තරයේ අධිෂ්ඨාන කරගති.

ඔහුට ඔරුව හමු විය. මේ පහත් වැඩය කර තිබුණේ ඈත ගමක කීපදෙනෙකි. ඔරුවට යම් හානි කර තිබුණත් ඔහුට පහසුවෙන් ඔරුව හඳුනාගත හැකි විය. මුදල් දී ඔරුව ආපසු ලබා ගැනීමට ඔහු සමත් විය.

ඔහුගේ සතුට නිම්හිම් නැත. මිස්ටි ආතා තවත් කීප දෙනෙකු සමඟ ඔරුව නිස්සරණ වනයට ගෙනාවේ කරපිටින් "වඩමවා" ගෙනයි. නිකම්ම නොවේ. බොහොම ගරු සරු ඇතිවය. හේවිසි, හොරණෑ ආදිය සහිත මහ පෙරහැරකින් සාදුකාර මැද ඔරුව ආපසු නිස්සරණ වනයට පැමිණියේය. එදා මීතිරිගල ගම් වාසීන් නිස්සරණ වන සෙනසුනට ආදරය කළේය. ගරු කළේය.

මේ අතීත තොරතුරු ඉදිරිපත් කළේ පූජ්‍ය මීතිරිගල ධම්මචාරී හිමියන් ය. උන්වහන්සේ පවසන පරිදි මිස්ටි ආතාගේ පුතා වූ පොඩිනෝරිස් උපාසක මහතා මහෝපාධ්‍යායාය මාහිමියන්ට අවුරුදු විසි පහක් ම අපවත් වනතුරුම උපස්ථාන කළේය.

අතීතයේ නිස්සරණ වනයේ කැපකරු දායකයෙකු ලෙස මහත් සේවයක් කළ හපුවලාන උපාසක මහතා ද හැමදෙනාගේ ම ගෞරවාදරයට පාත්‍ර වූ උතුමෙකි.

වත්මන් සම්බුදු සසුන එළිය කරන මිණි පහනක් වන් මීතිරිගල නිස්සරණ වනයේ අභිවෘද්ධිය වෙනුවෙන් එදා මෙදා තුර යම් සේවයක් කළ ගිහි පැවිදි උතුමෝ වෙත්ද, ඒ හැමට මේ ලිපිය පූජෝපහාරයක් වේවා!

7

# නිස්සරණ වන ව්‍යවස්ථා

**නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

"නයිදං භික්ඛවෙ බ්‍රහ්මචරියං වුස්සති ජනකුහනත්ථං, න ජනලපනත්ථං, න ලාභසක්කාරසිලොකානිසංසත්ථං, න ඉතිවාදප්පමොකඛානිසංසත්ථං, න ඉති මං ජනො ජානාතුති. අථ ඛො ඉදං භික්ඛවෙ බ්‍රහ්මචරියං වුස්සති සංවරත්ථං, පහාන්ත්ථං, විරාගත්ථං, නිරොධත්ථන්ති"

බ්‍රහ්මචරිය සූත්‍රය, චතුක්ක නිපාතය (උරුවෙල වර්ගය) අඞ්ගුත්තර නිකාය.

"මහණෙනි, මේ සාසන බ්‍රහ්මචර්යාව ජනයා පුදුමයට පත් කිරීම පිණිස නොවේ. ජනයා නැලවීම පිණිස, ලාභ - සත්කාර කීර්ති පිණිස නොවේ. වාද විවාදයන්ගෙන් මිදීම පිණිස නොවේ. මා මෙබන්දෙකැයි දනෝ දනිත්වා" යි ඉටාගෙන නොවේ. මහණෙනි, මේ සසුන් බඹසර වසනුයේ හුදෙක් සංවරය පිණිසමය. කෙළෙස් නැසීම පිණිසම ය. විරාගය පිණිසමය. නිරෝධය පිණිසම ය."

**මූලික පරමාර්ථ**

මීතිරිගල නිස්සරණ වන සෙනසුන හුදු නිස්සරණාධ්‍යාශයෙන් යුතුව ජීවිත පරිත්‍යාගයෙන් එම අදහස මුදුන් පමුණුවා ගැනීමට උත්සාහවත් වන යෝගාවචරයන් සඳහා විශේෂයෙන් වෙන් වූ විවේක සේනාසනයකි.

**මූලික ව්‍යවස්ථා**

1. භාවනා කර්මයට බාධාවන අන්දමේ ගිහි පැවිදි සබඳකම් වලින් හා අනිකුත් පළිබෝධ කරුණු වලින් ආරක්ෂාව පතන යෝගාවචරයන්හට එම ආරක්ෂාව හැම කල්හිම සැළසෙන අයුරින් මෙම අරණ්‍ය සේනාසනයේ ව්‍යවස්ථා සකස් විය යුතුය. එකී ව්‍යවස්ථා කලින් කළ ලිහිල් වන ලකුණු පෙනුනහොත් වහා රැස් වී සාකච්ඡා කොට නිසි පිළියම් යෙදිය යුතුය. **ආරණ්‍යය පරිසරයෙන් යෝගාවචරයාත්, යෝගාවචරයාගෙන් ආරණ්‍ය පරිසරයත් ආරක්ෂා විය යුතුය.**

2. සසුන් පිළිවෙත් පිරීමට උපකාරී වන පමණින් ධර්ම - විනය හැදැරීමට යම් යම් පහසුකම් මෙහි සැළසිය හැකි වෙතත්, මෙම ආරණ්‍ය අධ්‍යාපන ආයතනයක් බවට පෙරළීමට ඉඩ නොතැබිය යුතුය. අතීතයේ ඇතැම් ආරණ්‍යය සේනාසනයන්ට සිදු වූවාක් මෙන් ප්‍රතිපත්තිය පසුබා පර්යාප්තිය ඉස්මතු වීමේ පෙර නිමිති පහළ වෙතොත් වහා රැස් වී සාකච්ඡා කොට මූලික පරමාර්ථය යළි තහවුරු කරගත යුතුය.

3. මෙම සෙනසුනෙහි ප්‍රධානත්වය උසුලන කම්මට්ඨානාචාර්යයන් වහන්සේ භාවනා ප්‍රතිපත්තිය පිළිබඳව නිරවුල් අවබෝධයක් ඇති වූත්, යෝගාවචරයන්ගේ අදහස් තේරුම් ගැනීමේ හැකියාවක් ඇතිවූත් කෙනෙකුන් විය යුතුය. දිනකට දෙතුන් වරක් හෝ භාවනාවට හිඳගන්නා යෝග කර්මයෙහි සතතයෙන් යෙදෙන කෙනෙකුන් විය යුතුය.

එසේම,

"පියො ච ගරු භාවනියො
වත්තාච වචනක්ඛමො
ගම්භීරඤ්ච කථං කත්තා
නොචට්ඨානෙ නියොජයෙ"

යනුවෙන් දක්වන ලද කල්‍යාණ මිත්‍ර ගුණයන්ගෙන් සම්පූර්ණ වූවෙකු මෙන්ම මෙත්ත සූත්‍රයෙහි සඳහන් ගුණ ක්‍රියාවේ යොදවන්නෙකු ද විය යුතුය. තවද, උන්වහන්සේ මෙම සෙනසුනෙහි නිත්‍යවාසීව වැඩ විසිය යුතුය.

4. මෙහි යෝගාවචර ජීවිතයක් ගත කරන අදහස ඇතිව පැමිණෙන ප්‍රව්‍රජ්‍යාපේක්ෂක ගිහි පුද්ගලයන් මෙන්ම, ශ්‍රී කල්‍යානී යෝගාශ්‍රම සංස්ථාවෙන් බැහැර විහාර සේනාසනාදියකින් පැමිණෙන සංඝයා වහන්සේලා ද මෙම සෙනසුනට භාර ගැනීමට පෙර මනා පරීක්ෂණයක් කළ යුතුය. ඔවුන් මතු දැක්වෙන II (අ) ඡේදය යටතෙහි පිහිටුවනු ලබන "සංරක්ෂක සංඝ සභාව" මඟින් මැනවැයි සම්මත කරනු ලබන කිසියම් සේනාසනයකට යවා පුහුණුව හා පුද්ගල තත්ත්වය පිළිබඳ නිරීක්ෂණ කාල සීමාවකින් පසුව මෙම සෙනසුනට භාරගත යුතුය. එමෙන්ම අධ්‍යාපනික සුදුසුකම් ලබා ගැනීම පිණිස, අවශ්‍ය වෙතොත් ඇතැම් පැවිදි උපසම්පදා අපේක්ෂකයන් යෝගාශ්‍රමීය මධ්‍යස්ථානයට යැවිය හැකිය. යෝගාවචර සුදුසුකම් මැනීමේදී "පධානියංග" පහ පිළිබඳව විශේෂයෙන්, සලකා බැලිය යුතුය.

5. කර්මස්ථානාචාර්යයාණන් වහන්සේගේ ආරක්ෂාව යටතෙහි කිසියම් කමටහනක් පුරුදු කිරීමෙහි විශේෂ හැකියාවක් දක්වන ඇතැම් යොගාවචර කෙනෙකුන්ට, පර්යාප්තිය පිළිබඳ අවශ්‍යතාවන් සම්පූර්ණ කර ගැනීම සම්බන්ධයෙන් යම් යම් සහන අවස්ථානුකූලව කරුණාධ්‍යාසයෙන් සැලසිය යුතුය.

6. පැහැදිලි අවබෝධයකින් යුතුව, පරමාර්ථයට අදාල වන පරිදි වත් - පිළිවෙත් පිරිය යුතු වන අතර, එමගින් "කම්මාරාමතා භස්සාරාමතා, සංඝණිකාරාමතා" වැනි බාධක කරුණු ළංකර නොගැනීමට පරීක්ෂාකාරී විය යුතුය.

7. යෝග කර්මයට බාධා පැමිණෙන අන්දමින් වස් පින්කම් ආදී කිසිදු පින්කමක් මෙහි නොපැවැත් විය යුතුය. මහජනයා සමඟ කටයුතු කිරීම නිතරම "මුක්ත" අදහසට අනුව විය යුතුවාක් මෙන්ම ගිහි පින්වතුන්ට සෙනසුන තුළ නිදැල්ලේ ගැවසීමට අවකාශ නොලැබෙන පරිදි පාලනය විය යුතුය. භාවනාව පිළිබඳව සාකච්ඡා කිරීම වැනි විශේෂ අවශ්‍යතාවක් නොමැතිව සෙනසුනට ඇතුල්වීමට ගිහි පින්වතුන්ට අවසර නොදිය යුතුය. ආගන්තුකව පැමිණෙන සංඝයා වහන්සේලාට පවා සෙනසුනට ඇතුල්වීමට අවසර දිය යුත්තේ කරුණු විමසා බලා අවශ්‍යම කරුණක් ඇතොත් පමණි.

(1981 ඔක්තෝම්බර් මස 18 වෙනි දින සම්මත කරන ලද මීතිරිගල නිස්සරණ වන සෙනසුනෙහි පරමාර්ථ හා ප්‍රතිපත්ති පිළිබඳ මූලික ව්‍යවස්ථා මාලාවෙන් උපුටා ගන්නා ලදී.)

# 8

# නිස්සරණ පටිපදා

"නිස්සරණ පටිපදා" යන මේ වචන දෙක නිසි පරිදි විස්තර කරත හොත් සම්පූර්ණ බුද්ධ දේශනාවම - සුවාසූ දහසක් ධර්ම ස්කන්ධයම - විස්තර කළ යුතු වෙයි. "නිස්සරණ" යන වචනයට දිය හැකි ඉතාම කෙටි තේරුම නම් **"සසරින් නික්ම යාම" "සසරින් නිදහස් වීම"**, "සසරින් ගැලවීම", "නිවන් දැකීම" යනුයි. නිස්සරණ පටිපදා යන්නෙහි තේරුම "සසරින් ගැලවීමේ ක්‍රියා මාර්ගය", "නිවන් දැකීමේ වැඩ පිළිවෙල" "ධර්මානුධර්ම ප්‍රතිපත්තිය" "බුද්ධ ශාසනයෙහි යෙදීම" යනුවෙන් දැක්විය හැක.

සතිපට්ඨාන සතර, සම්මප්පධාන සතර, ඉද්ධිපාද සතර, ඉන්ද්‍රිය ධර්ම පහ, බල ධර්ම පහ, බොජ්ඣංග ධර්ම සත, ආර්ය අෂ්ටාංගික මාර්ගය යන මේ **සත් තිස් බෝධිපක්ෂික ධර්මයන් වැඩීම නිස්සරණ පටිපදාවයි.**

"තයො ඉමස්මිං ධම්ම විනයෙ
අප්පමතෙතා විහෙස්සති
පහාය ජාති සංසාරං
දුක්ඛස්සන්තං කරිස්සති"
- **අරුණවතී සූත්‍රය"**
සගාථක වර්ගය, සංයුක්ත නිකාය

"යමෙක් වනාහි මේ බුද්ධ ශාසනයෙහි අප්‍රමාදව යෙදී වාසය කරන්නේ ද, හෙතෙම ජාති ජාතීන්හි ඉපදීම යයි කියනු ලබන සසර සැරි සැරීම අතහැර දුක කෙළවර කරන්නේය"

## ඔබේ යුතුකම

මුලින් දක්වන ලද නමස්කාර ගාථාවේ පටන් මේ දක්වා කියවුණු කරුණු ගැන නැවත නැවත සිතා බැලීම ඔබේ යුතුකමය. එසේ සිතා බැලීමේදී ඔබ විසින් කළ යුතු උසස්ම යුතුකම කුමක්දැයි තේරුම්ගත හැකිවෙයි. මිනිස් ජීවිතය ගෙවී යන්නේ එකිනෙකට සම්බන්ධ වූ යුතුකම් මාලාවක එතීගෙනය. ධනය සැපයීම, ආරක්ෂා කිරීම, ආවාහ විවාහ වීම, අඹුදරු පෝෂණය, දේශපාලනය, ජීවිකරක්ෂාවන්හි යෙදීම, දුප්පතුන්ට සංග්‍රහ කිරීම, රෝගීන්ට උපස්ථාන කිරීම, මව් පියන්ට උපස්ථාන කිරීම යනාදී නා නා ප්‍රකාර ක්‍රියාවෝ ඊට අයත් වන්නාහ.

මේ යුතුකම් අතර තමාට හිත වැඩ පිණිස පවත්නා යුතුකම් ද ඇත. අහිත පිණිස දුක් පිණිස පවත්නා යුතුකම් ද ඇත. තමාගේ දුක වැඩෙන යුතුකම් කොටස අයින් කොට, දුක නැසෙන යුතුකම් පමණක් කිරීමට සිතට ගැනීම ඔබේ යුතුකමය. ලෞකික ආශාවන්ගෙන් තොර නොවූ සියලුම යුතුකම් භවෝත්පත්තියට හේතුවන උපාදානයන්ගෙන් යුක්තය. තමාගේ

දුක අන්තයටම නැති කළ හැකි එකම යුතුකම බුද්ධ ශාසනය රැකීම බව ඔබට තේරුම් යා යුතුය.

සම්බුද්ධ ශාසනය විනාශවීමට, අතුරුදහන් වීමට හේතුවන කරුණු පහක් බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රකාශකොට ඇත.

"න ඛො භූන කස්සප පඨවිධාතු සද්ධම්මං අන්තරධාපෙති න ආපොධාතු සද්ධම්මං අන්තරධාපෙති, න තෙජොධාතු සද්ධම්මං අන්තරධාපෙති, න වායොධාතු සද්ධම්මං අන්තරධාපෙති අථ ඛො ඉධෙව තෙ උප්පජ්ජන්ති මොඝපුරිසා යෙ ඉමං සද්ධම්මං අන්තරධාපෙන්ති.

පඤ්ච ඛො කස්සප ඔක්කමනියා ධම්මා සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තන්ති, කතමෙ පඤ්ච, ඉධ කස්සප භික්ඛු භික්ඛුනියො උපාසක උපාසිකායො සත්ථරි අගාරවා විහරන්ති අප්පතිස්සා ධම්මෙ අගාරවා විහරන්ති. අප්පතිස්සා සංඝෙ අගාරවා විහරන්ති. අප්පතිස්සා සික්ඛාය අගාරවා විහරන්ති, අප්පතිස්සා සමාධිස්සමිං අගාරවා විහරන්ති, අප්පතිස්සා ඉමෙ ඛො කස්සප පඤ්ච ඔක්ක මනියා ධම්මා සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තන්ති"

**කස්සප සංයුක්තය - නිදාන වග්ගය**
**සංයුක්ත නිකාය (බු. ජ. ත්‍රි. 14, 340 පිට)**

"කාශ්‍යපය, සද්ධර්මය සංඛ්‍යාත බුද්ධ ශාසනය නැතිකරන්නේ පඨවි ධාතුව නොවේ. ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතුන් නොවේ. බුදු සසුන වනසන මේ මෝඝ පුරිස නම් වූ හිස් පුරුෂයෝ මේ ශාසනයෙහිම ඇතිවන්නාහ.

කාශ්‍යපය, බුදු සසුන වැනසීමට අතුරුදහන් වීමට බැස ගන්නා කරුණු පසෙක් ඇත. ඒ පස කවරහුද? කාශ්‍යපය, මේ සස්නෙහි භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකාවන් ශාස්තෘන් වහන්සේ කෙරෙහි ආදර ගෞරව නැතිව යටහත් පැවතුම් නැතිව වසන්නාහුද, ධර්මය කෙරෙහි සංඝයා කෙරෙහි, ශික්ෂාව කෙරෙහි, විදර්ශනා සමාධිය කෙරෙහි ආදර ගෞරව නැතිව, යටහත් පැවතුම් නැතිව වසන්නාහු ද කාශ්‍යපය බුදු සසුන වැනසීමට අතුරුදහන් වීමට බැස ගන්නා කරුණු පස මේවාය" යනු මේ සම්බුද්ධ දේශනාවේ තේරුමයි.

පින්වත් සත්පුරුෂය, ඔබට දේවත්වය, බ්‍රහමත්වය, ශක්‍රත්වය, මනුෂ්‍යත්වය, චක්‍රවර්ති රාජත්වය, ශ්‍රාවක බෝධිය, අග්‍රශ්‍රාවක බෝධිය, පසේ බුදුබව, ලොවුතුරා බුදු බව යන සියලු ලෞකික ලෝකෝත්තර සම්පත් පහළ කරදෙන **සිතුමිණි රුවනක් බඳු වූ බුද්ධ ශාසනය රැක ගැනීම ඔබේ යුතුකමය.**

බුදු සසුන වනසන්නෝ කවරහුද යන බව ඉහතින් දක්වන ලදී. නැවත නැවතත් සිතන්න. තමා හා සම්බන්ධ කර සිතන්න. එවිට තමාගේ යුතුකම නිසි පරිදි ඉටුවේද නොවේද යනු දැනෙනවා ඇත.

ඔබ බුද්ධ ශාසනය නොරකින්නෙහි නම් ඔබට දුකේ කෙළවරක් දැකගත නොහැකිය. එහෙයින් අප්‍රමාදව බුද්ධ ශාසනය රැක ගැනීම ඔබේ යුතුකමයි.

ඔබට මේ සඳහා ලොකු වියදමක් දරන්නට සිදු නොවෙයි. බුද්ධ ශාසනය යනු සීල, සමාධි, පඤ්ඤා යන ත්‍රිවිධාකාර ගුණස්කන්ධය බව ඔබ දන්නෙහිය. බුද්ධ ශාසනය රැකීම යනු ඒ ත්‍රිශික්ෂාවන් පිරීම බවත් ඔබ විසින් දත යුතුය. ඉහත දැක්වූ සතර සතිපට්ඨාන ධර්මයන්

වැඩීමය, ත්‍රිශික්ෂා පිරීමය, නිස්සරණ පටිපදාවය, යන මේ සියල්ලම ඔබට නිවන් ළඟාකර දෙන්නා වූ, අද්‍රව්‍ය වූ ඔබ සන්තානයෙහිම දියුණුවට පත්කරගත යුතු වූ ධර්මයෝය.

සෝවාන් ආදී අර්ය මාර්ග සතරය, ආර්ය ඵල සතරය, නිර්වාණ ධාතුවය යන ලෝකෝත්තර ධර්ම නවය බුද්ධ ශාසනයෙන් ලැබිය යුතු, ලැබිය හැකි උසස්ම තත්ත්වයෝය.

එහි ඵලය නම් සත්ත්වයා සතර අපායටත්, සංසාර දුක්ඛයටත් වැටෙන්ට නොදී ආරක්ෂා කොට ජරා මරණාදි දුක්ඛයෙන් සම්පූර්ණයෙන්ම මුදවා ලීමය.

ඒ සඳහා ඔබ විසින් කළ යුත්තේ සීල, සමාධි, පඤ්ඤා වැඩීම් වශයෙන් පිළිවෙත් පිරීමය. එම පිළිවෙතින් ආර්ය මාර්ග සතර හා ආර්ය ඵල සතර උපදවා ගත යුතුය. නිර්වාණය ප්‍රත්‍යක්ෂ වන්නේ එවිටය.

මහා කාරුණික වූ සම්මා සම්බුදු පියාණන් වහන්සේගේ එම කරුණා සිලිල දහරින් සිසිල් වූ, ප්‍රඥාලෝකයෙන් ප්‍රභාවත් වූ ලෝකොත්තර මාර්ගය ම සේවනය කිරීම ඔබගේ දුක් ගිනි නිවාලීමට, ශාන්ත සුඛදායක අමෘත මහා නිර්වාණයට පැමිණීමට, ඇති එකම මාර්ගය බව ඔබ හොඳින් ම වටහා ගත යුතුය.

"යථා අගාරං දුච්ඡන්නං
වුට්ඨී සමති විජ්ඣති
එවං අභාවිතං චිත්තං
රාගො සමතිවිජ්ඣති"
**යමක වග්ගය, ධම්මපදය**

"හොඳින් සෙවිලි නොකළ ගෙය වැස්සෙන් තෙමෙන්නාක් මෙන් භාවනාවට පුරුදු නොකළ සිත රාගය විනිවිද යයි"

සිත භාවනා වශයෙන් පුරුදු නොකළහොත් සිතට රුචි වූ අකුසල් දෙසට ඇදීයාම සිතේ ස්වභාවයයි. කෙලෙස් මහ වැස්සෙන් සිත තෙමෙන්නේ එවිටය. කෙලෙස් මහ වැස්සට හසුව සසර සයුර වැද සතර අපායට හා ජාති ජරා මරණාදි දුක්වලට භාජන වන්නෝ භාවනා වශයෙන් සිත පුරුදු නොකළ, අභාවිත සිතැත්තෝය.

"යථා අගාරං සුච්ඡන්නං
වුට්ඨී න සමතිවිජ්ඣති
එවං සුභාවිතං චිත්තං
රාගො න සමතිවිජ්ඣති"

හොඳින් සෙවිලි කළ ගෙය වැස්සෙන් නොතෙමෙන්නාක් මෙන් මනාව භාවනාවට පුරුදු කළ සිත රාගයෙන් තෙත් නොවේ. (රාගය භාවිත සිත විනිවිද ගෙන නොයයි)

සමථ විදර්ශනා භාවනා වශයෙන් පුරුදු කළ සිතක් ඇත්තහු කෙලෙස් මහ වැස්සට නොතෙමෙති. ගොරතර සසර දුක් රැසින් මිදෙත්.

ධරමාන සර්වඥයන් වහන්සේ වෙතින් කමටහන් ලබා විදසුන් වඩා නිවන් දුටුවෝ ප්‍රමාණාතික්‍රාන්තය හ. ඒ සඳහා අනුගමනය කළ යුතු ඒකායන මාර්ගය වූ සතර සතිපට්ඨාන භාවනාව කියන ලද පරිදි ගුරුපදේශ අනුව යම් කෙනෙක් භාවනා කෙරෙත්ද, අදත් ඔවුනට මගඵල - නිවන් ලැබිය හැකිමය.

සතිපට්ඨාන භාවනාවෙන් කෙරෙන්නේ ආධ්‍යාත්මික ගුණ දියුණුවකි. විදර්ශනා ඥානයන්ගේ වැඩීමකි. එය ඉතා පිරිසිදු වූ, සියුම් වූ ගත සිත නිවාලන ශාන්ත සුඛදායක මනසිකාර ක්‍රමයකි. පළපුරුදු කමටහන් ඇදුරකු ඇසුරින් ලද උවදෙස් අනුව වැඩිය යුතු මෙනෙහි කිරීමකි. මෙනෙහි කිරීමක් මෙනෙහි කිරීමක් පාසා ගුණ නුවණ වැඩෙනු ඇත. එබැවින් එහි ලා අප්‍රමාද විය යුතුය.

"පමාදං භයතො දිස්වා
අප්පමාදඤ්ච ඛෙමතො
භාවෙථට්ඨඞ්ගිකං මග්ගං
එසා බුද්ධානු සාසනී"
**චරියා පිටක 372**

පමාව අනතුරක් වශයෙන් දැක, නො පමාව ආරක්ෂාවක් වශයෙන් දැක ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩව්. මෙය බුද්ධානු ශාසනාවයි.

**සතිපට්ඨාන භාවනාවෙන් අෂ්ඨාංගික මාර්ගය වැඩෙන බව තේරුම් ගත යුතුය.** භාවනා වැඩීමට බලාපොරොත්තු වන ඔබ විසින් පළමුවෙන් කළ යුත්තේ පිරිසිදු සීලයෙන් යුක්ත වීමයි. සීලය අපිරිසිදු නම් භාවනාව මුදුන්පත් නොවන බැවිනි. ගිහි පින්වතුන්ගේ සීල පාරි ශුද්ධිය අඛණ්ඩ වූ නිත්‍ය පංච ශීලයෙන් ද ආජීවෂ්ටමක ශීලයෙන් ද සම්පූර්ණ වෙයි. ආජීවෂ්ඨමක ශීලය වඩාත් හොඳය. අටසිල් ඊටත් වඩා හොඳය. ලෝකෝත්තර ධර්මයන් අවබෝධ කරගැනීමේ බලවත් අධිෂ්ඨානයෙන් හා ශ්‍රද්ධාවෙන් යුක්තව ම සිල් පිරිය යුතුය.

මතු දැක්වෙන පූර්වකෘත්‍යය විධිය පාඩම් කරගෙන භාවිතා කිරීමෙන් භාවනා මාර්ගයේ ඉදිරි ගමන පහසුවෙන් සලසා ගත හැකිය. මෙය සජ්ඣායනා කිරීම් වශයෙන් හා මෙනෙහි කිරීම් වශයෙන් පුරුදු කිරීමෙන් විදර්ශනා භාවනාවට සිත සකස්වන බව සැළකිය යුතුය. එම පූර්ව කෘත්‍ය විධිය අංග එකොළසකින් සමන්විත වේ.

එනම්,

1. නමස්කාරය
2. කමටහන් ඉල්ලීම
3. තුනුරුවන් කමා කරවා ගැනීම
4. පුණ්‍යානුමෝදනාව
5. ජීවිත පරිත්‍යාගය
6. තමාම අවවාද කරගැනීම
7. බුදු ගුණ මෙනෙහි කිරීම
8. මෙත් වැඩීම
9. පිළිකුළ මෙනෙහි කිරීම
10. මරණය සිහි කිරීම
11. අධිෂ්ඨානය

මේවායින් යෝගාවචරයාට ලැබෙන විශේෂ ආනිශංස සමූහයකි. එය කෙටියෙන් මෙසේ දත යුතුය.

නමස්කාරය හා කමටහන් ඉල්ලීම බලවත් ශ්‍රද්ධාවෙන්ම කළ යුතුය. ආචාර්යවරයෙකු හෝ බුදුරුවක් ඉදිරියෙහි ජීවමාන බුදුරදුන්ට මෙන් ගරු බුහුමන් ඇතිව කළ යුතුය. ආර්යෝපවාදයක් ඇතොත් එය මඟහරවා ගැනීම පිණිස කුනුරුවන් ඉදිරිපත් කරගෙන (සිතට නගාගෙන) සමාව අයැද සිටිය යුතුය. ආර්යෝපවාදය යනු සෝවාන් ආදී ආර්ය උත්තමයන් විෂයෙහි තුන් දොරින් සිදුවූ තුන් කාලයට අයත් දෝෂයෝයි. ආර්යෝපවාද ඇතොත් මගපල - නිවන් නොලැබේ. එබැවින් කමා කරවාගෙන චිත්ත බලය තරකර ගත යුතුය. එය ඇති නැති බවක් තමා නොදන්නා නිසා සමාව අයැද සිටීම කළ යුතුමය.

බුද්ධාදී උත්තමයන් වහන්සේලාගේ පින් අනුමෝදන් වීමෙන් සිතේ දුබලකම් මගහැරී උතුම් හැඟීම් ඇති වන්නේය. උන්වහන්සේලාගේ පාරමී පින්කම් සිහිකර මතුකොට ගනිමින් පින් අනුමෝදන්වන ගාථාව හා වාක්‍ය ද කිව යුතුය.

තමා විසින් කරන ලද පින් ද ආවර්ජනා කරමින් ලෝකයාට පින් දිය යුතුය. භාවනා වැඩීමේදී ඇතැම්විට භයානක අරමුණු ද පෙනිය හැක. ඇතැමෙකුට භූත, අමනුෂ්‍ය උපද්‍රව ද ඇතිවිය හැකිය. එසේ ඇතිවිය හැකි බිය තැති ගැනීම් නැතිකර ගැනීම් පිණිසය, බුදුරජාණන් වහන්සේට ජීවිතය පූජා කළයුත්තේ. ධර්ම රත්නයට හා සංඝ රත්නයට ජීවිතය පූජා කිරීම ද මැනවි. ආචාර්යවරයාට ජීවිතය පූජා කිරීමෙන් ආචාර්යවරයා කෙරෙහි තද භක්තියක් ඇතිවේ. ආචාර්යවරයාද ගෝලයා කෙරෙහි බලවත් වගකීමකින් බැඳී ඉතා ආදරයෙන් සියලු උපදෙස් දෙමින් රැකවරණය ද ලබා දෙනු ඇත.

මෙහි කියන ලද පරිදි තමාගේ සිතින්ම තමාට අවවාද කරගැනීම, ආත්ම ස්නේහය නැතිවීමට ද උත්සාහය වැඩිවීමට ද හේතුවන බව දත යුතුය.

බුදු ගුණ මෙනෙහි කිරීමෙන් ශ්‍රද්ධාව වර්ධනය වෙයි. ශ්‍රද්ධාව නොමැති සිත කර්කෂ වියළි මුඩු බිමක් වැන්න. මුඩු බිමෙහි රෝපිත බීජයෝ නොවැඩෙත්. බීජයාගේ මුල් ඇල්ලීම පිණිස බිම තෙත් කොට බුරුල් කොට සකස් කරගත යුතුය. බීජ තැන්පත් කළ යුත්තේ ඉන්පසුවය. භාවනා බීජය මුල් ඇල්ලීම පිණිස ද සිත් සතන් නමැති බිම ශ්‍රද්ධාවෙන් තෙත් කොට බුරුල් කරගත යුතුය. ද්වේෂයෙන් දූෂිත සිත මෛත්‍රී ජලයෙන් පිරිසිදු කරගත යුතුය. ද්වේෂය වනාහි නොයෙක් වේශයෙන් ඉදිරියට විත් යෝගාවචරයාට හිංසා කරන බලවත්ම ක්ලේශයකි. එහෙයින් හැකිතාක් මෛත්‍රිය දියුණු කළ යුතුය. හිත, ඉතා හිත, මැදහත්, වෛරී යන සියලු සත්ත්වයන් කෙරෙහි ද දෙවිවරුන් කෙරෙහි ද මෙත් වැඩීමෙන් ආරක්ෂාව සැලසේ. සිත සැහැල්ලු වේ. බැබලේ.

පිළිකුල මෙනෙහි කිරීමෙන් සිය සිරුර කෙරෙහි ඇති ඇල්ම නැති වී යයි. සසර කලකිරෙයි. එපාවෙයි. අත් හැරීමට සිත නැමෙයි.

මරණය සිහි කිරීමෙන් ද කෙලෙසුන්ගෙන් ආරක්ෂාව සැලසී චිත්ත ධෛර්යය වැඩි වන්නේය. ඉතා ඉක්මණින් සසර දුකින්, මාර මුඛයෙන් මිදීමට අවශ්‍ය වීරියාරම්භය පිණිස සිත නැමෙන්නේය.

"නිපකන්ති ඛණාතීතා
අනන්තෙ දුක්ඛ සාගරෙ
තස්මා පයොගො කතබ්බො
යාව තිට්ඨති සාසනං"

**දබ්බමල්ල ථෙරාපදාන - අපදාන පාළි.**

"නිර්වාණාවබෝධයට සුදුසු මේ මොහොත භාවනා නොවඩා ඉක්ම වූවෝ අනන්ත වූ දුක් මුහුදක ඇද වැටෙන්නාහ. එසේ හෙයින් සම්බුද්ධ ශාසනය පවත්නා තාක් විදර්ශනා වැඩීම් වශයෙන් වීර්ය කළ යුතුය"

සද්ධා වීර්ය සති සමාධි පඤ්ඤා යනාදී ආධ්‍යාත්මික ගුණ ධර්ම වැඩීමෙන් ඔබට මග-පල-නිවන් ලබාදෙන නෛර්යාණික සම්මා සම්බුද්ධ ශාසනය රැකගැනීම ඔබේ පරම යුතුකමය.

## විදර්ශනා භාවනාවේ පූර්වභාග ප්‍රතිපදාව (පූර්ව කෘත්‍යය)

නමස්කාරය

"නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"

"ඒ භාග්‍යවත් වූ අර්හත් වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා"

## කමටහන් ඉල්ලීම

"ඕකාස, අහං භන්තෙ සංසාර වට්ට දුක්ඛතො මුච්චනත්ථාය කම්මට්ඨානං යාචාමි"

ඕකාස අහං භන්තෙ - අවසර ස්වාමීනි

සංසාර වට්ට දුක්ඛතො මුච්චනත්ථාය - සංසාර වෘත්ත දුක්ඛයෙන් මිදීම පිණිස

කම්මට්ඨානං යාචාමි - මම සතිපට්ඨාන භාවනා කර්මස්ථානයක් ඉල්ලමි.

(මෙය තමාගේ ව්‍යවහාර භාෂාවෙන් කීවද වරදක් නැත)

## තුණුරුවන් සමාකර ගැනීම

"අතීත සංසාරයේ පටන් දැන් මේ දක්වා බුද්ධ රත්නය කෙරෙහි, ධර්ම රත්නය කෙරෙහි, සංඝ රත්නය කෙරෙහි මාගේ සිත කය වචනය යන තුන් දොරින් සිදු වූ සියලු වැරදි වලට බුද්ධ රත්නය මට සමාව දෙන සේක්වා! ධර්ම රත්නය මට සමාව දෙන සේක්වා! සංඝ රත්නය මට සමාව දෙන සේක්වා!"

## පුණ්‍යානුමෝදනාව

"පුඤ්ඤඤ්ච යං සබ්බ තථාගතානං
අඤ්ඤඤ්ච සම්බොධි පරායණානං
පච්චෙක බුද්ධස්සච සාවකානං
සබ්බං ගුරූනං අනුමොදයිසෙස"

සියලු බුදුවරුන්ගේ යම් පින් රැසක් වෙයිද, සියලු බෝධිසත්ත්වරයින්ගේ යම් පින් රැසක් වෙයිද, පසේ බුදුවරයින්ගේ ද ක්ෂීණශ්‍රවාදී ආර්යයන් වහන්සේලා ගේ හා සියලු ආචාර්යයන් වහන්සේලාගේ ද යම් පින් රැසක් වෙයිද, ඒ සියල්ල මම අනුමෝදන් වෙමි."

## දෙවියන්ට පින් දීම

අහසෙහි විමන්හි සිටිනාවූ ද, පොළොවෙහි වෘක්ෂ පර්වතාදිය ඇසුරු කොට සිටින්නාවූ ද, මහත් සෘද්ධි ඇති දෙවියෝ ද, ලෝක පාලක දෙවියෝ ද, ශක්‍ර බ්‍රහ්මාදි මහානුභාවසම්පන්න දෙවියෝ ද, නාගයෝ ද මා කළ පින් අනුමෝදන්ව මා ආරක්ෂා කෙරෙත්වා! සියලු භූතයෝ ද, මළගිය ඤාතිහු ද සියලු සත්ත්වයෝ ද මාගේ පින් අනුමෝදන් වෙත්වා.

## ජීවිත පරිත්‍යාගය

"ඉමහං අත්තභාවං බුද්ධස්ස භගවතො පරිච්චජාමි"
මම මගේ මේ ආත්ම භාවය භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට පූජා කරමි. පූජා වේවා!

"ඉමාහං අත්තභාවං ධම්මස්ස පරිච්චජාමි"
මම මාගේ මේ ආත්ම භාවය ශ්‍රී සද්ධර්මයට පූජා කරමි. පූජා වේවා!.

"ඉමාහං අත්තභාවං සඞ්ඝස්ස පරිච්චජාමි"
මම මාගේ මේ ආත්ම භාවය සංඝ රත්නයට පූජා කරමි. පූජා වේවා.

"ඉමාහං අත්තභාවං ආචරියස්ස පරිච්චජාමි"
මම මාගේ මේ ආත්මභාවය ආචාර්යයන් වහන්සේට පූජා කරමි. පූජා වේවා!.

## තමාට අවවාද කර ගැනීම

"පින්වත, දැන් ඔබේ ආත්ම භාවය ඔබට අයිති වූවක් නොව තුනුරුවන්ට හා ආචාර්යවරයන්ට පුදන ලද්දකි. එසේ පුදන ලද ස්කන්ධ ශරීරය නැවත ඔබට උවමනා පරිදි ක්‍රියා කරවිය නොහැකිය. එසේ කළහොත් එය අයුක්තියකි."

## බුදු ගුණ මෙනෙහි කිරීම

"ඒ මාගේ භාග්‍යවතුන් වහන්සේ සියලු කෙලෙසුන් කෙරෙන් දුරු වූ හෙයින් ද, සියලු සතුරන් නැසූ හෙයින් ද, සංසාර චක්‍රයාගේ අර සිඳලු හෙයින් ද, තුන් ලෝ වැසියන්ගේ ආමිස පූජා ප්‍රතිපත්ති පූජා ලැබීමට ඉතාම සුදුසු වූ හෙයින් ද, රහසින්වත් පව් නොකළ හෙයින් ද අර්හත් නම් වන සේක! අර්හත් නම් වන සේක!! අර්හත් නම් වන සේක!!!

මේ වැකියේ සඳහන් බුදු ගුණ නුවණින් සලකමින් කීප විටක් සජ්ඣායනා කොට පසුව සිතින් පමණක් සලකමින් හැකි වෙලාවක් භාවනා කරනු. මේ භාවනාව සිතේ තැන්පත්කම ඇතිවනතුරුම කිරීම මැනවි. එක් භාවනාවකින් සිත තැන්පත් කර ගැනීමට, සමාධිය ඇති කර ගැනීමට, හැකි වූවාට පසු ඊළඟට කරන භාවනාවේදී ඉතා ඉක්මණින් සමාධිය උපදවා ගතහැකි වෙයි. පොත්වල තිබෙනතාක් භාවනා වාක්‍ය දිගටම එකපැහැර කියවාගෙන යාම සමාධිය පහළ කරගැනීමට හේතුවක් නොවන බව මතක තබා ගත යුතුය. මේ එකම භාවනා ක්‍රමයකින් හෝ සිත සමාධි ගත වූ පසු ඇතිවන චිත්ත ශක්තිය, පසු පසු භාවනාවට බලවත් ශක්තියක් වී සිත ඉක්මණින් සමාධිගත වන අයුරු තමාට ම දැනෙනවා ඇත. මෙසේ දියුණු කරගත් බුද්ධානුස්සති මෛත්‍රී, අසුභ, මරණානුස්සති යන ආරක්ෂක භාවනා සතර විදර්ශනා වඩන අවස්ථාවේදී තමාට ආරක්ෂාව සළසා දෙන්නේ, ඒ ඒ අවස්ථාවන්හි විරුද්ධව නැගී සිටින කෙළෙස් නැමැති සතුරන් මෙල්ල කිරීම සඳහා කල්තබා මැ ළඟ තබාගත් තියුණු ආයුධ හතරක් මෙනි. එබැවින් එක් භාවනාවක් කරගෙන යාමේදී එහි සිත තැන්පත් වනතුරු වෙන භාවනා අරමුණකට සිත යෙදීමට ඉක්මන් නොවිය යුතුය.

## මෛත්‍රී භාවනාව

මේ උපදෙස් හොඳින් තේරුම් ගෙන භාවනා කළ යුතුය.

මෛත්‍රී භාවනාවෙන් යෝගාවචරයාට ලැබෙන ඉමහත් ආනිසංසයන්ගෙන් ස්වල්පයක් ඉහතින් දක්වන ලදී. මෛත්‍රී කළයුතු පුද්ගල කොටස් සතරෙකි. එනම්, තමා, හිතවතා, මධ්‍යස්ථයා සහ සතුරා ය. සියලු සත්ත්වයෝ ම මේ කොටස් සතරෙහි ඇතුළත් වන්නාහ. මෙත් සිත පහළ

කරගැනීම සඳහා භාවිතා කරන පද සතරකි. එනම්, වෛර නැති බව, තරහ නැති බව, දුක් පීඩා නැති බව හා සුවපත් බවය.

සිතට මෙත් පුරුද්ද ඇතිවන්නේ තමාට මෙත් කරගැනීමෙනි. එබැවින් "මම වෛර නැති වෙමි" යනාදි වශයෙන් පද හතර යොදමින් හිත තැන්පත් වනතුරුම එහි ආනිශංස වැටහෙන තෙක්ම කොතෙක් කල් හෝ පළමුකොට තමාට මෙත් කරගත යුතු.

**(මෙය පළමුවන අභ්‍යාසයයි)**

මෛත්‍රී සමාප්තිය හෙවත් මෛත්‍රිය සිත තුළ පිහිටා සිටීම - මෛත්‍රිය සිතෙහි පදිංචි වීම-ඇරඹෙන්නේ හිතවතාට මෙත් කිරීම සම්පූර්ණ වීමේදීය. එබැවින් වෛර නැති බව යනාදී පද සතරම යොදා දෙවනුව හිතවතාට මෙත් කළ යුතුය. මෙහිදී තමාට මෙත් කර ගැනීමෙන් තැන්පත් වූ සිතින්ම හිතවතා සිතට පෙනෙන පරිදි අරමුණු කොට "මා මෙන්ම මගේ හිතවතා ද වෛර නැතිවේවා" යනාදී වශයෙන් මෙත් වැඩිය යුතුය. හිතවතා සිතට පෙනෙන පරිදි අරමුණු කිරීමේදී "මා මෙන්ම මගේ හිතවතාද" යන වචන නොකියා ඔහු දෙස බලමින් "වෛර නැතිවේවා"යි කීම ද සෑහේ. හිතවතා වශයෙන් විසභාග (ස්ත්‍රිය පුරුෂයාටත්, පුරුෂයා ස්ත්‍රියටත් ලිංග වශයෙන් විෂභාග වේ) පුද්ගලයෙකු නොගත යුතුය. හිතවතාට මෙත් කිරීමේදී වෛර ක්‍රෝධාදිය සංසිඳී සිතේ තැන්පත්කම පෙරට වඩා හොඳින් පිහිටා සිටියි. ඒ සමාහිත සිතින් තව තවත් හිතවතුන් අරමුණු කොට මෙත් කළ හැකිය.

**(මෙය දෙවන අභ්‍යාසයයි)**

ඊළඟට තමාත් හිතවතාත් කෙරෙහි පැවති සමවූ මෙත් සිතින්ම මැදහත් පුද්ගලයකු සිතට පෙනෙන පරිදි අරමුණු කොට පෙරසේම මෙත් කල යුතුය. යම් හෙයකින් මෙහිදී සිත උදාසීන වෙන බව හැඟෙතොත් මධ්‍යස්ථයා අරමුණු නොකොට නැවතත් තමාට හා හිතවතාට මෙත් කිරීමෙන් සමාධිය ශක්තිමත් කරගෙනම මධ්‍යස්ථයාට මෙත් කළ යුතුය. එසේ මෙත් කිරීමේදී තමාය, හිතවතාය, මධ්‍යස්ථයාය යන තුන් දෙනා කෙරෙහි ම වෙනසක් නැති ආකාරයක් සිතට දැනෙයි. සම මෙතක් පවතියි. එසේ ඇති කල්හි තවත් මධ්‍යස්ථයෙකු කෙරෙහි ද මෙත් කළ යුතුය. මෙසේ ඒ සමාහිත සිතින් කැමති තාක් මධ්‍යස්ථයන් අරමුණු කළ හැකිය.

**(මෙය තුන්වන අභ්‍යාසයයි)**

ඊළඟට ඒ සමාහිත සිතින්ම තමාගේ සතුරෙකු ඇතහොත් ඔහු අරමුණු කොට පෙරසේම "වෛර නැති වේවා" යනාදි ක්‍රමයෙන් මෙත් කළ යුතුය. සතුරා අරමුණු වීමේදී වෛර තරහ ඇති වුවහොත් ඒ අරමුණෙන් සිත ඉවත් කොට, නැවත තමාට ද හිතවතාට ද, මධ්‍යස්ථයාට ද, පිළිවෙලින් මෙත් කොට සිත සමාහිත කරගෙනම සතුරාට මෙත් කළ යුතුය. එයින් සිත සමාහිත වූ පසු තවත් සතුරන් අරමුණු කළ හැක.

**(මෙය සතරවන අභ්‍යාසයයි)**

දැන් තමාගේ සිතෙහි වෛර තරහාදිය යටපත්ව ශක්තිමත් සමාධියක් පිහිටා ඇත. තමා, හිතවතා, මධ්‍යස්ථයා, සතුරා යන සතර දෙනම කිසි වෙනසක් නැතිව අරමුණු කළ හැක. මේ සතර දෙනම තමාට පෙනෙත්. මෙසේ ඇති කල්හි "වෛර නැති බව" යන පදය පමණක් ගෙන තමාගේ පටන් පිළිවෙලින් බොහෝ වේලාවක් මෙත් කරනු.

**(මෙය පස්වන අභ්‍යාසයයි)**

මෙයින් සමාධිය තර වූ පසු "තරහ නැති බව" යන පදය පමණක් ගෙන සතර දෙනා කෙරෙහිම මෙත් කළ යුතුය.

**(මෙය සවන අභ්‍යාසයයි)**

නැවත "දුක් පීඩා නැති බව" "සුවපත් බව" යන පද වෙන වෙනම ගෙන පෙර සේම මෙත් කළ යුතුය.

**(මේ සත්වන අටවන අභ්‍යාස දෙකය)**

දැන් මෛත්‍රී සමාධිය බොහෝ ශක්තිමත්ව ඇත. මේ අවස්ථාව වන විට තමාය, හිතවතාය, මධ්‍යස්ථයාය, සතුරාය යන වෙනසක් නැතිව සම තත්ත්වයකින් අරමුණු වෙයි. එය සීමා සම්භේදයයි.

ඉක්බිති එම පද හතරෙන් තමාගේ සිතට වඩා පහසුවෙන් හසුවන වඩා කැමති එක් පදයක් ගෙන, සතර දෙනා කෙරෙහි පිළිවෙලින් එක රවුමට එක පෙළටම මෙත් කළ යුතුය.

**(මෙය නවවන අභ්‍යාසයයි)**

මෙසේ මේ පුද්ගලයන් සතර දෙනා සිතට පෙනි පෙනී වෙනසක් නැතිව සමසිතින් අරමුණු කරමින් භාවනා කිරීමේදී පුද්ගල හැඟීම දුරු වී ඉබේටම සත්ව සංඥාවට සිත වැටෙයි. සත්ව සංඥාව සිතෙහි ඇති වෙයි. එසේම සියලු සත්වයින්ගේ සැප කැමති බවෙක් ද සිතෙහි පහළ වෙයි. එතැන් පටන් සියලු සත්වයින් කෙරෙහි මෛත්‍රී සිත පැවැත්විය හැක. එහිදී "සියලු සත්වයෝ සුවපත් වෙත්වා" යනුවෙන් දිගටම භාවනා කළ යුතුය. මේ තත්වයට පැමිනි පසු ගුරූපදේශ ලබා ගැනීමට ද සිතනු මැනවි.

## සැලකිය යුත්තක්

යම් කිසිවෙකු අරමුණු කොට භාවනා කිරීමේදී වෛර-තරහාදිය ඇති වුවහොත් ඒ හැම අවස්ථාවකම, ඒ භාවනා කළ අරමුණෙන් සිත බැහැර කොට තමාගේ පටන් පිළිවෙලින් මෙත් වඩා සිත තැන්පත් කර ගැනීමට මතක තබාගත යුතුය. එසේම එක් වරක් භාවනා කොට නවතා නැවත භාවනා කිරීමේදී තමාගේ පටන් මෛත්‍රී කිරීමේ පිළිවෙල අනුගමනය කළ යුතුය. එක් පුද්ගලයකු අරමුණු කිරීමේදී "වේවා" යන එක වචනයත් බොහෝ දෙනෙකු අරමුණු කිරීමේදී "වෙත්වා" යන බහු වචනයත් යොදා ගත යුතුය.

### පළමුවන අභ්‍යාසය

මම වෛර නැති වෙමි.
මම තරහ නැති වෙමි.
මම දුක් පීඩා නැති වෙමි.
මම සුවපත් වෙමි.

### දෙවන අභ්‍යාසය

මා මෙන්ම මාගේ හිතවතා ද වෛර නැති වේවා.
මා මෙන්ම මාගේ හිතවතාද තරහ නැති වේවා.
මා මෙන්ම මාගේ හිතවතාද දුක් පීඩා නැති වේවා.
මා මෙන්ම මාගේ හිතවතාද සුවපත් වේවා.

### තුන්වන අභ්‍යාසය

මා මෙන්ම මාගේ මධ්‍යස්ථයාද වෛර නැති වේවා.
මා මෙන්ම මාගේ මධ්‍යස්ථයාද තරහ නැති වේවා.
මා මෙන්ම මාගේ මධ්‍යස්ථයාද දුක් පීඩා නැති වේවා.
මා මෙන්ම මාගේ මධ්‍යස්ථයාද සුවපත් වේවා.

**සතරවන අභ්‍යාසය**

මා මෙන්ම මගේ සතුරා ද වෛර නැති වේවා.

මා මෙන්ම මගේ සතුරා ද තරහ නැති වේවා.

මා මෙන්ම මගේ සතුරා ද දුක් පීඩා නැති වේවා.

මා මෙන්ම මගේ සතුරා ද සුවපත් වේවා.

**පස්වන අභ්‍යාසය**

මම වෛර නැති වෙමි. මා මෙන්ම මගේ හිතවතා ද වෛර නැති වේවා. මගේ මධ්‍යස්ථයාද වෛර නැති වේවා. මගේ සතුරාද වෛර නැති වේවා.

**සවන අභ්‍යාසය**

මම තරහ නැති වෙමි. මා මෙන්ම මගේ හිතවතා ද තරහ නැති වේවා. මා මෙන්ම මගේ මධ්‍යස්ථයා ද තරහ නැති වේවා. මගේ සතුරා ද තරහ නැති වේවා.

**සත්වන අභ්‍යාසය**

මම දුක් පීඩා නැති වෙමි. මා මෙන්ම මගේ හිතවතා ද දුක් පීඩා නැති වේවා. මාගේ මධ්‍යස්ථයා ද දුක් පීඩා නැති වේවා. මාගේ සතුරා ද දුක් පීඩා නැති වේවා.

**අටවන අභ්‍යාසය**

මම සුවපත් වෙමි. මා මෙන්ම මගේ හිතවතා ද සුවපත් වේවා. මාගේ මධ්‍යස්ථයා ද සුවපත් වේවා. මගේ සතුරා ද සුවපත් වේවා.

**නවවන අභ්‍යාසය**

(නිදසුන : තමා කැමති පදය "දුක් පීඩා නැති බව" යයි සිතමු. එනිසා)

මම දුක් පීඩා නැති වෙමි. මා මෙන්ම මගේ හිතවතා ද දුක් පීඩා නැති වේවා මාගේ මධ්‍යස්ථයා ද දුක් පීඩා නැති වේවා මගේ සතුරා ද දුක් පීඩා නැති වේවා.

**දසවන අභ්‍යාසය**

සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා. සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා. සුවපත් වෙත්වායි දිගටම භාවනා කරනු.

## පිළිකුල මෙනෙහි කිරීම.

බඹයක් පමණ වූ මාගේ මේ ශරීරය රන්, රිදී, මුතු, මැණික් ආදියෙන් සෑදුනා වූ හෝ සඳුන් ආදී සුවඳ ද්‍රව්‍ය වලින් සෑදුනා වූ හෝ දෙයක් නොව කෙස්, ලොම්, නිය, දත් ආදී දෙතිස් කුණපයන්ගෙන් සෑදුනා වූ දුගඳ හමන අසූචිවලින් පිරුණා වූ කුණු කයෙකි. මේ කය සෑම අපවිත්‍ර ජාතියක්ම එකතු වන්නා වූ ගවර වලක් හා සමානය. මෙයට ඇල්ම පවත්නා තාක් දුකින් මිදිය නොහැකිය. සැපත නම් මෙයින් නිදහස් වූ නිවනමය.

## මරණය සිහි කිරීම.

මාගේ ජීවිතය අනියතයි. මාගේ මරණය නියතයි. මහා සම්පත් ඇති සත්ත්වයෝ යම් සේ මැරුණාහුද, මම ද ඒසේම මැරෙන්නෙමි. මාගේ මරණය වන්නේය. ජීවිතය විදුලියක් මෙන් වහා නැසී යන්නේය. දිය බුබුලක් මෙන් හරයක් නැත්තේය. තණ අග පිණි බිඳක් මෙන් වහා සිඳී යන්නේ ය. දියෙහි ඇඳි ඉරක් මෙන් වහා මැකී යන්නේය. කුඩා ඔයවල්හි ජලය සිඳී වියළී යන්නාක් මෙන් සත්ත්වයාගේ ජීවිතය රෑ දවල් නොතකා නැසී යන්නේය. මහත් යසසින් ද ගුණ නුවණින් ද වැඩි වූ බුදු පසේ බුදු මහ රහත් ආදී උතුමන්ගේ ජීවිත නමැති ප්‍රදීපයෝ මරු සුළඟින් නිවී ගියෝය. මා වැන්නවුන් ගැන කියනුම කවරේද?

ජීවිතය අනියතයි මරණය නියතයි.
ජීවිතය අනියතයි මරණය නියතයි.
ජීවිතය අනියතයි මරණය නියතයි.
මේ එක් එක් වාක්‍යයක් පාසාම නුවණින් යුතුව අර්ථ සලකමින් මෙනෙහි කළ යුතුය.

## අධිෂ්ඨානය

සියලු බුදු, පසේ බුදු මහ රහතන් වහන්සේලා ඒ ඒ බෝධීන් අවබෝධ කරගත් මේ විදර්ශනා භාවනා මාර්ගයෙන් ම මා පතන්නා වූ බෝධිය ද මට ලැබේවා.

විදර්ශනා භාවනාව කරනවිට භාවනාවට වාඩි වී ඉතා කෙටි කාලයකින් මෙය අවසන් වන ආකාරයට මුලදීම දියුණු කරගත යුතුය.

මෙසේ දියුණු කරගත් "චතුරක්ෂාව" ඇතිව විදර්ශනා භාවනාවට බසින ඔබට සතිපට්ඨාන, සම්මප්පධාන, ඉද්ධිපාද, ඉන්ද්‍රිය, බල, බොජ්ඣංග මග්ග ධර්මයන් ස්වසන්තානයෙහි කෙමෙන් වැඩෙනු අත් දකිත හැකි වෙයි. ඒ තුළින්ම බුදු රජාණන් වහන්සේගේ ස්වාක්ඛාත වූ ධර්මය තුළ ඇති සන්දිට්ඨික, අකාලික, ඒහි පස්සික, ඕපනයික, **පච්චත්තං, වේදිතබ්බෝ විඤ්ඤූහි** යන ගුණ සමුදාය මැනවින් ප්‍රත්‍යක්ෂ වනු ඇත. කාය, ජීවිත නිරපේක්ෂක උට්ඨාන වීර්යයෙන් මුවහත් කරගත් අතීත පුණ්‍ය ශක්තීන් පිහිට කරගෙන නිස්සරණ පටිපදාවෙහි යෙදෙන ඔබට අනන්ත කාලයක් සංසාරයෙහි කළ සංසරණයෙහි කෙළවර වන නිස්සරණයට-නිවනට-මේ ජීවිතයේදීම පැමිණිය හැකි වෙයි.

බුදු සසුන රකින ඔබට තෙරුවන් සරණයි!
සියලු සත්වයෝ සුමිහිරි නිවන් සැපතින් සැනසෙත්වා!
**චිරං තිට්ඨතු ලෝකස්මිං**
**සම්මා සම්බුද්ධ සාසනං**

මීතිරිගල නිස්සරණ වනය ආරම්භයේ සිටම මේ දක්වා අඛණ්ඩව මෙහිම වැඩ වෙසෙන වර්තමාන සේනාසනාධිපති අති පූජ්‍ය පානදුව ඛේමානන්ද ස්වාමීන් වහන්සේ විසින් සේනාසනයට විසි පස් වසරක් සම්පූර්ණ වීම නිමිති කරගෙන ශ්‍රී බු. වර්ෂ 2534 දී රචනා කරන ලදුව මෙතෙක් අමුද්‍රිතව පැවති "**නිස්සරණ පටිපදා**" මෙයින් නිමියේය.

# 9

# නිස්සරණයේ නිර්මාතෘවරයාණෝ



**අසෝක වීරරත්න මැතිතුමා**



**පූජ්‍ය මීතිරිගල ධම්මනිසන්ති හිමිපාණන් වහන්සේ.**
1972 අගෝස්තු 22 වෙනි දින පැවිදිවීමෙන් පසු මීතිරිගල නිස්සරණ වනයේදී

## "නිස්සරණයේ" නිර්මාතෘවරයාණෝ

ඒ 1961 අප්‍රියෙල් මස 12 වෙනි දිනයයි. රුසියන් ජාතික යූරි ඇලෙක්සියේවිච් ගගාරින් වොස්ටොක් 1 යානයෙන් ගොස් අභ්‍යවකාශය තරණය කළ ඒ ඓතිහාසික සිද්ධිය ලෝකයේ කෝටි සංඛ්‍යාත ජනතාවගේ සිත් සතන්වල මහා විස්මයක් දැන වූවාට සැක නැත. නූතන තාක්ෂණයේ හා නවීන විද්‍යාවේ මහා ජයග්‍රහණයක් ලෙස අනිවාර්යයෙන්ම ඔවුහු සිතූහ. නමුත් අසෝක වීරරත්න නමැති ශ්‍රේෂ්ඨ ශ්‍රී ලාංකික විද්‍යාඥයා-උතුම් සිංහල බෞද්ධයා මෙම භෞතික ජයග්‍රහණය දුටුවේ මෙසේය.

## ගගාරින් නිසා ජීවිතයේ අලුත් පිටුවක්

"රුසියන් ජාතික යූරි ගගාරින් අභ්‍යවකාශය තරණය කළ ඓතිහාසික සිද්ධිය සිදුවීමෙන් අනතුරුව ඒ පිළිබඳව බර්ලින් ගුවන් විදුලි සේවය දහවල් 11.00 ට කළ ප්‍රවෘත්ති ප්‍රකාශයට මා සවන් දුන්නේ ජර්මනියේ බර්ලින් විහාරයේ සිටි අවස්ථාවකදී ය. ඒ ක්ෂණයෙන්ම මට මේ අදහස පහළ විය. මේ ආශ්චර්යමත් සිද්ධිය සිදු වූයේ, ඥානවන්ත සැලැස්මක් වීර්යය යොදා දිගටම ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි. එය එසේ නම්, **අපට ඇති ඥානවන්ත සැලැස්ම වන ආර්ය අෂ්ඨාංගික මාර්ගය වීර්යයෙන් දිගටම ක්‍රියාත්මක කළහොත් ඒකාන්තයෙන්ම ධ්‍යාන-මාර්ග-ඵල මේ ජීවිතයේදී ම ලබා ගැනීමට හැකිය**"

"මේ අදහස මට පහළ වූ වහාම තවත් ප්‍රවෘත්ති ඇසීමේ රුචිය නැති වී ගොස් ගුවන් විදුලි යන්ත්‍රය වසා දැමුවෙමි. වසා දමා, මගේ අත් දෙකින් එකිනෙකට ගසා ගනිමින් "මම මේ අත්දෙක තවත් ධනය ඉපයීමට නො යොදවමි, මා වෙනුවට අයියාට සහාය වීමට කෙනෙකු පුරුදු කරනතුරු මාස හයක් පමණක් ව්‍යාපාරික කටයුතු කරන්නෙමි" යි අධිෂ්ඨාන කර ගත්තෙමි"

අමා බින්දු - පූජ්‍ය ධම්ම නිසන්ති හිමියන්ගේ ලිපිය - පිට 119.

සසර භාවිත පුණ්‍ය ශක්ති ඇති උතුමන්ගේ ජීවිතවල සුවිශේෂ ගති ලක්ෂණ දැකිය හැක. වළාකුළෙන් බැහැර වූ පුන් සඳ මඬල සේ ඔවුන්ගේ ජීවිතවල පුරුදු කරගෙන ආ කුශල ශක්තිය මතුවන අවස්ථාව මේ යයි කල්තබා කිව නොහැකිය. උපතිස්ස, කෝලිත (සැරියුත්, මුගලන් මාහිමිවරු) තරුණ යහළුවන් දෙදෙන නිවන් සොයා ගියේ "ගිරග්ග සමජ්ජ" නම් නාට්‍ය සන්දර්ශනය නැරඹීමෙන් ඇති වූ බුද්ධි විකාශය (ජීවිතය පිළිබඳ යථාවබෝධය තුළින් එබඳු දේහි ඇති නිසරු බව වැටහීම) නිසාවෙනි.

කෝටි ගණනක් මිනිසුන් අතරින් වුව ඉහත සඳහන් කළ අයුරේ ශ්‍රේෂ්ඨ සිතුවිල්ලක් අසෝක වීරරත්න මහතාට හැර තවත් කෙනෙකුට ඇති වූ බවක් අපි අසා නැත්තෙමු. සැබවින්ම භාවිත පුණ්‍ය මහිමයක් ඇති මහා ප්‍රාඥ උතුමෙකුට හැර වෙනත් කාට නම් මෙවැනි සිතුවිලි පහළ වේද?

මෙය අසෝක වීරරත්න නමැති මීතිරිගල නිස්සරණ වන සෙනසුනේ නිර්මාතෘවර ශ්‍රේෂ්ඨ වීර පුරුෂයාගේ ජීවිතයේ ආශ්චර්යමත් කඩඉමකි. සන්ධිස්ථානයකි. සැබවින්ම පුණ්‍ය සෘද්ධියක් පහළ වීමකි.

## ශ්‍රේෂ්ඨ පුත් රුවනක්

අසෝක වීරරත්නයන් ගාලු පුරවරයෙහි උපත ලැබුවේ 1918 දෙසැම්බර් 12 වෙනි දිනයෙහි ය. ඒ ධනවත් සුප්‍රසිද්ධ පී. ජේ. වීරරත්න දම්පතීන්ගේ අතිජාත කණිෂ්ඨ පුත්‍ර රත්නය ලෙසය. සිංහලකම, බෞද්ධකම ඉහළින් ම රැකගත් වීරරත්න යුවළ අසෝක වැනි ප්‍රකෘතියෙන්ම පිරිසිදු පුරන ලද පාරමී ඇති පින්වත් දරුවෙකුට මාපියන් වීමේ භාග්‍යය ලැබීම පුදුමයක් නොවේ.

කුඩා අවධියේ පටන්ම මේ දරුවා තුළ වෙනත් සම වයස් දරුවන්ට වඩා වෙනස් හැසිරීම්, ගති ලක්ෂණ ප්‍රදර්ශනය විය. සුව පහසු දනවන, සැප සම්පතින් පිරුණු ජීවන රටාවකට ඔහු ඇළුම් කළේ නැත. සැහැල්ලු පැවතුම් හා සරල චාම් ජීවන රටාවක් ඔහු තුළින් දැකිය හැකි විය. කුඩා අවධියේ සිටම ගැඹුරු ඥාණ ශක්තියක් පෙන්නුම් කළ අසෝකයන් ඉතා හොඳින් පංච ශීලය ආරක්ෂා කළේය. කරුණාවෙන් හා දයාවෙන් පිරිපුන් හදවතක් ඇති ඔහු තුවාල සැදී දුකට පත් අය දුටුවිට ගෙදර කැඳවාගෙන විත් කිසි පිළිකුලක් නැතිව

තමාම ඔවුන්ට සාත්තු සප්පායම් කළේය. කුඩා අවධියේ සිට නිර්මාංශ ආහාර ගත් අසෝකයන් උම්බලකඩ ටිකක්වත් ආහාරයට එක්වනවාට අකමැති විය.

## අධ්‍යාපනය

අසෝකයන් එකල දකුණු ලක පැවති උසස් ඉංග්‍රීසි බෞද්ධ විදුහල වූ ගාල්ලේ මහින්ද විද්‍යාලයේ ආදී ශිෂ්‍යයෙකු විය. බොදු හැදියාවෙන් ඔප වැටුණු බෞද්ධ දර්ශනය හා බෞද්ධ ප්‍රතිපත්ති මුල්කරගත් ඉතා හොඳ අධ්‍යාපනයක් ඔහු මහින්ද විද්‍යාලයෙන් ලබා ගත්තේය.

## උදාර චරිතය

ශක්තිමත් පෞරුෂ වර්ධනයක් කෙරේ අසෝකයන් අධ්‍යාපනය ලැබූ පාසල හා පවුල් පරිසරය ප්‍රබල ලෙස බල පෑ බව පෙනී යයි. විශේෂයෙන් අසෝකයන්ගේ මව්පියන් හා මව් පස ඥාතීන් ඉතාම ශ්‍රද්ධාවන්ත බෞද්ධයන් වීම නිසා, කුඩා අවධියේ සිටම බෞද්ධ වත් පිළිවෙත්, ආචාර ධර්ම කෙරේ දැඩි නැඹුරුවත් ඇති විය.

## දක්ෂ වෙළඳ ව්‍යාපාරිකයෙකු වීම

පියතුමාගේ අභාවයෙන් පසුව, තරුණ අසෝක වීරරත්නයන් තම වැඩිමහල් සොහොයුරු ධර්මසේනයන් සමඟ පවුලේ ව්‍යාපාර කටයුතු ඉතා සාර්ථක ලෙස ඉදිරියට ගෙන යාමට සමත් විය. ඔවුහු 1948 දී ගාල්ලේ තිබූ ස්වර්ණාභරණ හා ඔරලෝසු ව්‍යාපාරය කොළඹට ගෙන ඒමට කටයුතු කළහ. 1950 සිට ජර්මනිය හා අනිකුත් යුරෝපා රටවල් සමඟ සමීප සම්බන්ධතා පවත්වා ගත්තේ මුලින්ම ව්‍යාපාරික අවශ්‍යතා මතය. පණහෙ දශකයේ සිට මරදාන "පී. ජේ . වීරරත්න සහ පුත්‍රයෝ" සමාගම ශ්‍රී ලංකාවට "ස්විස්" ඔරලෝසු ගෙන්වන හා අලෙවි කරන ප්‍රධානම ආයතනය විය.

සැබවින්ම අසෝක වීරරත්න මැතිතුමාගේ තරුණ ජීවිතය අති දක්ෂ වෙළඳ ව්‍යාපාරිකයෙකු වශයෙන් පමණක් නොව, බුදු දහම අකුරට ම පිළිපදින, උසස් ප්‍රතිපදාවක් අනුගමනය කරන අත ගසන හැම කටයුත්තක්ම, ව්‍යාපාරයක් ම පිළිවෙලට නිමා කරන කැපී පෙනෙන ශ්‍රේෂ්ඨ ලක්ෂණ වලින් සමන්විත එකක් විය. කෝටිපති අසෝක වීරරත්න මහතාට තමා සතුව වටිනා ස්වර්ණාභරණ හා ඔරලෝසු ව්‍යාපාරයක් තිබුණි. නමුත් කිසිදිනක රන් මුද්දක් හෝ අත් ඔරලෝසුවක් පැළඳ නැතිබව ඔහුගේ හිත මිතුරෝ පවසති. උපතින්ම හිමි වූ ඉහළම ධන සම්පත් හා කීර්තිය එතුමා නිසරු කොට සැලකීය. තමාගේ සියලු හැකියාවන් ශක්තීන් පාවිච්චි කළේ ලෝකයාගේ හිත සුව පිණිසය. දැහැමින් ධනය උපයා ඒ සමස්ත ධනයම සැබෑ ශාසනික මෙහෙවරක නිස්සරණාධ්‍යාශයෙන්ම වැය කළ දුර්ලභ ගනයේ පින්වතෙකි.

## ධර්මයේ රැකවරණය

"ධම්මො හවෙ රක්ඛති ධම්ම චාරි"

ධර්මයෙහි හැසිරෙන්නා ධර්මය විසින් ම ආරක්ෂා කරනු ලැබේ. දැහැමි දේපොල, ධනය සොබාදහම විසින් රැකදෙයි. වීරරත්න මහත්මාගේ කොළඹ තිබූ වෙළඳසැල කැඩීමට සිව් වරක්ම හොරු පැමිණි බව සඳහන් වෙයි. ඒ හැම අවස්ථාවකම ඔවුන් සැලසුම් කළ දිනට පෙර දින රාත්‍රී මෙතුමාට ඒ බව සිහිනෙන් දර්ශනය වෙයි. ඒ නිසා පහසුවෙන් වෙළඳ සැල රැක ගැනීමට එතුමාට හැකි විය. එතුමාගේ ජීවිතය තළ මෙබඳු ආශ්චර්යමත් සිදුවීම් බොහෝය.

ධර්මය විසින් ධර්මයේ හැසිරෙන්නාව රකිනු ලබයි යන්න බොහෝ ගැඹුරින් සැලකිය යුතු දහම් පදයකි. ධර්මාරක්ෂාව සඳහා මී ළඟ භවය තෙක් බලා සිටිය යුතු නැත. මෙලොවදී ලබන සැනසිලි සුවය, ලෝක ධර්ම විෂයෙහි නොසැලෙන බව, අකම්පිත බව පමණක් නොව විශේෂ පරිශ්‍රමයකින් කටයුතු කරන්නේ නම් මාර්ග-ඵල ආදී ආරක්ෂාවත් ලැබෙයි.

## ජර්මනියේ සම්බුදු සසුන පිහිටුවීම

අසෝක වීරරත්න මැතිතුමාගෙන් සම්බුදු සසුනට සිදුවූ අපරිමිත සේවාවන් අතර ජර්මනියේ සම්බුදු සසුන පිහිටුවීම අතිශයින් අගය කළ යුත්තකි. ආසියාවෙන් යුරෝපයට දිය හැකි උතුම්ම ත්‍යාගය නම් බුදුරජාණන් වහන්සේ දේශිත ශ්‍රී සද්ධර්මය බව අසෝක වීරරත්න මැතිතුමා දැන සිටියේය. පණහේ දශකය නිදහස් චින්තනයෙන් පිබිදුණු බටහිර රටවල් බුදු දහම ගැන දැන ගැනීමේ පිපාසයකින් සිටි බව ඉතා පැහැදිලිය. ලෝක සංග්‍රාම දෙකක් තුළ වේදනා, දුක් පීඩා නොමඳව විඳ දරාගත් ජර්මන් ජනතාවට බුදු දහමේ මූලික සංකල්ප වන කරුණාව, මෛත්‍රිය, සාමය, අහිංසාව ආදී ගුණයන්, පිපාසිතයෙකුට අමා පැන් පොදක් මෙන් චිත්තාකර්ෂණීය වෙයි.

## ශ්‍රී ලංකා - ජර්මන් ධර්ම දූත සංගමය

වීරරත්න මැතිතුමා ව්‍යාපාර කටයුතු සඳහා ප්‍රථම වරට ජර්මනියට ගියේ 1951 වසරේදී ය. භාවනා හා අනිකුත් බෞද්ධ ප්‍රතිපත්ති ප්‍රායෝගිකව ජීවිතයට සම්බන්ධ කර ගැනීමට කැමැත්තෙන් සිටින විශාල පිරිසක් ජර්මනියේ සිටින බව එතුමාට මෙහිදී පෙනී ගියේය. මේ අනුව සම්බුදු සසුන පිහිටුවීමට දහම් පණිවිඩය ගෙනයාමට ජර්මනිය ඉතාමත් උචිත රටක් ලෙස එතුමා තීරණය කළේය.

ආපසු ලංකාවට පැමිණි වීරරත්න මහතා ජර්මනියේ සම්බුදු සසුන පිහිටුවමි'යි අරමුණු කරගෙන තම හිතවතුන් ද ඒ සඳහා යොමු කරගෙන දැඩි අධිෂ්ඨානයෙන් යුතුව 1952 සැප්තැම්බර් 21 වෙනි දින කොළඹ දී ජර්මන් ධර්ම දූත සංගමය පිහිටුවා ගන්නා ලදී. 1972 දී අසෝක වීරරත්න මැතිතුමා පැවිදි බවට පත්වන තුරුම එම සංගමයේ ගරු ලේකම් හා භාණ්ඩාගාරික වශයෙන් මහත් කැපවීමෙන් අති උදාර මෙහෙයක් ඉටු කළේය.

ජර්මනියේ සම්බුදු සසුන ව්‍යාප්ත කිරීම, ඓතිහාසික බර්ලින් විහාරය පාලනය කිරීම ආදී ජර්මනියේ බෞද්ධ කටයුතු භාරව ක්‍රියා කරන්නේ ජර්මන් ධර්ම දූත සමිතියයි. මෙම සංගමයට වර්තමානයේත්, අනාගතයේත් ඒ පිළිබඳ අති විශාල කාර්ය භාරයක් පැවරෙනු ඇත.

## ජර්මනියේ බෞද්ධ භික්ෂු මධ්‍යස්ථානයක් හා විහාරයක්

දෙවන වරට අසෝක වීරරත්න මැතිතුමා ජර්මනියට ගියේ 1953 දීය. ඒ ගමනේදී එතුමා ජර්මනියේ නගර රාශියකට යමින්, එරට බෞද්ධ නායකයින්, හිතවතුන් මුන ගැසෙමින් ජර්මනියේ සම්බුද්ධ ශාසනය පිහිටුවීම ගැන සාකච්ඡා කළේය. ඒ සඳහා දැකුම්කළු, නිහඬ විවේකී පරිසරයක බෞද්ධ භික්ෂු මධ්‍යස්ථානයක් හා විහාරයක් පිහිටුවා ගැනීමට අවශ්‍ය විය. උපාසක පිරිස් සඳහා ද විවේක ස්ථානයක් සෙවිය යුතුවිය. මෙහිදී වෛද්‍ය ඩාල්කේ මැතිතුමා 1924 දී තමා සතු කරගෙන තිබූ අක්කර හයක දර්ශනීය ඉඩම සහිත නිවස "බුඩිස්ට් හවුස්" මිලදී ගැනීමේ අදහස ඇති විය. ශ්‍රේෂ්ඨ බෞද්ධ උපාසකයෙකු යයි කිවහැකි ජර්මන් ජාතික වෛද්‍යවරයෙකු වූ ඩාල්කේ මැතිතුමා, හික්කඩුවේ ශ්‍රී සුමංගල මහ නාහිමියන්ගෙන් ද පාළි භාෂාව හා බුදු දහම දැන උගත් වරින් වර ලංකාවට පැමිණ බුදු දහම හැදෑරූ උතුමෙකි. අට වාරයක් ලංකාවට පැමිණි මෙතුමා පොත පත ලිවීමෙහි ද යෙදුණි. 1925 දී අනගාරික ධර්මපාලතුමා, ඩාල්කේ මැතිතුමාට එතුමාගේ "බුඩිස්ට් හවුස්" හිදී මුණ ගැසී ජර්මනියේ බුදු සසුන පිහිටුවීම ගැන සාකච්ඡා කර තිබේ. ධර්මානුකූලව හොඳින් ජීවිතය හැඩගසාගෙන සිටි මෙතුමා ශ්‍රේෂ්ඨ උපාසකවරයෙකු ලෙස 1928 දී අභාවප්‍රාප්ත විය.

ඩාල්කේ මැතිතුමාගේ නිවස වූ "බුඩිස්ට් හවුස්" හා ඒ ඉඩම මිලදී ගැනීමට ජර්මන් ධර්ම දූත සමිතිය විසින් රුපියල් දශ ලක්ෂයක් එකතු කිරීමේ අරමුදලක් අරඹන ලදී. මීට ලාංකික

සැදැහැවතුන් ද දායක විය. අසෝක වීරරත්න මහතා තමා උපයාගෙන තිබූ මුදල් ද එයට නොමසුරුව එකතු කොට ඩාල්කේ නිවස හා ඉඩම ජර්මනියේ බෞද්ධ කටයුතු සඳහා මිලට ගත්තේය. මෙය ජර්මනියේ ඉහළ වටිනාකමක් ඇති පෙදෙසක ශාන්ත පරිසරයක පිහිටි රමණීය භූමි භාගයකි. ජීවත්ව සිටියදී බෞද්ධ කටයුතුවලට කැප කළ ඩාල්කේ නිවස ඔහුගේ ඇවෑමෙන් බුදු සසුනේ ව්‍යාප්තියට කේන්ද්‍රස්ථානයක් විය. ශ්‍රේෂ්ඨ බෞද්ධ මධ්‍යස්ථානයක් බවට පත් විය.

## ජර්මනියේ සම්බුදු සසුන ස්ථිරසාරව පිහිටුවීම

එදා අනුබුදු මිහිඳුමහ රහතන් වහන්සේ හෙළ දිවට සම්බුදු සසුන ගෙන වැඩියේ පොසොන් පෝ දිනකය. සිංහල බෞද්ධ සංස්කෘතියේත්, ශිෂ්ඨාචාරයේත් උපන් බිම මිහින්තලේ වූයේ එදා සිටයි. 1957 ජූනි 11 පොසොන් පොහොය දින ජර්මනියේ ථෙරවාදි බුදු සසුන පිහිටුවීමේ උදාර කාර්ය භාරය ඉටුකිරීමට ධර්ම දූත කණ්ඩායම ජර්මන් ධර්මදූත සංගමයෙන් පිටත් වූහ. අසෝක වීරරත්න මැතිතුමාගේ අධිෂ්ඨාන ශක්තිය, කැපවීම, දැඩි වීර්යය හා බුද්ධි මහිමය නිසා ඉතා සාර්ථක ලෙස මේ කටයුත්ත ඉටු විය. මුල්ම ධර්ම දූත කණ්ඩායමට පූජ්‍ය සෝම හිමි, පූජ්‍ය බේමින්ද හිමි, පූජ්‍ය විනීත හිමි යන වජිරාරාම වාසී භික්ෂූන් වහන්සේලා තුන් නම සහභාගී වූහ. ධර්ම දූත කණ්ඩායම ජූලි 02 වෙනි දින බර්ලින් විහාරයට සැපත් වූහ.

ජර්මන් ජාතිකයන් පරම්පරා ගණනාවක සිට බුදු දහමෙහි හරයන් හා භාවනා ක්‍රම අවබෝධ කර ගැනීමට උත්සුක වූහ. එයට එක් හේතුවක් වූයේ ෂොපෙන්හවර් වැනි ජර්මන් දාර්ශනිකයෑ ් සිය පොත පත තුළින් බුදු දහම හඳුන්වා දී තිබීමයි.

ජර්මන් ජාතික ප්‍රථම බෞද්ධ භික්ෂූන් වහන්සේ ලෙස හඳුන්වනු ලබන්නේ පූජ්‍ය ඥානාතිලෝක ස්වාමීන් වහන්සේය. 1904 දී මහණ වූ උන්වහන්සේ විදේශිකයන් සඳහා වූ බෞද්ධ භාවනා මධ්‍යස්ථානයක් ලෙස හැඳින්වෙන දොඩන්දූව (පොල්ගස්දූව) ආරණ්‍ය සේනාසනයේ මහණ දම් පුරමින් සාරවත් බෞද්ධ පොත පත ද රචනා කළ සේක. උන්වහන්සේ විසින් විශුද්ධි මාර්ගය, මිලින්ද ප්‍රශ්නය, අඞ්ගුත්තර නිකාය යන පොත්වලට ජර්මන් භාෂාවෙන් පරිවර්තන ග්‍රන්ථ සකස් කළ සේක. තවත් බොහෝ පොත පත රචනය කරන ලද උන්වහන්සේ ජර්මනියේ "බුද්ධඝෝෂ" නමින් හඳුන්වයි.

උන්වහන්සේගේ ශිෂ්‍ය ඥාණපෝණික හිමියෝ ද සතිපට්ඨාන භාවනා ක්‍රමය ආදිය විග්‍රහ කරමින් පොත පත ලියා ඇති විශාරද දැනුමෙන් යුක්ත යෝගාවචර භික්ෂූන් වහන්සේ නමකි. ඥාණාතිලෝක හිමියන් ජර්මන් ධර්මදූත සංගමයේ අනුශාසක වශයෙන් මුලසිටම කටයුතු කිරීම ජර්මනියේ බෞද්ධ කටයුතු සාර්ථක වීමට වඩාත් හේතු විය.

මේ හිමිවරුන්ගේ ශාස්ත්‍රීය කටයුතු වලට අමතරව ජර්මනියේ නගර කිහිපයකම පිහිටුවා ඇති බෞද්ධ සමිතිවල ප්‍රචාරක කටයුතු බෞද්ධ සමිතිවලින් නිකුත් කරන සඟරා හා ග්‍රන්ථ ආදිය ද, ජර්මන් ප්‍රජාව බුදු දහම වෙත යොමු කිරීමට හේතු වී ඇත.

බුදු දහමේ ඉගැන්වෙන භාවනා ක්‍රම හදෑරීමට හා ප්‍රගුණ කිරීමට ජර්මන් ජනතාව වැඩි රුචියක් දක්වයි.

### වත්මන් තත්ත්වය

මීට අවුරුදු හතළිස් පහකට පෙර අසෝක වීරරත්න වීරවරයා ආරම්භ කළ ජර්මනියේ සම්බුදු සසුන ස්ථාපිත කිරීමේ කාර්යය භාරය අද එල දරා ඇති අයුරු ඉතාමත් පැහැදිලිය.

ජර්මන් බෞද්ධ භික්ෂු මධ්‍යස්ථානය හා විහාරය (බර්ලින්) එදා සිට අද වනතුරු ජර්මන් බෞද්ධයන්ට වැඳුම් පිදුම්, බණ දෙසුම්, භාවනා ක්‍රම ආදිය බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ අනුශාසකත්වය ඇතිව පවත්වාගෙන යාමට සුදුසු පරිසරයක් හා ආයතනයක් බවට පත්ව තිබේ. මේ නිසා ශ්‍රී ලංකාවත්, ජර්මනියත් අතර පමණක් නොව වෙනත් සමීප රටවල් සමඟත් ස්ථිර බෞද්ධ සබඳකම් ගොඩ නැගීමට හේතු වී ඇත.

අසෝක වීරරත්න මැතිතුමාගේ ඥාතීන් හා හිතවතුන් මේ කටයුතු ඉතා සාර්ථක ලෙස අදත් පවත්වාගන යන අතර ඔවුන් අනාගතයේදී ද එම වගකීම් සමුදාය එසේම උසුලනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

## ලෝකය රහතුන්ගෙන් නොහිස් බව

1961 අප්‍රියෙල් 12 දා මොස්කව් වේලාවෙන් උදෑසන 9.07 ට උඩු ගුවන බලා ඇදී ගිය වොස්ටොක් 1 යානයෙන් ලෝකය වටා එක් වරක් කරකැවී උදෑසන 10.55 ට **යූරි අලෙක්සියේවිච් ගගාරින්** නිරුපද්‍රිතව තමන්ගේ මවු බිමට පා තැබුයේ මානව සංහතියේ ශ්‍රේෂ්ඨතම ඉදිරි පියවරක් තබපු ගෞරවනීය පුද්ගලයා හැටියටයි. මේ යෝධ පිම්ම, මේ අසිරිමත් අවස්ථාව දැක බලා ගන්න කෝටි සංඛ්‍යාත මිනිස්සු රූපවාහිනි වටා එක් රොක් වූහ. සමස්ත ලෝක වාසීහු සතුට දරා ගන්න බැරුව කඳුළු සැලූහ. කුඩා රුසියානු දැරියන් මේ වීරයාගේ දෙපා මල් කළඹින් සැරසීය.

නමුත් . . . . . මේ ඓතිහාසික සිදුවීම අසෝක වීරරත්න නමැති බෝධි සත්ත්ව උතුමාගේ සසර භාවිත බෝධි ඥානය වසා සිටි අඳුරු වළා පටලය පහ කරන්ට හැමූ කුණාටුවක් වීම කෙතරම් අසිරිමත්ද?

ශ්‍රේෂ්ඨ තරණය අභ්‍යවකාශ තරණය නොවෙයි. **සසර තරණය** බව මේ උතුමාට වහා වැටහිණ. සර්වඥයන් වහන්සේගේ නිර්මල ශ්‍රී සද්ධර්මය අපට ලැබී ඇත. අවශ්‍ය වන්නේ ශීලයෙහි පිහිටා වීර්යයෙන් අත් නොහැරම විදසුන් වැඩීමයි. මේ ජීවිතයේදී ම ධ්‍යාන, මාර්ග ඵල ලැබිය හැක.

බුදුරජාණන් වහන්සේගේ දේශනාව අනුව ශ්‍රාවක පිරිස අප්‍රමාද විය යුතුය. ශීලයෙහි පිහිටා භාවනා වැඩිය යුතුය. එවිට ලෝකය රහතුන්ගෙන් හිස් නොවේ 'යයි එතුමාට කල්පනා විය.

**"ඉමෙච සුභද්ද, භික්ඛු සම්මා විහරෙය්‍යුං අසුඤ්ඤො ලොකො අරහන්තෙහි, අස්සාති"**
**මහා පරිනිබ්බාන සූත්‍රය**

මේ සඳහන් වන්නේ ඒ බවයි.

මෙකල මග-පල ලැබීම දුර්ලභව ඇත. හේතුව ඒ සඳහා දිවි කැප නොකිරීමයි. අප්‍රමාදීව, අත් නොහැර නොකඩවා භාවනා කිරීම දුර්ලභ වීමයි.

නවීන විද්‍යාවේ, භෞතික ලෝකයේ හාස්කම්වලට වීරරත්න මැතිතුමා මුළා කිරීමට නොහැකි විය. අවිඳු අඳුරේ ගැලී නිසරු දේ සරු ලෙස ගන්නා අය කෙරේ එතුමාගේ අනුකම්පාව හා කරුණාව නිතැතින් යොමු විය. ඒ නිසාම ඔවුන් ද සසරින් එතෙර කරවීමේ බෝසත් සිරිත එතුමා තුළ ක්‍රියාත්මක විය. මෙතුමාගේ නිස්සරණ වැඩ පිළිවෙල තමන් මතු නොව අනුන් ද සසරින් එතෙර කරවීමට ය. මගේ ධනය සම්පූර්ණයෙන්ම සම්බුදු සසුනේ දියුණුව සඳහාය යනු එතුමාගේ පැතුම හා ක්‍රියාව ද විය.

අසෝක වීරරත්න මැතිතුමා තුළ ජර්මනියේදී උපන් මේ ධාර්මික අදහස් දිනෙන් දින ප්‍රබල අධිෂ්ඨාන ශක්තියක් ද සමඟ පෝෂණය වන්ට විය.

### මෑණියන්ගේ සහාය

ලංකාවට පැමිණි අසෝක වීරරත්න මහතා තම අදහස මෑණියන්ට විස්තර කළේය. නිවන් අවබෝධය සඳහා සප්පාය සෙනසුනක් ගොඩ නැගීමේ තම අදහස ද ඉදිරිපත් කළේය. මග-පල-නිවන් ලැබීමට අරි අටඟි මග ගමන් කිරීමට සම්බාධ රහිත යෝග්‍ය අරණ්‍ය සේනාසනයක් තිබීම අවශ්‍ය වෙයි. තම පුතුගේ සාසන මාමක උදාර අදහසට ගුණ නැණ පිරි මෑණියන්ගෙන් ලැබුණේ අපේක්ෂා නොකළ ප්‍රමාණයේ දිරි ගැන්වීමකි. සම්බුද්ධ ශාසනය වෙනුවෙන් තමා සතු සියලු ධනය වැය කිරීමට වුව එතුමිය කැමැත්ත ප්‍රකාශ කළාය.

### පා දූවිල්ලක් සේ සියල්ල අත්හැර

අසෝක වීරරත්න මහතා අධිෂ්ඨානශීලි හැඟීමෙන් තම සොහොයුරු හමු විය. දෙදෙනා සහයෝගයෙන් ගෙනගිය ව්‍යාපාර කටයුතු සම්පූර්ණයෙන් භාරගෙන කරගෙන යන ලෙස සොයුරාගෙන් ඉල්ලා සිටියේය. තමා මින් පසු කිසිම ලෞකික වැඩක නො යෙදෙන බව ඔහු කියා සිටින්ට විය. මුළු ජීවිත කාලයම මාර්ග-ඵල ලබා ගැනීම සඳහා වීර්ය කරනු හැර භාවනාවට අනුරූප කටයුතු මිස වෙනත් පින්කම් ආදිය වුනත් නොකරන බව එතුමා තරයේ ම කියා සිටියේය.

වැඩිමල් සොහොයුරු ධර්මසේන වීරරත්න මහතා මලනුවන්ගේ මේ නිස්සරණ අදහසට වැඩි කැමැත්තක් දැක්වූයේ නැත. ඒ නිසා සොහොයුරන් අතර මේ අරමුණු කරගෙන වරින් වර "වාග් ප්‍රහාර" ඇති වුනත් අසෝකයන් කිසිවිටක තම අදහස අත් හැරීමට කැමති නොවීය.

තම මතයෙහි අචලව ස්ථිරසාරව දැඩි අදිටනෙහි පිහිටා සිටි අසෝක වීරරත්න මහතා අගනුවර මරදානේ තමන් සතුව තිබූ ලක්ෂ ගණන් අගනා ස්වර්ණාභරණ හා ඔර්ලෝසු වෙළඳ ව්‍යාපාරය පා දූවිල්ලක් සේ අත්හැර දැමූහ. ශෝකයක් නූපදනා පරිද්දේන්ම පරිත්‍යාග කළේ, හේ නමට අනුරූපව ම "අසෝක" විය.

### නිස්සරණ අදහස ක්‍රියාත්මක කළ හැටි

ක්‍රම ක්‍රමයෙන් එකින් එක තම අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගනිමින් වීර්යයෙන් ඉදිරියට යන අසෝක වීරරත්න මහතාට දැන් ජයගත යුතු ප්‍රධාන අභියෝග දෙකක් විය. ජීවිතාන්තය දක්වා මහණ දම් පිරීමට සුදුසු වන සෙනසුනක් සොයා ගත යුතු විය. එපමණක් නොව සුදුසු කර්මස්ථානාචාර්ය ස්වාමීන් වහන්සේ නමක් ද අත්‍යවශ්‍ය වෙයි. මේ පරමාර්ථයන් සපුරා ගැනීමට එතුමා රට පුරා ඇවිද්දේය. කුසට හරි හැටි අහරක්, නෙතට නින්දක්, කයට සැප විහරණයක් නැතිව මේ ගිය ගමන් ගැන ඉතා හොඳින් දන්නා පුද්ගලයෙකි. ඒ එවක එතුමා ළඟින්ම සිටි ඒ හැම ගමනකට ම සහභාගී වූ දැනට පැවිදිව මීතිරිගල නිස්සරණ වන සෙනසුනෙහි වැඩ වසන පූජ්‍ය මීතිරිගල ධම්මචාරී ස්වාමීන් වහන්සේය. ඉතා රසවත්, ඉතා වැදගත් අනුවේදනීය අතීත තොරතුරු මහා රාශියක් උන්වහන්සේගෙන් අසා දැනගත හැකිය.

අසෝක වීරරත්න වීරයා තුළ මුලින්ම නිස්සරණ අදහස පහළ වූයේ ජර්මනියේ දී බව අපි දනිමු. එය වැනෙන එකක් නොව ප්‍රබල අධිෂ්ඨාන ශක්තියකින් ගොඩ නැගුනකි. කාලයත් සමඟ එතුමාගේ චිත්ත සන්තානය තුළ මේ අදහස් ක්‍රමානුකූලව හැඩ ගැසෙන්ට විය. සසර දුකින් මිදීමේ පිළිවෙත් මග සකස්කර ගත්තොත් ඒකාන්තයෙන් නිවන් සාක්ෂාත් කළ හැකිය. මෙබඳු ශ්‍රේෂ්ඨ කාර්යයක් තනිව කළ යුතු නැත. තවත් අයට අවස්ථාව දිය යුතුය. ඒ අනුව

බොහෝ දෙනාට හිත වැඩ සලසා ගත හැකි සෙනසුනක් ඉදිකළ යුතු යයි එතුමා තීරණය කළේය.

## අසිරිමත් හමුවීම

බොරැල්ලේ ජර්මන් ධර්ම දූත ආශ්‍රමය වීරරත්න මහත්මාට "මහගෙදර" වගේ උතුම් තැනක්. එහිදී 1964 වර්ෂයේ දිනක රාත්‍රී 8.00 ට පමණ අති පූජ්‍ය මාතර ශ්‍රී ඥානාරාම හිමියන් හමුවීම දෛවෝපගත අසිරිමත් හමුවක් ලෙස එතුමා සඳහන් කරයි. දෙදෙනා කළ සාකච්ඡාවට මාතෘකාව වූයේ මේ ජීවිතයේදීම ධ්‍යාන-මාර්ග-ඵල ලබාගැනීම ගැනයි. "අප දෙන්නට මේ උතුම් ලෝකෝත්තර වැඩ පිළිවෙල හෙට ඉඳලම පටන් ගන්න පුළුවනි" මාහිමි වදන උන්වහන්සේ තුළ ඇති වූ ප්‍රීති ප්‍රමෝදය, අධිෂ්ඨානය, කැපවීමේ කැමැත්ත පෙන්නුම් කරයි. දැන් වීරරත්න මහත්මාගේ එක් පරමාර්ථයක් ඉටු වී හමාරය. සුදුසුම කර්මස්ථානාචාර්යවරයා එතුමාට හමු විය. දැන් අවශ්‍ය වන්නේ සප්පාය සෙනසුනකි.

දිවයිනේ ඈත එපිට නොයෙක් ස්ථානවලට එතුමා මාහිමියන් කැටුව ගියේය. හුදකලාව ගියේය. අති දුෂ්කර මහත් සේ විඩා ගෙනදෙන ස්ථාන වලට ද ගියේය. කළුගල, අරන්කැලේ, නිකවැරටියට මඳක් දුරින් පිහිටි නාගම්සෝලේ, නාථගනේ වැනි බොහෝ තැන්වලට ගියේ නොයෙක් දුක් හිරිහැර විඳ දරා ගනිමිනි.

අවසානයේ එතුමාගේ බලාපොරොත්තු පිරිදිම සියලු දෙයින් පරිපූර්ණ මීතිරිගල රක්ෂිත වනය හමුවිය.

## මීතිරිගල රක්ෂිතය, නිස්සරණ වන සෙනසුන වීම.

අගනුවරට සැතපුම් තිහක් පමණ දුරින් පිහිටි මීතිරිගල මූකලාන රමණීය වන පියසකි. වීතරාගී උතුමෝ පවා සොබා දහමේ නොකිලිටි සුන්දරත්වය අගය කළහ. බුදුරජාණන් වහන්සේ පවා චාපාල චෛතිය වැනි රමණීය තැන් වර්ණනා කර ඇත. තියුණු ඉඳුරන් ඇති, විනිවිද දකින නුවණක් ඇති රහතන් වහන්සේ කිසිවක් උපාදාන නොකරයි. නමුත් ගලා ඇද හැලෙන දිය ඇල්ලක, වහින වැස්සේ, මහ මුහුදේ ගලන ගඟේ සැබෑ සුන්දරත්වය දුටු සේක. යෝගාවචරයාට සොබා දහම බණ පොතක පත් ඉරු වැනිය.

වීරරත්න මහතා සොබා දහමේ සැබෑ සුන්දරත්වය වින්දනය කළ හැකි සංවේදී රසඥතාවයක් හා මුදු මොලොක් හද ඇත්තෙකි. එතුමාට අවශ්‍ය වූයේ සැබෑ සුන්දරත්වයකින් පිරි නිහැඬි විවේකී පරිසරයකි. දිය ඇළි, ඇළ දොළ කඳුවැටිවලින් දැකුම්කලු වූ හුදකලා වාසයට යෝග්‍යය දර්ශනීය පෙදෙසකි. මීතිරිගල රක්ෂිත වනය වීරරත්න මහතාට පමණක් නොව මහෝපාධ්‍යායාය හිමියන්ට ද අවශ්‍ය වැඩ සටහනට අතිශයින් ගැලපෙන බව හැඟුනි.

මේ නිසා මීතිරිගල රක්ෂිත වනයෙන් අක්කර 500 ක් බද්දට ගැනීමට එවක අගමැතිනි ගරු සිරිමාවෝ බණ්ඩාරණායක මැතිණිය එකඟ කර ගැනීමට වීරරත්න මහතා සමත් විය. මෙයට නිළධාරී වාදය හරස් වීමෙන් ඇති වූ බාධක එතුමා වීර්යය, අධිෂ්ඨාන ශක්තිය, දැඩි කැපවීම නිසා ජයගෙන තම උදාර අභිමතාර්ථය ඉෂ්ඨ සිද්ධ කර ගැනීමට දක්ෂ විය.

තම අනාගත දර්ශනය සැබෑවක් වන බවට පෙර නිමිති දකින වීරරත්න මහතා 1964 පෙබරවාරි 12 වෙනි දින තම පුද්ගලික ධනය වැයකර අත් කරගත් මේ සුන්දර වන රජ දහන යෝගාවචර කෙම් බිමක් කරන්ට කුටි ඉදි කිරීම ඇරඹුවේය.

මේ වනවිට මෙතුමාට උතුම් අදහස් ඇති සත් පුරුෂ පිරිසක් ද එක්ව සිටියහ. මේ වකවානුවේ මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන් වහන්සේ වැඩ සිටියේ නාථගනේ අරණ්‍ය සේනාසනයෙහි ය. ඒ නිසා එහි කුටි දෙකක් සෑද වූ වීරරත්න මහතා සත් පුරුෂ උතුමන් තිදෙනෙකු මාහිමිපාණන් ඇසුරෙහි භාවනා පුහුණුවට යවන ලදී.

මෙතුමාට දිගින් දිගට ආ බාධක, කරදර අපමණය. නමුත් ඒ කිසිවකින් පසුබට නොවී අප්‍රතිහත ධෛර්යයෙන් ඉදිරියට ම ගිය වීරරත්න මහතාට 1967 වනවිට නිස්සරණ වැඩ පිළිවෙල ආරම්භ කිරීමට හැකි විය.

## අතීතයෙන් ආදර්ශයක්



කාශ්‍යප සම්බුදු සසුනේදී නිවන් පතා මහත් වෙර වැඩූ
යෝගාවචරයින් වහන්සේලා හත් නම
1967-නිස්සරණ වනයේ විශ්‍රාම ශාලාවේ බිත්තියේ ඇඳ ඇති චිත්‍රය

අසෝක වීරරත්න නමැති සුදු පියුම විකසිත වුනේ ගගාරින් නමැති හිරු එළිය වැටීමෙනි. එම ඓතිහාසික ජයග්‍රහණය මෙතුමා තුළ සැඟවී පැවති සසර භාවිත චිත්ත සන්තානය වහා විකසිත කළේය. නමුත් ඒ සුදු පියුමට සුවඳ දුන්නේ අති ශ්‍රේෂ්ඨ අතීත ආදර්ශයකි. එම සිත් ඇද බැඳ ගන්නා කතා පුවත මීතිරිගල නිස්සරණ වනයේ විශ්‍රාම ශාලාවේ 1967 දී අඳින ලද බිත්ති චිත්‍රයකින් පෙන්නුම් කරයි.

කාශ්‍යප සම්මා සම්බුදු පියාණන් වහන්සේගේ සසුන පිරිහෙන අවදියකි. අද අද නිවන් දකිම්'යි ශ්‍රේෂ්ඨ භික්ෂූන් වහන්සේලා හත් නමක් දිවි නොතකා කළ යෝධ වෑයමකි. මේ අතීත ආදර්ශය එතුමා තුළ ප්‍රබල ලෙස සටහන් විය.

## අදහස් ඉටුවීම

1967 ජූලි නිස්සරණ වනයට මංගල මාසයකි. ජූලි 13 වෙනි දින අති පූජ්‍ය මාතර ශ්‍රී ඥානාරාම මාහිමියන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා සිව් නමක් සෙනසුනට වැඩම කළහ. මහ සඟ රුවන හැත්තෑ නමකට පමණ එදින නිස්සරණ වනයේ මහා දානයකි. ඒ මංගල ආරම්භයයි. ප්‍රථම වස් එළඹීම හා ශ්‍රේෂ්ඨ භාවනා වැඩ පිළිවෙළේ ආරම්භයත් සිදු වූයේ ජූලි 22 දිනයෙහි ය.

හැම දෙයක් ම ඉතා සියුම් ලෙස සොයා බලා සැලසුම් කිරීමට සහජ දක්ෂතාවයන් වීරරත්න මහතා තුළ විය. විටක එතුමා දක්ෂ විනිශ්චයකාරයෙකු මෙන් විය. සෙනසුන පිහිටුවා අවුරුදු තිස් පහක් ගතවී ඇතත් අද ද මීතිරිගල නිස්සරණ වනය යෝගාවචර කෙම් බිමක්, ශ්‍රේෂ්ඨ භාවනා මධ්‍යස්ථානයක් ලෙස මහේශාක්‍යව බබලන්නේ එතුමාගේ අනාගත දර්ශනය හා බැඳුනු නිවැරදි සැලසුම් නිසාය.

**මහජන අදහස්**

එදා නිස්සරණ වනයේ මංගල පින්කම් දිනයට රටේ දස දිගින් ජන ගංඟාවක් ගැලූ හැටි අපට මතකය. මේ වගේ ශ්‍රේෂ්ඨ කර්තව්‍යයක් කළ ඒ සිටුතුමා, ධන කුවේරයා, මහා පින්වතා කවුදැයි දකින්ට, එතුමාගේ කටහඬ අහන්ට ජනතාව පුල පුලා බලා සිටියෝය. තවත් කෙනෙක් උත්තම හාමුදුරුවෝ, කමටහන් දෙන, භාවනා උගන්වන හාමුදුරුවෝ කවුදැයි විමසිලිමත් වූහ.

**අසෝක වීරරත්න මහතා**

"ඔහු මීතිරිගල නිස්සරණ වනය නමැති අති විශිෂ්ඨ ආයතනයේ නිර්මාතෘවරයා පමණක් නොවේ. තමාගේ ම සංසාර විමුක්තිය සාක්‍ෂාත් කර ගැනීමේ අධිෂ්ඨානයෙන් යුතු සැබෑ නෛෂ්ක්‍රම්‍යයක් කිරීමෙන් ලෝකයාට විශිෂ්ඨ ආදර්ශයක් ද දීමට සමත් විය"

**1968 "ඩේලි නිව්ස්" පුවත්පත**

**මීතිරිගල නිස්සරණ වනය**

"සතර මග ඵල ලබනු සඳහා ඇතුළුවන මහ දොරක් වැනි මීතිරිගල නිස්සරණ අරණ පහළ වී ඇත්තේ පිරිහී යන බුදු සසුන යළි නගා සිටුවීමට කාලයා විසින් ඇති කරන ලද වුවමනාව නිසා යයි හැඟේ".

**1968 ඔක්තෝම්බර් 28 ලංකාදීප පුවත්පත.**

**නිස්සරණ වනයේ වැඩ පිළිවෙල**

"මීතිරිගල නිස්සරණ වනයේ ක්‍රියාත්මක කෙරෙන උදාරතම පංච ප්‍රතිපත්තිය සලකා බලනවිට මෙම ආරණ්‍යයෙන් ඇත්තවශයෙන්ම ධ්‍යානලාභී, අභිඥාලාභී, මාර්ගඵල ලාභී ආශ්චර්ය පුද්ගලයන් යළිත් මේ ධර්ම ද්වීපයේ පහළව මුළු මහත් ලෝකයම ධර්මාලෝකයෙන් ඒකාලෝක කරන බව සක් සුදක් සේ පැහැදිලි බව එම අරණ්‍ය තුළ සැරිසැරීමේදී අප තුළ පහළ වූ නිසැක අදහසකි"

**1968 ඔක්තෝම්බර් 31 දින දවස පත්‍රය**


නිස්සරණ වනයේ එදා පැවති මංගල පින්කම් මාලාව ඇසින් දුටුවෝ මෙසේ උදාන පහළ කළෝ.

**පැවිදිවීම**

පූජ්‍ය මීතිරිගල ධම්මනිසන්ති යනු උන්වහන්සේගේ පැවිදි නාමයයි. ඇත්ත වශයෙන්ම උන්වහන්සේ මීතිරිගලට අයිති වස්තුවක් නොවේ. නිස්සරණ වනයට ඇති ඉමහත් ගෞරවය

නිසා සදේවක ලෝකයාගේ සාධුකර මැද පින්වත් අසෝක වීරරත්න මැතිතුමා "**මීතිරිගල ධම්මනිසන්ති නමින් 1972 අගෝස්තු 22 වෙනි දින** පැවිදි බවට පත් විය. නිස්සරණ වනය ආරම්භ කළ වකවානුවේම පැවිදි වීම එතුමාගේ බලවත් අධ්‍යාශය විය. නමුත් එතුමා වටා වැට බැඳි පළිබෝධ සිඳ බිඳ දැමීමට මෙසේ කලක් ගත විය.

පූජ්‍ය මීතිරිගල ධම්මනිසන්ති හිමියන් මීතිරිගල නිස්සරණ වනය ගොඩ නැගුවේ තමන්ගේ කාලය, ධනය, ශ්‍රමය ආදී අපමණ කැප කිරීම් තුළිනි. නිස්සරණ වනය, යෝගාවචර කෙම් බිමක් කරන්ට උතුම් කම්මට්ඨානාචාර්යයන් වහන්සේ නමක් තෝරා ගත්තේ ඉතා සුපරික්ෂාකාරීවය. මේ ජීවිතයේදී ම මග-ඵල-නිවන් ලැබීමේ පවිත්‍ර උත්කෘෂ්ඨ අභිමතාර්ථයත් උන්වහන්සේ තුළ විය. සියලු කැප කිරීම් හා බුද්ධි පරිපාකයත් නිස්සරණ වනයේ විවේක සුවයත්, මහෝපාධ්‍යායාය හිමියන්ගේ පා සෙවනත් තුළින් අභිමතාර්ථ සාධනය කරන්ට ඇතැයි විශ්වාස කරනු ලැබේ. ධම්මනිසන්ති හිමියන් බිහි කළ තවත් පුණ්‍යායතන ඇත. නමුත් උන්වහන්සේගේ ජීවිතය හා සෘජු සම්බන්ධතාවයක් ඇති එකම ස්ථානය මීතිරිගල නිස්සරණ වනයයි.



මීතිරිගල නිස්සරණ වනයේ

***පූජ්‍ය මීතිරිගල ධම්මනිසන්ති හිමියන්ගේ කුටිය අබියසදී.***

වමේ : පූජ්‍ය කටුකුරුන්දේ ඤාණානන්ද හිමිපාණන් වහන්සේ.

දකුණ : පූජ්‍ය මීතිරිගල ධම්මනිසන්ති හිමිපාණන් වහන්සේ.

මුල් අවදියේ යෝගාවචර භික්ෂූන් වහන්සේලා උදෙසා කුටි 15 ක් ස්ථිර ගොඩනැගිලි ලෙස ඉදි විය. සැප සම්පතින් ආඪ්‍ය ජීවිතයකට උපතින් ම උරුම කී ධම්ම නිසන්ති හිමියන් තමා වෙනුවෙන් ඉදිකරගෙන තිබුණේ පොල්අතු සෙවිලි කළ, කටුමැටි බිත්තියෙන් හා ගොම මැටි ගාන ලද ගෙබිමෙන් යුත් වූ චාම් වූ පුංචි කුටියකි. මුල් කාලයේ මෙහි සර්පයන් ද බහුල විය. මේ නිසා විශේෂයෙන් මහෝපාධ්‍යයාය හිමියන්ගේ මැදහත් වීමෙන් නිහතමානීත්වයේ හා යෝගාවචර ජීවිතයක ප්‍රති මූර්තියක් බඳු මේ පුංචි කුටිය වෙනුවට ස්ථිර කුටියක් උන්වහන්සේ සඳහා ද ඉදි විය.

තමන්ගේ ම නිර්මාණයක් වුවත් නිස්සරණ වනය ගැනවත් උන්වහන්සේට මමත්වයක් තිබුණේ නැත. අල්පේච්ඡව, නිහතමානීව, නිහඬව, නිබඳව ශීල, සමාධි, ප්‍රඥා වැඩීමෙහි උත්සුක වූ සේක. අපවත් වනතුරුම නිස්සරණ වනයෙහි ම එකලා ජීවිතයක් ගතකළ ශ්‍රේෂ්ඨ සංඝ පීතෘන්වහන්සේ නමකි.

## දුර්ලභ දේශනයක්

ඒ 1991 අප්‍රියෙල් 28 වන දා පුර පසළොස්වක පොහොය දිනයයි. මීතිරිගල නිස්සරණ වන සෙනසුනේ ප්‍රධාන කම්මට්ඨානාචාර්ය උතුමාණන් වූයේ අති පූජ්‍ය මාතර ශ්‍රී ඤාණාරාම මහෝපාධ්‍යායාය මාහිමිපාණන් වහන්සේය. උන්වහන්සේ එදින නේවාසික යෝගාවචර භික්ෂූන් වහන්සේලා අමතා කළ විශේෂ දේශනයකි.

**"එදින පටන් අවුරුද්දක කාල සීමාවක් තුළ දැඩි වීර්යයෙන් යුතුව විදර්ශනා භාවනාවේ යෙදිය යුතුය. ධ්‍යාන-සමාධි-මග-ඵල ලැබීමට වෑයම් කළ යුතුය. විවේක නිඃශ්‍රිතව විසිය යුතුය. පොත පත කියවීම, උපාසක පිරිස් සමඟ කතාබහ කිරීම ආදී ඇසුරු කිරීම් සම්පූර්ණයෙන් නැවැත්විය යුතුය"**

මෙබඳු ආකාරයේ එදා උන්වහන්සේ කළ ඒ දුර්ලභ අනුශාසනය ධම්ම නිශන්ති හිමියන් තවදුරටත් වඩ වඩාත් නිස්සරණාධ්‍යාශයටත්, දැඩි වීර්යයෙන් භාවනා කිරීමටත් පොළඹවා ඇත.

මින් කලකට පසු පූජ්‍ය මීතිරිගල ධම්මනිසන්ති ස්වාමිපාදයන් වහන්සේ **"මරණය"** ගැන හා **තමන්ගේ අවසන් කටයුතු සිදුවිය යුතු** ආකාරය ගැන ලියා ඇති ලියවිල්ල බෞද්ධ සමාජයට ප්‍රබල ආදර්ශයක් ඉදිරිපත් කරයි.

"මගේ දැක්ම පරිදි බෞද්ධයෙකුගේ අවමඟුල් කටයුත්තක ගෞරවනීය ආකාරය ඇතිවන්නේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන බෞද්ධ සංකල්පයන් සංකේතවත් වන පමණටය. නමුත් අද ගිහි අයගේ පමණක් නොව පැවිදි පක්ෂයේ අවමඟුල් කටයුතුවලදී පවා මේ බෞද්ධ සංකල්ප ගැන නොසැලකීම ඉතාම කණගාටුදායක ය. අද දැකිය හැක්කේ මංගල උත්සවයක වාතාවරණය මවා පෑමට ගන්නා උත්සාහයකි. මේ දර්ශනය මරණය පිළිබඳ ගරු බුහුමන් දැක්වීමක් නම් නොවේ."

මෙසේ අද අවමඟුල් කටයුතු කෙරෙන ආකාරය අප්‍රසාදයෙන් බැහැර කරන ධම්මනිසන්ති හිමියන් තමන් වහන්සේ අපවත් වීමෙන් පසු ඥාති හිත මිත්‍රාදි ගිහි පැවිදි අය ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලිව සටහන් කර ඇත.

## අවසන් කටයුතු ගැන

"මරණය සිදු වී පැය 24 ක් ඇතුළත ඉතාම අඩු වියදමකින් ශරීරය ආදාහනය කළ යුතුය. අනිවාර්යයෙන්ම උත්සව අලංකාර වලින් තොර විය යුතුය. ශරීරය බෙහෙත් ගල්වා (එම්බාම්) සකස් නොකළ යුතු වෙයි.

අඩු තරමින් ගොක්කොළ සැරසිල්ලක්වත් කැමති නොවූ උන්වහන්සේ මල් වඩම්, කොඩි බැනර්, මරණ දැන්වීම් පත්‍රිකා ද සම්පූර්ණයෙන් බැහැර කර ඇත. පුවත්පත්, ගුවන් විදුලිය ආදී ජන මාධ්‍යයන්ගෙන් ප්‍රචාරය නොකළ යුතුයයි දක්වා ඇත.

"මේ අනවශ්‍ය දෙයින් තොර වූ ආදාහනය මට කරන ඉහළම ගෞරවයක් සේ මම සලකමි"

**"*Afarewell Tribute*" රංජිත් අමේන්ද්‍ර මහතාගේ ලිපිය (32 පිට)**

## අපවත් වීම

ශ්‍රී ලංකාවට පමණක් නොව යුරෝපයේ සම්බුද්ධ ශාසනය නගා සිටුවීමටත් අමරණීය සේවාවක් කළ පූජ්‍ය මීතිරිගල ධම්මනිසන්ති හිමිපාණන් වහන්සේ 1999 ජූලි මස 02 දින අපවත් වූ සේක. ඒ වනවිට උන්වහන්සේගේ වයස අවුරුදු 80 ක් විය. ශ්‍රී දේහය පිළිබඳ අවසන් කටයුතු උන්වහන්සේගේ කැමැත්ත පරිදි එලෙසම ඉටු කරන ලදී. මේ ශ්‍රේෂ්ඨ සංඝ පීතෲන්වහන්සේ අපවත් වූ බව මහජනතාව දැන ගත්තේ අවසන් කටයුතු සිදු කිරීමෙන් පසුවය.

## තෙමස් පිංකම

1999 ඔක්තෝම්බර් 03 දිනට පූජ්‍ය මීතිරිගල ධම්මනිසන්ති හිමියන් අපවත් වීමෙන් තෙමස පිරෙන දිනයයි. එදින උන්වහන්සේගේ අසීමිත ගුණස්කන්ධය ආවර්ජනය කිරීමට ඥාති මිත්‍ර දායක කාරකාදී හිතවත් පිරිස අමතක කළේ නැත.

එපමණක් නොව එදින මීතිරිගල නිස්සරණ වනයේ පණස් නමකට අධික මහා සංඝයා වහන්සේලා විෂයෙහි සපිරිකර සංඝ දක්ෂිණාවක් පිරිනමා උන්වහන්සේට පින් පමුණුවන්ට යෙදුණි. මීතිරිගල ශ්‍රී ඥානාරාම ධර්මායතනයේ ප්‍රධානාචාර්ය අති පූජනීය දේවගොඩ මංගලසිරි මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ හා ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සංඥා ලේඛකාධිකාරී අති පූජ්‍ය නාඋයනේ අරියධම්ම මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ද මේ පින්කමට සහභාගී වූ සේක.

## සියපත් සුවඳ

නිස්සරණ වනයේ චිර පැවැත්ම, ආරක්ෂාව නුවණින් සලකා බැලූ පූජ්‍ය ධම්මනිසන්ති ස්වාමීන් වහන්සේ, තමා සතුව පැවති බලතල සියල්ල 1980 ජනවාරි 01 වෙනි දින නිශ්ශරණාධ්‍යාශයෙන්ම ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවට පවරා දුන් සේක.

අසීමිත චිත්ත ශක්තියක් සහ අධිෂ්ඨාන ශක්තියක් ඇති මිනිස්සු සියපත් මෙන් ගොහොරු මඩෙන් ඉඳහිට මතුවෙති. ඔවුහු ප්‍රභාවත් ව සිය ජීවන සුවඳ පතුරවන විට සියවස් ගණනාවක් මේ මිනිස් ලොව සුවඳවත් මිනිසුන් තව තවත් බිහි වෙනවා ඇත.

සිය ආත්ම ශක්තියේ සහ තිර අදිටනෙහි එලයන් මතුකර ගත් උතුම් මිනිසෙකු ගේ ශ්‍රේෂ්ඨ ජීවන සුවඳ අනාගත පරපුරක නිස්සරණය සඳහා මීතිරිගල නිස්සරණ වනයේ රඳවා ඇත.

කිසිවිටක ඇඟ වූයේ නැතත් ඒ සියපත් සුවඳ තුළ උතුරු මිනිස් ගුණ සුවඳ මුසු බවක් අපට දැනෙන්නේ සාධු සිරිතක ආදර්ශය හද සන්තානයේ රඳවමිනි.

# 10

## මීතිරිගල මිණි පහන

අති පූජ්‍ය මීතිරිගල ශ්‍රී ඤාණාරාමාභිධාන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහෝපාධ්‍යායය වූ සේක. ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධානාචාර්ය වූ සේක. මීතිරිගල නිස්සරණ වනයේ ආරණ්‍ය සේනාසනාධිපති හා ප්‍රධාන කර්මස්ථානාචාර්ය වූ සේක. මීතිරිගල ශ්‍රී ඥානාරාම ධර්මායතනයේ ප්‍රධාන අනුශාසක වූයේ ද උන්වහන්සේය. **මේ සියලු පදවි ස්ථානාන්තර වලින් පෙන්නුම් කළේ මේ උත්තමයාණන් වහන්සේ දිගු කලක් සම්බුද්ධ ශාසනයට කළ අති උදාර මෙහෙවරයි.**

### යෝගාවචර ජීවිතය

ලෝකයේ ශ්‍රේෂ්ඨම ජීවිතය යෝගාවචර ජීවිතයයි. ධර්මය නොදන්නා අය යෝගාවචර ජීවිතය ආත්මාර්ථකාමී එකකැයි කියති. සමාජය පොදුවේ කෙළෙස්බරය. සුඛෝපභෝගිත්වය අගය කරයි. එයින් ඈත්ව සුන්දර වන පරිසරයක ආධ්‍යාත්මික පවිත්‍රත්වය අරබයා ගත කරන නිසංසල තපස් දිවිය සසර භාවිත පුණ්‍ය සම්පත්තියක් නිසාම උදාවන්නකි.

පූජ්‍ය ඥානාරාම මාහිමියන් උතුම් කමටහන් ගුරුවරයෙකි. උන්වහන්සේ යෝගාවචර භික්ෂූන්ගේ භාවනා කටයුතු ගැන විශාල සැලකිල්ලක් දැක්වීය. "භාවනාවෙහි යෙදී සිටින විටකදී බුදුරජාණන් වහන්සේ වැඩියායි කීවද භාවනාව නැවැත්විය යුතු නොවේ" යනු උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ අවවාදයකි.

අපවත්වීමට පෙර මාහිමිපාණන් වහන්සේ යෝගාවචර ජීවිතයක සියලු විශිෂ්ඨ අරමුණු සාක්ෂාත් කරගත් සේක.

### යෝගාශ්‍රම සංස්ථාව හා මාහිමිපාණන්

1992 අප්‍රියෙල් 30 වෙනි දින මාහිමිපාණන් වහන්සේ අපවත් වූ සේක. ඒ වනවිට 1951 දී බිහි වූ ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවට උන්වහන්සේගෙන් හතළිස් වසරක අති උදාර සේවයක් ඉටුවී තිබුණි. මීතිරිගල නිස්සරණ වන සෙනසුනට පස් විසි වසරක් පිරී තිබුණි. අති පූජ්‍ය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ මහා ස්ථවිර පාදයන් වහන්සේ හා අතිපූජ්‍ය මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන් වහන්සේ නිසා බිහි වූ යෝගාවචර භික්ෂු පරපුර හා වන සෙනසුන් ප්‍රතිපදාව සම්බුද්ධ ශාසනයට මහා ආලෝකයක් විය. යෝගාශ්‍රම සංස්ථාවට අයත් මැල්ලගල, නිමලව, දනව්කන්ද, නාථගනේ වැනි බොහෝ යෝගාශ්‍රමයන්හි වරින්වර වැඩ වසමින් යෝගාවචර භික්ෂු සමූහයට ධර්ම විනය ඉගැන්වීම, කමටහන් දීම ආදියෙන් අන්‍යයන් ද සසරින් මිදවීමේ වැඩපිළිවෙලක උන්වහන්සේ නිරත වූ සේක.



අතිපූජනීය කර්මස්ථානාචාර්ය මහෝපාධ්‍යාය
මාතර ශ්‍රී ඥානාරාමාභිධාන මාහිමිපාණන් වහන්සේ

කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවට අයත් සේනාසන එකසිය විසිදෙකක් පමණ අද ලක්දිව සතර දිග් භාගයෙන්ම බිහි වී තිබීම මෙම උදාර ශාසනික වැඩ පිළිවෙලේ අභිවර්ධනය පෙන්නුම් කරයි. පූජ්‍ය කඩවැද්දුව ජිනවංශ මාහිමිපාණන් වහන්සේගේ උදාර යෝජනා හා පූජ්‍ය මාතර ඥානාරාම මාහිමිපාණන් වහන්සේගේ ශාසනික අදහස් ද ගලපා දියත් කළ වැඩ පිළිවෙල උගත්, ගුණවත්, ශාසන මාමක ගිහි පැවිදි උතුමන්ගේ අමන්දානන්දයට හේතු වී තිබේ. මාහිමිපාණන් වහන්සේ විසින් සම්පාදනය කරන ලද යෝගාශ්‍රමීය කතිකාවත හා දිනචරියාව ධ්‍යාන-මග-පල නිවන් අරමුණු කරගත් උසස් භික්ෂු ජීවිතයකට මග හෙළි කරයි. ආධ්‍යාත්මික දියුණුවට කටයුතු කිරීමට මහණකමේ හරය බව උන්වහන්සේ තරයේ ම පෙන්වා දුන්හ.

## භාෂා ඥානය හා ග්‍රන්ථකරණය

සිංහල, පාලි, සංස්කෘත යන භාෂා තුනෙන්ම ගද්‍ය පද්‍ය නිබන්ධනයෙහි මහත් පරිචයක් මාහිමිපාණන් වහන්සේට තිබුණි. උන්වහන්සේ විසින් රචිත ග්‍රන්ථ ප්‍රමාණය අති මහත්ය. ශමථ විදර්ශනා භාවනා, සප්ත විශුද්ධිය, විදර්ශනා ඥාන ආදී පොත් උන්වහන්සේ ධර්මාවබෝධයකින් ම කළ බව විද්වතුන්ගේ මතයයි. පොත පත ලිවීමට හොඳ පන්නරයක් තිබුණද, උන්වහන්සේ දවසේ වැඩි කාලයක් විදර්ශනා භාවනාවෙහි යෙදීමට ම ප්‍රිය කළ බව පෙනේ.

## භික්ෂු අභ්‍යාස ආයතනයක්

මීතිරිගල නිස්සරණ වන සෙනසුන පාමුල ශ්‍රී ඥානාරාම ධර්මායතනය පිහිටුවා ඇත. මෙය ඥානාරාම මාහිමියන්ගේ ද අදහස් හා උපදෙස් ඇතිව සම්බුද්ධ සසුන නගා සිටුවීමේ පරම පවිත්‍ර චේතනාවෙන් ආරම්භ කෙරුණු භික්ෂු අභ්‍යාස ආයතනයකි.

මෙහි නිර්මාතෘවරයා නුගේගොඩ බෞද්ධ කල්‍යාණ මිත්‍ර සංගමයේ ගරු අනුශාසක වරලත් ගණකාධිකාරී එන්. ජී. පී. පණ්ඩිතරත්න මැතිතුමාණන් ය. ධර්මායතනය පිහිටියේ අතිශය මනරම් නිහඬ නිසසල පරිසරයකයි. වන සෙනසුනක සියලු අංගෝපාංගයන්ගෙන් සමන්විත කදිම නිර්මාණයකි.

## උතුමන් දුටු උතුම් ජීවිතය

"මගේ ජීවිතයේ අග කොටස ගෙවා ලන්ට සිදු වී තිබෙන්නේ මීතිරිගල නිස්සරණ වනයේය. නිරතුරු භාවනා මනසිකාරයෙන් ඉතා ඕනාකමින් කල්ගෙවන ඉහාත්මයේම ධ්‍යාන-මාර්ග-ඵල යන උත්තරීතර ගුණයන් ලැබීමේ එකම ප්‍රාර්ථනාව කියාගෙන සිටිනා යෝගාවචර පිරිසක් මැදය" (1967 ජූලි)

මහෝපාධ්‍යායාය මාහිමියන්ගේ මේ අනාගත දැක්ම එසේම සිදුවිය.

ස්ව සන්තානයේ ගුණ ඇතිවිටම අනුන්ගේ ගුණ වඩාත් වැටහේ. මාහිමියන්ගේ ශ්‍රේෂ්ඨ යෝගාවචර ජීවිතයේ ආදර්ශමත් ස්වභාවය, ගැඹුරු ගුණ නුවණ විනිවිද දුටු සබ්‍රහ්මචාරීහු වෙති. උන්වහන්සේ තුළ විද්‍යාමාන වූ ඥාන සම්භාරය, අභ්‍යන්තර බාහිර පවිත්‍රතාවය ගැන දැක්වූ සැලකිල්ල පවිවේකතාව-යෝගාවචර ජීවිතය අන් අයට බරක් නොවිය යුතුය යන අදහස-වැනි අපමණ ගුණාංග උන්වහන්සේලා දුටහ. තම තමාගේ කටයුතු තමා විසින්ම කරගැනීමෙන් සතිය පිහිටයි. කායාදි විවේකය ද සැලසේ යයි මාහිමිපාණන් අදහස් කළ සේක. කායික දුක, වේදනාව ඉවසීමේ මහා පුදුම ආත්ම ශක්තියක් උන්වහන්සේ තුළ විය. ඉහළම ත්‍යාගශීලිත්වයක් තිබූ අතර තමන්ට පුද්ගලිකව ලැබෙන දේ පවා සංඝයා අතර බෙදී යන්ට කටයුතු සළසා ඇත.

පූජ්‍ය කටුකුරුන්දේ ඤාණානන්ද හිමිපාණන් වහන්සේ කලක් මීතිරගල නිස්සරණ වනයේ වැඩ සිටි සිල්වත්, උගත්, ධර්මධර මහ තෙර නමකි. නිස්සරණ වනයේ නේවාසික යෝගාවචර භික්ෂූන් වහන්සේට "නිවන" මැයෙන් දෙසුම් පෙළක් පැවැත්වීමට ඤාණානන්ද හිමියන්ට නායක හිමියන්ගෙන් ආරාධනයක් ලැබුණි. සනීපයෙන් සිටි හැම අවස්ථාවකම නායක හිමියන් ද ධර්ම ගෞරවයෙන් යුතුව සාවධානව එම දේශනයට සවන් යොමු කළ සේක. දේශකයාණන් වහන්සේගේ ධර්මාවබෝධයටත්, නාහිමියන්ගේ ඤාණ දර්ශනයට හා නිහතමානීත්වයටත් මෙය කදිම නිදසුනකි. සාම්ප්‍රදායික ථෙර වාදී ආකල්පයන්ට ගැති නොවූ මෙම දෙසුම් පෙළ "නිවනේ නිවීම" නමින් දේවාලේගම, පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනයෙන් මුද්‍රණ ද්වාරයෙන් බිහිවීම සාමාන්‍ය පාඨකයා ලද සුවිශේෂ පුණ්‍ය වාසනාවකි.

දෙස් විදෙස් බුද්ධිමත්, සැදැහැවත් යෝගාවචරයෝ නාහිමියන් මහත් ප්‍රසාදයෙන් හා ගෞරවයෙන් ඇසුරු කළහ. නාහිමියන් වහන්සේගේ සීල, සමාධි, ප්‍රඥා මහා ගුණස්කන්ධය ඇසුර ලද ගිහි පැවිදි උතුමන්ගේ සිත් සතන්වල ගරු සම්භාවනීය ලෙස සටහන්ව ඇත. ධර්මය දන්නෝ ම විමුක්ති මාර්ගයේ ගමන් කරන්නෝ ම මාහිමි චරිතය බඳු ගම්භීර අසිරිමත් චරිත විනිවිද දකිති. එහි වූ ගුණ කදම්බය හඳුනා ගනිති. මහෝපාධ්‍යායාය නාහිමිපාණන් උත්තරීතර නිවන් රසය හඳුනාගත්, විමුක්ති මාර්ගයේ බොහෝ දුර ගමන් කළ ආර්ය උතුමෙකු බව, උතුම් බුද්ධ පුත්‍රයෙකු බව එබන්දෝ හඳුනා දෙති.

## චරිතාදර්ශය

මාහිමි චරිතයෙන් එක් ශ්‍රේෂ්ඨ ගුණාංගයක් හෝ අපේ ජීවිතයට එක්කර ගැනීමට වෑයම් කරතහොත් එයම උන්වහන්සේට කරන මහඟු පූජාවකි. උන්වහන්සේ අනුන්ගේ "සිදුරු" සොයා තම සිත කිලිටි කර නොගත් සේක. කිසිවිටෙකත් තමන්ගේ අඩු ලුහුඬුකම් වසන් කිරීමට වෑයම් කළේ ද නැත. අඩුපාඩුකමක් වැටහුනේ නම් එය නැතිකර ගැනීමට අධිෂ්ඨානශීලි වූ සේක. සුළු වරදෙහි පවා බිය දක්නා සුළු විය. පාතිමෝක්ෂ සංවරාදි සීලයෙන් පරිපූර්ණ වූ සේක. සීලාදි ගුණ සහිත ආර්යයන් වහන්සේලා දෙව් මිනිසුන්ගේ ආදර ගෞරවයට පාත්‍ර වෙත්.

අතීත කාලයේ මිස මෙකල ශාසනික ගුණ ධර්ම සපුරා පිරිය නොහැකිය යනාදි දුර්මතයන් උන්වහන්සේ බිඳ දැමුවේ වචනවලින් නොව ක්‍රියාවෙනි. තමන් නිවැරදි නිවන් මග ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධ කරගෙන, අන්‍යයන්ට ද අනුත්තර මාර්ගය දැක් වූ සේක.

## අපේ භාග්‍යය

නාහිමියන් විසින් රචිත "ශමථ විදර්ශනා භාවනා මාර්ගය" කර්මස්ථානාචාර්ය වරයෙකු වැනිය. ලෝලුවාගොඩ සහ ඇටඹේ මීතිරිගල නිස්සරණ වන දාන දායක සමිතිය මගින් මෙම පොතෙහි තුන්වන මුද්‍රණයක් කරන ලදී. එය ඔවුන්ට උදා වූ මහා භාග්‍යයකි. මේ සඳහා සේනාසනාධිපති පූජ්‍ය පානදුව ඛේමානන්ද හිමිපාණන් වහන්සේගෙන් හා පූජ්‍ය කටුකුරුන්දේ ඤාණානන්ද හිමිපාණන් වහන්සේගෙන් අපට ලැබුණ අපමණ අනුග්‍රහයන්ට අපගේ ගෞරවාදර භක්ති ප්‍රණාමය හිමි වේ.

අඩුම වශයෙන් වර්ෂයකට දෙවරක් අපේ සැදැහැවත්හු නිස්සරණ වනයට එති. බොහෝ අවස්ථාවල මහෝපාධ්‍යායාය හිමියන් දකින්ට වඳින්ට චතු මධුර බෝතලයක් වැනි දෙයක් දෝතට පුදන්ට අවස්ථාව ලැබේ. ඒ හැම විටකම කයින් දුබල වුවත් සඳහම් අමා බිඳක් අපේ සවන් පත්හි ලා සනසන්ට පසුබට නොවේ. උන්වහන්සේ බැහැ දැකීමට ගිය අවස්ථාවල කිසිවිටෙකත් සැතපී, නොසිටි අතර බොහෝවිට දහවල් දානයෙන් පසු සක්මන් කරනු දුටුවෙමු.

උන්වහන්සේගේ චරිතාදර්ශය අපට මහා භාග්‍යයක් කර ගත යුත්තේ එය අපේ ජීවිතවල සජීවී ලක්ෂණයන් කර ගැනීමෙනි.

- **අප්පමාදෙන භික්ඛවෙ සම්පාදෙථ"**
  මහණෙනි, නො පමාව නිවන් මග සම්පාදනය කරව්.
  මක්නිසාද?
- **"දුල්ලභො බුද්ධුප්පාදො ලෝකස්මිං"**
  ලෝකයෙහි බුදු උපත දුර්ලභය.
- **"දුල්ලභො මනුස්සත්ත පටිලාභො"**
  මිනිසත්බව ලැබීම දුර්ලභය.
- **"දුල්ලභා ඛන සම්පත්ති"**
  බුදු සස්නෙක ක්‍ෂණ සම්පත්තිය දුර්ලභය.
- **"දුල්ලභා පබ්බජ්ජා"**
  පැවිද්ද දුර්ලභය.
- **"දුල්ලභං සද්ධම්ම සවණං"**
  සඳහම් ඇසීම දුර්ලභය
- **"දුල්ලභා සප්පුරිස සංසේවෝ ති"**
  සත් පුරුෂ ආශ්‍රය දුර්ලභය. (එහෙයිනි)

මේ දහම් පද ඇසුරු කොට කළ කෙටි දහම් දෙසුම් අපි උන්වහන්සේගෙන් නොයෙක් වර කුටිය අසලදී ඇසුවෙමු. ප්‍රබෝධමත් සිතකින් ආපසු යන අපට මාස ගණනක් යන තුරුත් ඒ සඳහම් රසය රැව් පිළිරැව් දෙමින් සිහියට නැංවෙන්නේ මහ නාහිමියන්ගේ ආශ්චර්ය බලයෙන් විය හැක. උන්වහන්සේ සුගතෝවාදය නිතර මෙනෙහි කළ බව පෙනී යයි.

සුගතෝවාදයට අනුව දිවි මග පහන් කරගත් අති පූජනීය මාතර ශ්‍රී ඤාණාරාම මහ නාහිමියන් වහන්සේ දෙව් බඹුන් සහිත ලෝකයෙහි සියල්ලන්ගේම වන්දනීය පූජනීය තත්ත්වයට නිසිවන පරිදි ආර්යයන් වහන්සේ නමක ලෙස 1992 අප්‍රියෙල් 30 වෙනි දින අපවත් වූ සේක. සියලු සංස්කාර ධර්මයන්ගේ අනිත්‍යතාවය පසක් කරමින් 1992 මැයි මස 07 වෙනි දින ගල්දූවේ ගුනවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානයේ ආදාහන මළුවේදී ශ්‍රී දේහය ආදාහනය කරන ලදී. ස්වාර්ථයත් සලසාගෙන පරාර්ථයත් සලසා උන්වහන්සේ අපවත් වූයේ අනූ එක් වැනි වියේදී ය.

# 11

# අපේ කුසල් පෙරහැර

බුද්ධ ශාසනය යනු කාල සම්පත්තියකි. ක්‍ෂණ සම්පත්තියකි. දෙවියන් සහිත ලෝකයා අගය කරන මිනිස්කම ලැබුණ අවස්ථාවේ එයින් ප්‍රයෝජන ගත යුතුය. වරක් ගිලිහී ගියේ නම් යලි ලබා ගැනීම ඉතා අසීරු විය හැක.

## ජීවිතයේ යථාර්ථය

බුදු දහම ලොවට හඳුන්වා දුන් ජීවිතයක යථාර්ථය පුළුල් ජීවන දර්ශනයකි. ජීවිතයක සොඳුරු අඳුරු දෙ පැත්තකි. අට ලෝ දහම යනු එයයි. යථාවබෝධය හෙවත් ඇත්ත ඇති සැටියෙන් දැන ගැනීම තුළින් කම්පිත නොවන උපේක්ෂාවකට සිත ගෙන එන අයුරු බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇත.

හිමිදිරියේ උදාවන හිරු හවසට බැහැල යන බව කාටත් පහසුවෙන් වැටහෙයි. නමුත් විවිධ මද වලින් මත්ව සිටින අයට ජීවිතයත් ඒ වගෙයි කියා වැටහෙන්නේ නැත. ඒ නිසාම වටිනා මිනිස්කම විනාශ කර ගනිමින් කාලය අපතේ හරිමින් අකුසල් කරමින් සිට මරණයට පත් වෙන අය අපට දැකිය හැක.

කෙනෙකුට ජීවිතයේ යථාර්ථය වැටහීම වළක්වන සිහි බුද්ධිය යටපත් කරන මත්වීම් ගැන බුදු දහම කරුණු පෙන්වයි. තරුණ බව නිසා ඇතිවන මාන්නය, නිරෝගී බව නිසා ඇතිවන මාන්නය, තමා ජීවත් වනවා කියන එක තුළින් ඇතිවන මාන්නය, පිළිවෙලින් ජරාව, ව්‍යාධිය, මරණය අමතක කරවන මත්වීම් තුනකි. ධන මදය, රූප මදය ආදියද මත්වීම් ගොඩට වැටේ.

මත්වීම් වලින් මිදිලා ජීවිතයේ යථා ස්වභාවය තේරුම් ගැනීමට උදව් වන නිමිති මේ ලෝකය තුළ විද්‍යාමාන වෙයි. මේ කරුණු දේව දූතයින් හැටියට අඞ්ගුත්තර නිකායේ තික නිපාතයේ දේවදූත සූත්‍රයේ දක්වා ඇත. මිනිස් ජීවිතය අර්ථවත් කරගන්ට දෙව් ලොවින් එවන පණිවිඩකරුවන් කියන එකයි ඉන් අදහස් කරන්නේ. මහල්ලා, රෝගියා මළ සිරුර තමයි මේ දේව දූතයින්. මේ දේව දූතයින් තිදෙනා ගැන හරියාකාරව තේරුම් ගත් කෙනෙකුට ලැබෙන අනුසස් අපමණය. තමන් ටිකෙන් ටික දිරන බව, ලෙඩ වෙන බව, මැරෙන බව පිළිගන්ට ආත්ම ශක්තියක් ගොඩ නැගෙන විට ජීවිතයේ අසහනය, කම්පනය, සිත් තැවුල් නැතිව උපේක්ෂාවෙන් යුතුව සිටිය හැකි වෙයි. ජරාව, ව්‍යාධිය, මරණය හමුවේ හිත හදා ගන්ට නම් මේ දේව දූතයින් කල්තබාම අපට කියාදෙන පාඩම වටහා ගැනීම වැදගත්ය. මේවා උපන් හැම සත්වයාටම පොදු ධර්මතා බව සිහියට නගා ගැනීමෙන් දැඩි දුක්-දොම්නස්-හැඬීම්-වැලපීම් නැතිකර ගත හැකිවෙයි.

යම්තාක් සත්වයින් මේ ලෝකේ උපදිනවා නම් ඒ හැම සත්වයාගේම දිරන ස්වභාවය ඇති දේ දිරනවාමයි. දිරන සුළු දේ දිරුවහම ශෝක කිරීම, හැඬීම, වැලපීම නිස්සාරබව ධර්මානුකූලව තේරුම් ගැනීමට නියම බෞද්ධයාට හැකිවිය යුතුය. ලෙඩ වෙන ස්වභාවය ඇති සත්වයා ලෙඩ වෙනකොට, මැරෙන ස්වභාවය ඇති සත්වයා මැරෙන කොට නුවණින් කල්පනා නොකරන්නා දුකට ශෝකයට පීඩාවට පත් වෙයි.

ධර්මය දන්නා ආර්ය ශ්‍රාවකයා ජරා, ව්‍යාධි, මරණ මට පමණක් නොව යම්තාක් මේ ලෝකේ ඉපදුන සත්වයින් ඇත්ද, ඒ සියල්ලනටම පොදු බව, උරුම බව තේරුම් ගනී. එසේම මහලු වීම, ලෙඩ වීම, මරණය යන මේ ස්වභාවයන් කෙනෙකුගෙන් තවත් කෙනෙකුට පවරා ගැනීමට නොහැකිය.

බුදු පියාණන් වහන්සේ හැම කෙනෙකු විසින්ම නිතර සිහිපත් කළ යුතු කරුණු පහක් **අඬගුත්තර නිකායේ පඤ්චක නිපාතයේ "ඨාන" සූත්‍රයේදී දක්වයි.**

1. මම ජරාවට-දිරීමට-මහලු බවට පත්වන ස්වභාවය ඇත්තෙක් වෙමි. ඒ තත්ත්වය නො ඉක්මවූ කෙනෙක් වෙමි.
2. මම ලෙඩ වෙන ස්වභාවය ඇත්තෙක් වෙමි. ලෙඩ වීමේ ස්වභාවය නො ඉක්මවූ කෙනෙක් වෙමි.
3. මම මැරෙන ස්වභාවය ඇත්තෙක් වෙමි. මරණය නො ඉක්මවූ කෙනෙක් වෙමි.
4. සියලු ප්‍රිය මනාප අයගෙන් වෙන් වීමත්, වියෝ වීමත් මට ඇති වේ. ඒ ස්වභාවය නො ඉක්ම වූ කෙනෙක් වෙමි.
5. මම මා විසින් කරන ලද කුසලාකුසල කර්මයන්ගේ හිමිකරුවා වෙමි. කර්මය දායාද කොට, නෑයා කොට පිහිට කොට සිටිමි.

ජරා ව්‍යාධි මරණ තමාටත්, අන් අයටත් ජීවිතය තුළ අනිවාර්යයෙන්ම උරුම වෙන බව නුවණින් සිතන විට තරුණ මද, ආරෝග්‍ය මද, ජීවිත මද කෙමෙන් තුරන් වෙයි. එසේම මේ කරුණු පහ නිතර මෙනෙහි කරන ආර්ය ශ්‍රාවකයා කයින් වචනයෙන් මනසින් කරන වැරදි වලින් අකුසල්වලින් වැළකීමේ දක්ෂතාවයක් කෙමෙන් ගොඩ නගා ගනී.

එසේම ජරා, ව්‍යාධි, මරණ මෙනෙහි කිරීම තුළින් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම කියන ත්‍රි ලක්ෂණය මතුකරගත හැකි වෙයි. මේවා නිවනට උපකාරවන භාවනා හැටියට වඩන්න පුළුවනි. අසුභ භාවනාවෙන් සමාධියට එරෙහි ප්‍රධාන නීවරණය වන කාමච්ඡන්දය දුරු වෙයි. මරණ සතියෙන් ජීවිත මදය දුරු වෙයි. සසර බිය වැඩෙයි. බලවත් වීර්ය ඇති වෙයි. අසුභ සංඥාව හා ආදීනව සංඥාවත් මෙයට එකතු කරගත හැකිය.

ගිරිමානන්ද සූත්‍රයේදී බුදු පියාණන් වහන්සේ පුහුදුන් පුද්ගලයා හොඳයි, ලස්සනයි, සුභයි කියා වරදවා ගන්න මේ ශරීරයේ ඇතිවන ආබාධ පිළිබඳ දිගු නාමාවලියක් ඉදිරිපත් කරයි. මේ ශරීරය බොහෝ ආදීනව සහිතය, දුක් සහිතය, යනුවෙන් නිතර මෙනෙහි කිරීම නිවනට උපකාර වන්නේය. කොයි තරම් උවමනාවෙන්, උත්සාහයෙන්, ආසාවෙන් රැක බලාගන්න උත්සාහ කළත් මේ ශරීරය එකම රෝග කුඩුවක් බව යථාර්ථයට අනුව සිහිපත් කළ හැකිය. මේ කල්පනාවෙන් විශේෂයෙන් කෙනෙකුට රෝගී අවස්ථාවක හිත හදාගන්ට උපකාර වෙයි. දිගු සසර ගමන පිළිබඳ කල කිරීම තුළින් නිවන් ප්‍රත්‍යක්ෂ කරගන්ටත් උපකාර වෙයි. විශේෂයෙන් මරණ සතිය-තමන් මැරෙන බව නිතර සිහිපත් කිරීම-නිවන් ලබාදෙන ප්‍රබල භාවනාවක් හැටියට භාග්‍යවතුන් වහන්සේ බොහෝ තැන්වල වර්ණනා කර ඇත. ගත්තු හුස්ම

හෙලන තුරු, හෙලු හුස්මට අලුත් හුස්මක් ගන්නා තුරු ජීවත් වෙයිද සැක සහිතය. ජීවිතය පිනි බිඳක් සේය. දිය බුබුලක් සේය. වහා නැසෙන සුළුය. සුළං කපොල්ලක දැල්වූ පහනක් වැනිය, යනුවෙන් සිතා අප්‍රමාදීව, ශක්තිමත් ලෙස, වේගවත් ලෙස නිවන් අවබෝධය සඳහා කටයුතු සම්පාදනය කිරීමට බුදුවරුන්ගේ ප්‍රශංසාවට ලක් වෙයි.

ජරා, ව්‍යාධි, මරණ යනු ජීවිතයේ අවස්ථා නොවේ. උපතත් සමඟම දිරීමේ ක්‍රියාවලිය ඇරඹෙයි. නමුත් තරුණ අවදිය දක්වා ප්‍රකටව පෙනෙන්නේ ජීවිතයක වැඩීමයි. ජරාව හෙවත් දිරීම වඩා ප්‍රකට වන්නේ මැදි වයසෙන් පසුවයි. දිරන වේගය වැඩිවෙන කොට රෝගවලට ලැබෙන ඉඩ ප්‍රස්ථා වැඩිය. සම්මතයෙන් අපි දකින මරණය ශරීරයෙන් විඥානය ඉවත් වී ශරීරය වැඩකට නැති නිශ්ක්‍රීය එකක් වීමයි. **නමුත් සැබවින්ම හුස්ම දෙකක් අතර තියෙන්නේ මරණයයි.** ගත්තු හුස්ම හෙලන්න බැරි වුනොත්, හුස්ම හෙලුවාට පසු වෙන හුස්මක් ගන්න බැරිවුනොත් එතන තියෙන්නේ මරණයයි. "පණ කෙන්ද" කියන්නේ ඒකයි.

ජරාව, ව්‍යාධිය, මරණය යනු මුළු ජීවිත කාලය පුරාම විහිදුනු දේවල්. මේ ශරීර කුඩුව තුළ හැම විටම මේ තත්ත්වයන් තුන පවතී. මනා සිහි නුවණින් මේ තත්ත්වය මෙනෙහි කිරීම ජීවිතයේ යථාර්ථයට සිත ගෙන ඒමයි. අවිද්‍යා අන්ධකාරය නසා ජීවිතයට ප්‍රඥා ආලෝකය පහළ වන්නේ යථාර්ථය දැකීම තුළින්මය.

ටිකින් ටික මේ තත්වය කරා කෙනෙකුට ගමන් කළ හැකි නම් සැනසුමෙන් අවසන් හුස්ම හෙලන්ට පුළුවන් වනවා ඇත. ප්‍රඥා ආලෝකය මතුකරගත් විට සසර වට වළල්ලේ දිවීමේ නිසරු බව වැටහෙයි. එයින් තණ්හාව දුරු කිරීමේ අවශ්‍යතාවය මතු වේ. සංස්කාර ජවය අඩුකර ගනී. පංචස්කන්ධය මමය, මගේය වශයෙන් ගැනීම සංස්කාරයි. සංස්කාර යනු සකස් කිරීම් ගොඩකි. මුලු මහත් පංචස්කන්ධයම දුක් ගොඩකි. එසේ යාන්තමින් හරි දැනුන වැටහුන දා සිට පුද්ගලයා පිවිතුරු, ලොව්තුරු සැනසුම් සුවය සොයා අප්‍රමාදීව නිවන් මග ගමන් කරයි.

ජීවිතයේ මේ යථාර්ථය අවබෝධ කරගැනීමට සංසාරයෙන් මිදීමට, නියම සැනසීමක් ලැබීමට විදර්ශනා භාවනා වැඩිය යුතුය. හිස ගිනි ගත් කෙනෙකු, ඇඳිවත ගිනිගත් කෙනෙකු ඒ ගින්න නිවීමට අප්‍රමාද වන්නා සේ නිවන සඳහා ද අප්‍රමාදී විය යුතු බව ධර්මයේ දැක්වේ.

මේ අනුව නිවන කල් දැමීම දුර්ලභව ලැබෙන මිනිස් ජීවිතයෙන් නිසි පල ලැබීම අතපසු කිරීමකි. අපේ චින්තනය ශ්‍රී සද්ධර්මය ඔස්සේ මෙහෙයවීමට සැබෑ වීර්යයක්, අධිෂ්ඨානයක්, ඇතිකර ගැනීම අවශ්‍ය වෙයි.

**"අප්පමාදො අමත පදං" යන බුද්ධ වචනයට අනුකූලව අප්‍රමාදව කුසල් දහම්හි යෙදිය යුතුය.**

## ගිහි පැවිදි සබඳතාවය

ගිහි පැවිදි සබඳතාවය පිළිබඳ ඉතා වටිනා දේශනා රැසක් ත්‍රිපිටකය පුරා විසිරී ඇත. ඛුද්දක නිකායේ **ඉතිවුත්තක පාළියේ "බහුකාර සූත්‍රය"** එයින් එකකි.

ගිහි පිනැතියන් පැවිදි උතුමන් කෙරෙහි මහා කරුණාවකින් හා මහා මෙත් සිතකින් යුතුව උන්වහන්සේලාට නිවන් මග යාමට අනුග්‍රහ පිණිස, උපකාර පිණිස කරන පූජාවන් සිව්පස පූජාවන් නම් වෙයි. "මහණෙනි, චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස, බෙහෙත්, පිරිකර ආදිය පිළිගන්වා උපස්ථාන කරන ගිහියන් නුඹලාට බොහෝ උපකාර ඇත්තන්ය" යනුවෙන් බුදුරජාණන් වහන්සේ වදාරති.

එබඳු ගිහි සැදැහැතියනට භික්ෂූන් වහන්සේ ප්‍රත්‍යුපකාර කළ යුතු අයුරු ද මෙහිදී උන්වහන්සේ පැහැදිලි කළ සේක. "එබඳු උපාසකයනට මුල, මැද, අග යහපත් වූ දහම් දෙසන්න. අර්ථ සහිත ව්‍යාඤ්ජන සහිත හැම අතින්ම පරිපූර්ණ වූ දහම් දෙසන්න. පිරිසිදු බ්‍රහ්ම චර්යාව ප්‍රකාශ කර දහම් දෙසන්න. එවිට ඔබලාද ඔවුනට ප්‍රති උපකාර කළා වේ" යැයි දේශනා කළ සේක.

ඔවුනොවුන් කෙරෙහි මෙත් සිතින් කරන මේ ඇසුර දෙ පිරිසට ම සංසාරය නමැති ඕඝය තරණය කොට දුක් කෙළවර කර අමා මහ නිවන් සුව සාක්ෂාත් කර ගැනීමට හේතු වේ.

### ගිහී සාමීචි පටිපදාව

**"ගිහී සාමීචිපටිපදං පටිපජ්ජන්ති පණ්ඩිතා,**
**සම්මග්ගතෙ සීලවනෙත චීවරෙන උපට්ඨිතා,**
**පිණ්ඩපාතසයනෙන ගිලානපච්චයෙන ච.**

**තෙසං දිවා ච රත්තො ච සදා පුඤ්ඤං පවඩ්ඪති,**
**සගගඤ්ච කමතිට්ඨානං කම්මං කත්වාන භද්දකනති"**
**(ගිහී සාමීචිපටිපදා සූත්‍රය - චතුක්කනිපාතය - අඞ්ගුත්තර නිකාය)**

නිවැරදි මග ගත් සිල්වත් ප්‍රතිග්‍රාහකයන්ට චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස, බෙහෙත් පිරිකරින් උවටැන් කරන නැණවත්හු ගිහි සාමීචි පටිපදාව පිළිපදිති.

ඔවුන්ට රෑ දවල් හැමදා පින් වැඩෙයි.
යහපත් කර්ම කොට ස්වර්ගයට යෙති.

### සසර කතරේ කෙම් බිමක්

මීතිරිගල නිස්සරණ වනය අපට සසර කතරේ කෙම් බිමක් වූ අයුරු කෙතරම් අපූරුදැයි සිතේ. අපි නිස්සරණ වනය සමඟ අවුරුදු තිස් හතරක දුර ගමනක් ආවෙමු. ඒ අපේ සසර නැවැත්මට මහෝපකාරී වූ පින් බිමක් නිසාවෙනි. දිවි තිබෙන තුරාවට අපේ ඇත්තන් නිස්සරණ වනය මුල්කොට කුසල් ප්‍රතිපදාවෙහි යෙදෙන බව ඉතා පැහැදිලිය. අපෙන් පසුව තරුණ පෙළ හා ළමා පෙළ කෙමෙන් හොඳ පන්නරයක් ලබා මේ කුසල් පෙරහැර ඉදිරියට මෙහෙයවනු ඇතැයි වැඩිහිටියන් විශ්වාස කරයි.

යායුතු නිවැරදි මග දක්වන කලණ මිතුරන්ය. අනුත්තර පින් කෙතය. අප උන්වහන්සේ කැප සරුප් ආමිෂයෙන් සතප්පා අනුග්‍රහ දක්වන්නේ යෝගාවචර උතුමෝ පහසු විහරණයෙන් නිවන් අවබෝධ කරත්වා! යන පරම පවිත්‍ර මෙත් සිතෙනි. අපේ අදිටන ද ඔබ වහන්සේලා අනුගමනය කරමින් නිවන් මග ගමන් කිරීමයි.

අපේ කුසල් පෙරහැර භව සැප පතා නොවේ. දානයෙන් වැඩි වැඩියෙන් ලබමි'යි තණ්හාව ගොඩනගන්ට නොවේ. දානයෙන් සිත මුදු මොළොක් වෙයි. කරුණාව, මෛත්‍රිය දියුණු වෙයි. ලෝභය තුනී වෙයි. කෙමෙන් තණ්හාව බිඳ දමන්ට හැකි වෙයි.

සියලු පින්කම් නිවන් පතාය. සසර නැවැත්මටයි. අටපිරිකර යනු ශ්‍රමණ පරිෂ්කාරයි. අටපිරිකර පූජා කරන්නේ අපටත් දුර්ලභ වූ මහණකම ලැබී ඉක්මණින් අමා මහ නිවන ලැබේවා යන පැතුමෙනි. කාන්තාවන්ට මේල පළඳනා ලබන්ට හෝ සක්විති සැප, සක් දෙව් සැප, රජ සැප ලබමින් මෙතේ බුදුන් බුදුවන තුරු සසර සැරිසරන්ට නොවේ. එබඳු බොළඳ බණ දෙසුම් අපේ සවන් පත් හකුළුවාලයි.

සීල, සමාධි, ප්‍රඥා සංඛ්‍යාත මහ වෙහෙර ගොඩ නංවා අමා මහ නිවන නමැති චූඩාමාණික්‍යය පළන්දා ධර්ම ප්‍රාතිහාර්යයක් පානා සේ අපේ සවන් පත් සද්ධර්ම අමෘතයෙන් පුරවාලන ඒ දහම් මිහිර අපට නිස්සරණ වනයෙන් ලැබෙන අමිල තිළිණයකි.

නිස්සරණයේ උතුම් මහ සඟ රුවන අපද උන්වහන්සේලා අනුව නිවන් මග යන ගිහි පිනැතියන් වනු දකින්ටයි හැමවිට කැමැත්ත. අපේ පිරිස ද එසේ තම තමන් ගැන අදිටන් කරත්වා!

## අතීතයෙන් බිඳක්

'මීතිරිගල මූකලාන' මීතිරිගල නිස්සරණ වනය වූ දා, ඒ මංගල දිනයට නිස්සරණ වනයට සිව් දිගින් ගලා ආ ජන ගඟ අතර අපේ සුවිශේෂ පුද්ගලයන් දෙදෙනෙකු ද විය. එනම්, ලෝලුවාගොඩ සහ ඇටඹේ මීතිරිගල නිස්සරණ වන දාන දායක සමිතියේ වත්මන් සභාපති මේනිස් නිවුන්හැල්ල මහතාත්, සමිතියේ ආරම්භක ප්‍රමුඛයා වූ පළමුවෙනි සභාපති පරලෝ සැපත් චාල්ස් හෙට්ටිආරච්චි මහතාත් ය. අහම්බෙන් වගේ එහිදී මූණ ගැසුණු මේ දෙදෙනා දාන වාරයක් ඉල්ලා අදාල පොතෙහි සටහන් තැබීමට අමතක නොකළේය. ඔවුන් මහත් සතුටට පත් කරවමින් 1969 ජූනි මස 24 වෙනි දිනට පළමු දාන වාරය ලැබෙන පරිදි වාර්ෂික දාන දිනයක් ලැබුණි.

1969 ජූනි 23 දින සවස දාන කළමනා රැගෙන මීතිරිගලට ගියේ හත්දෙනෙකි. එදා වාහනයට ගාස්තුව වූයේ රුපියල් දාහතරකි. වෙල් නියර ඔස්සේ ඒ දඬු හරහා බඩු මලු ඔසවාගෙන දාන ශාලාවට ඒමට සැහෙන දුරකි. වාහන නැවැත්විය හැකි වූයේ වෙල් යායෙන් එහා ය. ඒ කාලයේ ලෝලුවාගොඩ පිරිස සමඟ මීතිරිගල දානයට ආව ගිය පිරිස අතර 'වඩු මහත්තයා' බොහොම සැදහැති වැඩිහිටියෙකි. වැඩිම බර බඩු ගෝනිය හිස තබාගෙන සැහැල්ලුවෙන් එන්නේ ඔහු බව නිවුන්හැල්ල මහතා ආදරයෙන් සිහිපත් කරයි. දාන දායකයින් සමඟ දහවල් බුද්ධ පූජාව කළ 'හපුවලාන උපාසක මහතා' ද නිවුන්හැල්ල මහතා ගෞරවයෙන් සිහි කරයි. අදට අප අතර නැති මෙවැනි බොහෝ සැදැහැතියන් නිස්සරණ වනය නිසා අපමණ ප්‍රබල කුසල් රැස් කරන්ට ඇත.

අසෝක වීරරත්න මහතා මහා දාන පතියෙකු විය. විමසුම් නුවණක් හා හොඳ කළමනාකාරීත්වයක් ද එතුමා සතු විය. දැන් තිබෙන මුළුතැන්ගෙය, පිණ්ඩපාත ශාලාව, දාන දායකයින්ගේ විශ්‍රාම ශාලාව ද කෙටි කලකින් තනා නිම කිරීමට එතුමාට හැකි විය. 1967 සිට ඉදිරියට අවුරුදු දෙකක් පමණ ම නිස්සරණ වනයේ යෝගාවචර භික්ෂූන් වහන්සේලාගේ සැප විහරණයට අදාල දාන කටයුතු ආදී එදිනෙදා අවශ්‍යතා පවා පිරිමැසුවේ එතුමා අතිනි.

## දන් වැටක හැඩ වැඩ බණ පොත සමඟ

දානයේ ආනිසංස ඵලය නම් සිත පිරිසිදු කිරීමයි.
**"දදතො පුඤ්ඤං පවඩ්ඪති"** යනුයි. ඒ නිසා සෙසු ගුණ වැඩුමට දාන ගුණය ක්ෂේත්‍ර වෙයි.

1969 - 2002 දක්වා මීතිරිගල නිස්සරණ වනයේ 34 වාරයක් වාර්ෂිකව පිණ්ඩපාත දාන පිරි නැමීමට අපට අවස්ථාව උදා විය. 2002 දෙසැම්බර් 22 වෙනි දින අප පැවැත්වූයේ 18 වන බෙහෙත් පූජා පින්කමයි. මේ බෙහෙත් පූජා පින්කම නිතරම සිව්පස පූජා ලෙස හැඳින්වීමේ හැකියාව ඇත. ඊට අමතරව කුටි අලුත්වැඩියා කිරීම මහෝපාධ්‍යායාය මාහිමියන් විසින් රචිත 'ශමථ විදර්ශනා භාවනා' නමැති ධර්ම ග්‍රන්ථය ධර්ම දාන වශයෙන් මුද්‍රණය කිරීම, ඒ ඒ අවස්ථාවල නිස්සරණ වනයේ කුදු මහත් අවශ්‍යතා ලෙස සඳහන් වූ පාරවල් සකස් කිරීම, ගිලන් කටයුතු, කුටි අලුත් වැඩියා වැනි විවිධ කරුණු සඳහා කළ මුදල් පරිත්‍යාග ආදී වශයෙන් අපේ කුසල් පෙරහැරේ විවිධ විචිත්‍ර මාතෘකා රාශියකි.

අඞ්ගුත්තර නිකායේ අට්ඨක නිපාතයේ **සප්පුරිස දාන සූත්‍රය** අපේ සිත් පහන් කරයි. දැන හෝ නොදැන හෝ සැබවින් අපේ පිරිස කටයුතු කළේ මෙසේම නොවේදැයි සිතෙන විට ඇතිවන සතුට අපමණය.

"අට්ඨිමානි භික්ඛවෙ, සප්පුරිසදානානි, කතමානි අට්ඨ", මහණෙනි මේ සත් පුරුෂ දාන අටකි. අට කුමක්ද?

"සුචිං දෙති, පණීතං දෙති, කාලෙන දෙති, කප්පියං දෙති, විචෙය්‍ය දෙති, අභිණ්හං දෙති, දදං චිත්තං පසාදෙති දත්වා අත්තමනො හොති, ඉමානි බො භික්ඛවෙ, අට්ඨ සප්පුරිසදානානි ති"

**පිරිසිදු දෙය දෙයි. ප්‍රණීත දෙය දෙයි. සුදුසු කල්හි දෙයි. කැප දේ දෙයි. විමසා බලා දෙයි. නිරතුරු දෙයි. දෙනුයේ සිත පහන් කෙරෙයි, දී තුටු සිත් ඇතියේ වෙයි.**

මහණෙනි, මේ සත් පුරුෂ දාන අටයි.

වැඩි වැඩියෙන් ලබන්ට සිතා දන් දෙන්නෝ වෙති. එබඳු තණ්හා ආශා මිශ්‍ර වට්ට නිශ්‍රිත දානය සංසාර වට වළල්ලේ ගමන් කරවන සුළුය. **තණ්හා ආශාවන්ගෙන් පරිබාහිර විවට්ට නිශ්‍රිත දානයම නිවනට හේතු වෙයි.** සසර කෙටි කරයි. මසුරු මල දුරු කොට මසුරුකම මැඩ පවත්වා දන් දිය යුතුය.

**"දානංච යුද්ධංච සමාන මාහු**
**අප්පාපි සත්තා බහුකේ ජිනන්ති**
**අප්පම්පි චෙ සද්ධහානො දදාති**
**තෙනෙව සෝ හෝති සුඛී පරත්ථ"**

දන් දීමත්, යුද්ධ කිරීමත් එක සමාන යයි සම්බුදු වදනකි. වීර පුරුෂයෝ ටික දෙනෙක් වුවද ශ්‍රද්ධාදි ගුණ ධර්ම තියුණු වූ තැනැත්තෝය. එබඳු වූ අය ස්වල්ප දානයක් දුන්නත් කර්ම ඵල අදහා දන් දෙයි. ඒ නිසා ඔවුන් මසුරු මල ඇති අය පරදවති. පරලොවදී පමණක් නොව මෙලොවදී ද බොහෝ දාන විපාක ලබති. එයින් සැප ඇත්තෝ වෙති.

තමා සතු දෙයක් කර්ම ඵල විශ්වාස කොට පූජා වශයෙන් හෝ අනුග්‍රහ වශයෙන් හෝ දීම දානයයි. සීලාදි වශයෙන් තමාට වඩා උසස් අයට ගෞරවයෙන් කරන පරිත්‍යාගය පූජා නම් වේ. සංඝ රත්නයට දන්දීම පූජාවකි. කරුණාවෙන්, උපාය දැනීමේ නුවණින්, දක්ෂතාවෙන් යුතුව, තණ්හා, මාන, වැරදි දැකීමෙන් තොරව කරන පරිත්‍යාගය දාන පාරමිතාව නම් වෙයි. මෙයයි විවට්ට නිශ්‍රිත දානය වනුයේ.

ජීවිත ආශාව අධික තැනැත්තාට යුද්ධ කළ නොහැකිය. ධනාශාව අධික තැනැත්තාට දන්දීම කළ නොහැකිය. ජීවිතයත් රැක ගන්නෙමි. යුද්ධත් කරගන්නෙමි යි සිතන්නාට යුද්ධ කළ නොහැකිය. දානයක් දෙන්නෙමි. ධනයත් රැක ගන්නෙමි යි සිතන්නාට දන් දිය නොහැක.

වස්තු සම්පත්වල ඇල්ම අත්හැර මහා දානයක් දෙන්නෙමි යි, වීර්යය හා උත්සාහය ඇත්තාම දන් දෙයි. දානයත් යුද්ධයත් සමාන වන්නේ මෙසේය.

දන් දීමෙහි දී නිවනම පැතීම වැදගත් වෙයි. බෞද්ධයාගේ ඒකායන අරමුණ නිවනයි. පැතීමෙන් පමණක් නිවන නොලැබේ. නමුත් නිවන පැතීමෙන් නිවන් මග ගමන් කිරීමේ දක්ෂතා, කුශලතා අප තුළ ඒක රාශී වෙයි. දානයෙන් ලැබෙන භව භෝග සම්පත් හා ආයුෂ, වර්ණ සැප බල ප්‍රඥා ආදියත් නො පැතුවද අනිවාර්යයෙන්ම දෙ ලොවෙහිම ලැබේ. හැම පින්කමක් ම නිවන් සුවය සඳහා උත්සාහවත් වීමට සුදුසු උතුම් පුද්ගල භාවයක් ලැබීමට හේතු වෙයි. දුක්ඛිත ජීවිත ලැබීම නිවනට බාධාවකි.

හැම පින්කමකම ප්‍රබල බව, අනභිභවනීය ආශ්චර්යවත් ප්‍රතිඵල ලබාදීමේ හැකියාව ඇත්තේ ඒ සඳහා යොදන යෙදෙන සිත අනුවයි. අනුගාමික නිධාන යනු පින්කම්වල ආනිසංස අප පසු පස සෙවනැල්ල මෙන් ගමන් කරන බවයි.

දන් දීම පිළිබඳ ශ්‍රේෂ්ඨ, බුද්ධිමත් අදහස් ඇතිකර ගැනීමට, දක්ෂතා දියුණු කර ගැනීමට සිතන කෙනෙකුට **පිළින්දවච්ඡ මහ රහතන් වහන්සේගේ ශ්‍රාවක අපදානය කදිම චිත්තාකර්ෂණීය** කතා පුවතකි. පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ කාලයේදී උන්වහන්සේ පදුම නම් තරුණ සිටුවරයෙකි. එතුමා සංඝ රත්නයට කැප සරුප් අවශ්‍ය යයි කිවහැකි සියලුම පරිෂ්කාර එක වර්ගයකින් ලක්ෂයකට අධිකව සකස් කළේය. බොහෝ අමාරුවෙන් බුදුරජාණන් වහන්සේ ද ලබාගෙන සත් දිනක් නොකඩවා ලක්ෂයකට අධික වූ බුද්ධ ප්‍රමුඛ මහා සංඝ රත්නයට-ලක්ෂයක් මහ රහතන් වහන්සේලාට මහ දන් දුන්නේය. උන්වහන්සේ සසරදී ඒ පින්කම් නිසා ලැබූ ආනිසංස අප්‍රමාණය. මේ බුදු සස්නේ දෙවියන්ගේ ප්‍රිය මනාපය ලැබුවන් අතර අග තැන්පත් වූයේ පිළින්දවච්ඡ මහ රහතන් වහන්සේය. හේතුව වූයේ අතීත සංසාරයේදී තමන්ගේ ඥාති මිත්‍රාදීන් පිරිවරා පින්කම් කිරීමය. ඒ පුණ්‍ය ක්‍රියා මහිමයෙන් දිව්‍ය බ්‍රහ්මාදී සැප විපාක ලැබූ පිරිස් කෘත ගුණ සැලකීම් වශයෙන් නිතර පිළින්දවච්ඡ මහ රහතන් වහන්සේ දැකීමට වැඳීමට එළඹෙන සිරිතක් විය. නිතර පැමිණ ගෞරව කිරීම, සිතැඟි ඉටුකර දීම ආදියෙන් කෘතවේදී වූහ.

ජීවක සූත්‍රයේදී පෙන්නුම් කළ ආකාරයට තමන් යහපත් කටයුතුවල යෙදෙන අතර, අනුන් ද එවැනි යහපත් කටයුතුවල යෙදවීමේ වටිනාකම මේ කතා පුවතෙන් හෙළිවන එක් ආදර්ශයකි.

### මහා කුසලයක් සිදුවන ආකාරය

පින්කම්වලදී මහා කුසල් සිදුවන ආකාරය යන්තමින් හෝ දැනගැනීම ප්‍රයෝජනවත් ය. බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේලා පාරමී සපුරන සංසාරික ජීවිතවල ප්‍රාතිහාර්ය කුසල සිත් පහළ කරගත් උතුමෝ වෙති. "**සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික**" මහ කුසලයක් සිදුවන ආකාරයට පින්කම් කිරීම දැනගත යුතු දෙයකි. පිළින්දවච්ඡ මහ රහතන් වහන්සේ පදුම කුමාරයා වශයෙන් කළ ඒ අසදෘශ මහා දානය එබඳු මහා කුසලයක් නිසාය, කල්ප ගණන් සැප විපාක ලදුයේ.

මහා කුසල් සිත් අටෙන් ප්‍රබලම මහා කුසල් සිත සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික සිතයි.

- ***සිතක් සෝමනස්ස සහගත වන්නේ කෙසේද?***

  සොම්නස් සිතකින් උපන්නෙකු වීමය.
  ශ්‍රද්ධාව බුහුලව ඇති බවය.
  පිරිසිදු සම්මා දිට්ඨිය ඇති බවය.
  කුශල කර්මයන්හි අනුසස් දැකීමය.
  දාන වස්තුව - ප්‍රතිග්‍රාහක සම්පත්තිය ආදිය යහපත් වීමය.
  කරදර හිරිහැර පීඩා ආදිය නැති බවය.

මේ කරුණු පින්කමක යෙදෙනවිට සිත සෝමනස්ස සහගත වීමට බලපායි.

- ***ඥාණ සම්ප්‍රයුක්ත වන්නේ කෙසේද?***

ඥාණය හා එක්ව යෙදුනේ ඥාණ සම්ප්‍රයුක්තයි. ඥාණය නම් යමක ඇති හැටි නුවණ නමැති ඇසින් දක්නා ප්‍රඥාවයි.

ත්‍රිහේතුක සිතකින් උපන්නෙකු වීමය.

දොම්නස නැති බවය.
ශ්‍රද්ධාව ආදී ඉන්ද්‍රිය ධර්මයන්ගේ මේරීම.
කෙළෙසුන්ගෙන් ඈත් වීම.
නුවණ වැඩෙන කටයුතු.

- ***අසංඛාරික වන්නේ කෙසේද?***

  අසංඛාරික කර්මයකින් උපන්නෙකු වීමය.
  පූර්ව භවයන්හි පින් කොට පුරුදු බවය.
  සුදුසු ඍතු, භෝජනාදීන්ගේ උපකාරයෙන් කයත් සිතත් සුවපත් වීමය.
  නුවණ මෝරන වයසට පැමිණීමය.
  ශ්‍රද්ධා ප්‍රඥාවන් සම්පූර්ණ වීමය.
  සිත් වූ පරිදි දාන වස්තු හා ප්‍රතිග්‍රාහකයන් ලැබීමය.

මේ කරුණු සම්පූර්ණ වීමෙන් **'සෝමනස්ස සහගත ඤාන සම්ප්‍රයුක්ත අසංඛාරික'** මහග්ගත කුසල් කරගත හැකිය.

පින් කරන්නෝ තමා කළ පින් ගැනත්, ඉදිරියට කරන පින් කටයුතුවලදීත් මේ කරුණු කෙරහි සැලකිලිමත් වෙත්වා!

## මෛත්‍රියේ පිවිතුරු දර්ශනය

"එළවළු පමණයි. උම්බලකඩවත් මිශ්‍ර නොකරන්න" නිස්සරණ වනයෙන් දාන දායකයාට එවන විස්තර පත්‍රිකාවේ ඉහළින්ම සඳහන් වන්නේ මේ වචන ටිකයි. එය නිස්සරණ ප්‍රතිපදාවේ එක් පූර්වාදර්ශයක් ලොවට හෙළි කරයි. සම්බුදු සසුන කරුණා ශාසනයයි. සම්බුදු දහම කියාදෙන අනුපමේය වූ අපරිමිත වූ මහ මෙත දක්වන්නේ **"සබ්බේ සත්තා භවන්තු සුඛිතත්ථා"** යනුවෙනි. 'සියලු සත්වයෝ සුවපත් වෙත්වා' යන මෛත්‍රී සංකල්පයට අනුව කිසිම කෙනෙකුට තවත් සත්වයෙකුගේ ජීවිතයට අල්පමාත්‍ර වූ තර්ජනයක්, වධයක්, වේදනාවක් ඇතිවන අයුරින් හැසිරිය නොහැක.

බුදු දහම මෛත්‍රිය ප්‍රායෝගිකව ජීවිතයට හුරු කරන්නේ ඉතා ක්‍රමානුකූලවය. පළමුව තමා පිළිබඳ මුදු මොළොක් බව ගොඩ නගා ගත යුතුය. ඕනාම කෙනෙකු නිරෝගිව, සැපවත්ව, නිදහසේ ජීවත්වීමට කැමතිය. 'මා මෙන්ම' අන් අය ද ඒ කැමැත්ත ඇතිව සිටින බව වැටහිය යුතුය. මෛත්‍රී භාවනාවට පාදක වන්නේ එබඳු සිතුවිලි දාරාවකි. බුදු දහමේ එන මෛත්‍රී සංකල්පය විශ්ව මෛත්‍රියකි. එය 'මානව දයාව' හෝ අසල්වැසියාට ප්‍රේම කිරීම, වැනි පටු සිතිවිල්ලක් නොවේ.

පූර්ණ ලෙස මෛත්‍රී සංකල්පය දියුණු කරගත් පුද්ගලයාට සත්ව හිංසාවක් කිරීමට තබා ඊට අනුබල ලැබෙන කිසිම ක්‍රියාවක් කිරීමට හෝ සිතීමටවත් නොහැකිය. මස් මාංශ අනුභවය කිසිසේත් කළ නොහැකිය. කල්ප කෝටි ගණන් දිගු සසර ගමනක ආ අපිට මව නොවූ පියා නොවූ, ඥාති මිත්‍ර නොවූ කිසිදු සත්වයකු නැතැයි සිතීම බුද්ධි ගෝචරය.

කරණීය මෙත්ත සූත්‍රය, ඛන්ධ සූත්‍රය වැනි සූත්‍ර ධර්ම මෙම විශ්ව මෛත්‍රී සංකල්පය ප්‍රායෝගිකව පුරුදු කරන හැටි පෙන්වා දෙයි.

**"මාතා යථා නියං පුත්තං - ආයුසා ඒක පුත්ත මනුරක්ඛේ"**
"මවක් තම එකම දරුවා රකින්නා සේ", සියලු සත්වයා අකලංක මිත්‍රත්වයෙන් ගෙන සැලකුවමනා බවයි, මෙයින් දක්වන්නේ.

ජීව පැවැත්ම රඳා පවත්නේ විශ්ව මෛත්‍රිය මතයි. අද මේ තත්වය භයානක ලෙස පිරිහෙමින් පවතී. සියලු විපත්, කරදර, රෝග පීඩා ඒ නිසාය. බුදු දහම සසර පැවැත්ම නිසි ලෙස ක්‍රමවත් ලෙස සසර නැවැත්ම කරා යොමු කරවයි. ආධ්‍යාත්ම සංවර්ධනයෙන් තොර භෞතික සංවර්ධනය මුළු විශ්වයම විනාශ කරමින් සිටී. මස් මාංශ අනුභවයට ගිජුකම් දක්වන වත්මන් මිනිසා මේ ජීවිතය තුළම අපා දුක් වලට යොමු කරන හැටි විමසා බලත්වා!

සත්ව මාංශ අනුභව කරන ගිහි පැවිදි කිසිම කෙනෙකුට පන්සිල්වත් නැති අයුරු විමසා බලන්න. කොළ වර්ග පමණක් ආහාරයට ගන්න අලියා, ගවයා, එළුවා, මුවා ආදී සතුන් කොතරම් ශක්ති සම්පන්නද? ආහාරයේ ගුණ පිළිබඳ වැරදි දර්ශන ඔස්සේ ද මිනිසා මුලා වී ඇත. ආදි කාලීන පෙරදිග දර්ශනයන් ඍෂි භාෂිත ඔස්සේ තම නුවණැස යොමු කිරීමට කාලය පැමිණ ඇත. ප්‍රාණඝාතයෙන් වැළකීමේ සිල් පදය නිවැරදිව දකින්නේ නැත.

"නිහිත දණ්ඩො, නිහිත සත්ථො ලජ්ජී දයාපන්නො සබ්බ පාණ භූත හිතානුකම්පී විහරති"

පළමුවෙනි සිල් පදය නිවැරදිව අනුගමනය කරන්නා ජීවත් වන අයුරු ඉතා පැහැදිලිව දක්වා ඇත. දඬු මුගුරු අවි ආයුධ වලින් තොරවීම (සත්ත්ව හිංසාවෙන් තොරවීම) එවැනි වැරදි කිරීමට ලැජ්ජා වීම හා දයාව පැතිරවීම, සියලු සත්ත්ව වර්ගයා, කෙරෙහි හිතවත්කම අනුකම්පාව පතුරවමින් ජීවත්වීම යි, සිල්වතාගේ ජීවිතය. මෙය ගැඹුරු දර්ශනයකි.

## 'සබ්බේ සං ජීවිතං පියං'

සියලුම සත්ත්වයා තමන්ගේ ජීවිතයට ප්‍රිය කරයි. එබඳු අසරණ අහිංසක සත්ත්වයින් හඬව හඬවා අපමණ දුක් වේදනා දී ඔවුන්ගේ අකමැත්තෙන් මරණයට පත් කළ සතුන්ගේ මාංශ අනුභව කරන්නා මිනිස්කමට ගැලපේද? කැමැත්තෙන් නුදුන් දේ නිසා සොරකම් කිරීමකි. වැරදි ලෙස රස තෘෂ්ණාවට වහල් වීම නිසා තුන්වෙනි සිල් පදයත්, දිගටම කීවේ බොරුව නිසාත් සිල් පද හතරක් ම කඩන මාංශ භෝජීන්ට පන්සිල් පිහිටන්නේ නැත. උසස් සීල ගැන කියනුම කවරේද? මෛත්‍රී භාවනාව කළ නොහැකිමය. සමාධියක් ඇති නොවේ. මාංශ අනුභව කරන්නා සාධු සමාජයේ ගර්හාවට පිළිකුලට ලක්වෙයි. "ගව මස් කන්නා රොඩියා" කියා අපේ මුතුන් මිත්තන් එබඳු අය සමාජයෙන් කොන් කළේය.

නිර්මාංශ භෝජියා සියලු සතුන්ට අභය දානය දෙන්නෙකි. බුදු දහම, හින්දු දහම හෝ පුරාකෘත පුණ්‍ය බලයකින් හෝ බිහිවුන නිර්මාංශ භෝජී මනුෂ්‍යයා උත්තරීතර මනුෂ්‍ය රත්නයකි. බුදු පුතුන් විය හැක්කේ ඔවුනට ය.

මීතිරිගල නිස්සරණ වනයේ යෝගාවචරයන් වහන්සේලා පිළිබඳ අපට කෙතරම් පිවිතුරු ලෙස සිතිය හැකිද? සිත් ප්‍රසාදයට පත් කරගත හැකිද?

## කුසල් පෙරහැරේ හැඩගැස්ම

සමිතියේ මුල් දායක පිරිස 1974 දී නිස්සරණ වනයේ අමරණීය සාමාජිකත්වය ලබාගැනීම සතුටකි. මුළුතැන්ගෙය හා පිණ්ඩපාත ශාලාව ඉදිකළ මුල් කාලයේ වඩු මහත්තයාගේ මූලිකත්වයෙන් හිරමන, පිහි, බංකු, මේස ආදී භාණ්ඩ ටිකක් සැපයූ හැටි සමිතියේ පැරණිම සාමාජිකයෙකු වන සභාපති, නිවුන්හැල්ල මහතා සිහිපත් කරයි.

1969 ආරම්භ වූ නිස්සරණ වනයේ වාර්ෂික දානයට සහභාගී වන පිරිස කෙමෙන් වැඩි විය. අවුරුදු දෙක තුනකට පසු හැත්තෑවක පමණ පිරිසක් නිස්සරණ වනයට පැමිණි අවස්ථාවකි. නායක සමිඳුන් බැහැ දැකීමට ගොස් ප්‍රීතියෙන් පිනා ගිය පිරිසේ අභිප්‍රාය ප්‍රකාශ කරන්ට සිතු

වඩුමහත්තයා "අවසර ස්වාමිනි, ඔබ වහන්සේ දැක ගන්ට අපි බොහොම ආසාවෙන් හිටියෙ" යනුවෙන් ගෞරවාන්විතව ප්‍රකාශ කළේය. අඩ බැල්මක් ඇතිව මුවගට සිහින් සිනාවක් නගාගත් මහෝපාධ්‍යායය හිමියන් "ආසාව, ආසාව නේද? ආසාව හොඳ දෙයක් නොවෙයි නෙ. අපි මේ සසර දිගින් දිගට ගෙනියන්නේ ඔය ආසවනෙ. ඒක ටික ටික අඩුකර ගන්න ඕන" යනුවෙන් ඉතා කුළුණු බරව සිහින් හඬින් වදාළ හැටි ඔවුන්ට මතකය. ආසාවෙන් පටන් ගෙන, ආසාව නැතිකර අමා මහ නිවන කරා ගමන් කරන හැටි ධර්ම ප්‍රාතිහාර්යයක් පානා සේ සරල කෙටි එහෙත් ගැඹුරු ධර්ම දේශනයකට වඩු මහත්තයා මාතෘකාව සැපයූ හැටි නිවුන්හැල්ල මහතා සිනාමුසුව අදත් මතකයට නංවයි.

අවුරුදු හය හතකට පසු ලෝලුවාගොඩ නිවුන්හැල්ල මහතාට ඇටඹේ බේලින් උපාසක මහතා හමු විය. නිස්සරණ වනයේ වාර්ෂික දාන දිනයට මීතිරිගල යන්ට ඔහුට කළ ආරාධනය පිළිගැණුනි. නිස්සරණ වනයට ගිය පසුව බේලින් මහතාට ඇති වූ සතුට, ස්ථානය පිළිබඳ අවබෝධය, පැහැදීම ආදී සියලු ධනාත්මක ආකල්ප සම්ප්‍රේෂණය වූයේ ඇටඹේ කරුණාතිලක රාළහමි වෙතටය. එයින් පසු ලෝලුවාගොඩ පිරිසට ඇටඹේ, බටපත ඇල, කටුගම්පොල යන ගම්වලින් ද සැදැහැති පිරිස් සම්බන්ධ වූහ.

පරලෝ සැපත් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා නියෝජිත චාර්ලිස් හෙට්ටිආරච්චි මහතාගේ දක්ෂ සංවිධායකත්වයත්, දුර දක්නා නුවණත් නිසා නිස්සරණ වනයේ ජූනි 24 දාන දායක පිරිස ව්‍යවස්ථානුකූල සමිතියක් බවට පත් වී ස්ථාවර පදනමක් වැටුණේ මෙසේ පිරිස වැඩි වීමෙන් පසුවය.

## පින් කෙතේ වැඩෙන පින් රුක

"ලෝලුවාගොඩ සහ ඇටඹේ මීතිරිගල නිස්සරණ වන දාන දායක සමිතිය" යනු ගුණ සුවඳ විහිදුවන යහපත් මිනිසුන්ගේ එකතුවකි. සමගි සම්පන්නකම, අන්‍යෝන්‍ය විශ්වාසය, අධිෂ්ඨානය, කැපවීම, අනතිමානය, පරිත්‍යාගශීලීත්වය ඔවුන්ගේ සුවිශේෂ ලක්ෂණ කිහිපයකි. වැඩිහිටියන් සෙවනට එන තරුණ හා ළමා පෙළ තුළ පවා දැඩි සංයමයක් දැකිය හැක. ආකර්ශණීය ලෙස පූර්වාදර්ශයන් ඔවුන්ගේ සිත් සතන්වල ගොඩනැගී ඇත. මේ හැඩගැස්ම, මේ පන්නරය, මෙම සංවිධිතභාවය පිළිබඳව දැනට අප අතරින් වියෝවී ඇති ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් කිහිපදෙනෙකු ගෞරව පෙරදැරිව අනුස්මරණය කිරීම අපේ බලවත් යුතුකමකි. ලෝලුවාගොඩ රක්ෂණ නියෝජිත හා පත්‍ර කලාවේදී චාර්ලිස් හෙට්ටිආරච්චි මහතා, අක්ෂි වෛද්‍ය ඇටඹේ එච්. එම්. පී. කරුණාතිලක රාළහාමි, ලෝලුවාගොඩ මැදිහේන වත්තේ සාම විනිසුරු කුලසේකර රත්නායක මහතා, පාඨශාලාචාර්ය යටත්තාවල ජයසේන මහතා, ඇටඹේ එන්. ඒ. බේලින් සිංඤ්ඤෝ මහතා ඇතුළු එදා මෙදා තුර අපේ පින්කම්වලට ඇප කැප වී උදාර සේවයක් කර පරලෝ සැපත් හැමදෙනා ආදර ගෞරවයෙන් සිහි කරමු. තව තවත් ඉදිරියට අතුපතර විහිදුවා මල් පල දරා වැඩෙන පින් රුක දෙස බලා ඔවුන් සතුටු වනවා ඇත. අප කරන මේ පින් අනුමෝදනා වනවා ඇත.

සාරාණීය ප්‍රබල කුසල් සිදුකරන තැනක ඊට සැසඳෙන පෙර පින් මහිම ඇති අය එකතුවීම ධර්මතාවයකි. එවිට ඒ කුසල් වඩ වඩාත් ප්‍රබල ලෙස ඉටු කිරීමට ශක්තිය ලැබේ. තමා දැනගත්තත් නැතත් බලවත් කුසල් එයට අනුරූප ආනිසංස ගෙනදීමට සමත්ය. හැම පින්කමකම ඇති සැප විපාක ලැබීමේ ශක්තිය අප නොපැතුවාට ධර්මානුකූලව ලැබේ. පිනෙහි විපාක ඇත්තේ පරලොවට පමණක් නොවේ. සියලු කුසල් අකුසල්වල ආනිසංස විපාක මෙලොව සිටම, අද අදම ලැබේ. පිනෙහි ආනිසංස වශයෙන් දක්වන සැප සම්පත් කෙරෙහි ඇලීම තෘෂ්ණාව වැඩීමයි. තෘෂ්ණාව අඩුකර ගැනීමයි දානයකින් බලාපොරොත්තු විය යුත්තේ. නිවන යනු අලෝභ, අදෝෂ, අමෝහ ස්වභාවයයි.

## අපේ බෙහෙත් පූජා

1987. 06. 24 අපට අනුස්මරණීය දිනයක් විය. වාර්ෂික පිණ්ඩපාත දානයෙන් පසු සම්ප්‍රදායානුකූලව විශ්‍රාම ශාලාවේ පැවැත් වූ සමිති රැස්වීමට නව යෝජනාවක් ගෙන එනු ලැබුවේ ඇටඹේ එච්. එම්. පී. කරුණාතිලක රාළහාමි විසිනි. එනම්, යෝගාවචර ස්වාමීන් වහන්සේලාගේ නිරෝගී භාවය සඳහා කැප සරුප් පරිදි බෙහෙත් වර්ග ඇතුළත් පූජාවක් කරමුද යන්නයි. සාධුකාර මැද යෝජනාව සම්මත විය. ඒ අනුව ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලය වූයේ අපේ පළමුවෙනි බෙහෙත් පූජා පින්කම 1987. 12. 28 දින පැවැත්වීමයි.

ඒ අවස්ථාවේ ඉතා දීප්තිමත් තත්වයක පැවති සීමාසහිත දඹදෙණිය ආයුර්වේද සමූපකාර සමිතියෙන් ඖෂධ වර්ග සියල්ලක් මිලට ගනු ලැබීය. ඉතාමත් පිරිසිදුව හා ක්‍රමානුකූලව නියම ඖෂධ වර්ග යොදා පිළියෙල කළ මේ ඖෂධ වර්ග අපේ පින්කමට යොදා ගනු ලැබුවේ මහත් සතුටෙනි. රෝගීව පරලෝ සැපත් වනතුරුම බෙහෙත් පූජා පින්කම්වල ප්‍රබලම ක්‍රියාකාරී සාමාජිකයා වූයේ අක්ෂි වෛද්‍ය ඇටඹේ කරුණාතිලක රාළහාමි බව ඉමහත් ගෞරවයෙන් සටහන් කරමි.

මීතිරිගල නිස්සරණ වන සංරක්ෂණ මණ්ඩලයේ 1991-92 සංවත්සර රැස්වීම් වාර්තාවේ 8 වෙනි පිටුවෙහි "සීමාසහිත දඹදෙණිය ආයුර්වේද සමූපකාර සමිතිය මගින් වාර්ෂිකව කරනු ලබන දේශීය බෙහෙත් ද්‍රව්‍ය ප්‍රමුඛ පූජාවන්" යනුවෙන් පුණ්‍යානුමෝදනයක් ඉදිරිපත් කර ඇත. එම සමිතිය මෙම පින්කමට කිසිම සම්බන්ධයක් නොමැති බව සටහන් කරමි. අපේ සමිතිය හා එම බෙහෙත් නිෂ්පාදන සමිතියත් අතර තිබුණේ මුදල්මය ගනුදෙනුවක් පමණි.

දඹදෙණිය ආයුර්වේද සමූපකාර සමිතිය බිඳ වැටීමෙන් පසුව ශ්‍රී ධන්වන්තරී ඖෂධ නිෂ්පාදන සමිතියෙන් ඖෂධ මිලට ගන්ට යෙදුණි. පසුව යක්කල වෛද්‍යාචාර්ය අභාවප්‍රාප්ත කවිරාජ් කේ. ඒ. ජිනදාස වෙද මැතිතුමාගෙන් හා යක්කල සිද්ධායුර්වේද ඖෂධ රසායනාගාරයෙන් ඖෂධ මිලට ගත්තෙමු. දැන් අපි දිගටම ඖෂධ වර්ග ලබාගන්නේ ඒ අයුරින්ය. ඇතැම් ඖෂධ පූජා පින්කම් වලදී අප මිලට ගන්නා බෙහෙත්වලට අමතරව 'ටාටා ආයුර්වේද ඖෂධ' නිෂ්පාදන අධිපති වෛද්‍ය ජයන්ත එදිරිසිංහ මහත්මා සහ වෛද්‍ය සුමනා එදිරිසිංහ මහත්මිය විසින් 'ටාටා ඖෂධ' මහත් රාශියක් පූජා කරනු ලැබීය. හැමවිටම ඉතාමත් වගකීමෙන් යුතුව ඖෂධ වර්ග සපයා ගනු ලබන හෙයින් පුද්ගලයන්ට වෙන වෙනම ගෙනවිත් නිෂ්පාදිත ඖෂධ වර්ග පූජාවට එක් කිරීමට අවසර දෙනු නොලැබේ.

ආයුර්වේද නිෂ්පාදනවල ඖෂධීය ගුණ පාවිච්චි කරන අවස්ථා හා පිළිවෙල පිළිබඳව දැනුවත් කිරීමේ සටහන් වෙනම පොතක් වශයෙන් සකසා පූජා අවස්ථා දෙකකදී සපයා ඇත.

වන ඖෂධ ඉදිරිපත් කිරීමේදී ඉතාමත් පිරිසිදු ස්ථානවලින් ඒවා සපයා ගැනේ. එසේ ලබාගත් වන මුල් කොළ පොතු ආදිය සුදුසු පරිදි සෝදා වියළා පෙට්ටිවල අහුරා නම් සඳහන් කර පූජාවට ඉදිරිපත් කෙරේ. එක් පූජා පින්කමකට අපේ එක උපාසක මහත්මයෙකු සත් තිස් බෝධි පාක්ෂික ධර්මයන්ට පූජා පිණිස වන ඖෂධ වර්ග 37 ක් ඉතා හොඳින් සෝදා වියළා පෙට්ටිවල (කි. ග්‍රෑ. 2 බිස්කට් පෙට්ටි) අහුරා පූජාවට එක් කරනු ලැබීය. මේ අපේ පිරිසේ ශ්‍රද්ධාවත්, කැපවීමත් පිළිබඳ එක් උදාහරණයක් පමණි. අමුඉඟුරු, අමු කහ, රසකිඳ ආදී අමුවෙන් ගන්නා බෙහෙත් බඩු එසේ අමුවෙන් සැපයේ.

## සිව්පසා පූජාවක් බව

ආයුර්වේදය හා බුදු දහම අතර ඇති සමීප සබඳතාවය නිසාත්, දේශීය වෙදකම සිංහල බෞද්ධයාගේ ජීව රුධිරය බඳු නිසාත් අපි ආයුර්වේද බෙහෙත්වලට ප්‍රමුඛතාවය දුන්නෙමු.

මෙය සැබවින්ම ඖෂධ පූජාවක් පමණක් නොව **සිව්පස පූජාවකි.** පළමුවන බෙහෙත් පූජා පින්කමේදී ම එම සහතිකය දුන්නේ අපවත් වී වදාළ මහෝපාධ්‍යායාය මාහිමිපාණන් වහන්සේ විසිනි. නමුත් විශාල ප්‍රමාණයක් බෙහෙත් වර්ග ඇති නිසාත් ආරම්භ කළේ ඖෂධ පූජාවක් යන සිතුවිල්ල ඇතිව නිසාත් 'ඖෂධ පූජාව' යනුවෙන් හැඳින්වීමට හැමෝම පුරුදුව සිටී. අනිවාර්යයෙන්ම හැම බෙහෙත් පූජා පින්කමකටම සේනාසන සඳහා අවශ්‍ය ගරු භාණ්ඩ ද විශාල හෝ කුඩා ප්‍රමාණ වශයෙන් ඇතුළත් වෙයි. හැම පූජා පින්කමකට ම අට පිරිකරක් පූජා කිරීමේ 'වරම' ද අපට ලැබුණේ අපවත් වූ නා සමිඳුන්ගේ මහා කරුණාව නිසාමය.

අපේ වාර්ෂික බෙහෙත් පූජා නැත්නම් සිව්පස පූජා පින්කම් වලදී බෙහෙත් ද්‍රව්‍ය හා ගරු, ලඝු සේනාසන භාණ්ඩ සැපයීම කෙරෙන්නේ කිනම් ප්‍රමිතියකින් දැයි කෙනෙකුට ප්‍රශ්නයක් ඇති විය හැක. බෙහෙත් ද්‍රව්‍ය අප සපයනු ලබන්නේ ඉදිරි වර්ෂයකට සෑහෙන පරිදිය. බොහෝ විට මේ බෙහෙත් වර්ග යෝගාශ්‍රම සංස්ථාවට අයත් වෙනත් සේනාසනවලටත් අවශ්‍යතා පරිදි මීතිරිගලින් සැපයෙන බව අසා ඇත. ඒ අනුව අපි පූජා පින්කමට සෑහෙන කාලයක් ඉදිරියට තිබියදී තොරතුරු රැස්කර, දෙවනු මුදල් සොයා ගැනීම හා වන ඖෂධ ආදිය සපයා ගැනීමට කාලය, ශ්‍රමය වැය කිරීම ආදී කැප කිරීම් කරනු ලැබේ. අදාල යෝගාවචර ස්වාමීන් වහන්සේලා සමග සාකච්ඡා කිරීමෙන් කෙළින්ම අසා දැන හෝ ඉඟියෙන් හෝ අපි අවශ්‍යතා ලැයිස්තු සකස් කරන්නෙමු. 10 වෙනි බෙහෙත් පූජා පින්කමේ **සුවිශේෂ පූජාව වූ 'ශමථ විදර්ශනා භාවනා මාර්ගය'** පොත නැවත මුද්‍රණයට අපට අවස්ථාව ලැබුණේ 'ධර්ම පූජාව'ක් සඳහා අපට අවස්ථාව සලසා දෙන්නැයි කළ ඉල්ලීම අනුවය. නිස්සරණ වනයේ කැපකරු දායකයන් වන අපට ගරු ස්වාමීන් වහන්සේලාගෙන් සේනාසනයේ අඩුපාඩු අසා ගැනීමට හුඟක්ම අමාරු නැත.

පළමුවන සිව්පස පූජා පින්කමේ සිට සියලුම බෙහෙත් පූජා පින්කම්වලට පොදුවේ ඇතුළත් වූ **බෙහෙත් ද්‍රව්‍ය හා ගරු භාණ්ඩ** ලැයිස්තුවක් පොතට ඇතුළත් කිරීම ඉතා වැදගත් යයි කල්පනා විය. හේතුව මේ පින්කම් ඇසින් නුදුටු කෙනෙකුට එහි සාරාණීය බව පිළිබඳ චිත්ත රූපයක් ගොඩ නගා ගැනීම අපහසු නිසාවෙනි. අනුන් කළ පින් මහත් ප්‍රීති ප්‍රමෝදයෙන් ශ්‍රද්ධා පෙරදැරිව අනුමෝදන්ව බලවත් කුසල ශක්තීන් උපදවා ගැනීමට සමත් සත් පුරුෂ ජනයා වෙනුවෙන් එය කළ යුතු බව වැටහුණි.

දේශීය ඖෂධ වර්ග වශයෙන් අරිෂ්ට, ආසව, රසායන, කල්ක, චූර්ණ, තෙල් වර්ග, ගුලි වර්ග ආදිය මේ පූජා ද්‍රව්‍යයන්ට අයත් වෙයි. සාමාන්‍යයෙන් අරිෂ්ට ආදිය එක් වර්ගයකින් බෝතල් 2 - 6 වැනි ප්‍රමාණ ද, තෙල් වර්ග බෝතල් 1/4 ඒවා 4 - 8 වැනි ප්‍රමාණ ද චූර්ණ, රසායන ආදිය ග්‍රෑම් 50×4-8 වැනි ප්‍රමාණ ද, බොහෝ විට පූජාවලට ඇතුළත් වේ. ඒ අවස්ථාවන්ට අනුව මේ ප්‍රමාණ වෙනස් වෙයි. පළමුවෙනි බෙහෙත් පූජාවේ සිට ඉදිරිපත් කළ පොදු ලැයිස්තුවකි මේ සඳහන් වන්නේ.

| | | |
|---|---|---|
| දශමූලාරිෂ්ඨය | අශ්වගන්ධාරිෂ්ඨය | අමෘතාරිෂ්ඨය |
| බදිරා අරිෂ්ඨය | ධාත්‍ර්‍යාරිෂ්ඨය | මුස්තකාරිෂ්ඨය |
| දන්ත්‍යාරිෂ්ඨය | ද්‍රාක්ෂාරිෂ්ඨය | අභයාරිෂ්ඨය |
| අර්ජුනාරිෂ්ඨය | නිම්බාරිෂ්ඨය | බාලාරිෂ්ඨය |
| පිප්පල්‍යාද්‍යාශවය | උශිරාසවය | ලෞහාසවය |
| චන්දනාශවය | පුනර්ණවාසවය | කනකාශවය |
| ශාරිවාද්‍යාශවය | නෙල්ලි සිරප් | වාසක සිරප් |
| නාගර පානය | ඒරණ්ඩ සප්තකය | වාසක පංචාංග පැණිය |

| | | |
|---|---|---|
| කෛශෝර් ගුග්ගුලුව | යෝගරාජ ගුග්ගුලුව | ගොක්ෂුරාදි ගුග්ගුලුව |
| රජ්ණාදි සප්තකය | භාෂ්කර ලවණ | ච්‍යවන ප්‍රශාව ලේහය |
| බුද්ධ රාජ කල්කය | දෙසඳුන් කල්කය | නවරත්න කල්කය |
| චන්ද්‍ර කල්කය | ත්‍රිකටුකාදි ක්වාථය | නවකාර්ෂික ක්වාථය |
| දන්ති මූලාදි කෂාය | මහා රත් හඳුන් කෂාය | චන්ද්‍ර ප්‍රභාවටී |
| ප්‍රමේහ ගජංකුෂය | හිංගුවෂ්ටක චූර්ණය | මහා සරස්වතී චූර්ණය |
| මානි මන්ථ චූර්ණය | ශීතෝපලාදි චූර්ණය | අශ්වගන්ධ චූර්ණය |
| සැප විරේකය (ධාත්‍රි චූර්ණය) | ප්‍රමේහ ගජකේසරී රසායනය | ධාත්‍රී රසායනය |
| කුෂ්මාණ්ඩ රසායනය | ලශුන පද්ම රසායනය | කොත්තමල්ලි චූර්ණය |
| ශීතෝපලාදි චූර්ණය | සීතාරාම ගුලිය | වර්තිකාව |
| බටු තෙල් | රතුලූණු තෙල් | නීල්‍යාදි තෛලය |
| නිශාදි තෛලය | මහා නාරායන තෛලය | නිර්ගුණ්ඩ්‍යාදි තෛලය |
| පිණ්ඩ තෛලය | චන්ද්‍ර කාන්ති තෛලය | මහා වාත විදූරංග තෛලය |
| මහා සිද්ධාර්ථ තෛලය | ශුලහර තෛලය | මහා සර්ව විසාදි තෛලය |
| දන්ත්‍යාරක්ෂක දත් බෙහෙත | කෝලශ්ලේශ්මා තෛලය | |

**මේ හැරනු විට සාමාන්‍යයෙන් බෙහෙත් පූජාවට එක්වන තවත් වර්ග කිහිපයකි.**

| | | |
|---|---|---|
| කඩහපොල මූල රෝග සුවය | අර්ශස් කුඩු | සිද්ධාලේප |
| මීගමුවේ නාසානන්ද තෛලය | එළඟි තෙල් | තල තෙල් |
| මී පැණි | මී තෙල් | තැඹිලි තෙල් |

වැල්මිලෙක්ස්, වින්ටජිනෝ වැනි ඉංග්‍රීසි බෙහෙත් වර්ග කිහිපයක්.

ආදී ඒ ඒ අවස්ථාවට අවශ්‍ය වන තෙල් බෙහෙත් වර්ග සැපයේ. නිතරම පූජා සඳහා ඉදිරිපත් කරන ගරු භාණ්ඩ අතරට, උදලු, කැති, පොරව, පිහියා, රේක්ක, යකඩ නාරාසන ආදී දේ නම් කළ හැක.

කොසු, ඉදල්, පාපිසි, ලණු පැදුරු, පඩික්කන්, කොට්ට, මෙට්ට ආදී විවිධ සේනාසන භාණ්ඩ අවශ්‍යතාවය පරිදි අපේ සිව්පස පූජාවට එක්විය. මුලදී සාමාන්‍යයෙන් රු. 5000/= ක පමණ වැයක් සකස් කළ බෙහෙත් සඳහා අවශ්‍ය විය. පසු පින්කම්වලදී රු. 15000/= 20000/= ක පමණ වැයක් සකස් කළ බෙහෙත් වර්ග සඳහා පමණක් වැය කිරීම අවශ්‍ය විය.

අපේ මතකයට නැගෙන බෙහෙත් පූජාවට නොහොත් අපේ සිව්පස පූජාවට සම්බන්ධව පූජා කළ විශේෂ ගරු භාණ්ඩ කිහිපයකි.

1994. 01. 09 - 9 වන ඖෂධ පූජාව-ඇඳක්, වෙලාව හඟවන ගෙඩියක්, අල්මාරියක්.
1997. 02. 02 - 13 වන බෙහෙත් පූජාව-භාවනා ආසන 16 ක් පූජා කරන ලදී.
1998. 12. 27 - 14 වන බෙහෙත් පූජාව-ඇඳක්, පඬු ඔරුව, වෙලාව හඟවන ගෙඩියක්.

වානේ කබඩ් එකක් පූජා කිරීම සහ ඖෂධ ගබඩාවට රාක්කයක් අලුත් වැඩියා කර දීම ද සතුටින් සිහියට නැගේ.

සැබවින්ම භික්ෂූන් වහන්සේලාගේ පරිභෝගයට අවශ්‍ය ගරු භාණ්ඩ හෝ ලඝු භාණ්ඩ ගණයට වැටෙන කුමක් පූජා නොකළේද කියා සිතා ගැනීමට බැරිය. අවුරුදු 35 කට ආසන්න කාලය තුළ වාර්ෂික පිණ්ඩපාත දාන දිනය හා බෙහෙත් පූජා (සිව්පස පූජා) පින්කම්වලදී අවශ්‍යවන හැම දෙයක්ම පූජා කර ඇතැයි සිතේ.

## සුවිශේෂ පින්කම් කිහිපයක්

### *1. කුටි අලුත් වැඩියා පින්කම*

ලෝලුවාගොඩ සහ ඇටඹේ මීතිරිගල නිස්සරණ වන දාන දායක සමිතියට නිස්සරණ වනයේ යෝගාවචර භික්ෂූන් වහන්සේලා සඳහා කුටියක් ඉදිකරවීමට ඇත්නම් යන පුණ්‍යකාමී සිතක් පහළ විය. නමුත් අවසර නොලැබුණි. ඒ වෙනුවට අබලන් වූ කුටි දෙකක් අලුත් වැඩියා කිරීමේ වරප්‍රසාදය හිමි විය. ඒ වරම ලැබුණේ 1993 ජූනි 24 වාර්ෂික දාන දිනයේදී ය.

1993 සැප්තැම්බර් 13 කුටි අලුත් වැඩියා කිරීමේ මහා ශ්‍රමදානය, එම මහා පින්කම සිදු කළෙමු. සමූහ භාවනා ශාලාවත්, යෝගී කුටියකුත් අලුත් වැඩියා කරන ලදී. රු. 6000/= ක පමණ මුදලක් අවශ්‍ය භාණ්ඩ සඳහා වැය වූ අතර සියලු කටයුතු සිදු වූයේ පුණ්‍යකාමී දායක භවතුන්ගේ ශ්‍රමය කැප කිරීමෙනි. මෙම පින්කමේ සුවිශේෂ ලක්ෂණයකි එය.

මෙම ශ්‍රේෂ්ඨ පින්කමේදී සුවිශේෂ වූ විශාල වැඩ කොටසක් කළ ඇටඹේ එන්. එච්. ඒ. ගාමිණී ජයවීර තරුණ මහතා පසුකලක හදිසි රෝගාබාධයකින් පරලෝ සැපත් විය. එතුමාට අපි සසර වසන තුරා නිරෝගි බව හා දීර්ඝායුෂ වළඳා පැතුම් පරිදි අමා මහ නිවණින් සැනසීමට ලැබේවායි පුණ්‍යානුමෝදනා කරමු.

### *2. විහාර මන්දිරයේ අලුත් වැඩියාවක්*

යෝගාවචරයින් වහන්සේලාගේ බොජුන් හලට යාබද විහාර මන්දිරයේ පිඟන් ගඩොල් ඇල්ලීමේ බුද්ධෝපස්ථාන මහා පින්කමක් සඳහා ද අපට පින පෑදුණි. 1997. 12.. 22 වැනි දින මේ පින්කම කරන ලදී. මෙහිදී බුදු මැඳුරේ බිමට පිඟන් ගඩොල් ඇල්ලීමත්, මල් ආසනයට ෆෝමිකා ව.ස්මක් යෙදීමත් කරනු ලැබීය. බුදු මැඳුරට ගැලපෙන කදිම සුන්දර තිර රෙද්දක් යෙදීමෙන් පසු පින්කම සම්පූර්ණ විය.

## බෙහෙත් පූජාව ගිලන් සංග්‍රහයකි. එය බුද්ධ පූජාවකි.

ගිලනුන්ට සංග්‍රහ කිරීම, ගිලන් වීමෙන් වළක්වා ගැනීම බුදුරජාණන් වහන්සේගේ ධර්මය අනුගමනය කිරීමකි. ජරාව නම් වූ වයසට යාමත්, ව්‍යාධිය නම් වූ රෝගාතුර වීමත් නිසා ඕනාම කෙනෙකු ගිලන් බවට පත්වේ. ගිලනුන්ට සැලකීම ඉතා උසස් ගුණයක් බව බුද්ධ දේශනාවේ සඳහන්ය.

"යො ගිලානං උපට්ඨහෙය්‍ය සො මං උපට්ඨහෙය්‍ය" යමෙක් ගිලනුන්ට උපස්ථාන කෙරේද? හේ මට උපස්ථාන කෙරේ, යනුයි. එයින් පෙන්වන්නේ ගිලනුන්ට උවැටන් කරන්නා බුද්ධ අවවාදය අනුව කටයුතු කරන බව හා බුදු පියාණන් වහන්සේට ගරු කරන බවයි. බුදු රජාණන් වහන්සේ තමන් වහන්සේ විසින්ම ගිලනුන්ට උවැටන් කර ලොවට ආදර්ශයයෙන් ම එය දැක් වූ සේක.

ගිලානෝපස්ථානය පුද්ගලයාගේ ආධ්‍යාත්ම සංවර්ධනයට හේතු වෙයි. එයින් කරුණාව, මෛත්‍රිය, පරෝපකාරය දියුණු වෙයි. තමාට මෙන්ම අනුන්ට ද හිත වැඩ සැලසේ.

ගිලනුන්ට උපස්ථාන කිරීම නිරෝගී වීමට හේතුවෙයි.

"දෙනකගෙන් කිරි බින්දුවක් දෙවීමට ගතවන කාලයක් වැනි සුළු කාලයක්වත් ආබාධයකින් පෙළුණු බවක් නොදනී.

අරළු කැබැල්ලක් තරම්වත් බෙහෙතක් ගත් බවක් නො දනිමි"
**(බක්කුල සූත්‍රය - මජ්ඣිම නිකාය)**

අප විසින් භාවනා ආසන පූජා කළ අවස්ථාවේදී ආසන 16 න් එක් ආසනයක වැඩ හිඳ නායක හිමිපාණන් වහන්සේ බක්කුල සූත්‍රයෙන් අපට දහම් දෙසූ සේක.

## කායික ලෙඩ අඩුකර ගනිමු.

මේ සම්බුද්ධ ශාසනයේ නිරෝගිම ශ්‍රාවකයාණන් වහන්සේ බක්කුල මහ රහතන් වහන්සේය.

**"ඒත දග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛුනං**
**අප්පාබාධානං යදිදං බක්කුලො"** යි වදාළ සේක.

නිරෝගි වූවන්, අල්ප ආබාධ ඇත්තවුන් අතරින් අග්‍රයි යන අග තනතුරු ලැබුන අයුරුයි.

උන්වහන්සේ මේ තත්ත්වය ලැබීමට සසරදී කළ පින්කම් මොනවාද?

ප්‍රධාන කොට සඳහන් වන්නේ අනෝමදස්සී බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ ලක්ෂයක් මහ රහතන් වහන්සේලාට ඇති වූ වාතාබාධයකට ඖෂධ සපයා දී සුවපත් කිරීමයි. තුන් සිත පහදවා කළ පින්කම්ය. කාශ්‍යප බුදු රජාණන් වහන්සේගේ කාලයේ දුබල වූ කුටි අලුත් වැඩියා කිරීම නිරෝගී බවට හේතු වූ තවත් පින්කමකි. අල්ප ආබාධ ඇතිවන්ට හේතු වූ ප්‍රබල පින්කම වූයේ සත්ව හිංසාවෙන් තොර වීමයි. එසේම ගිලන් උවටැන, මෙත් සිතින් සත්වයින්ට පිහිට වීම අතිශය වැදගත් කරුණු කිහිපයකි.

බුදු දහම, හින්දි ආගම වැනි පෙරදිග ශ්‍රේෂ්ඨ දර්ශනයන්ගෙන් පැහැදිලි වන කරුණකි, කායික මානසික නිරෝගී බව පිළිබඳ අන්‍යොන්‍ය බලපෑම. ශරීරය නිරෝගී වීමට නිරවද්‍ය ආහාර-හොඳ නිර්මාංශ ආහාර, අවශ්‍ය පමණට ව්‍යායාම ආදිය හේතුවෙයි. මානසික සුවතාවය ඇතිවන්නේ මෛත්‍රිය, කරුණාව, ශ්‍රද්ධාව, දයාව ආදී ගුණ ධර්ම වලිනි.

පාපයට බර සිතුවිලි වලින් මනස ලෙඩ වෙන අතර ඒ මඟින් ශරීරය ද රෝගී වන්නේය. කායික මානසික නිරෝගීතාවය ගැන නිවැරදිව උගන්වන ශ්‍රේෂ්ඨ දර්ශනයක් බුදු දහම හැර වෙන නැත.

ලෞකික හෝ ලෝකෝත්තර සැප ලබා ගැනීමට කායික මානසික නිරෝගිකම අවශ්‍ය වේ. කායික ලෙඩ අඩු වුවත් මානසික ලෙඩ අඩුකර ගැනීම නම් ඉතා දුෂ්කරය. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට පනවා වදාළ සිව් පසය අතර "ගිලාන පච්චය භෙසජ්ජ පරික්ඛාරය" එකක් වශයෙන් හඳුන්වා ඇත. ගිලන්පස යයි බෞද්ධයන් අතර ඉතා ප්‍රකටව පවතින්නේ ඉර අවරට යාමෙන් පසුව වළඳන පැන් වර්ග, ගිතෙල්, වෙඬරු, හකුරු, මී පැණි වැනි දේයි. භික්ෂූන්ගේ නිරෝගී බවත්, සරල පැවැත්මත් සලකා එළ ගවයන්ගේ මුත්‍ර ගිලන්පස වශයෙන් වළඳන්ට නියම කළේය. පාණ්ඩු රෝගයෙන් පෙළෙන භික්ෂුවකට එළ මුත්‍ර අරළු දමා වළඳන්ට අනු දත් සේක.

## සත්හට වන බව දුකට වෙදාණන්

දෙතිස් කුණපයක් වූ මේ කය නිතර ලෙඩවන සුළුය. කොතෙක් සප්පායම් කළත් ජරා, ව්‍යාධි මරණයෙන් ගලවා ගත නොහැක. එසේ වුවත් කය ව්‍යාධියට ගොදුරු වීම හැකිතාක් අඩුකර ගත යුතු වේ. සසර දුක නමැති අති භයංකර රෝගයෙන් මිදීමට හෙවත් සසර ගමන නැවැත්ම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනයට කයේ මනසේ නිරෝගිකම යම් තරමකින් හෝ පවත්වා ගැනීම අවශ්‍ය වන නිසාවෙනි.

බුදුවරු ලොව පහළ වන්නේ සත්ත්වයා සසර දුකින් මුදවාලනු පිණිස වෙති. අමා නිවනින් සනසා ලනු පිණිසය. කායික රෝගවලින් නොපෙළී කලක් සිටිය හැකි වුවත් සාමාන්‍ය සත්වයාට මානසික රෝගවලින් මිදී මොහොතක්වත් සිටීමට අපහසු තරම්ය. පූර්ණ මානසික සුවය සඳහා බුදුවරු බෙහෙත් කරති. මානසික නිරෝගීතාවය ඇති වන්නේ කෙළෙසුන්ගෙන් මිදීමෙනි. එනම් අර්හත් භාවයෙනි.

තමා ශ්‍රේෂ්ඨතම ශල්‍ය වෛද්‍යවරයා බව බුදුරජාණන් වහන්සේ තමාම හඳුන්වා ගත් අවස්ථා ත්‍රිපිටකයේ නොයෙක් තැන පෙනෙයි. "වෛද්‍යවරු පිතින් හටගන්නා රෝග සුව කිරීමටත්, වාතයෙන් හටගන්නා රෝග සුව කිරීමටත්, සෙමෙන් හටගන්නා ලෙඩ සුව කිරීමටත් විරේචන දෙති. මමත් ජාති-ජරා-මරණ-සෝක ආදී රෝගයන්ගෙන් පෙළෙන සත්වයින්ට ආර්ය විරේකයක් දේශනා කරමි. එයින් ම සත්ත්වයා සුවපත් වේ" යයි බුදු හිමියෝ දේශනා කළහ.

අඞ්ගුත්තර නිකාය.

## ධම්මෝසධ සමං නත්ථි

ලෝකයේ විද්‍යාමාන කිසිම ඖෂධ වර්ගයකින් ජරා-ව්‍යාධි-මරණ යන ලෙඩ සනීප කිරීමේ හැකියාවක් නැත. බෙහෙත් වලට ඇත්තේ ඒ තත්වයන් තාවකාලිකව යටපත් කර තාවකාලික නිරෝගී බව හා ආයුෂය දික් කිරීමේ යම් ශක්තියක් පමණි.

මේ කායික හා මානසික රෝග සඳහටම නිට්ටාවට ම සුව කිරීමේ හැකියාව ඇත්තේ ශ්‍රී සද්ධර්මයට පමණි.

"යේකේචි ඕසධා ලෝකේ විජ්ජන්ති විවිධා බහු
ධම්මෝසධ සමං නත්ථි ඒතං පිවථ භික්ඛවො"

ලෝක සත්ත්වයාගේ කායික මානසික වශයෙන් හට ගන්නා වූ රෝගාබාධ සුවපත් කර ගැනීමට උපකාරවන විවිධ වූ බෙහෙත් වර්ග ලෝකයෙහි විද්‍යාමාන වෙයි. නමුත් ධර්මය හා සමාන ඖෂධයක් ලෝකයේ නැත. මේ ධර්මය නමැති ඖෂධය පානය කොට සංසාර නමැති භයානක රෝගය සුවපත් කර ගනිත්වා යනු ඉහත ගාථාවේ අර්ථයයි.

ඉපදීම-ජාති-සමගම රෝග ඇති වේ. බෙහෙතින් කලකට යම් රෝගයක් සුව වේ. වෙනත් රෝගයක් හෝ නැවත මතුවේ. ධර්මය නමැති ඖෂධය පානය කිරීම යනු **ධර්මය දැන ධර්මයට අනුව ජීවත් වීමයි.** ධර්මාවබෝධයට ගන්නා වෑයමයි. ධර්මානුකූල වීමෙන් ලෝභ-දෝෂ-මෝහ කියන කෙළෙස් රෝගයන් සුවපත් කරගත හැක. ඒ සුවපත්බව නිට්ටාවට සුවපත් වීමකි. එනම් අලෝබ-අදෝෂ-අමෝහ නම් වූ නිරෝගී බව ලැබීමෙන් අව්‍යාධි නම් වූ ශාන්ත නිවනට පත් වන්නේය.

"සබ්බ දානං ධම්ම දානං ජිනාති"

ධර්මය පරිත්‍යාග කිරීම ලෝකයේ සියලුම දානයන් පරදවන ශ්‍රේෂ්ඨතම දානය වන්නේ ඒ නිසාය. **ධර්මය පරිත්‍යාග කිරීම සදාකාලික සුවය ගෙන දෙන ඖෂධයක් දන් දීමකි.** සදාකාලික සුවය නම් අමා මහ නිවනයි. මේ දානය මේ පරිත්‍යාගය දිය හැක්කේ සම්බුදු සසුනකදී පමණයි. වෙනත් දානමය පින්කම් ඕනෑම කාලයකදී කළ හැකිය. ඒ නිසා **ධර්ම දානමය කුසලය සුවිශේෂ වූම මහා පින්කමකි.**

## අපේ ධර්ම දානමය මහා පින්කම් දෙක

මීතිරිගල නිස්සරණ වනයේදීත් අපි වරින්වර දහම් පොත් එක දෙක පූජා කර ඇත. නමුත් 10 වෙනි බෙහෙත් පූජා මහා පින්කමේදී අපි මහා ධර්ම දානමය පින්කමක් කළෙමු.

අපවත් වී වදාළ අති පූජ්‍ය, මාතර ශ්‍රී ඤාණාරාමාභිධාන මාහිමිපාණන් විසින් රචිත 'ශමථ විදර්ශනා භාවනා මාර්ගය' නමැති පොතේ තුන්වෙනි මුද්‍රණය කිරීමයි.

ඒ අවස්ථාවේ මෙම අති ශ්‍රේෂ්ඨ ග්‍රන්ථ රත්නයෙන් පිටපත් 3000 ක් මුද්‍රණය කරන ලදී. එයින් පිටපත් 2000 ක්ම නිස්සරණ වනයට වඩමවාගෙන විත් පූජා කරන ලදී. මෙය අප කළ ශ්‍රේෂ්ඨතම පූජාවකි.

මේ පින්කමේදී එහි සුවිශේෂ කාර්ය භාරයන් ඉසිලූ උතුමන් කීපදෙනෙකු සමරා පුණ්‍යානුමෝදනය කිරීම සමිතියේ වගකීමයි. පූජ්‍ය කටුකුරුන්දේ ඤාණානන්ද හිමිපාණන් වහන්සේ, හිටපු ග්‍රන්ථ ප්‍රකාශන නියෝජ්‍ය කොමසාරිස් හා කථිකාචාර්ය චන්ද්‍රදාස හතුරුසිංහ මැතිතුමා, කොළඹ විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දයා රෝහන අතුකෝරල මැතිතුමා සහ මහරගම ව්‍යාපාරික මහින්ද සපරමාදු මැතිතුමා විවිධ අයුරින් දායකත්වය ඉසිලූ අයුරු සිහිපත් කර පින් අනුමෝදන් වෙත්වා යි ආශිර්වාද කරමු.

අප කළ කුසල් පෙරහැරට අනුයාතව අතීතය සිහි කැඳවා, ලියන මේ පොතත් මහඟු ධර්ම දානයකි. ඒ ඒ තැනට ගැලපෙන ධර්ම කරුණු ද මතුකර ඇත. ඒ නිසා මෙය වාර්තාවක් නොවීමට වග බලා ඇත.

කළ පින් සිහි කැඳවන්නේ නිවනට එල්ල කොට ධර්මානුකූලවය. ඉදිරියට සවිමත්ව, ඔදවත්ව, තෙදවත්ව, ජව සම්පන්නව කුසල් පෙරහැරේ යාමට මග පෙන්වන දහම් කරුණුය. ඒ නිසා කියවන ඔබට යහපතක්ම වනවාට සැක නැත.

**'ධම්මෝ හවෙ රක්ඛති ධම්ම චාරි'**
ධර්මයෙහි හැසිරෙන්නා ධර්මය විසින්ම ආරක්ෂා කරයි.

# 12

# අප ඇසූ නිස්සරණ බණ

## 10 වන ඖෂධ පූජා මහා පිංකම - 1991. 08. 22

***මීතිරිගල නිස්සරණ වන අරණ්‍ය සේනාසනාධිපති, කර්මස්ථානාචාර්ය, පූජ්‍ය පානදුව බේමානන්ද මහා ස්ථවිරයන් වහන්සේගේ ධර්ම දේශනය***

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස!!!

ගෞරවණීය මහා සංඝ රත්නයෙන් අවසරයි,
ශ්‍රද්ධාවන්ත පින්වතුනි,

දැන් මේ අවස්ථාවේදී කරන්ට යන පූජාව පිළිබඳ මහත් විස්තරයක් මේ සංඝයා වහන්සේලා ඇතුලු සියලුදෙනාට ම දැනගන්නට ලැබුණා. මේ පිළිබඳව අමුතුවෙන් අපට හැඳින්වීමක් කරන්නට උවමනාවක් නැහැ. අපි දන්නව මේ ශ්‍රද්ධාවන්ත පින්වතුන්ගේ ශ්‍රද්ධා මහිමය කොතරම් දුරට අධිකව පවතිනවද, පවත්වනවද කියන බව. ඒ අනුව අවුරුදු දහයක් මුළුල්ලේම, මීට අවුරුදු දහයකට පෙර සුළුවෙන් පටන් ගන්නා ලද්දා වූ මේ බෙහෙත් පූජාව, ක්‍රම ක්‍රමයෙන් දියුණු වෙවී, දියුණු වෙවී ගිහිල්ලා අද ඉතාමත්ම උසස් තත්ත්වයකට පැමිණිලා තියෙනවා. මේ දහවෙනි වාරයයි. මේ දහවෙනි වාරයේදී මේ දායක පින්වතුන් විසින් කරනු ලබන මේ උදාරතර බෙහෙත් පූජාව පමණක් නොවෙයි, මේකට සම්බන්ධ නා නා ප්‍රකාර පූජාවන් ඇතුලත් වී තිබෙනවා. භික්ෂූන් වහන්සේලාට උවමනා කරන්නා වූ සිව්පසයට ම අයත් දේවල් මේ සමඟ පූජාවෙන බව අපට මේ පූර්ව වශයෙන් කතාකරන්ට යෙදුන කතාවලින් දැනගන්නට ලැබුණා. ඒ වගේම සියලුම පින් පරදවා කරගත යුතු සියලුම දානමය පුණ්‍ය ක්‍රියාවන්ට වඩා උසස් පුණ්‍ය ක්‍රියාවක් වූ ධර්ම පුස්තකයක් පූජා කර ගැනීමත් මේ අවස්ථාවේදී සිද්ධ කෙරෙනවා.

දානමය පුණ්‍ය ක්‍රියාව සාමාන්‍ය වශයෙන් සියලු දෙනාට ම සැප ලබාදෙන්නා වූ පුණ්‍ය ක්‍රියාවක්. දානමය පුණ්‍ය ක්‍රියාව වගේම ඊට වඩා උසස් පුණ්‍ය ක්‍රියාවක් තමයි මේ ධර්ම දානය කියන එක. ආමිෂ දානයන් සියල්ලක් ම පරදවා ජය ගන්නා වූ දානයක් ධර්මදානය. ධර්ම දානය වශයෙන් අද පූජා කරන්නට යන්නා වූ මේ ධර්ම පුස්තකය 'ශමථ විදර්ශනා භාවනා මාර්ගය වශයෙන් හඳුන්වන්නේ මේක ඒකාන්ත වශයෙන්ම, කෙළින්ම අමා මහ නිවනට පමුණුවන්නා වූ මාර්ගය පෙන්නුම් කරන්නා වූ ධර්මයක්. ඒ ධර්මයට අනුව යම්කිසි කෙනෙක් පිළිපදිනවා නම් මේ ආත්මයේදීම අමා මහ නිවන සාක්ෂාත් කර ගැනීමට ඔහුට පුළුවන්කම තිබෙනවා. බැරියෙයි කියලා කවුරුත් හිතන්නට හොඳ නෑ.

බුදුරජාණන් වහන්සේගේ මේ ධර්මය, මේ බුද්ධ ශාසනය, නෛර්යානිකයි. ඒ බුද්ධ ශාසනයෙහි යම්කිසි කෙනෙක් ඒ නෛර්යානික තත්ත්වය තේරුම් අරගෙන අපටත් මේ නෛර්යානිකත්වය ලැබේවා කියන සම්මා අදහසින් යුක්තව සමථ විදර්ශනා භාවනාව කරනවා නම්, ඒ ඇත්තන්ටත් අමා මහ නිවන ඒකාන්ත වශයෙන්ම සාක්ෂාත් කර ගැනීමට පුළුවන් වෙනව.

ඒ සඳහා විශේෂයෙන්ම ඉදිරිපත් ව සිටින්නා වූ පිරිසක් තමයි, භික්ෂූන් වහන්සේලා. එයිනුත් විශේෂත්වයකින් සඳහන් කරන්නට පුළුවන් වෙනවා මේ නිස්සරණ වනයට ඇතුල් වී භාවනාවෙහි යෙදී සිටින්නා වූ ස්වාමීන්වහන්සේලා. ඒ වෙනුවෙන්ම ජීවිත පරිත්‍යාගයෙන් මුළු දවසම භාවනාවෙහි යෙදී සිටින්නා වූ උත්තමයන් වහන්සේලා. උන්වහන්සේලාගේ ජීවිතය රැක ගැනීම ගිහි පින්වතුන් විසින් කළයුතු දෙයක්. ගිහි පින්වතුන්ගේ ආධාරය නොලැබෙනවා නම් උන්වහන්සේලාට මේ වනගතව ප්‍රතිපත්ති පිරීමට කිසිම විදියකින් පුළුවන්කමක් ඇත්තේ නෑ.

ඒ අනුව සිත යෙදුවාවු සත් පුරුෂ පින්වතුන් අතරින් මේ ලෝලුවාගොඩ සහ ඇටඹේ ඒ රාළහාමි ඇතුළු, මේ සභාපති මහත්තයා ඇතුළු අර මුලින් කියන ලද්දා වූ ඒ මහත්වරුන් ඇතුළු මේ ප්‍රභූ පිරිස සියලුදෙනාම ඒක රාශී වී එකහිතින්ම කරනු ලබන්නා වූ මේ පරිෂ්කාර පූජාව ඒකාන්ත වශයෙන්ම තම තමන්ට හිතු පැතු සියලු සම්පත් ලබා ගැනීමට පුළුවන් වන්නා වූ පින්කමක් බව අපට කියන්නට පුළුවනි, ධර්මානුකූලව. ඒ වගේම මේ පින්වතුන් දවසින් දවස හැඩගැස්වෙන ආකාරය ගැන බැලුවහම බෝධි සත්ව ගුණයන්ගෙන් යුක්තව මේ පින්වතුන් මේ පින්කම කරගෙන යනවා. මේ වාගේ සැදැහැති පිරිස් එකතුවෙලා සමූහ වශයෙන් කරන ලද්දා වූ පින්කම් බලයෙන් අපේ බුද්ධ ශාසනයේදී සිය ගණන්, සිය දහස් ගණන්, ලක්ෂ ගණන් එකවරට අමා මහ නිවන් සාක්ෂාත් කරගත්තු කථා ප්‍රවෘත්තීන් සඳහන් වෙනවා.



***10 වෙනි බෙහෙත් පූජා පින්කම - සමථ විදර්ශනා භාවනා පොතේ පිටපත් 2000 ක් පූජා කළ අවස්ථාව.***

ඒ අනුව බලනකොට මේ සැදැහැති පින්වතුන් දවසින් දවස පිරිස වැඩිවෙමින්, පූජා භාණ්ඩ වැඩිවෙමින්, ශ්‍රද්ධාවෙන් උතුරා යමින් අර මහත්මයා කිව්ව හැටියට චිත්ත ශක්තියෙන් කරනවයි කියල. චිත්ත ඍද්ධි පාදයන් බවට පත්වෙලා මේ ඍද්ධියෙන් කරන්නා වාගේ මේ පින්කම් කරගෙන යනවා. ඒකාන්ත වශයෙන් මේ සැදැහැවත් පින්වතුන් විසින් යම්කිසි ප්‍රාර්ථනාවක් කරනවා නම් ඒ ප්‍රාර්ථනාව කිසිම පැකිලීමක් නැතිව, වැරදීමක් නැතිව ඒකාන්ත වශයෙන්ම සිද්ධ වෙනවා. ඒක බුද්ධ ධර්මයෙහි සඳහන් වෙනවා. ඒ නිසා මේ සැදැහැති පින්වතුන්ට ඉතාමත් සන්තෝෂ වෙන්ට පුළුවනි. අද මේ කරනු ලබන්නා වූ පිංකමේ ආනිශංස පක්ෂය අපේ ගරු, කටුකුරුන්දේ, ඤාණානන්ද ස්වාමීන් වහන්සේ මේ පිරිසට කියා දෙනවා ඇති, ධර්ම දේශනා වශයෙන්.



**මේ අවස්ථාවට සහභාගී වූ මහ සඟ රුවන හා පරිෂ්කාර පිළිබඳ දර්ශනයක්**

දැන් මේ අවස්ථාවේදී කළ යුතුව තිබෙන්නේ මේ සියලු පරිෂ්කාරයන් සංඝ සතුකොට පූජා කිරීමයි. මෙහි ප්‍රධාන වශයෙන් බෙහෙත් පූජාව ආරම්භ කරල තියෙනවා. ඊළඟට තව තවත් නා නා ප්‍රකාර පූජාවන් තියෙන බව අපට අර පූජා භාණ්ඩ ලැයිස්තුව කියවීමේදී අහන්ට ලැබුණා. ඒ වාගේම ධර්ම පුස්තකයක් තියෙනවා. මේ සියල්ලම අපි එකවිට සංඝ සතුකරලා පූජා කරනවා. ඒ පූජාවට අයිති නොවන්නා වූ, කිසිම භාණ්ඩයක් මෙහි නැති බව සලකාගෙන ඒකාන්ත වශයෙන්ම අපි මේ පූජා කරනු ලබන්නේ සැරියුත් මුගලන් පරම්පරාවෙන් පැවත එන්නා වූ ගරු මහා සංඝ රත්නයටයි, කියන මේ අදහස ඇතිකරගෙන මේ කියන වාක්‍යය කියලා පූජා කරන්නට සූදානම් වන්න.

නමස්කාරය කියන්න.

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

"ඉමානි සබ්බ පරික්ඛාරානි
භික්ඛු සංඝස්ස දෙම"!!!
සාධු! සාධු!! සාධු!!!

දැන් පිංකම සම්පූර්ණයි.

මේ වාගේ බෙහෙත් පූජා කිරීමෙන් ලබන ලද්දා වූ ආනිසංස පිළිබඳව නොයෙක් කථා ප්‍රවෘත්ති තියෙනවා. පිළින්දිවච්ඡ මහ රහතන් වහන්සේ බෙහෙත් පූජාවක් කරල ඒ පූජාවේ ආනිශංස ඵලය වින්දනය කරන ගමන් ඒ ස්වාමීන් වහන්සේ මෙසේ උදානයක් අනනව.

"භෙසජ්ජං සුගතෙ දත්වා
සංඝෙ ගුණ වරුත්තමෙ
දසානිසංසෙ අනුභෝමි
කම්මානුච්ඡවිකේ මම"

මේ ගාථාවෙන් කියන්නේ බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝ රත්නයට බෙහෙත් පූජා කරල, ඒ බෙහෙත් පූජාවේ ආනිසංශ වශයෙන් මම ආනිසංශ දහයක් උපනුපන් ආත්මයක් පාසා වින්දනය කරලා, දැන් මේ ආත්මයේදීත් මං ඒ අනුභව කරනවය, වින්දනය කරනවය කර්මානුරූපව කියලයි.



***නිස්සරණ වන සේනාසනාධිපති පූජ්‍ය පානදුව බේමානන්ද මාහිමිපාණන් වහන්සේ මුලසුන හොබවති.***
***ධර්ම ග්‍රන්ථ අතරින් මැද සිටින්නේ අප දකින්නේ බෙහෙත් පූජා පින්කම් නිර්මාතෘ ඇටබේ එච්. එම්. පී. කරුණාතිලක රාළහාමිය.***

පිළින්දිවච්ඡ මහ රහතන් වහන්සේ පිළිබඳ කථා ප්‍රවෘත්තිය දීර්ඝ කථාවක්. උන්වහන්සේගේ මුල්ම ප්‍රාර්ථනය අනෝමදස්සී බුදුරජාණන් වහන්සේගේ කාලයේ ඉඳලයි, එන්නේ. උන්වහන්සේ බන්ධුමතී නුවර විපස්සී බුදුරජාණන් වහන්සේගේ කාලයේ මහා පූජාවක් කරල තියෙනවා. සර්ව පරිෂ්කාර පූජාව කියලා. මනුෂ්‍යයන්ට, භික්ෂූන් වහන්සේලාට උවමනා කරන්නා වූ සියලුම භාණ්ඩ වර්ග උන්වහන්සේ සූදානම් කෙරුව. එක වර්ගයකින් ලක්ෂය ලක්ෂය බැගින් භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් කුඩ ලක්ෂයක්, සිවුරු ලක්ෂයක්, ඒ විදියට සියල්ලෙන්ම සූදානම් කළා. නිය පොතු කපන ආයුධය කන් හාරන ආයුධය ආදී වශයෙන්, කිසිම අඩුවක් නැතිව ලක්ෂය ලක්ෂය සකස් කරල, බුදුරජාණන් වහන්සෙ ඉතාමත් අමාරුවෙන් ලබාගෙන ඒ පිංකම කරලා ප්‍රාර්ථනා තබා ගත්තා.

පිළින්දිවච්ඡ මහ රහතන් වහන්සේ ඒ කාලයේ පටන් නරකාදි සතර අපා දුග්ගතියකට නො පැමිණ දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරමින් ඇවිල්ලා අපේ බුදුරජාණන් වහන්සේගේ කාලයේදී මහත් ධනවත් කුලයක ඉපදිලා මහණ වෙලා ඍද්ධි ප්‍රාතිහාර්ය පාමින් බණ කියමින් හැමදෙනාම පහදවමින් ඉඳලා අන්තිමේදී පිරිනිවන් පා වදාළා. උන්වහන්සේ විසින් උදාන වශයෙන් කියන ලද්දා වූ ගාථාවක් තමයි මං මේ ප්‍රකාශ කරන්ට යෙදුනෙ. බුදුරජාණන් වහන්සේ සහිත භික්ෂූන් වහන්සේලාට බෙහෙත් පූජා කරල මම ඒ බෙහෙත් පූජාවේ ආනිසංශ දහයක් වින්දනය කරනවය කියල.



***සභාපති මේනිස් නිවුන්හැල්ල මහතා පෙරමුණේ. ගෞරවාකාරයෙන් දාන ශාලාව කරා මේ වැඩම කරවන්නේ ශමථ විදර්ශනා භාවනා ධර්ම පුස්තකයන් ය.***

මොනවද ඒ ආනිශංස දහය?

ආයුවා : කියන්නේ ආයුෂය, දීර්ඝායුෂ ලබාගන්ට හේතුවක් වුණා.

බලවා : ශරීර ශක්තිය ලැබීමට හේතුවක් වුණා. බෙහෙත් පූජා කිරීමෙන් උපනුපන් ආත්මයක් පාසාම.

වීරෝ : වීර්යයක් ලබා ගැනීමට හේතුවක් වුනා.

වණ්ණෝ: කියන්නෙ රූප ශෝභාව, ඡවි වර්ණය දුටුවන් පහද වන්නා වූ පැහැපත් ඡවි වර්ණයක් ලබා ගැනීමට උන්වහන්සේට පුළුවන් වුනා. ආත්මයක් ආත්මයක් පාසා.

යසවා : පරිවාර සම්පත්තියත්, ඓශ්වර්යයත්, අධිපතිභාවයත් ලබා ගැනීමට උපනූපන් ආත්මයක් පාසාම හැකි වුනා.

සුඛී : මේ සුඛිත මුදිත භාවය ලබා ගැනීමට හැකි වුනා. සැපවත්බව ඇති උපද්‍රව රහිත පුද්ගලයෙකු බවට පත්වුනා. කිසිම උපද්‍රවයක් උන්වහන්සේට ඇත්තේ නැහැ. ඒ වගේම උන්වහන්සේට කිසිම බයක්, තැති ගැනීමක් ඇත්තේ නැහැ. උන්වහන්සේට ආවතේව කරන්නා වූ පිරිස ඉතාමත් උසස් අන්දමින් ඒවා තමන් හිතුවාටත් වඩා ඉහළින් කටයුතු කිරීමට, මෙහෙකාර පිරිසක්, යාලු මිත්‍ර පිරිසක් ඇති වුනා. උන් වහන්සේට කිසිම අඩුපාඩුවක් වුනේ නැහැ. උන්වහන්සේට උපනූපන් ආත්මවල ලක්ෂ ගණන් ආවතේව පිරිස තමන්ගේ හිතු මනාපේ හැටියට ඒ වැඩ කර ගැනීමට ලැබුණු බව සඳහන් වෙනවා. ඒ වගේම අන්තිම වශයෙන් දේශනාවේ සඳහන් වෙනවා, මම ප්‍රිය විප්‍රයෝග දුක්ඛයෙන් සම්පූර්ණයෙන් මිදුනය කියල. එසේම උන්වහන්සේ ප්‍රිය විප්‍රයෝග දුක්ඛයෙන් මිදුනාය කියන මේ සැපය අප විසින් ඉතා ගරු කටයුතු සැපයක්. හැමදෙනාම යම් යම් දේවලට ප්‍රිය කරනව. යම් යම් පුද්ගලයින්ට ප්‍රිය කරනව. නිලතල වලට ප්‍රිය කරනවා. නම්බු නාමවලට ප්‍රිය කරනවා. වෙනත් වෙනත් දේවල්වලට ප්‍රිය කරනවා. ඔයාදි විවිධ දේවලට, විවිධ පුද්ගලයින්ට ඔය කිසිම දේකට ප්‍රිය කරන්නාට කිසිම සැනසීමක් සම්පූර්ණයෙන් ලබන්නාට බැහැ. ඒ මොකද? තමා ප්‍රිය කරන්නා වූ පුද්ගලයින්, ප්‍රිය කරන්නා වූ දේවල් නැති වුනහම පුද්ගලයින්ට ඇතිවෙන්නෙ මහත් දුකක්. නමුත් මේ පිළින්දිවච්ඡ මහ රහතන් වහන්සේ ප්‍රිය විප්‍රයෝග දුක්ඛය සම්පූර්ණයෙන්ම නැති කරලා උන්වහන්සේ සදාකාලික සැනසීම වූ අමා මහ නිවනට පැමිණියා.



***10 වෙනි පූජා පින්කමේ තවත් අවස්ථාවක්.***

දැන් මේ සැදැහැති පින්වතුන්ට මේ වාගේ මේ කරන ලද්දා වූ පූජාවේ ආනිශංස වශයෙන් උපනුපන් සෑම ආත්මයක් ආත්මයක් පාසාම මේ ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥාවන් ලබාගෙන ඒකාන්තවශයෙන් තමා බලාපොරොත්තු වන්නා වූ යම් බෝධියක් ඇත් ද, උත්තම ඒ බෝධියට ඉතා පහසුවෙන් පැමිණ දුක් කෙළවර කර ගැනීමට ලැබේවා කියල අපි මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා.

ඒ වගේම මේ පින්වතුන්ගේ මේ පිංකම්වලට උදව් උපකාර කරන්නා වූ ඒ සියලුම ශ්‍රද්ධාවන්ත පින්වතුන්ටත්, දෙවියන් සහිත සකල ලෝකයාටක් තම තමන් නමින් මිය පරලොව ගියා වූ ඥාති මිත්‍ර ආදී හිතවතුන්ටත් මේ පින් අනුමෝදන් කරවමු. ඒ පින් බලයෙන් ඒ සියලුදෙනාම දුක්ඛිත ස්වභාවයෙන් අත් මිදේවා.

ලබා තිබෙන්නා වූ සැප සම්පත් තව තවත් දියුණුකර ගනිත්වා! ඔවුන් සියලුදෙනාට ම අජරාමර සංඛ්‍යාත **අමා මහ නිවන්** අත්පත් වේවා යි පින් අනුමෝදන් කරවමු.

දැන් මීට වඩා මා කතා කිරීමට බලාපොරොත්තු වන්නේ නැහැ. දැන් සියලු දෙනාම ධර්ම ශ්‍රවණය කිරීමට බලාපොරොත්තු වන්න.



***ලොකු කුඩා හැමදෙනම මේ උතුම් පින්කමට සහභාගී වන අයුරුයි.***

## මීතිරිගල නිස්සරණ වන අරණ්‍යවාසී, කර්මස්ථානාචාර්ය, පූජ්‍ය කටුකුරුන්දේ ඤාණානන්ද ස්වාමීන් වහන්සේගේ ධර්මානුශාසනය

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස!!!

"ද්වේමානි භික්ඛවෙ පධානානි දුරභිසම්භවානි ලොකස්මිං"
කතමානි ද්වේ : යඤ්ච ගිහීනං අගාරං
අජ්ඣාවසතං චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානපච්චය
භෙසජ්ජ පරික්ඛාරානුප්පදානත්ථං පධානං,
යඤ්ච අගාරස්මා අනගාරියං පබ්බජිතානං

සබ්බූපධිපටිනිස්සග්ගත්ථං පධානං.
ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ පධානානි දුරභිසම්භවානි ලොකස්මිං.

"එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං පධානානං යදිදං සබ්බූපධිපටිනිස්සග්ගත්ථං පධානං"
(අඞ්ගුත්තර නිකාය, දුක නිපාතය, වස්සූපනායිකා වර්ගය-පධාන සූත්‍රය)

අති පූජනීය නායක මාහිමියන් වහන්සේගෙන් අවසරයි.
ගරුතර මහා සංඝ රත්නයෙන් අවසරයි,
සැදැහැවත් පින්වතුනි,

මේ අවස්ථාවේදී මේ සැදැහැවත් පින්වතුන් විසින් පවත්වන ලද උදාර සාංඝික පූජාව, ධර්ම පූජාව, ඖෂධ පූජාව තව නොයෙකුත් පරිෂ්කාර පූජා සහිත ඒ පූජාව පිළිබඳව මේ පින්වතුන් හිත යොදන කොට ඒ වටිනා පිංකම තුළින් මේ පින්වතුන් රැස්කරගත් ඒ චිත්ත ශක්තිය තේරුම් ගැනීමට උපකාරවන වටිනා සූත්‍ර දේශනාවක් බුදු පියාණන් වහන්සේ විසින් අර කළින් සඳහන් කළ පාඨයෙන් ඉදිරිපත් කළේ.

"ද්වේමානි භික්ඛවෙ පධානානි දුරභිසම්භවානි ලොකස්මිං"

**'මහණෙනි, මේ ලෝකයේ අතිශයින්ම දුර්ලභ වූ උත්කෘෂ්ඨ ප්‍රයත්න දෙකක් ඇත'**

**"කතමානි ද්වේ"**
'කවර දෙකක්ද?'

"යඤ්ච ගිහීනං අගාරං අජ්ඣාවසතං චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරානුප්පදානත්ථං පධානං"

**'ගිහි පින්වතුන් සංඝයා වහන්සේලාට චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානපච්ච යන සිව්පසය පිරිනැමීම සඳහා යොදන ඒ උත්කෘෂ්ඨ ප්‍රයත්නය එකක්'**

"යඤ්ච අගාරස්මා අනගාරියං පබ්බජිතානං සබ්බූපධිපටිනිස්සග්ගත්ථං පධානං"

'ගිහිගෙන් නික්ම පැවිදි වූ මේ සංඝයා වහන්සේලා මේ පැවිදි පක්ෂය සියලු උපධි නැති කිරීම නම් වූ, ඒ අත් හැරීම නම් වූ, **ඒ උතුම් නිර්වාණ ධර්මය ප්‍රත්‍යක්ෂ කර ගැනීම සඳහා දරන ඒ උත්කෘෂ්ඨ ප්‍රයත්නය දෙවෙනි ප්‍රයත්නයයි.**

"ඉමානි, ඛො භික්ඛවෙ ද්වේ පධානානි දුරභිසම්භවානි ලොකස්මිං"

'මහණෙනි, මේ ලෝකයේ ඇති අතිශයින්ම දුර්ලභ වූ උත්කෘෂ්ඨ ප්‍රයත්න දෙක මෙන්න මෙයයි.'

"එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං පධානානං යදිදං සබ්බූපධිපටිනිස්සග්ගත්ථං පධානං"

'මහණෙනි, මේ කියාපු මේ උත්කෘෂ්ඨ ප්‍රයත්න දෙක අතුරෙන්, සංඝයා වහන්සේ මේ සියලු උපධි අත්හැරීම නම් වූ නිවන් ප්‍රත්‍යක්ෂයට දරන ඒ උත්කෘෂ්ඨ ප්‍රයත්නය ම ශ්‍රේෂ්ඨයි. අග්‍රයි.'

තිලෝගුරු බුදු පියාණන් වහන්සේ විසින් මෙසේ ප්‍රකාශ කොට වදාළා. මේ පින්වතුන් විසින් දැන් මේ කරන්ට යෙදුනෙත් ඒ බුදු පියාණන් වහන්සේ විසින් ප්‍රශංසා කරන ලද

සංඝයා වහන්සේලාගේ ඒ උත්කෘෂ්ඨ ප්‍රයත්නය හා බොහෝ දුරට සංසන්දනය කරමින් වදාළ, සංඝයා වහන්සේට සිව්පසය සැපයීම නම් වූ ඒ උත්කෘෂ්ඨ ප්‍රයත්නයයි.

ඒ වගේම මේ පිංකමේ ආරම්භයේදී ඒ පුරෝගාමී දායක මහත්තයෙක් ඉදිරිපත් වෙලා මේ පිංකමේ ඉතිහාස කතාව වගේ සුළු විස්තරයක් ඉදිරිපත් කරන්ට යෙදුනා. ඒ ආශ්‍රයෙන් අපට වටිනා අදහස් කීපයක් යම් යම් සිතුවිලි සිතාගන්ට පුළුවන් පිංකම් කිරීම පිළිබඳව. පිංකමක් කියන කොට බොහෝවිට කාලයක් තිස්සේ පිංකමක වැඩීම නැත්නම් පිංකමක අභිවර්ධනය සිදුවෙනවා. ඒක ස්වාභාවිකවම සිදුවිය යුත්තක්. බොහෝ විට පිංකම් කිරීම ගැන සමහරු හිතා ගන්නවා තරඟකාරී ආකල්පයකින් යුක්තව, සැලසුමක් ඇතිව, අනික් අයට වඩා කැපී පෙනෙන ලෙස කරන්ට ඕනෑ කියල. ඒ විදියට ලොකු පිංකම් කරන්ට ලොකු සැලැස්මවල් දාගෙන ලොකු පිංකම් කරන සිරිතකුත් ඇතැම්විට තියෙනවා. එබඳු පිංකම් වැඩිදුර යන්නෙ නෑ. ඒවා කඩාකප්පල් වෙනවා.

මේක ඒ වගෙ පිංකමක් නොවේ. අපට අහන්ට ලැබුන ඉතිහාස කතාව අනුව මේ පිංකම ආරම්භ වෙලා තියෙන්නෙ ඉතාමත් සුළුවෙන්. සුළු ආරම්භයකින් යුක්තව පටන් අරන් අවුරුදු දහයක් තිස්සේ වැඩීමේදී, හරියට ගහක් වුනත් සුළු බීජයකින් ආරම්භ වෙලා වැඩෙනවා වගේ. දැන් අඹ ගහක් නම් අඹ ඇටයක් පැලවෙනකොට මුලින්ම පත්‍ර දෙකක් විහිදුවලා ඊළඟට ක්‍රමානුකූලව ඒකට ලැබෙන පෝර අනුව, බිමේ සරුසාරකම අනුව වෘක්ෂයක් වෙලා හැදෙනවා, අවුරුදු ගණනක් තිස්සේ. ඒ වගෙයි. මේ පිංකමේ ආරම්භයත් අපට දැනගන්නට ලැබුන ආකාරයට.

ඒ මහෝපාධ්‍යායාය හිමියන්ගේ ධර්ම තේජසින් මේ ස්ථානයට ළඟා වූ මේ සැදැහැවත් දායක පින්වතුන්ගේ චිත්ත සන්තානවල මේ පිංකම පිළිබඳ මූලික බීජය පැළපදියම් වෙලා තියෙනවා, මීට වසර දහයකට උඩදී. ඒ සුළුවෙන් ආරම්භ වූ පිංකම් බීජය ඊළඟට ක්‍රමාන්කූලව වර්ධනය වුනා. අඹ ඇටය පත්‍ර දෙකක් විහිදුවන්නා වාගේ. **ලෝලුවාගොඩ සහ ඇටඹේ-මීතිරිගල නිස්සරණ වන දාන දායක සමිතිය**' නමින් සමිතියක් පිහිටුවා ගෙන, ගම් දෙකක් හවුල්ව, සහයෝගයෙන් තරඟකාරීව නෙවෙයි. එක්සත්ව මේ පිංකම ආරම්භ කරන්ට යෙදුනා.

ඊ ළඟට මේ ආරම්භ වූ පින් පැලය ක්‍රමානුකූලව වැඩිලා අවුරුදු දහයකට පස්සෙ අතු පතර විහිදුවලා විශාල ප්‍රදේශ රාශියක පැතිරිලා, විශාල ශ්‍රද්ධාවන්ත දායක පිරිසකට සෙවන දෙමින් නොයෙකුත් විදියෙ නොයෙකුත් තරාතිරම්වල පුද්ගලයන්, පින්වතුන් මේකට සම්බන්ධ වෙලා දැන් මේ දස වසරක් යනකොට මේ අවස්ථාවට පත්වෙලා තියෙනවා.

කාලයෙන්, ධනයෙන්, ශ්‍රමයෙන් ආදී නොයෙකුත් ආකාරයෙන් මේවට සහභාගිවෙච්ච, උපකාර වෙච්ච පින්වතුන්ගෙන් කොටසක් දැන් මෙහාට පැමිණිලා තියෙනවා. ඒ අනුව බලනවිට දැන් බාහිර වශයෙන් බැලුවත් මේ පිංකම අල්ප සමාරම්භක නොවෙයි. දැන් මහා සමාරම්භක, මහා පරිමාණ පිංකමක් බවට පත්වෙලා තියෙනවා, වසර දහයක් තුළදී. මේ ගැන සිතන විට මේ පින්වතුන්ට විශාල සතුටක් ඇති වෙනව. ඒ මොකද? මේ පින්කම වැරදි ආකල්පයකින් ආරම්භ වුනා නොවේ. මේ පින්වතුන්ගේ චිත්ත සන්තානවල ශ්‍රද්ධා ශක්තිය, ඒ වගේම ප්‍රඥාව ආදී ගුණධර්ම රාශියක් නිසා, කුශල ශක්තිය නිසා ක්‍රමානුකූව වැඩී යන්නා වූ තත්ත්වයක්, පින්එල මේ විදියට ඇතිවෙලා තියෙන්නෙ. ඒ ගැන හිතනකොට මේ පින්වතුන්ට ලොකු සතුටක් ඇති වෙනව.

ප්‍රදේශ වශයෙන් අතු පතර විහිදුවලා මේ පින් ගහ වැඩුනා වගේම, ඊ ළඟට පූජා වස්තු ගැන කල්පනා කර බලනවිට මුලදී මේ පින්වතුන්ගේ හිතේ තිබුණේ යෝගාවචර සංඝයා වහන්සේලාට බෙහෙත් ඖෂධ ආදිය ක්‍රමානුකූලව සැපයෙන පිළිවෙලක් පැවැත්වීමයි.

ඊට පසු ක්‍රම ක්‍රමයෙන් මේ පින්වතුන් ඥානවන්තව විමර්ශන බුද්ධියෙන් යුක්තව ක්‍රමානුකූලව කල්පනා කරල සංඝයා වහන්සේලාට අවශ්‍ය සමහර දේවල් සංඝයා වහන්සේගෙන් අහල දැනගත්ත. සමහර දේවල් ඉඟියෙන් ඒ කියන්නේ සංඝයා වහන්සේ ඇසුරු කිරීමෙන් නුවණින් කල්පනා කරල ඒ ගැන අපි ඉල්ලන්නෙත් නැතිව හිතල සම්පාදනය කරගත්ත.

ඥාන සම්ප්‍රයුක්තව දායක පින්වතුන් අන්න ඒ විදියටයි, ක්‍රියා කළ යුත්තේ. දැන් ඒ විදියට පිරිස වශයෙන් විශාල වුනා වගේම, පූජා ද්‍රව්‍යවල විශාලත්වය නිසා නිකමට එබිල බලන කෙනෙකුටත් පෙනෙනව මේ පිංකම සුළුපටු දෙයක් නොවන බව. මෙබඳු කාලයක ආර්ථික පරිහානිය පිළිබඳව රටේ හැමතැනම කතා කරන මෙවැනි කාලයක මෙබඳු පින්කමක් කරන්න කොයිතරම් උත්සාහයක්, ඇත්ත වශයෙන් අර ප්‍රධන් වීර්යයක් වැනි දෙයක් තියෙන්ට ඕන. සංඝයා වහන්සේ නිවන් සඳහා යොදවන ක්‍රියාව යන තේරුමෙනුයි **පධාන** කියන වචනය බුදු පියාණන් වහන්සේ දේශනා කළේ. උත්කෘෂ්ඨ ප්‍රයත්නයක් කියන එකයි. අන්න එබඳු උත්කෘෂ්ඨ ප්‍රයත්නයක් කරලයි මෙබඳු පින්කමක් සාර්ථක කරගන්න පුළුවන් වෙන්නෙ. ඒ සඳහා ඉතාම ක්‍රමානුකූලව සහයෝගයෙන්, ශ්‍රද්ධාවෙන්, සංවිධානාත්මකව සැලකිල්ලෙන් යුක්තව කටයුතු කළ යුතු වෙනවා.

මේක වාර්ෂික පින්කමක් නොවෙයි. වර්ෂයක් තිස්සේම සූදානමක් ඇතිව ක්‍රමානුකූලව පුළුල් සංවිධානයකින් කරන පිංකමක් ඒ පිංකමේ අවසාන අවස්ථාව තමයි අපට මේ දකින්න ලැබෙන්නෙ.

පිංකම වැඩී ඇති ආකාරය ගැන කල්පනාකර බලනවිට ඇත්ත වශයෙන්ම චිත්ත සන්තානවල ඇති වූ විශාල ප්‍රාතිහාර්යයක් වගේ. මේ දසවෙනි වසරෙ පිංකමට මුල් වුන, මූල බීජයක් වුන විශේෂ සිද්ධිය හැටියට මහෝපාධ්‍යායා මාහිමිපාණන් වහන්සේගේ අසූවෙනි ජන්ම දින ප්‍රකාශයට පත් කරන්ට යෙදුන 'ශමථ විදර්ශනා භාවනා මාර්ගය' නමැති ශ්‍රේෂ්ඨ ග්‍රන්ථ රත්නය. මේ පින්වතුන් විසින් තුන්වෙනි වරට පිටපත් 3000 ක් මුද්‍රණය කරන්ට යෙදුන බව ප්‍රකාශ කළා. සියලුම දානයන්ට වඩා උතුම්ම දානය ධර්ම දානමය පින බව බුදු පියාණන් වහන්සේ දේශනා කළා.

**"සබ්බ දානං ධම්ම දානං ජිනාති**
**සබ්බං රසං ධම්මරසෙ ජිනාති**
**සබ්බං රතිං ධම්ම රතී ජිනාති**
**තණ්හක්ඛයො සබ්බ දුක්ඛං ජිනාති"**
**(ධම්ම පදය - තෘෂ්ණා වර්ගය)**

කියල බුදු රජාණන් වහන්සෙ ප්‍රකාශ කර තිබෙනවා. ධර්ම දානය අනික් හැම දානයක්ම දිනනවා. ඒ කියන්නේ අනික් දාන පරද්දනව කියන එකයි. සියලු රසයන්ට වඩා ධර්ම රසය ශ්‍රේෂ්ඨයි. ධර්ම රසය පරද්දනව අනික් සියලු රසයන්. ධර්මයට තිබෙන ඇල්ම අනික් සියලුම ඇල්ම, සියලුම රුචිකත්ව යටපත් කරන්ට තරම් සමත්, ශක්තිමත්, පුදුමාකාර වශයෙන් ධර්මයට ඇල්ම ඇතිවෙනවා.

ඊළඟට අවසාන වශයෙන් තෘෂ්ණාව ක්ෂය කිරීම තමයි, සියලුම දුක්වලින් දිනීම කියලා වටිනා දේශනාවක් බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරලා තිබෙනවා. මෙන්න මේ ධර්ම දානයේ වටිනාකම තේරුම්කර දීමටයි.

ඒ වගේම,

"සක්කත්වා ධම්ම රතනං
ඔසධං උත්තමං වරං"

කියල ප්‍රකාශ කරල තියෙනව. ධර්ම රත්නය උතුම් වූ ඖෂධයක් හැටියට දක්වල තියෙනවා, මේ බව දුක නිවා ගැනීමට. අපේ කවියන් ඒ කාරණය දක්වල තියෙනවා.

"සත්හට වන බව දුකට වෙදාණන්" යනුවෙන් බව දුක කියන ලෙඩේට වෙදකම් කරන වෙදදුරු තුමාණන් තමයි බුදු පියාණන් වහන්සේ. උන් වහන්සේ දුන්නු ඖෂධය තමයි, නිර්වාණය සාක්ෂාත් කරන ධර්ම රත්නයේ ගැබ් වෙන්නේ.

අපේ කිසිම උපදෙසක් ඇතිව නොවෙයි, මේ පින්වතුන් නුවණින් කල්පනා කරල ඉතාම ගෞරව සම්ප්‍රයුක්තව රිය පෙරහැරකින් මේ ධර්ම ග්‍රන්ථ වඩම්මාගෙන එන බව අපට දැනගන්නට ලැබුණා. ඒ වගේම ධර්මය පිළිබඳව එතරම්ම සැලකිල්ලක් නැති යුගයක ඒ කියන්නෙ, ධර්මය නම් පැතිරෙනවා. ධර්ම ග්‍රන්ථ පැතිරෙනවා. ධර්මයට තියෙන ගෞරවය හීනවෙලා යනවා. ධර්මය බොහෝවිට යොදා ගන්නෙ ශාස්ත්‍රීය වශයෙන් කැපී පෙනීමට. උපාධි ආදිය ලබා ගැනීමට එබඳු සංකල්පයක් ඇති කාලයක ධර්මයට ඇති ගෞරවය ලෝකයට පෙන්වා දීමටයි මේ පින්වතුන් රිය පෙරහැරකින් ධර්ම ග්‍රන්ථ වඩම්මාගෙන ආවෙ. අන්න ඒක ඉතා උතුම් ශ්‍රේෂ්ඨ අදහසක්. මේ පින්වතුන්ගේ චිත්ත සන්තාන තුළින් බිහි වූ වටිනා අදහසක් හැටියට ඒක සලකන්ට පුළුවන්.

**සක්කත්වා ධම්ම රතනං**
**ඔසධං උත්තමං වරං**

කියල කිවූ හැටියට ධර්මය නමැති ඖෂධයට සත්කාර කිරීමක් ඒක. ඒ වගේම අනික් අතින් කල්පනා කර බලනවිට බුදු පියාණන් වහන්සේ පවා ධර්මයටයි ගරු කළේ. බුදු පියාණන් වහන්සේ සම්බෝධි ලාභයෙන් පසු කල්පනා කළා, මට වඩා ඉහළින් කෙනෙක් නෑ. ඒ නිසා මම කාටද ගරු කරමින් ජීවත් වෙන්නේ, කාටද ගරු සත්කාර කරන්නේ කියා. අතීත බුදුවරයින් වහන්සේලාගේ චාරිත්‍රය අනුව බලනවිට ධර්මයටයි ගරු කරමින් ජීවත් වුනේ බුදු වුනාට පස්සේ.

ඒ අනුව බුදු පියාණන් වහන්සේ "ධම්මං යේව සක්කරොන්තෝ, ගරු කරොන්තෝ"
මම ධර්මයට ගරු කරමින්, සත්කාර කරමින් මෙතන ඉඳලා වැඩ ඉන්නවා කියලා බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කළේ. එයිනුත් පෙනෙනවා මේ ශාසනයේ ධර්ම ගෞරවය, පුද්ගල ගෞරවය අභිබවා යන බව. මෙතනදීත් ඒ ධර්ම ගෞරවය නිසයි අපට මේ ආසනයට ආරාධනා කළේ. මේ නායක ස්වාමීන් වහන්සේ ඉදිරිපිට මෙබඳු ආසනයක අපට වැඩ ඉන්ට අවසර ලැබුණේ ඒ ධර්ම ගෞරවය නිසයි. ධර්මයට තිබෙන ගෞරවය පුදුමයි, මේ ශාසනයේ.

මේ පිංකමට සහභාගී වූ අත හිත යෙදූ විශාල ධනස්කන්ධයක් වැය කළ මේ පින්වතුන්ට ලොකු සතුටක් ඇති කරන දෙයක් කියන්ට යෙදුනා දායක මහත්මයෙකු විසින්. සාමාන්‍යයෙන් මේ තරම් විශාල ධර්ම ග්‍රන්ථයක් මුද්‍රණය කිරීමට අද කාලෙ හැටියට විශාල බර පැනක්. අවශ්‍ය වෙනවා. මේ පින්වතුන්ට මේ බර පැන පිළිබඳ ප්‍රශ්නය බරපැනයක් නොවූ බව පෙනී යනවා. බර ප්‍රශ්නයක් සැහැල්ලු ප්‍රශ්නයක් බවට පත්වුන ආකාරය ප්‍රකාශ කළා. ඇත්ත වශයෙන්ම අර පුණ්‍ය ඍද්ධියක් වගේ, ඥාණවන්ත පින්වතුන්ට, බුද්ධිමත් පින්වතුන්ට මේ පුණ්‍ය කර්මයට සහභාගී වී එහි කොටස්කරුවන් වීමට ඇති වූ කැමැත්ත නිසා අඩු මුදලකින් මේ කටයුත්ත කර ගැනීමට හැකි වූ බව ප්‍රකාශ වුනා. එයින් පෙනෙනවා මේ පිංකම විශේෂ අමුතු සංවිධානයක් නැතිවත් ස්වාභාවිකව වැඩී වර්ධනය වූ ආකාරය.

ධර්ම දානයට, ඖෂධ දානයට අමතරව මේ ගරු භාණ්ඩ ලඝු භාණ්ඩ වශයෙන් සංඝයා වහන්සේලාගේ සිව්පසයට අදාල විශාල ප්‍රමාණයක භාණ්ඩ රාශියක් මේ පින්වතුන් මේ අවස්ථාවේදී පූජා කරන්ට යෙදුනා. එතකොට මේවායේ ආනිසංස පක්ෂය ගැන කල්පනාකර බලනකොට මේ පිංකම පිළිබඳව, මෙතන්ට ඇවිත්ල එබිල බලන කෙනෙකුට මේ පිංකමේ බාහිර පක්ෂය ගැන පමණයි පෙනෙන්නේ. මෙයට අතහිත යොදවල වෙහෙස මහන්සි වෙලා කාලය, ධනය, ශ්‍රමය යොදවලා කටයුතු කරපු මේ පින්වතුන්ට බලන්ට තියෙන්නේ පිංකමේ ඇතුල් පැත්තයි. ඇතුල් පැත්ත බලනවා කියන්නේ තම තමන්ගේ චිත්ත සන්තානය දිහා බැලීමයි. ආවර්ජනා කරලා, මේ පිංකමේ ඉතිහාසය දෙස බලලා අවුරුද්දක් තිස්සේ මේ භාණ්ඩ සකස් කරන්ට යෙද වූ ඒ සිත තුළින් තමන්ගේ චිත්ත සන්තානය තුළ එක් රැස්වුන ධර්ම ශක්තිය සතුට දෙස බැලිය යුතුයි. ඇත්ත වශයෙන්ම මේ වගේ අනුමෝදනා බණ අවස්ථාවකදී කළ යුත්තේ සතුටු වීමයි. **අනුමෝදනා යනු අනුව සතුටුවීමයි. මේ අනුව සතුටුවීම** කියන එක මහා පිංකමක්.

බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරල තියෙන්නෙ,

**"ඉධ මොදති පෙච්ච මොදති**
**කත පුඤ්ඤො උභයත්ථ මොදති**
**සො මොදති සො පමොදති**
**දිස්වා කම්ම විසුද්ධි මත්තනො"**
යනුවෙන්

**"ඉධ මොදති පෙච්ච මොදති**
**කත පුඤ්ඤො උභයත්ථ මොදති"**

පින් කළ තැනැත්තා මෙලොවත් සතුටු වෙනවා. පරලොවත් සතුටු වෙනවා. ඒ දෙකේම සතුටු වෙනවා.

"සො මොදති සො පමොදති"

ඒ වගේම සතුටු වෙනවා පමණක් නොව ප්‍රමෝද වෙනවා. ප්‍රමෝදය කියන එක සාමාන්‍යයෙන් ලෝකයා යොදාගෙන තියෙන්නෙ ආමිශය සම්බන්ධ දේවලට. මෙතන යෙදෙන්නේ නිරාමිෂ සුවයක් සඳහායි. මේ පින්වතුන් නිරාමිෂ සතුටක් ලබනවා.

"දිස්වා කම්ම විසුද්ධි මත්තනො"

විසුද්ධි කියන්නෙ පිරිසිදුකම. තමා කළ වැඩයේ පිරිසිදුකම පිළිබඳව හිතලා නිතර දෙවේලේ සතුටුවන අරමුණක් බවට පත්වෙන මේ පිංකම ශ්‍රේෂ්ඨ ආනිසංස ලබා දෙන්නක්.

ඒ වගේම බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරල තියෙනව, පිංකමකට සිත යෙදූ අවස්ථාවේ ඉඳලම පින් ගලාගන එන බව. සාමාන්‍ය ලෝකයේ වැරදි සංකල්පයක් තියෙනව පින් කියන ජාතියෙ අනුසස් නැත්නම් විපාක ලබන්ට පුළුවන් පරලොවදී පමණයි කියලා. මෙලොව සඳහා එක කොටසක් වෙන්කරගෙන සැප විඳිනවා, අදුරදර්ශී පුද්ගලයින්. එක ඇහැකින් බලල. ඒකාන්ත වශයෙන්ම ඥානවන්ත පුද්ගලයින් පින්කමක ආනිසංස ඒ මොහොතෙ ඉඳලම ලැබෙන බව තේරුම් ගන්නව.

බුදු පියාණන් වහන්සේ චුන්ද ස්වාමීන් වහන්සේට ප්‍රකාශ කරනව,
"චිත්තුප්පාදම්පි ඛො අහං චුන්ද කුසලේසු ධම්මේසු
බහුකාරං වදාමි කො පන වාදෙ කායෙන වාචාය අනුවිධීයනාසු"

චුන්දය, කුසල ධර්ම පිළිබඳ සිතක් ඇතිකර ගැනීම පවා බොහෝ ආනිසංස සම්පන්න යයි ප්‍රකාශ කරමි.

"කො පන වාදෙ කායෙන වාචාය අනුවිධීයනාසු"

එසේ නම් කයින් වචනයෙන් සංවිධානාත්මකව කුසලයක යෙදීමේ ඇති ආනිසංස ගැන කවර කතාද? කියනුව කවරේද?

අමුතුවෙන් කියන්ට ඕනද කියලා තිලෝගුරු බුදු පියාණන් වහන්සේ දැක්වූවා. එහෙම නම් මේ පින්වතුන්ටත් හිතාගන්ට පුළුවන් මේ පින්කමේ ශ්‍රේෂ්ඨ ආනිසංස පක්ෂය ගැන. මෙයට පුරෝගාමී වූ දායක පින්වතුන්ට මෙය විශේෂ සතුටට හේතුවක්. ඊට පසුව නොයෙකුත් අයුරින් සහභාගී වූ අනික් පින්වතුන්, යටත් පිරිසෙයින් මේ පින්කම දැකල සිත පහදවා ගත් පින්වතුන්ට පවා අර චිත්තුප්පසාද වශයෙන් ලැබෙන ඒ කුසලය අයත් වෙනවා.

අනුමෝදනාවීම සමහරවිට මෙබඳු ස්ථානයකට පැමිණෙන දුගියෙකුට පවා කළහැකි දෙයක්, ඒකයි මේ ශාසනික පිංකම්වල තියෙන වටිනාකම.

ඊටත් වඩා ඇතුලට එබිල බැලුවොත් ඒ සිත යෙදීම අනුව උපන්නා වූ මහත් වූ පින් රාශියක් එක් වෙනව. කය, වචනය යෙදීම අනුව අනුවිධීයනාසු කීවෙ සංවිධානත් වෙනවා. එක පින්කමක් ඉවර කරල මේ පින්වතුන් තම තමන්ගේ නිවෙස්වලට යන්නේ ඊළඟට එන පිංකමට සිත යොදවාලයි. එතකොට මුලු අවුරුද්ද පුරාම මීතිරිගල නිස්සරණ වනය පිළිබඳ සිතුවිලි රාශියකින් යුක්තවයි, මේ දාන දායක පිරිස ගත කරන්නේ.

ලෝලුවාගොඩ සහ ඇටඹේ යන ගම් දෙක හා ඒ අවට ප්‍රදේශවල ගම්වාසීන් මේ භාණ්ඩ සකස් කිරීමේදී කයින්, වචනයෙන් දරණ වෑයම, ඒ සඳහා යොදන ක්‍රියාවලිය කරන්ට සිද්ධවෙන කටයුතු රාශිය ගිහි ජීවිතයේ නොයෙකුත් ආපදා, ප්‍රශ්න මධ්‍යයේ මේව කරනකොට විශේෂ චිත්ත ශක්තියක් අවශ්‍ය වෙනවා. නොයෙකුත් විදියේ මාර බලවේග, අකුසල බලවේග ඇතුලතිනුත් පිටතිනුත් ගලාගෙන එනව පිංකම්වලට විරුද්ධව. ඒවා මැඩ පවත්වාගෙන උත්සාහයෙන් ඉදිරියට යාම තුළින් මොහොතක් පාසා මේ පින්වතුන්ගේ සිත පිරිසිදු වෙනවා.පින්කමක ඇතුළත ලෙස සැලකෙන ඒ ආකාරය අනුව **සත් තිස් බෝධි පාක්ෂික ධර්මයන්ගෙන්** රාශියක්ම නුවණැති පින්වතෙකුට මේ පින්කම ආශ්‍රයෙන් වඩාගන්න පුළුවන්. විශේෂයෙන් දැන් මේ කියාපු සූත්‍රය අනුව කල්පනාකර බලනවිට කෙනෙකුට **සතර සම්‍යක් පධාන ධර්මයන්** වඩා ගැනීමට උපකාර වෙනවා එක්තරා මට්ටමකින්, මේ පින්කම පිහිට කරගෙන.

බුදු පියාණන් වහන්සේ සම්‍යක් ප්‍රධාන හැටියට හෙවත් සම්මා වායාම හැටියට හඳුන්වන තැන,

"අනුප්පන්නානං පාපකානං අකුසලනං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති, වායමති, විරියං ආරහති, චිත්තං පග්ගණ්හාති පදහති"

කියලා වචන පෙළක් සඳහන් කරනවා. බුදු පියාණන් වහන්සේ අනවශ්‍ය වචන කිසිම තැනක සඳහන් කරන්නේ නැහැ. දැන් මෙතන යොදල තියෙන්නෙ වීර්ය වැඩෙන ආකාරයයි. නූපන්නා වූ අකුසල් නොවැඩීම සඳහා,

'ඡන්දං ජනේති'

ඒ කියන්නෙ කැමැත්තක් ඇතිකර ගන්නවා. ඕනෑකමක් ඇතිකර ගන්නවා. යමකට කැමැත්ත ඕනෑකම ඇතිවීම තමයි ආරම්භය, කුසල බීජය. දැන් මේ පින්කම කරන්ට ඕනෑ කියල කුසලච්ඡන්දයක් පහල වුනා. නමුත් ඊට වඩා ඇතට යන්ට ඕනෑ සිත.

**'ඡන්දං ජනෙති, වායමති'**
වෑයමක් දරනවා, විශේෂ උත්සාහයක් දරනවා ඊළඟට.

**'විරියං ආරභති'**
ඊටත් වඩා උත්කෘෂ්ඨ, ඉහළ මට්ටමකින් වීර්යක් කරනවා. ඒ වීර්ය කරගෙන යනවිට මතුවන නොයෙකුත් බාධක කරදර හිරිහැර මැඩ පවත්වා ගන්ට චිත්ත ශක්තිය, අධිෂ්ඨානශක්තිය යොදවනවා.

ඒකටයි,

**'චිත්තං පග්ගණ්හාති'** කියන්නෙ සිත දැඩිව තබා ගන්නවා. අහවල් අවුරුද්දෙ, අහවල් දවසෙ අපි කොහොම හරි මේ පින්කම කරනවා. අන්න ඒ අපි කොහොම හරි කරනවා කියන එක තමයි සිත දැඩිකර ගැනීම. චිත්ත ශක්තිය තමයි 'චිත්තං පග්ගන්හාති' කියන්නෙ.

ඊ ළඟට,

**'පදහති'** කියල කියන්නෙ අර කලින් කී ආකාරයට මොන ආපදා බාධා කරදර කම්කටොලු තිබුණත් ඒවා පැත්තකට කරල, බලාපොරොත්තු මුදුන් පත්කර ගැනීම, සාර්ථක කරගැනීම සඳහා සමහර විට ජීවිත පරිත්‍යාගයෙන්, ධන පරිත්‍යාගයෙන්, කාල පරිත්‍යාගයෙන්, ශ්‍රම පරිත්‍යාගයෙන් ඒ උත්කෘෂ්ඨ ප්‍රයත්නයේ යෙදීමයි, පදහති කියන්නේ.

මේකයි පධාන වීර්ය. බුද්ධ ශාසනයේදී ඉතාමත්ම උත්කෘෂ්ඨ ඉතාමත් ඉහළම වීර්ය හඳුන්වන්නේ පධාන යන වචනයෙන්. අන්න ඒ විදියට කල්පනාකර බලනවිට මේ සතර සම්‍යක් පධාන ධර්මයන් එක්තරා මට්ටමකින් මුදුන් පත් කරගැනීම මේ පුණ්‍ය ක්‍රියාව සාර්ථක කර ගැනීම සඳහා කටයුතු කරගෙන යනවිට පුළුවන් වෙනවා.

ඇතුලිනුත් පිටතිනුත් ගලා එන අකුසල බලවේග මර්ධනය කර ගැනීමටත්, කුසල සිතුවිලි ළංකර ගැනීමටත්, ඒ වගේම තමා තුළ තියෙන කුසල සිතුවිලි තහවුරු කර ගැනීමටත්, නූපන් අකුසල් නූපදවීම සඳහාත් දරන මේ සතර ආකාර ප්‍රයත්නයන් එක්තරා මට්ටමකින් මේ පින්කම අරමුණු කරගෙන මේ පින්වතුන් සම්පූර්ණකර ගත්තා.

ඊ ළඟට ඒ දර්ශනය තුළින්මයි කෙනෙක් ඍද්ධිපාද ධර්මයන් වඩා ගන්නෙ. ඍද්ධිපාද කියල කියන්නේ යමක් සාර්ථක කරගැනීමට ඇති මාර්ග. දැන් මෙතන පුණ්‍ය ඍද්ධියක් කියල කියවුණා. මේ පින්කම ආරම්භ කළ පින්වතුන් පුදුම වෙනව මේක කොහොමද? කෙරුවෙ කියල. ඒක පුදුමයක් වගේ හැඟෙන්නේ මක්නිසාද? පින්කම දිහා බලපුවහම මේක කරන්න බැරි දෙයක් වගේ. ඒ වුනත් කොහොම හරි කෙරුන. අර පින්වතුන් තුළ ඇති ඍද්ධිපාද ධර්මයන් නිසා ඡන්ද, චිත්ත, විරිය, වීමංසා කියනම.

**ඡන්ද** කියන්නෙ කැමැත්ත ඇතිකර ගැනීම හොඳ කටයුතු පවත්වා ගන්න. **විරිය** කියන්නෙ වීර්ය ඇතිකර ගැනීම. **චිත්ත** කියල කියන්නෙ අර කී විදියට අධිෂ්ඨාන ඇතිකර ගැනීම. ඊළඟට **වීමංසන** බුද්ධිය. ඒක ප්‍රඥාව ඇති කරනවා. මේ වගේ විශාල පින්කමක් සංවිධානයකින් තොරව කරන්නට බෑ. ඒකට වීමංසන බුද්ධිය අවශ්‍යයි. කලට වෙලාවට, කැප සරුප් ආකාරයෙන් පිළිවෙලට වැඩ කරගන්න, ඡන්ද, විරිය, චිත්ත, වීමංසා කියන ඍද්ධි පාද ධර්මයන් බොහොම වැදගත් වෙනවා. නැත්නම් වැඩ අවුල් වෙනවා. අන්න ඒ නිසා මේ සතර ඍද්ධිපාද ධර්මයන් මේ පිංකම ආරම්භ කළ අවස්ථාවේ පටන් ඇති කරගන්ට පුළුවන් වුනා කියල මේ පින්වතුන්ට සතුටු වෙන්න පුළුවන්.

ඒ වගේම බල ධර්ම, ඉන්ද්‍රිය ධර්ම හැටියට දක්වන ධර්මයන්, සද්ධා, සති, විරිය, සමාධි, ප්‍රඥා ආදී මේවා නොයෙකුත් ආකාරයෙන් සිතට වැටෙනවා. මේ ශ්‍රද්ධාව කියනකොට, ඒක තමයි ඉතාමත් ළඟ වචනය බෞද්ධ පින්වතෙකුට. ශ්‍රද්ධාව ඉන්ද්‍රිය ධර්මයක් හැටියට දක්වනවා. ඇස් කන් නාසා දි ඉන්ද්‍රියන්ගෙන් කෙරෙන කෘත්‍යයන් තියෙනවා. ඒ ඒ කටයුතු කරන්න පුළුවන්. ඇහෙන් බලන්න පුළුවන්. කණෙන් අහන්න පුළුවන්. අන්න ඒ වාගේ ශ්‍රද්ධාවෙන් කරන්න පුළුවන් හපන්කම් තියෙනවා. ඒකයි ඒකට ඉන්ද්‍රිය තත්ත්වයක් දීලා තියෙන්නෙ. වීර්යත් ඒවගේ ඉන්ද්‍රියක්. සතිය කියල කියන්නේ සිහිය. සමාධිය හිතේ තැන්පත්කම. ඊළඟට ප්‍රඥාව. මෙන්න මේවා ඉන්ද්‍රිය ධර්මයන් හැටියට දක්වල තියෙනව. යම් තරමකට මේ ඉන්ද්‍රිය ධර්මයන් වැඩිල තියෙනව නම් ඒ පුද්ගලයාගේ චිත්ත සන්තානයට යම්කිසි බලපුළුවන්කාර කමක් ලැබෙනවා. ඒකට බල ධර්ම කියල කියනවා.

ඒ විදියට කල්පනාකර බලනවිට මේ සත් තිස් බෝධි පාක්ෂික ධර්මයන්ගෙන් ධර්ම රාශියක් තම චිත්ත සන්තානවල මේ පින්කම ආශ්‍රය කරගෙන වඩා ගන්නට පුළුවන් වුනා.

ඒ වගේම බෞද්ධ පින්වතෙකුට ඇති නියම ධනය හැටියට තමයි, සප්ත ආර්ය ධනය දක්වල තියෙන්නෙ. සද්ධා, සීල, සුත, චාග, පඤ්ඤා, හිරි-ඔතප්ප කියල. සද්ධා ධනයෙන් වැඩුන මේ පින්වතුන් සීල ධනයෙනුත් වැඩුනා. සුත කියල කියන්නේ ධර්ම ඥානය ඒ ධනයෙන් වැඩුනා. චාග, පරිත්‍යාග කියල කියන්නේ ලොකු ධනයක්, ඒ වගේම ලොකු හපන්කමක්. ඒ ධනය නැතිනම් එදිනෙදා ජීවිතය පවා ගෙනියන්න බෑ. ලෝකයේ රැස් කිරීමට විරුද්ධ අතහැරීමේ ශක්තිය මේ පින්වතුන් ඇතිකර ගත්තා. ඊළඟට ප්‍රඥාව තමයි ලොකුම ධනය. ශ්‍රද්ධා, සීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥා කියන ආර්ය ධන ළං කර ගැනීමටත් මේ පින්කම හේතු වුනා. පවට ලැජ්ජාව හා බිය ඉබේම වැඩෙනවා.

ඒ විදියට බලන කොට මේ පින්කමේ ඇතුල් පැත්ත දිහා, මේ පින්වතුන්ගේ චිත්ත සන්තානවල අර අමා මහ නිවන් ලබා ගැනීමට උදව්වන මෙලොවදීම බෝධි පාක්ෂික ධර්ම රාශියක් සිය චිත්ත සන්තානවල තැන්පත් කරගැනීමට පුළුවන් වුනා කියල සතුටුවෙන්ට ඕන.

දැන් කල්පනා කර බලනවිට විශේෂයෙන් මේ ඖෂධ පූජා ආදිය ගැන-ඒ ධර්මයේ සඳහන්වන බක්කුල මහ රහතන් වහන්සේ, අතීතයේ පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ කාලයේ, අනෝමදස්සී බුදුරජාණන් වහන්සේගේ කාලයේ කළ යම් යම් ඖෂධ පූජාවන් නිසා නිරෝගිව අවුරුදු අසූවක් ගිහි ගෙයි වාසය කළා. දේශනාවල සඳහන් වෙනවා, බක්කුල මහ රහතන් වහන්සේගේ ආශ්චර්ය අද්භූත ධර්මයක් හැටියට පැවිදි වෙලාත් අවුරුදු අසූවක් ම නිරෝගිව සිටි බව, කොයි තරම් නිරෝගිව සිටියද කියනව නම් අරළු කැල්ලක් පාවිච්චි කරන්න වුනේ නෑ. එබඳු ආශ්චර්යමත් නිරෝගී බවක් ලැබුනේ ඖෂධ ආදිය පූජා කළ නිසා.

මේ ප්‍රවෘත්තියෙන් වටිනා කාරණයක් මතුකර ගන්න පුළුවන්.

ධර්මයෙහි සඳහන් වෙනවා.

"**ආරෝග්‍ය පරමා ලාභා**
**සන්තුට්ඨී පරමං ධනං**
**විස්සාසා පරමා ඥාති**
**නිබ්බානං පරමං සුඛං**" කියලා.

'ආරෝග්‍ය පරමා ලාභා' කියන එකේ ගැඹුර අපට මේ බක්කුල මහ රහතන් වහන්සේගේ ජීවිතය ආශ්‍රයෙන් තේරුම් ගන්න පුළුවන්. සමහර කෙනෙක් අපට මේ දානයක් පූජා කරනවිට, ඒ වගේ සිය දහස් ගුණයක් අපට ලැබේවා කියන විදියෙ ප්‍රාර්ථනයක් කරනව නම් ඒ විදියට කල්පනා කරනවිට කෙනෙකුට හිතෙන්ට පුළුවන් බක්කුල මහ රහතන් වහන්සේට පාඩුවක්

සිද්ධ වුනා කියලා. ඒ මොකද? ඖෂධ අනවශ්‍යවීම නිසා. ඖෂධ පූජා කළා. නිරෝගී බව ලැබුණා. ඒ කියන්නේ ඖෂධ අනවශ්‍ය බව. ඒකෙ තියෙනවා ලොකු අදහසක්. නිරෝගි බව කියන්නෙ බෙහෙත් අනවශ්‍ය බව. ඒක ලොකුම ලාභයක්. යමක් අවශ්‍ය නම් ඒක දුකක්, පීඩාවක්, කරදරයක්. ඒ අවශ්‍යතාව සම්පූර්ණ කරගන්න යාම පීඩාවක්. එක්කො දුකක්. ඒ අනුව මේ කරුණු ධර්මානුකූලව ගැඹුරින් කල්පනා කර බලනවිට 'ආරෝග්‍ය පරමා ලාභා' කියන්නෙ **නිරෝගි බව තමයි, උතුම්ම ලාභය.** කිසිවෙක් හිතුවොත් අපි අවුරුදු දහයක් තිස්සේ නිස්සරණ වනයට මහා රාශියක් ඖෂධ පූජා කළා. ඒ වාගේ සිය දහස් ගුණයක් සංසාරෙදි මට ඖෂධ ලැබේවා කියල පැතුවොත් ඒ එක්ක පතන්නේ මොනවද, ඖෂධ පාවිච්චි කරන්න මට ලෙඩ ලැබේවා කියල. ඖෂධ පාවිච්චි කරන්ට ලෙඩ පැතිය යුතුයි. අන්න ඒ නිසා නුවණැත්තන් පැතිය යුත්තේ නිරෝගි බවයි.

**'ආරෝග්‍ය පරමා ලාභා'** කියන්නෙ ඊට එහා තව ලාභයක් නැති නිසයි. අනිකුත් හැම ලාභයක්ම වැඩිකර ගන්ට හිතෙනවා. ආරක්ෂා කරගන්ට හිතෙනවා. ඔය විදියට මහ ප්‍රශ්න රාශියක් ඇතිකරන දේවල්. නිරෝගි බව තමයි, ලොකුම ලාභය.

ඒ අදහස තවත් තහවුරු වෙනවා.

**'සන්තුට්ඨී පරමං ධනං'**
නොයෙකුත් ධන ලබා ගත්තත් ඒවා නැති වෙනවා. ලද දෙයින් සතුටු වීම තමයි පරම ධනය.

**'විස්සාසා පරමා ඥාති'**
කියන්නේ, දැන් සමහර නෑයන් ඉන්නේ ලේ නෑයන් කියලා. අපට යම්කිසි දෙයක් සාක්කි වශයෙන් ඔප්පු කර ගන්න උවමනා වුනාම ලේ නෑයන්ගෙ පිහිට සොයනවා. යම් කෙනෙකුට විශ්වාස මිතුරෙක් ඉන්නව නම් අපට ඒ ලේ නෑයන්ගෙන් ඉටු කරගන්න දේ ඒ විශ්වාසවන්තයාගෙන් ඉටුකර ගත හැකියි. වෙන නෑයෙක් ඔන නෑ. විශ්වාසය තමයි පරම ඥාතියා.

ඒ අදහස ම අපි නිවනට කිට්ටු කරල බැලුවොත්.

**'නිබ්බානං පරමං සුඛං'**
නිබ්බාන යනු නිවීමයි. නිවීම තියෙනව නම් තණ්හක්ඛය කියල කිව් හැටියට තණ්හාව ක්ෂය කිරීම තමයි, ලොකුම සැපය. ඊට එහා සැපයක් නැහැ. ඊට එහාට දෙයක් අවශ්‍ය නැහැ.

ආරෝග්‍ය පරමාලාභා කියන ගාථාවෙන් වඩා ගැඹුරු අර්ථයක් තේරුම් ගන්න පුළුවන්. ඒක නිසා තමයි, බක්කුල මහ රහතන් වහන්සේගේ ඖෂධ පූජාවේ විශිෂ්ඨ ආනිසංසය නිරෝගි බවයි. මේ පින්වතුනුත් ඥානවන්තව පතන්ට ඕනෑ අන්න ඒ විදියටයි.

අන්න ඒක ආශ්‍රයෙන් අපි ඊළඟට මේ සූත්‍ර දේශනාව අනුව කල්පනාකර බැලුවොත් අර ප්‍රයත්න දෙක අතුරෙන්, ගිහි පින්වතුන් සිව්පසය ලබාදීමට කරන ප්‍රයත්නය, එක අතකින් බලනවිට ඒක පරම පරාර්ථ ප්‍රයත්නයක්.

මේ සංඝයා වහන්සේලා ආරණ්‍ය සේනාසනයට වැදිල බණ භාවනා කරනවයි කියල ඇස් දෙක පියාගෙන සමහරවිට ලෝකයට සම්බන්ධයක් නැතිව කරන ප්‍රයත්නය, ඒක ලොකු හැටියට බුදු පියාණන් වහන්සේ දැක්වූවෙ මක්නිසාද?

**'සබ්බූපධිපටිනිස්සග්ගත්ථං පධානං'**
උපධීන් කියල කියන්නෙ මේ අල්ලගන තියෙන දේවල්. කරගහගෙන තිනෙ දේවල්. මේ පෙනෙන දේවල් නෙමෙයි කරගහගන ඉන්නෙ.

**'භාර හාරොපි පංචක්ඛන්ධා**

**භාර හාරොපි පුග්ගලො'**

මේ පංචස්කන්ධ භාරයන් තමයි පුද්ගලයා සංසාරයෙ දීර්ඝ කාලයක් අරගෙන යන්නේ. මමය, මාගේය කියල ඒවා මමත්වයෙන් රැකගන්න නිසයි, ඒවා උපධි වෙන්නෙ. ගේ දොර, ඉඩකඩම්, මිල මුදල් ආදියටත් උපධි කියල ලෝකයේ ව්‍යවහාර වෙනවා. ධර්මයේ උපධි කියලා සඳහන් වන්නේ මෙන්න මේ පංචස්කන්ධයටයි. පංචස්කන්ධයෙන් මිදීමට දරන මේ උත්සාහය තමයි නිර්වාණය සඳහා උත්සාහ දරනවා කියල කියන්නෙ. උපධීන්ගෙන් සිත මුදා ගත් අවස්ථාව තමයි, විමුක්තිය, නිර්වාණය, සැනසීම, නිවීම කියල කියන්නෙ. අන්න ඒ නිසා.

**'සබ්බූපධි පටිනිස්සග්ගො'**

මේ උපධි අත්හැරීම තමයි, ලෝකයේ ඇති ලොකුම සැපය. ඒක සාමාන්‍ය ලෝකයාට තේරුම් ගැනීම අපහසුයි. දීර්ඝ කාලයක් පින්කම්වලට හිත යොදලා, මේ යෝගාවචරයන් වහන්සේලා ඇසුරු කරලා පුරුදු පින්වතුන්ට නම් තේරුම් ගැනීම ඒ තරම් අමාරු නොවෙන්ට පුළුවන්.

වටිනා ගාථා තුනක් ධර්මයේ සඳහන් වෙනවා. මෙන්න මේ නුවණැත්තන් පින් කිරීමේදී බලාපොරොත්තු වෙන ඉලක්කය, පරමාර්ථය කුමක්ද? කියල පෙන්නුම් කරන ගාථා තුනක්,

'න පණ්ඩිතා උපධි සුඛත්ත හේතු
දදන්ති දානානි පුනබ්බවාය
සාමන්තතො උපධි පරික්ඛයාය
දදන්ති දානං අපුනබ්භවාය

න පණ්ඩිතා උපධි සුඛත්ත හේතු
ඣායේති ඣාණානි පුනබ්භවාය
සාමන්තතො උපධි පරික්ඛයාය
භාවෙන්ති ඣාණං අපුනබ්භවාය

න පණ්ඩිතා උපධි විපරික්ඛ හේතු
තෙ නිබ්බුතිං ආකිංචමානා දදන්ති
සන්නිද්ධ චිත්තා තදාති මුත්තා
භවන්ති නිබ්බාන පරායනානි'

ඤාණවන්ත පුද්ගලයින් දානදිය දෙන්නෙ උපධි සඳහා නොවේ.

**'න පණ්ඩිතා උපධි සුඛත්ත හේතු'**

උපධින්ගෙන් ලැබෙන සැප කියන්නේ ගේ දොර ඉඩකඩම්, යාන වාහන, මිල මුදල් ආදිය ප්‍රාර්ථනා කිරීමෙන් කෙනෙක් භවයේ සැප බලාපොරොත්තු වෙනවා. අන්න ඒ සැප ඉලක්ක වශයෙන් තබා ගත්තොත් මේ සංසාරයේ වට රවුමේ යාම මිසක් ඉන් එලියට ඒමේ ශක්තිය, මිදීමේ හැකියාව ලැබෙන්නේ නෑ. **නුවණැත්තන් ඒ උපධි සම්පත්, භව සම්පත් සඳහා නොවේ දාන දෙන්නෙ.**

'සාමන්තතෙ උපධි පරික්ඛයාය'
මේ උපධින් නැති කිරීම නම් වූ
'උපධි පටිනිස්සග්ග' නම් නිවන ඉලක්ක කරගෙනයි.
පින් කරන්නේ,
'සාමන්තතො උපධි පරික්ඛයාය
දදන්ති දානානි අපුනප්භවාය'

ජාතිය, පුනර්භවය නැති කිරීම ඉලක්ක කරගෙනයි, අමා මහ නිවන් සඳහායි ඥාණවන්තයා පින් කරන්නෙ. මේ දායක මහත්තයත් සංඝයා වහන්සේලාට ආරාධනා කළේ අමා මහ නිවන් සඳහා පූජාව පිළිගන්න කියලයි. ඒ දානය ගැනයි.

ධ්‍යාන වුනත් සම්බුද්ධ ශාසනයෙ එහෙමයි. බුද්ධෝත්පාද කාලයක ධ්‍යාන වඩන්නෙත් ඒ විදිහට භව භෝග සම්පත් බලාපොරොත්තුවෙන් නොවේ. ඒ විදියට ධ්‍යාන වඩල කල්ප ගණන් බ්‍රහ්ම ලෝකවල ලැගල ඉන්න නොවේ. ඒක භව තෘෂ්ණාවෙන් වෙන ප්‍රාර්ථනාවක්. ඒ වෙනුවට ධ්‍යාන වඩන්නේ, ශමථ භාවනා වඩන්නේ මොටද? ඒ ධ්‍යාන, සමථ භාවනා පිහිට කරගෙන, පාදක කරගෙන විදර්ශනා භාවනා වඩා අමා මහ නිවන් දැකීමටයි.

අන්න ඒ විදයට කල්පනා කරනකොට ඒකයි මේ දෙවෙනි ගාථාවෙ සඳහන් වෙන්නෙ.

'න පණ්ඩිතා උපධි සුඛත්ත හේතු
ඣායේථ ඣාණානි පුනබ්භවාය
සාමන්තතො උපධි පරික්ඛයාය
භාවෙන්ති ඣාණං අපුනබ්භවාය'

නුවණැත්තන් උපධි සැප සඳහා නොවේ ධ්‍යාන වඩන්නෙ. ඒකාන්ත වශයෙන්ම ඒ ධ්‍යාන වඩන්නෙ මොකක් සඳහාද-**උපධි පරික්ඛයාය**-උපධීන් නැති කිරීම සඳහාය යන අදහසයි මෙතනත් කියන්නෙ.

"තෙ නිබ්බුතිං ආකිංචමානා දදන්ති
සන්නිද්ධ චිත්තා තදාති මුක්තා
නජ්ජා යථා සාගර මජ්ඣ පත්තා
භවන්ති නිබ්බාණ පරායනාති"

ඒ අය නිර්වාණයම බලාපොරොත්තුවෙන් පින්කම් කරනවා, හරියට සාගරයට ගිහින් කෙළවර වන නදීන් වගේ. නිවනම පරායන කොට, නිවනම පරමාර්ථ කොටයි පින්කම් කරන්නේ. අන්න ඒ විදියට ක්‍රමානුකූලව මේ පින්වතුන් පින්කමට හිත යොදන කොට අර විදියට යම් හෙයකින් සුගතිගාමීව සංසාරයෙ දිගට යනවා නම් ඒවාට උපකාරවන භව භෝග සම්පත් ලැබෙනවා. අමුතු ප්‍රාර්ථනාවක් නැතුවත්.

මෙවැනි පින්කම්වල ආනිසංස වශයෙන් බුදු රජාණන් වහන්සේ ප්‍රකාශ කරල තිබෙනවා. ආයු, වර්ණ, සුඛ, බල, පටිභාන කියන ඒ ආනිසංස දාන දීම නිසා සංසාරික වශයෙන් කෙනෙකුට හිමිවන බව ධර්මයේ සඳහන් වෙනවා. ඒවා අමුතුවෙන් පැතිය යුතු දේවල් නොවේ. **නමුත් නිර්වාණය ඉලක්කයක් හැටියට තබා ගත්තොත් එය විවට්ටගාමී කුසලයක් බවට** පත් වෙනවා. සංවට්ට, විවට්ට කියලා දෙකක් තිබෙනවා. අබුද්ධොත්පාද කාලවල ලෝකයේ මේ දීර්ඝ සංසාර ගමන යනවා කීමට සංවට්ට කුසල් කියනවා.

කෙනෙකුට සංසාරය ගැන හිතනකොට ලොකු බයක් ඇති වෙනවා. අපි දීර්ඝ කාලයක් කාල වශයෙන්, දේශ වශයෙන් නොයකුත් භවවල ඉපදිලා මේ සංසාරයේ දීර්ඝ ගමනක් ආව නේද? කියල ලොකු සංවේගයක් ඇති වෙනව. ඊටත් වඩා ලොකු සංවේගයක් ඇති වෙනව. මෙච්චර කල් ආව කියල මං එක වට වළල්ලෙ කරකැවීම මිසක් වෙන මොකක්ද කළේ කියල හිතෙන කොට. දීර්ඝ කාලයක ගමන් කළත් එක වට වළල්ලක කරකැවීම තමයි සංසරණය කියන්නෙ. තිතක් වගේ එකම කේන්ද්‍රයක් වටේ එකම තැන කරකැවීමයි, සංසරණය කියන්නෙ. **නිස්සරණය** කියල කියන්නේ ඒ වට වළල්ලෙන් පිට පැනීමයි. ඒකට තමයි අතීතයේ යෙදුවෙ සංවට්ට විවට්ට කියන වචන. සංවට්ට කියන්නෙ අර සංසරණය කියන අදහසයි. එක තැන වට වළල්ලේ කරකැවීමයි. මේ තුළින් යම්කිසි ජවයක් ඇති වෙනවා. ඒ ජවයට යටවෙලා ඊළඟට මේකෙන් එළියට පනින්ට බැරි තත්ත්වයක් ඇති වෙනවා. කෙනෙක් වට වළල්ලෙ කරකැවෙන කොට ඒක ප්‍රත්‍යක්ෂ කරගන්න පුළුවන් දෙයක්. ටික වෙලාවක් යනකොට අමුතු ජවයක් ඇති වෙනවා. ඒ ජවය නිසා එයින් පිට පනින්ට තබා ඒ කරකැවිල්ලවත් නවත්වා ගන්ට බැරි වෙනවා.

ඔය විදියෙ දෙයක් සිද්ධ වෙනවා. ඒවට තමයි කෙළෙස් කියල කියන්නේ. ආෂය, අනුෂය ධර්ම කියල කියන්නෙ. සංසාරෙ දීර්ඝ කාලයක් සංසරණය නිසා චිත්ත සන්තානවල එක් රැස්වුන ඒ ආෂය ධර්ම, අනුෂය ධර්ම තමයි ඒ ජවය. ඒක කෙළෙස් ජවයක්. අකුසල ජවයක්. ඒ ජවයට යටවෙලා මොන උත්පත්තියක් ලැබුවත්-බ්‍රහ්ම ලෝක, දිව්‍ය ආත්ම භාව, මනුෂ්‍ය ආත්ම භාව, ප්‍රේත ආත්ම භාව, තිරිසන් ආත්ම භාව ඒ කොයි ආත්ම භාවයක් ලැබුවත්-

මොකක්ද මේ වට වළල්ල?

**ජාති ජරා ව්‍යාධි මරණ**

**ජාති ජරා ව්‍යාධි මරණ**

කථාන්තරය එච්චරයි. ජාතියෙන් පටන් ගන්නවා. ජරාවට දෙවෙනි පියවර තබනවා. ඔය අතර ව්‍යාධියෙන් තව දුක් විඳිනවා. මරණයෙන් කෙළවර වෙනවා. ඕකයි, වට වළල්ල. එක අතකින් අපි දීර්ඝ කාලයක් සංසාරෙ ගමන් කළා. ඔය අතර එකම තැන කරකැවිලා ඒක අතිශයින් සංවේගජනකයි. මේක තේරුම් ගන්නේ නෑ බොහෝ දෙනා. සංසරණ තත්ත්වය තේරුම් ගත්තාම යි නිස්සරණ තත්වය ඇති කරගන්න ඕනෑ කියන හැඟීම එන්නෙ. නිස්සරණ අධ්‍යාශයෙන් පින්කම් කරනවා කියන්නේ ඒකයි.

නිස්සරණ කියන වචනයට පින්වතුන්ගේ හිත ඇදිල යන්නෙ ඔන්න ඔය නිසයි. අබුද්ධෝත්පාද කාලවල මේ සංසරණ, සංවට්ට වටවළල්ලේ කර කැවීම පමණයි.

බුද්ධෝත්පාද කාලයක ඥානවන්ත පින්වතුන්ට පමණයි, මේ නිස්සරණ කියන වචනය අර්ථවත් වෙන්නෙ.

මේ වට වළල්ලෙන් පිට පනින්ට නම් ප්‍රතිවිරුද්ධ ඊට වඩා ලොකු ජවයක් ඇතිකර ගන්ට ඕන. ඒ ජවය නම් අලෝභ, අදෝෂ, අමෝහ යි. එහෙම නැතිනම් **සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන්ගෙන් ඇතිකර ගතයුතු ජවය.** ඒක කුසල ජවයක්.

අකුසල් ජවය නිසා වට වළල්ලේ කර කැවෙනවා. කුසල් කියන්නේ දක්ෂ බව. අකුසල් කියන්නෙ අදක්ෂ බව. අදක්ෂ බව නිසාමයි මේ වට වළල්ලේ කර කැවෙන්නේ.

කුසල ක්‍රියා ආදිය කිරීමෙන් කරන්නේ කුමක්ද? තම චිත්ත සන්තානයේ ඇතිකර ගන්නවා, අර විවට්ටගාමී ශක්තිය, ඒ නිස්සරණ ශක්තිය.

අර මේ කාලයේ වචනවලින් කියනවා නම් **කේන්ද්‍රානුසාරී, කේන්ද්‍රාපසාරී** කියල. ඒ පාරිභාෂික වචන අනුව කියනවා නම් කේන්ද්‍රානුසාරී කියන්නෙ, එකම වට වළල්ලේ කරකැවීමයි. මැද තිතක් බලාගෙන.

කේන්ද්‍රාපසාරී කියන්නෙ, ඒ මැද තිතට පිටදාල, පිටුපාල ඒ වට වළල්ලෙන් පිට පැනීමට කරන බලවේගයයි. මේ බලවේග දෙකෙන් තමන් අසු විය යුත්තේ කුමන බලවේගයටද? කියලා ඥාණවන්ත පින්වතුන් සලකා ගත යුතුයි. එහෙම කල්පනා කරනවිට මේ පින්කමේ අර කලින් බක්කුල ස්ථවිරයන් වහන්සේ පිළිබඳ ප්‍රකාශ කළ ආකාරය අනුව අපි මේ කොච්චර දේවල්-ඒක බෙහෙත් පිළිබඳව නම් ලෙහෙසියෙන් තේරුම් ගන්න පුළුවන්. බෙහෙත් පූජා කරල අපි බෙහෙත් බලාපොරොත්තු වෙන්නෙ නැහැ. බෙහෙත් බලාපොරොත්තු වෙනව නම් ඒත් එක්ක ලෙඩක් බලාපොරොත්තු වෙන්න ඕන. ඒ නිසා අපි නිරෝගි බව ප්‍රාර්ථනා කරනව.

නමුත් බුදු පියාණන් වහන්සෙට පෙනුන මේ භවය ලෙඩක් හැටියට.
ඒක නිසා තමයි,

**'සත්හට වන බව දුකට වෙදාණන්'** කීවෙ. බුදු පියාණන් වහන්සේ මේ භවය ප්‍රාර්ථනා කිරීමෙන් කරන්නේ කුමක්ද? මේ භවය එක්ක යන තව ලෙඩ ගොඩක් ප්‍රාර්ථනා කිරීමයි. ඒ නිසයි මේ භව තෘෂ්ණාව නැති කිරීම වැදගත් වන්නෙ.

**"තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බාණං"** මේ තෘෂ්ණාව ක්‍ෂය කිරීමයි කෙනෙකුගේ ඉලක්කය විය යුත්තේ. ඒක තමයි නියම සැනසීම.

බෙහෙත් පූජා කරල බෙහෙත් බලාපොරොත්තු වෙනව නම්, ඒ බෙහෙත් වලට සරිලන ලෙඩක් තියෙන්ට ඕන, ඒ බෙහෙත් පරිභෝග කරන්ට.

ධර්මානුකූලව සලකන විට මේ බෙහෙත් සංකල්පය අනික් දේවල් ගැන, සිව්පසය ගැන වුනත් අපේ බෞද්ධ කවියන් යොදල තියෙනව. ලෝවැඩ සඟරාවෙ වීදාගම ස්වාමීන් වහන්සෙ ප්‍රකාශ කරල තියෙනවා.

'සයට වේද රස මුසු බත් කන්නේ
ගඳට වේද ඇඟ සුවඳ කරන්නේ
ලෙඩට බේති මේ මොලොව සතුන්නේ
කුමට මීට සැපයයි පවසන්නේ'

සිංහලෙන් වුනත් බොහොම ගැඹුරු අදහසක් තියෙනව, පාලියෙන් නොකීවයි කියල අඩුවක් නෑ.

'සයට වේද රස මුසු බත් කන්නේ'
කුසගින්න නිසා නේද? ආහාර ගන්නෙ.
'ගඳට වේද ඇඟ සුවඳ කරන්නේ'
ගඳ ගහනවාට නේද? නොයෙකුත් සුවඳ විලවුන් වර්ග පාවිච්චි කරන්නෙ. මෙලොව සතුන්ට ඇතිවන ලෙඩ, බඩගින්න, පිපාසාව, ඇඟ ගඳ ගැසීම ආදී ලෙඩට බේත් නේද? මේ. ඒ ලෙඩ නිසා නේද? මේවා පාවිච්චි කරන්නෙ. ඒ නිසා,
'කුමට මීට සැපයයි පවසන්නේ'
මීට සැපයයි පවසන්නේ ඇයි? මේ තමයි නියම බෞද්ධ ආකල්පය. මේ විදියට බලනවිට අර බක්කුල මහ රහතන් වහන්සේ නිරෝගි බව ප්‍රාර්ථනා කළා වගේ අපිත් මේ සංසාර රෝගයෙන් නිරෝගි වෙන්න ප්‍රාර්ථනා කරන්න ඕන.

තවත් තැනක සඳහන් වන ශ්‍රේෂ්ඨ කියමනක් තමයි,

'ආරෝග්‍ය පරමා ලාභා
නිබ්බානං පරමං සුඛං'

ආරෝග්‍ය තමයි ලෝකයේ ඇති ලොකුම ලාභය. නිර්වාණය තමයි ලෝකයේ ඇති ලොකුම සැපත.

මේ පින්කම ආශ්‍රයෙන් මේ පින්වතුන්ගේ චිත්ත සන්තානවල වඩා වර්ධනය විය යුතු පුණ්‍ය චේතනා නිර්වාණය ඉලක්ක කරගත යුතුයි. අර ගංගාවල් ගිහින්ලා සාගරයෙන් කෙළවර වන්නා වාගේ. මේ පින්කම උපනිශ්‍රය කරගෙන අපටත් අමා මහ නිවන ලැබේවායි ප්‍රාර්ථනා කර ගන්න.

ධර්ම දානයට සහභාගී වුන පින්වතුන් අත හිත දුන්න පින්වතුන් තම තමන්ගේ චිත්ත සන්තානවල සමථ විදර්ශනා භාවනා මාර්ගය හෙළි පෙහෙළි වේවා කියල. ඒ වගේම අමෘත මහා නිර්වාණය ඒ තුළින් ලබා ගැනීමට හැකිවේවා කියල ප්‍රාර්ථනා තබා ගන්න.

මේ ඖෂධ දානය පූජා කළ පින්වතුන්ට භව දුක්ඛයෙන් මිදෙන්න, බව ලෙඩේ සනීප කරගන්න අදහසින් ධර්මය නමැති ඖෂධය වළඳල බුදුපියාණන් වහන්සේ පෙන්වා දුන් මාර්ගයේ ගමන් කිරීමට ශක්තිය ලැබේවා කියල ප්‍රාර්ථනා තබාගන්ට හැකි වේවා!

මේ පින්කමට මූල බීජය වශයෙන් මේ පිළිබඳ අදහස පැහැදිලි වුනේ අති පූජනීය මහෝපාධ්‍යායාය මාහිමිපාණන් වහන්සේ නිසා. උන්වහන්සේගේ මේ වටිනා ධර්ම ග්‍රන්ථය නිර්වානගාමී ප්‍රතිපදාව දක්වන්නක්. උන්වහන්සේගේ ජීවිතය ඇත්ත වශයෙන්ම පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ ත්‍රිවිධ ශාසනය මූර්තිමත් කළ වටිනා ජීවිතයක්. මෙය විශේෂයෙන් ම උන්වහන්සේගේ ජීවිතයේ අසූවෙනි වසරේදී මුද්‍රණය වූ කෘතියක්. උන්වහන්සේගේ තියෙන ඒ ගැඹුරු ශාසනික හැඟීම් රාශිය මතුකරල ලියන ලද එම ග්‍රන්ථය උන්වහන්සේට කෘතෝපකාර වශයෙන්, නැවත මුද්‍රණය කරල උන්වහන්සේට උපහාර වශයෙන් මේ අවස්ථාවේදී පූජා කරන්ට ලැබීම, විශේෂ පුණ්‍ය කර්මයක් හැටියට මේ පින්වතුන්ට සතුටුවෙන්න පුළුවන්.

ඒ මහෝපාධ්‍යායාය ස්වාමීන් වහන්සේ භවයේ යම් තැනක සිටිනව නම්, මේ පින්වතුන්ගේ පින්කම දිහා බලල සතුටුවෙලා මේ පින්වතුන්ට ආශිර්වාද කරත්වා!

ඒ වාගේම මේ ප්‍රතිවේධ ශාසනය බැබලවීමට මේ යෝගාවචර සංඝයා වහන්සේලාටත් මේ උපාසක උපාසිකා දායක දායිකාවන්ටත් ශක්තිය රැකවරණය සලසත්වා! ආශිර්වාද කරත්වා කියල ප්‍රාර්ථනා කරගන්ට ඕන.

සම්‍යක් දෘෂ්ටික දෙවි දේවතාවරුන්ගේ බැල්ම නිසැකයෙන්ම මේ වාගේ පින්කම්වලට යොමු වෙනව. පුණ්‍ය සෘද්ධියක්, ප්‍රාතිහාර්යක් වගේ සිද්ධි සමහරවිට සිදුවෙන්ට ඇත්තේ අපට නොපෙනුනත් අපට හිතන්ට පුළුවන්, ඒ සම්‍යක් දෘෂ්ටික දෙවිවරුන්ගේ පිහිටයි කියල. මේ ශාසනික පරිහානිය දැකල, ශාසනයේ දියුණුවට අත හිත දෙන කීප දෙනාට හරි උපකාර කරන්ට උත්සාහ දරනවා ඇති. මේ පින්වතුන්ට ඒ ශාසනාරක්ෂක දෙවිවරුන්ගේත් ආරක්ෂාව ලැබේවා! ඊට අමතරව මේ පින්වතුන්ට තමන් කරන මේ පිංකම්ම ඇත්ත වශයෙන් පරිත්‍රානයක් වෙනවා. ඒ කොහොමද? බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති කියන ත්‍රිවිධ අනුස්සති ද නොදැනුවත්වම වාගේ මේ පින්වතුන්ගේ චිත්ත සන්තානවල නිතරම මතුවෙනවා. ඒකම ආරක්ෂාවක්. බුද්ධ රත්නය, ධම්ම රත්නය, සංඝ රත්නය කියන ත්‍රිවිධ රත්නය හදවතේ තියෙනව නම් කිසිම දේකට බය වෙන්ට ඕන නෑ. **ලෝකයේ තිබෙන ලොකුම හපන්කම, පෝසත්කම තමයි මේ ත්‍රිවිධ රත්නය චිත්ත සන්තානයේ තැන්පත් කරගැනීම.** ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය මේ පින්වතුන්ට එදිනෙදා ජීවිතයේ ලැබේවා කියා ප්‍රාර්ථනා ඇති කරගන්ට ඕන.

ඒ වගේම අමුතුවෙන් නොකීවත් කර්මය පිළිබඳව බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කළ කරුණු අනුව තේරුම් ගන්ට පුළුවනි.

කුසල කර්ම, පින්කම් කරන පින්වතුන්ට ලැබෙන තවත් රැකවරණයක් තමයි.

අතීත දීර්ඝ සංසාරයේ කළ අකුසල කර්ම, පාප කර්ම තියෙනව නම් අලුයට ගිනි පුපුරු වගේ විපාක දෙන්ට සූදානම්ව, පින්කරන පුද්ගලයා ළඟට ඒවාට කිට්ටුවෙන්ට අමාරුයි. මොකද, පින් කරන පුද්ගලයාගේ පුණ්‍ය ශක්ති නිසා ඒ පින් කරන පුද්ගලයා ළඟදි ඒවා මොට වෙනවා. ඒක ධර්මයේ සඳහන් වෙනවා. සමහරවිට උප පීඩක වශයෙන් ඉදිරිපත් වන්නට තිබෙන බරපතල කර්ම වේග යටපත්වන ස්වභාවයක් තිබෙනවා, පින්කම් කරන පින්වතුන්ට.

ඒ වගේම තමන් කරන්ට බලාපොරොත්තු වන භාවනා ආදී පිංකම් තිබේ නම් ඒවාට තවත් අත හිත දෙන අර උපස්ථම්භක වන, අතීත සංසාරයේ භාවනා වශයෙන් වඩල තියෙන කුසල ධර්ම තිබේ නම් ඒවා තවත් මුවහත් වෙලා එනවා. මෙවැනි පින්කම්වලින් උපස්ථම්භක වශයෙන් බරපතල අකුසල කර්ම අහෝසි වෙනවා.

මේ නිසා තමන් සිතින්, කයින් වචනයෙන් කරන කුසල කර්මවලින්ම එදිනෙදා ජීවිතයට ආශිර්වාදයක් ලැබෙනවා. මේ කාලයේ සමහරු නොයෙකුත් පාප කර්ම කරලා ආශිර්වාද බලාපොරොත්තු වෙනවා. ඒ විදියට ආශිර්වාද ලැබෙන්නේ නැහැ. පින්කම් කරන අයට ඉබේම ත්‍රිවිධ රත්නයේත්, දෙවියන්ගේත් ආශිර්වාද ලැබෙනවා.

ඒ වගේම දැන් එතකොට මේ එකතු කරගත්ත කුශල සම්භාරය-මේ අවස්ථාවේදී දානමය, ධර්ම ශ්‍රමණමය වශයෙන්, අපිත් ධර්ම දේශනාමය වශයෙන් යම් කුශල සම්භාරයක් එක් රැස්කර ගත්තා නම්, මේ ශාසන පරිහානි අවදියේ අවදිව සිටින ශාසනාරක්ෂක දෙවි දේවතාවන් ආදී දිව්‍ය බ්‍රහ්ම මණ්ඩලයක් සිටිනවා නම් ඒ දෙවි දේවතාවනුත් මේ පින් අනුමෝදන් වෙත්වා.

මේ පින්වතුන් සිත යොදල, ඒ අනුව වචනය යොදල, සංවිධානය කරල ඒ කයින් වෙහෙසවෙලා, කාලය, ධනය ඒ හැම එකක්ම වැය කරලා මේ කළ උත්සාහය ඇත්ත වශයෙන්ම තමන්ගේ ඒ සංසාරයෙ යම්තාක් කාලයක් කාලය ගෙවනව නම්, ඒ තාක් කාලය නිරායාසයෙන් ම ඒ කාලයෙ සංසාරික දුක් බොහෝ දුරට අඩුවෙලා ඒ නිවන් මග පැදෙන්න සුගතිගාමී වෙන්න උපකාර වෙනවා. මග පැදෙනවා. තමන් යම්කිසි ප්‍රාර්ථනාවක් තබා ගන්නවා නම් ඒකාන්තයෙන් ම ඒක ඉෂ්ඨ සිද්ධ වෙනවා. ඒ වශයෙන් සතුටු වෙලා මේ අවස්ථාවේ අනුමෝදන් වීම් වශයෙන් මේ තාක් මේ රැස්කරගත් කුසල සම්භාරය තම තමන්ට ප්‍රාර්ථනා කරගන්ට ඕන. තමන් බලාපොරොත්තුවන බෝධියකින් අමාමහ නිවන් ලැබීමට මේ පින්කම උපනිශ්ශ්‍රය වේවා කියල.

ඒ වාගේම මේ පින්කමට සහභාගී වුන, ඇතැම්විට දස වසරක් තිස්සෙ මේ පිංකමට අත හිත යොදල අභාවප්‍රාප්ත වුණු තම තමන්ගේ ඥාති හිත මිත්‍රාදීන් ගැනත් සිහිපත් කරලා මේ පින්කමේ ආනිශංස බෙදා හදා ගන්ට, ඒ අයටත් මේ පින් අනුමෝදන් කරන්ට බලාපොරොත්තු වන්න ඕන. ඒ වගේම දෙවි දේවතාවුන්ටත් පින් අනුමෝදන් කරන්ට ඕන.

අවසාන වශයෙන් කල්පනා කරලා දන් දීම්, සිල් රැකීම්, ඒ සංඝයා වහන්සේලාට ගරු සත්කාර කිරීම්, ඇප උපස්ථාන කිරීම්, බණ ඇසීම් ආදී පුණ්‍ය රාශිය, පුණ්‍ය චේතනා සමූහය ඒ පින්කම්වල ආනිසංස වශයෙන්, අපි බලාපොරොත්තු වන ඒ යම්කිසි බෝධියකින් උතුම් වූ අමා මහ නිවන් සාක්ෂාත් කරගැනීමට ලැබේවා කියලා ප්‍රාර්ථනා කරගන්න.

ඥාතීන්ට පින්දීම් ආදිය කරන්න.
"ඉදං මෙ ඥාතිනං හෝතු"
"එත්තාවතා ච අම්හෙහි"

## 10 වෙනි ඖෂධ පූජා පින්කමට සහභාගී වූ විශේෂ පින්වතුන් අතුරින් බ්‍රහ්මචාරී ධර්මසේන ආරියතිලක මැතිතුමාගේ දේශනයෙන්

ඓතිහාසික අනුස්මරණීය මහා පින්කමක්. ශ්‍රී ලංකාවේ සේනාසන ක්ෂේත්‍රයේ මුදුන් මල්කඩ හැටියට සලකන්ට පුළුවන්. ඒ වගේම කර්මස්ථානාචාර්ය ස්වාමීන් වහන්සේලා අතර මුදුන් මල්කඩ හැටියට වැඩ සිටිය ඒ මහෝපාධ්‍යායාය මාහිමිපාණන් වහන්සේගේ පුණ්‍ය ශක්තියෙන් පුණ්‍ය භූමියක් හැටියට පවතින මීතිරිගල නිස්සරරණ වන සෙනසුන් ශුද්ධ භූමියේ ඒ මහා පින්කම අවසානයේදී කෙටියෙන් පුණ්‍යානුමෝදනයක් කරන්ට ඒ දායක මණ්ඩලයෙන් මට අවස්ථාවක් ලැබීම මේ පින්කමට අනුමෝදනා වෙමින් තවත් මගේ පින්කම් අර්ථවත් කරගන්ට ලැබුන භාග්‍යයක් හැටියට මා සලකනවා.

පින්වතුනි, මෙම මීතිරිගල නිස්සරණ වනය ආරම්භ කළ උතුමා මේ ස්ථානය ගොඩනගා මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන් වහන්සේ ළග සසුන් ගත වෙලා අද සංඝ පීතෘන් වහන්සේ නමක් හැටියට මේ සේනාසනයේම වැඩ ඉන්නවා. උන්වහන්සේටත්, මේ ආයතනය ගොඩ නගන්ට වෙහෙස මහන්සි වෙච්ච සියලුම ජනතාවටත්, දායක කාරකාදීන්ටත් සන්තෝෂ වෙන්ට පුළුවන්. උදන් අනන්ට පුළුවන්. උදාන ප්‍රකාශ කරන්ට පුළුවන් අවස්ථාවක් හැටියට මේ ශ්‍රේෂ්ඨ පින්කම සලකන්ට පුළුවන්.

මීතිරිගල නිස්සරණ වනය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සේනාසනයක් හැටියට හැඳින්විය හැකියි. ශීල, සමාධි, ප්‍රඥා ප්‍රතිපදාව දෙන්ට පුළුවන්, භාවනා ක්ෂේත්‍රයේ පණිවිඩය ලංකාවට පමණක් නොව, මුළු ලෝකයට ම දෙන්ට පුළුවන් වැදගත් මධ්‍යස්ථානයක්. බුදුහාමුදුරුවන්ගේ ධර්ම දායාදය ලොවට දෙන්ට සමත් වෙච්ච මහෝපාධ්‍යායාය මාහිමිපාණන් වහන්සේගේ පාද ස්පර්ෂය ලැබූ ශුද්ධ භූමියක් හැටියටත් උන්වහන්සේගේ මග පෙන්වීම අනුව ඒ සෙවනේ හැදුන වැඩුන බුද්ධ පුත්‍රයන් වහන්සේලා කෙලෙස් තැවීමට නිවන් මග ගමන් කිරීමට යොදා ගන්නා ශුද්ධ භූමියක් හැටියටත් හඳුන්වා දෙන්ට ඕන.

අපගේ අපවත් වී වදාළ ඒ මහෝපාධ්‍යායාය මාහිමිපාණන් වහන්සේ පිළිබඳව අවස්ථා තුනක් මං මේ අවස්ථාවේදී මතක් කරනව. අවස්ථා දෙකක් පෞද්ගලිකව මට බලපෑවත් මං හිතනව ඒක මේ අවස්ථාවේදී මතක් කරන එක හොඳයි කියල.

මීට අවුරුදු පහළොවකට විතර ඉස්සර උන්වහන්සේ මා ගැන අහල මීතිරිගල නිස්සරණ වන සංරක්ෂණ සභාවේ සභාපති මහත්මයා හැටියට කලක් වැඩකළ මීගමුවෙ මීමැඩුම මුදලාලි මහත්මාට මතක් කරල තියෙනව මාව දකින්ට උවමනා බව. එතුමාගේ රථයෙන් මාව මේ ස්ථානයට ගෙන්වාගෙන උන්වහන්සේ මාත් එක්ක පැයක් පමණ සාකච්ඡා කරන්ට තරම් නිහතමානි වුනා.

ඒ වගේම උන්වහන්සේ ප්‍රකාශ කරන්ට යෙදුනා, මේ පැය මට නොවෙයි වැදගත් වන්නේ මේ සේනාසනයේ වැඩ ඉන්න ස්වාමීන් වහන්සේලාට. උන්වහන්සේලාට මේ පණිවිඩය දෙන්ට මහත්මයාට එන්ට පුළුවන් දවසක් දෙන්ට කියල දිනයක් ලබා ගත්තා. මීමැඩුම මුදලාලි මහත්මයා ලවාම මාව සේනාසනයට ගෙන්වාගෙන, පොහොය සීමාවට සේනාසනයේ ස්වාමීන් වහන්සේලා රැස් කරල උන්වහන්සේත් වැඩම කරල භාවනාව පිළිබඳ පැය දෙකක දේශනයක් මට කරන්ට අවස්ථාව දීල ගිහියෙක් හැටියට මට මහා ධර්ම දානමය පුණ්‍ය ශක්තියක් ලබා ගන්ට උන්වහන්සේ මට අවස්ථාව ලබා දුන්න.

මේ පින්කමේ සම්පූර්ණ අදහස, සම්පූර්ණ පුණ්‍ය ශක්තිය, සම්පූර්ණ අවබෝධය ඇටඹේ රාළහාමි ඇතුළු මේ පිරිසට ලැබුනේ මහෝපාධ්‍යායාය මාහිමියන්ගෙන්. පසුගිය අවුරුද්දෙත් මේ පිංකම පැවැත්වුව. විශාල පිරිසක් මෙතනට රැස්වුනා. අපේ මහෝපාධ්‍යායාය මාහිමියන් වහන්සේ ආරෝග්‍ය ශාලාවෙ වැඩ සිටියෙ. උන්වහන්සෙ කල්පනා කළා, මම මේ පින්කමට වඩින්ට ඕන. මේ දායකයින්ට අනුශාසනාවක් කරන්ට ඕන කියල, වෛද්‍යවරුන්ගෙන් අවසරයක් ලබාගෙන ඇවිත් අපේ පින්කමට සහභාගි වෙලා අනුශාසනාවක් කරලා, අපේ පුණ්‍ය ශක්ති දියුණු කරමින් අපව නිර්වාණ මාර්ගයට නැඹුරු කරන්න තරම් උන්වහන්සේ බෝධිසත්ව ගුණයෙන් පරිපූර්ණ වුනා.

අද දවසෙ අප විසින් මහා පුදුම විදියට අනුස්මරණීය විදියට ආදර්ශමත් විදියට කළ මේ පින්කම ඒ මහෝපාධ්‍යායාය මාහිමිපාණන් වහන්සේට ගුරු පූජාවක් වේවා! උන්වහන්සේ සාධුකර දිදී මේ පින් අනුමෝදන් වෙත්වා! උන්වහන්සේගේ ආශිර්වාදය සේනාසනාධිපති ස්වාමීන් වහන්සේ ඇතුළු සියලුම මහා සංඝයා වහන්සේටත්, පින්කමේ දායක පින්වතුන්ටත් ලැබේවා!

මේ පින්කමට සහභාගිවෙන පිරිස අතර විවිධ තරාතිරමේ බලතල, නිලතල, දැන උගත්කම් ඇති අය සිටිනවා. ඒ පමණට ම ශ්‍රද්ධාවෙන් උසස් ශීලයෙන් උසස්, පරිත්‍යාගයෙන් උසස් වෙච්ච මේ රටේ ඉන්න දුර්ලභ ගණයේ සත් පුරුෂයන් පිරිසක්, බෞද්ධ ප්‍රභූ පිරිසක්, සාධූන් පිරිසක් ඒකරාශිවුන අවස්ථාවක්ය කියල මං සන්තෝෂ වෙනව. මේ ඒකරාශී වීමට උපකාර වුනේ ලෝලුවාගොඩ සහ ඇටඹේ මීතිරිගල නිස්සරණ වන දාන දායක සමිතියයි. ඒ සංගමය නිසා මේ රටේ ඉන්න මේ උගත් පිරිස, ගුණ ගරුක පිරිස, සැදැහැවත් පිරිස, ධර්මධර පිරිස මේසේ ඒක රාශි වෙලා, අවුරුද්දකට දෙවරක් අනිවාර්යයෙන් ම මේ ශුද්ධ භූමියට ඇවිල්ලා ඔබවහන්සේලාගේ ආශිර්වාද ලබන්ට තරම් මේ පිරිස වාසනාවන්ත වෙලා සිටිනවා.

පින්වතුන් ශුද්ධ භූමියකට ආවෙ. අපි ආ වෙලාවෙ ඉඳල කුසල් දියුණු කර ගත්තෙ. අපේ පිරිස, අපේ ස්වාමීන් වහන්සේ මතක් කළ විදියට අපේ පිරිස මේ පිංකම ඉවර කරල මෙතනින් යන්නෙ ලබන අවුරුද්දෙ මේ දානය දෙන්නෙ කොහොමද කියල සිතමිනුයි. මාස තුනක් වගේ ආසන්න වෙනකොට සම්පූර්ණයෙන්ම කාලය, ධනය, ශ්‍රමය වැය කරමින් සූදානම් වෙන මහා දානයක්. මේ දානය පූර්ව චේතනා වශයෙන් අවුරුද්දක්ම සූදානම් වෙනව.

ඒ වගේම මේ අවස්ථාවෙ අපේ නායක ස්වාමීන් වහන්සේගේ අර්ථවත්, සාර ගර්භ සැදැහැ ජනිතවන ඒ අනුශාසනාව, අපේ ධර්ම දේශකයන් වහන්සේගෙන් ලැබිච්ච හුඟක් දුර්ලභ ධර්ම විනය වගේම බෞද්ධ ප්‍රතිපදාව ආදී හැම එකක්ම සම්බන්ධ කරල අපට අහන්ට ලැබුන ඒ දුර්ලභ ගණයේ ධර්ම දේශනාව හා අපේ දායක පින්වතුන්ගේ අදහස් ප්‍රකාශ කිරීම් ආදී හැම දෙයක් නිසා මේ අවස්ථාවේදී අපට ධර්ම සමාගමකට සහභාගි වෙන්ට ලැබුන කියල සන්තෝෂ වෙන්ට ඕන.

අද අපි දුර්ලභ පින්කමක් කළේ. සාංඝික දාන දෙන අවස්ථාවන් දැකල තියෙනව. මං ජීවිතයට දැකල නෑ, මේ වගේ විශාල පිරිසක් එකතු වෙලා, විශාල සංවිධානයක් වෙලා, ලොකු වියදමක් දරල, විශාල කැපවීමක් කරල මේ වගේ මහා ඖෂධ දානයක් ගිලාන ප්‍රත්‍ය දානයක් පිරිනමන අවස්ථාවක්. පිණ්ඩපාත දානය හැර අනික් අංශ තුනම මේ දානයට සම්බන්ධ වෙනවා. සේනාසන දානය වශයෙන් ස්වාමීන් වහන්සේලාගේ පරිහරණයට උපකරණ තියෙනව. ගිලාන ප්‍රත්‍ය වශයෙන් මහා රාශියක් ඖෂධ ආදිය තිබෙනවා. මේ සේනාසනයට පමණක් නොව, යෝගාශ්‍රම සංස්ථාවට සම්බන්ධ සියලුම සේනාසනවල මහා සංඝ රත්නයට නිරෝගිකම ලබාදෙන ඖෂධ සමුදායක් පූජා කිරීමේ වාසනාව ලැබුණා.

මේ සියලුම කුසල් ආමිශ ප්‍රතිපත්ති වශයෙන්, දාන ශීල භාවනා වශයෙන්, දශ පුණ්‍ය ක්‍රියා වශයෙන් අපි පුරුදු කළ සකල, විපුල කුසල සම්පත්තිය ශාසනාරක්ෂක, ස්ථාන අධිගෘහිත අපේ ආරක්ෂක දේව මණ්ඩලයට දේව පූජාවක් වේවා! සාධු කාර දීදී මේ පින් අනුමෝදන් වෙත්වා!

සියලුම ස්වාමීන් වහන්සේලාත්, පැමිණි නොපැමිණි දායක පින්වතුනුත්, පරලෝ සැපත් ඥාති හිත මිත්‍රාදීනුත් ඇතුළු හැමට මේ කුසල් පාරමී කුසල් වේවා! සැනසුම ලැබේවා!

**ධර්ම ග්‍රන්ථය මුද්‍රණය කිරීමේ කාර්යයට මහත් කැපවීමකින් කටයුතු කළ, කථිකාචාර්ය චන්ද්‍රදාස හතුරුසිංහ මැතිතුමාගේ දේශනයෙන්,**

'තමන් පද වන්දන
කළ පමණකින් නන්දන
නිවන් සැප වින්දන
වදිමි මහ සඟන මුනි නන්දන

'ශමථ විදර්ශනා භාවනා' නමැති ධර්ම ග්‍රන්ථය මේ සෙනසුනේ ආරම්භක කර්මස්ථානාචාර්ය ස්වාමීන් වහන්සේ ලෙස වැඩ සිටි මාතර ශ්‍රී ඥානාරාම මහෝපාධ්‍යායාය මාහිමිපාණන් වහන්සේ රචනය කරන ලද දුර්ලභ ගණයේ ධර්ම ග්‍රන්ථයක්. ඇත්ත වශයෙන්ම ධර්ම ඥානය තියෙන කෙනෙකුට මේක මොන තරම් වටිනා ධර්ම ග්‍රන්ථයක් ද කියල වැටහෙනව. මේ ධර්ම ග්‍රන්ථයේ අකුරක් ගානෙ, පෙළක් ගානෙ, පිටුවක් ගානෙ කියවාගෙන යනකොට, බුද්ධඝෝෂ හාමුදුරුවන්ගේ විශුද්ධි මාර්ගය ලියවුනාට පස්සෙ මේ විෂයෙහි ලා මේ රටේ ලියවුන එකම ග්‍රන්ථය කියල මට හිතෙනවා. ශමථ භාවනා, විදර්ශනා භාවනා පිළිබඳ පැහැදිලි නිරවුල් අවබෝධයක්, විවරණයක් ලබාදෙන වෙනත් තැනක් මා දැක නැහැ. ඒ නිසා මේක පුදුම දුර්ලභ ගණයේ ධර්ම ග්‍රන්ථයක්. මේක කියවන්න, කියවන්න මට නම් පුදුම සතුටක්. අර ආනන්ද හාමුදුරුවන්ට වාගෙ, ප්‍රාතිහාර්යයකින්වත් එක සැරයක් බැලුවහම මතක හිටින ශක්තියක් මට ලැබේවා කියල හිතුන. මොකද මේ ධර්ම ග්‍රන්ථය පාඩම් හිටින්න.

අද මේ ස්ථානයේදි ධර්ම දේශනාව පැවැත් වූ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ අපට පේරාදෙණියෙ විශ්ව විද්‍යාලයෙදි පාලි භාෂාව ඉගැන් වූ කථිකාචාර්යවරයා. තමන්ගේ චිත්ත අභ්‍යන්තරයෙන්ම ආ සසර පුරුදු අනුව පැවිදි බිමට පත් වූ උන්වහන්සේගේ පැවිදි උත්සවයටත් අපි ශිෂ්‍යන් වශයෙන් සහභාගී වුනා. අවුරුදු ගණනාවකට පසු නැවත උන්වහන්සේ දැක ගන්ට, ඇසුරු කරන්ට ලැබීම ලොකුම භාග්‍යයක් ලෙස මට කල්පනා වෙනවා.

මේ පොතෙන් පිටපත් 3000ක් මුද්‍රණය කිරීමේදී රු. 88000/=ක් වැනි සුළු මුදලකට එය කරදීමෙන් මගේ හිතවත් මිත්‍රයෙකු වන කොළඹ විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දයා රෝහන අතුකෝරල මහත්මා දැක්වූ අනුග්‍රහය මම ස්තුති පූර්වකව පුන්‍යානුමෝදනා සහිතව අගය කරනවා. සිය කාලය, ධනය කැපකර පානදුරේ සිට ලෝලුවගොඩට මේ පොත් ප්‍රවාහනය කර දීමෙන් මහරගම ව්‍යාපාරික මහින්ද සපරමාදු මහත්මා දැක් වූ උපකාරය ද ගෞරවයෙන් සිහිකර පින් අනුමෝදන් කරනවා. අවසාන වශයෙන් තම දරුවන් යහමග යවන්ට, උගන්වන්ට මහත් සේ කැප වූ, එමෙන් දන්නා දින සිට පිනට ම යොමුවුන මගේ පරලෝ සැපත් ආදරණීය පියතුමාණන්ට මේ කටයුතු වලින් ජනිත වූ සියලු කුසල ශක්තීන් අනුමෝදන් කරනවා.

**නිර්වාණාවබෝධය පිණිස ම ඒ කුසල් හේතු වේවා! කියල ප්‍රාර්ථනා කරනවා.**

**හැමට තෙරුවන් සරණයි.!!!**

**1998. 12. 27 - 14 වන බෙහෙත් පූජා පිංකමේ දී මීතිරිගල නිස්සරණ වනයේ කම්මට්ඨානාචාර්ය පූජ්‍ය උඩඊරියගම ධම්මජීව හිමිපාණන් වහන්සේ පැවැත්වූ ධර්ම දේශනයයි.**

නමෝතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස!!!

"කිත්තාවතා පන භන්තෙ, උපාසකො අත්තහිතාය ච පටිපන්නො හොති, පරහිතාය චාති:

යතො ඛො ජීවක, උපාසකො අත්තනා ච සද්ධාසම්පන්නො හොති, පරඤ්ච සද්ධාසම්පදාය සමාදපෙති. අත්තනා ච සීලසම්පන්නො හොති, පරඤ්ච සීලසම්පදාය සමාදපෙති. අත්ත නා ච චාගසම්පන්නො හොති, පරඤ්ච චාගසම්පදාය සමාදපෙති. අත්තනා ච භික්ඛූනං දස්සනකාමො හොති, පරඤ්ච භික්ඛූනං දස්සනෙ සමාදපෙති. අත්තනා ච සද්ධම්මං සොතුකාමො හොති, පරඤ්ච සද්ධම්මසවණෙ සමාදපෙති. අත්තනා ච සුතානං ධම්මානං ධාරණජාතිකො හොති, පරඤ්ච ධම්මධාරණාය සමාදපෙති. අත්තනා ච ධතානං ධම්මානං අත්ථූපපරික්ඛිතා හොති, පරඤ්ච අත්ථූපපරික්ඛාය සමාදපෙති. අත්තනා ච අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති, පරඤ්ච ධම්මානුධම්මපටිපත්තියා සමාදපෙති. එත්තාවතා ඛො ජීවක, උපාසකො අත්තහිතාය ච පටිපන්නො හොති, පරහිතාය චාති"

**(අඞ්ගුත්තර නිකාය - අට්ඨකනිපාතය, ජීවක සූත්‍රය)**

මූලාසනයේ වැඩ සිටින ගෞරවණීය ලොකු ස්වාමීන් වහන්සේ ප්‍රධාන මහා සංඝරත්නයෙන් අවසරයි.

බෙහෙත් පූජාවට සම්බන්ධ වෙච්ච සියලු දායක පිරිසේ ඇත්තන්ගෙනුත්, අනිකුත් සියලුම ඇපකාර, උපකාර ඇත්තන්ගෙනුත් දේශනාව කරන වේලාව තුළ ධර්ම ගෞරවය පිහිටුවා ගෙන මේ දෙසට කණ හිත නතුකරගෙන අසත්වා, යන ආරාධනයෙන් මේ පින්වතුන්ට ධර්මයෙන් අනුශාසනාවක් කිරීමටයි මේ ආරම්භ කරන්නෙ.

දැනට විනාඩි කීපයක්, අප මේ ශාලාවට රැස් වූ තැන් පටන් සෑම කෙනෙකුගේ ම අවධානයට යොමුවුන මේ වටිනා අවස්ථාවේ දානය කියන දෙය බොහොම ප්‍රකටව, බොහෝම ශ්‍රද්ධාවට ප්‍රඥාවට ගැලපෙන ආකාරයට දැන් ගිහි පැවිදි දෙපාර්ශවයෙන්ම ඉදිරිපත් වෙන්ට යෙදුන. මේ දානයක් විශේෂයෙන් ඖෂධ පූජාවක් වශයෙන් ඖෂධ දානයක් වශයෙන් මේ දානය චාරිත්‍රානුකූල දානයක් වීමෙන් සීලයක් බවටත් පත්වෙච්ච හැටි, සියලු දෙනාගේම ශ්‍රද්ධාව, උනන්දුව වැඩි කරමින් මේ වෙනකම් කාට කාටත් අහන්ට ලැබුන. ඒක අපට අප වගේ ජීවිත වලදී බොහොම කලාතුරකින් සම්බන්ධ වෙන්ට පුළුවන් වෙන දැකගන්ට පුළුවන් වෙන, අපට සාක්ෂි වෙන්ට පුළුවන් වෙන වටින පූජාවක්. ඉතින් ඒ වගේ ඖෂධ සම්බන්ධයි, දානයත් සම්බන්ධයි. විශාල පිරිසකුත් සම්බන්ධයි. සන්තෝෂයෙනුත් කටයුතු සිද්ධවෙන වෙලාවේදි මේ වගේ පිරිසකට මේ වගේ ස්ථානයකට ගැලපෙන බොහෝ දෙනා දන්නා හඳුනන ජීවක වෙද මහත්තයා හෙවත් ජීවක කෝමාරභච්ච කියන පාලි නමින් හඳුන්වන ජීවක උපාසක මහත්තයා ගැන කතා පුවතක් මේ සභාවට ඉදිරිපත් කරන්ට හොඳයි කියල මූලස්ථානයෙ වැඩ සිටින ලොකු ස්වාමීන් වහන්සෙගෙන් අපට අවසර ලැබුණා.

ඒ අනුව දීර්ඝ වශයෙන් ඉදිරිපත් වන මේ ධර්ම මාතෘකාවට සම්බන්ධ වෙන්නේ ජීවක කෝමාරභච්ච හෙවත් ජීවක වෙද මහත්තයා. මේ බුදුහාමුදුරුවන්ගෙ වෙද මහත්තය, රාජකීය වෙද මහත්තය එදා රජගහනුවර තමන් විසින් ම පූජා කරපු ජීවක අම්බ වනයෙ තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සෙ වැඩ ඉන්නකොට එතෙන්ට එළඹිලා අහපු ප්‍රශ්නත්, ඒවට බුදුපියාණන් වහන්සෙගෙන් ලැබිච්ච උත්තරත් ගැනයි දේශනය.

මේ ජීවක වෙද මහත්තයව බොහෝ දෙනා හඳුනන්නෙ බුදු වෛද්‍යවරයෙක්, රාජකීය වෛද්‍යවරයෙක්, සංඝ වෛද්‍යවරයෙක් හැටියට. ශාසනය පැත්තෙන් පොත් පත් බලනවිට පෙනෙන්නේ බුදු රජාණන් වහන්සේ දීපු විශේෂ නම්බු නාමය තමයි, 'පුග්ගලප්පසන්නානං' මහජනතාවගේ ප්‍රසාදය දිනා ගත්තා වූ පුද්ගලයන් අතර ප්‍රථම ස්ථානය. මේ බණ අහන බොහෝ දෙනා අහල නැතිව ඇති ඒ තරම්ම එදා බුද්ධ ශාසනයේ ගිහි පැවිදි දෙ පිරිස අතර ජීවක වෙද මහත්තයා බොහෝ දෙනාගේ ප්‍රසාදයට පත්වුනා කියන එක.

අඞ්ගුත්තර නිකායේ, ඒකක නිපාතයේ එතදග්ගපාළියේ සඳහන් වෙනවා,

"එතදග්ගං භික්ඛවෙ මම සාවකානං උපාසකානං පුග්ගලප්පසන්නානං යදිදං ජීවකො කොමාරභච්චො"

කියල. අද කාලයේ විශ්ව විද්‍යාලවල උපාධි ප්‍රදානොත්සව පවත්වන්නේ. අන්න ඒ වගේ සිව් වණක් පිරිස රැස්වුන වෙලාවෙදි බුදුරජාණන් වහන්සේ මේ ජීවක වෙද මහත්තයට, බොහෝ පුද්ගලයන් අතර ප්‍රසාදයට පත්වුන අයගෙන් අග්‍රස්ථානයේ කියල ප්‍රශංසා කරන්ට යෙදුන.

ඉතින් මේ බණ අහන පිරිස බොහෝ දෙනා වෛද්‍ය වෘත්තියට නැත්නම් බෙහෙත්වලට සම්බන්ධ අය. ඒ පිරිස දන්නව අද කාලෙ පවතින විදියට නම් සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු කියා සමාජය කොටස් පහකට බෙදෙන කොට කොහොමටත් මේ වගේ සමිතියක, සම්භාවනීය සමාජයක සංඝයා වහන්සේලාට, පූජ්‍ය පූජක පක්ෂයට ප්‍රධාන තැන දෙනවා. ඊළඟට ගෘහස්ථ වශයෙන් හඳුන්වන අඹුදරුවන් රකින ගෙවල් දොරවල් බලාගන්න පිරිස අතර ප්‍රධාන තැනක් ගන්නෙ මේ වෛද්‍ය පිරිස. බුදු රජාණන් වහන්සේට වෙදකම් කරපු අඹ වනයක් පූජා කරපු විවිධ විදියට සංඝයාට උදව් කරපු මේ ජීවක කෝමාරභච්ච කියන වෙද මහත්තයා බොහෝ දෙනාට ප්‍රිය මනාප පුද්ගලයෙකු වුනා කියන එක බොහොම ලෙහෙසියි තේරුම් ගන්න. අපි දන්නව අපේ සමාජයේ සංඝයා වහන්සේ කෙනෙකු නැති විට ගුරුපදේශයක් ගන්න සංස්කෘත ශ්ලෝකයක් හම්බවුනාම අපට ඒක තේරුම් කරගන්න අර්ථයක් දැනගන්න බෙහෙත් ඖෂධයක් අහන්න ඉන්නේ වෙද මහත්තයා.

ජීවක කෝමාරභච්ච වෙද මහත්තයට බුදුහාමුදුරුවො පුද්ගලයන් අතර "ප්‍රසන්න භාවයට පත්" කියන නම්බු නාමය දුන්නා කියන කොට අපට අද නම් බොහොම ලෙහෙසියි තේරුම් ගන්න. නමුත් එහෙම ලෙහසි බවක් පහසු බවක් එදා බුදුරජාණන් වහන්සේ වැඩ සිටි කාලයෙ තිබුණෙ නැහැ. එදා ආයුර්වේදය පිළිබඳව තිබුණු තත්ත්වය ඉතිහාසයට අනුව කල්පනාකර බලනවිට බුදු පියාණන් වහන්සේ වැනි සියල්ල දන්නා වූ ශාස්තෘවරයෙකුට හැර වෙනත් කිසිම කෙනෙකුට වෙද මහත්තයෙකුට ඒ වගේ නම්බු නාමයක් දිය හැකි තත්ත්වයක් දඹදිව් තලයෙ එදා තිබුනේ නැහැ.

බුදු පියාණන් වහන්සේ මේ ලෝකයට පහළ වෙලා ඒ අනාත්ම භාවය, දුක්ඛ භාවය, අනිත්‍යභාවය දේශනා කළා. බුදු පියාණන් වහන්සේ හැර එක එල්ලේ කොඩියක් දැම්මා වාගේ අභීතව මේ කරුණු දේශනා කරපු වෙන කිසිම ශාස්තෘවරයෙකු බිහිවුණේ නැහැ. දඹදිව ආගම ධර්ම වැඩිම හරියක් තිබුණේ ආත්ම වාදය පදනම් කරගෙන. තිබුණ තාක් ආගම ධර්ම වැටුනේ ශාස්වත වාදයට. එක්කෝ එය ප්‍රතික්ෂේප කරන උච්ඡේද වාදයට බාහිර ලෝකයත් එක්ක බලනවිට ඉන්දියාවේ මේ බ්‍රාහ්මණ මත අනුව, ආත්මයක් පවතිනවය, ආත්මය බ්‍රහ්මයා විසින් මවන ලද්දක්ය, මේ ලෝකයත් බ්‍රහ්මයාගේ නිර්මාණයක්ය ආදී වශයෙන් නිර්මාණ වාදය තුළ එදා ජය කෙහෙළි නංවමින් තිබුනේ ආත්ම වාදය තමයි. බුදුරජාණන් වහන්සේ උපදිනවිටත් ඉහළින් පැවතුනේ ඒ නක්ෂත්‍ර ශාස්ත්‍ර ක්‍රම ආදියයි. එදා බෝ මැඩදී

බුදුපියාණන් වහන්සේ කියා සිටියා, අනාත්ම වාදය සත්‍ය දෙයක්ය යනුවෙන්. බුදු හාමුදුරුවො ඉදිරිපත් කරපු මතය නිසා ඇති වූ මහා ආගමික විප්ලවයෙදි වෛද්‍ය ශාස්ත්‍රයට සිදුවුනේ විශාල පෙරළියක්.

ආයුර්වේදය ගැන සඳහන් වෙන්නේ එය ජීවිතයේ ආයුෂය දික්කිරීමේ උපදෙස් සලසන ශාස්ත්‍රයක් හැටියට. ඉහත පුරාණ කාලයේ හිටපු ඒ ප්‍රධාන ඍෂිවරු මේ වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ තුන් කාලය දැනගෙන ලියාපු ඒ ශ්ලෝකවල ජීවිතය පිළිබඳ විශාල රහස් සැඟවී තියෙනවා. නමුත් ඒ කාලයේ ඒ කරුණු කාරණා තේරුම් අරගෙන ප්‍රකාශ කරපු අයට ආත්ම වාදය කරපින්නාගත් බමුණන්ගෙන් ලැබුණේ ඉතාමත් නින්දිත නිර්දය ප්‍රහාරයක්. ඒ මොකද කාරණාව බ්‍රහ්මණ ආගමේ හැටියට මේ ලෝකය කියල කියන්නෙ බ්‍රහ්ම නිර්මාණයක්. මනුෂ්‍යයා යනු බ්‍රහ්ම නිර්මාණයක්. සත්වයෝ කියන්නේ බ්‍රහ්ම නිර්මාණයක්. ගස්වැල් කියන්නේ, ගින්න කියන්නේ, ජලය කියන්නේ බ්‍රහ්ම නිර්මාණයක්. බ්‍රහ්ම නිර්මාණයට අනුව ඇති වුනා වූ සත්ත්වයින්ට ලෙඩක්, රෝගයක්, අමලියක්, කරදරයක් ඇතිවෙනව නම් ඒක බ්‍රහ්මයාගේ කැමැත්ත. අද කාලයේ වෛද්‍ය ශාස්ත්‍රය කියනවා සත්ත්වයාට, මනුෂ්‍යයාට ස්වභාවික ලෙඩ රෝග, අතුරු ආන්තරා ඇතිවෙන බව. කායික රෝග, මානසික රෝග වශයෙන් කොටස්වලට බෙදන මේ රෝගයන්ට ප්‍රතිකාරත් ඇති බව.නමුත් එදා බමුණෝ ඒකාධිකාරයක් ඇතිකර ගෙන හිටියෙ මේක බ්‍රහ්මයාගේ තැන, මේක දෙවියන්ගෙ තැන. යම්කිසි කෙනෙක් කියනවා නම් කිසියම් ස්වභාවික ලෙඩරෝග, අතුරු ආන්තරා සඳහා ප්‍රතිකර්මයක් තියෙනවයි කියල ඒක බ්‍රහ්මයාට විරුද්ධව යාමක්. ඒ වෙලාවට කරන්ට තියෙන්නේ එක්කො යාගයක්, හෝමයක් නැත්නම් ස්තෝත්‍ර කීමක්. ඒකට බමුණො ළඟට යා යුතුයි.

යම් කිසි කෙනෙකුට කායික රෝගයක් හැදුනොත් ඉන්ද්‍රිය ධර්මයන් දුර්වලවෙලා, ආහාර පෝෂණය මදි වෙලා-ඒකට ප්‍රතිකාර කරන්න පුළුවන් කියා අත්දුටු කෙනෙක් කීවත් ඒක සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප වෙනවා. බමුණු මතයට, ශාස්වත වාදයට විරුද්ධව යාමක් වුනා. යම් කෙනෙක් කීව නම් ස්වාභාවිකව ඇතිවන කායික රෝගවලට ප්‍රතිකර්ම කරන්න පුළුවන් බව. ඖෂධ සංයෝග යෙදිය හැකි බව, ඒක බමුණු මතවලට විශාල අභියෝගයක් වුනා. ඊර්ෂ්‍යාව, ක්‍රෝධය ආදිය දැඩිව ගැනීම නිසා හිත වෙහෙසට පත්වෙලා ඇති වූ මානසික රෝගයක් ප්‍රතිකර්ම ක්‍රම වලින් මානසික චිකිත්සාවකින් සුව කරන්න පුළුවන් කියල යම් කෙනෙක් කියනව නම් ඒක බමුණන්ට විරුද්ධව යාමක් වුණා. කායික රෝග, මානසික රෝග ඇති වුනේ කර්මය නිසා හෝ ලෝක පාලක සර්ව බලධාරී දෙවියන්ගේ කැමැත්ත නිසා හෝ බැවින් යම්ම කිසි කෙනෙක් දෙවියන්ට උඩින් ගිහිල්ලා තමන්ට පෙනෙන කණට ඇහෙන දේවලින් දැකල අහල ඖෂධ වලින් සුවකරන්ට පුළුවන්ය කියනවා නම් ඒක දෙවියන්ගෙ උත්තරීතර භාවයට විරුද්ධව යාමක්. ඒ නිසා එබඳු අය මේ සමාජයේ තියන්ට හොඳ නෑ කියන අදහස ඔවුන් දැරුවා.

උත්පත්ති රෝග, මරණ රෝග, බඩගිනි රෝග ආදී දෙයක් මතුවුනා නම්, ඒකට වෛද්‍ය ප්‍රතිකර්ම නොවෙයි කළ යුත්තෙ. ඒකට කළ යුතු එකම දේ යාග කර්ම, බලි කර්ම හෝම ආදියයි. ඒ සියල්ලටම බමුණන්ට පඬුරු පාක්කුඩම් දෙන්ට ඕන. එහෙම නැතිව වෛද්‍ය කර්ම කරන්ට ගියානම් ඒ වෛද්‍යවරුන්ට බමුණු කැල නිර්දය ලෙස පහර දුන්නා. බමුණන් කිසිම දවසක මෙබඳු වෛද්‍ය කර්ම කරන අයගෙන් ලැබුණු පිණ්ඩපාතයක් භාරගන්න කැමති වුනේ නැහැ. එසේ සම්මත කරගෙන තිබුණු අතර සමහර පොත්පත්වල පවා එසේ සඳහන්වන බව කියනවා. එබඳු වෛද්‍යවරයෙකුගෙන්, ශල්‍ය වෛද්‍යවරයෙකුගෙන් නොදැන හෝ ආහාරයක් ගත්තොත් තුන් දවසක් නිරාහාරව එයට දඬුවම් ලැබිය යුතුයයි සඳහන් වෙයි. එබඳු අය දෙන

ආහාර සැරව සේ සලකන්ටය. ලේ සේ සලකන්ටය. නීච කරන්ටය කියා සඳහන් වෙනවා. එපමණක් නොව වෛද්‍යකර්ම කරන්නන් මිනීමරුවන් සේ නීච කරන්ටය, පරම්පරාව ම නීචයන් වසලයන් වෛශ්‍යා ස්ත්‍රීන් සේ සලකන්ටය කියා, මේ අන්දමට බමුණු මතය වෛද්‍ය වරුන්ට විරුද්ධව උග්‍රව පැවති කාලයක්. වෛද්‍ය ශාස්ත්‍රය පරම්පරාවට ගෙන ගියා නම්, ඒ පරම්පරාව ම, ඒ කුලය ම එසේ පහත් කොට සැලකුවා. වෛද්‍ය ශාස්ත්‍රය උගන්වපු තක්සලාව සම්පූර්ණ කෙලසිච්ච භූමියක් ලෙස බමුණන්ගේ පොත්පත්වල පවා සඳහන් වෙනවා. මේ නිසා වෛද්‍යවරයෙකුට ආත්ම ගරුත්වයක් ඇතිව නම්බුකාර ලෙස පිරිසිදු ජීවිතයක් ගත කරමින් කටයුතු කරන්ට එදා දඹදිව පුළුවන්කම තිබුණෙ නැහැ.

මෙවැනි යුගයකයි බුදු පියාණන් වහන්සේ චතුරාර්ය සත්‍යය අවබෝධය කළේ. මෙයයි දුක්ඛ සත්‍යය, එයට හේතුවන ධර්මය සමුදය සත්‍යය නම්, මේ, දුක නැති බව නම් වූ නිරෝධ සත්‍යය නම් මේය, අනුගමනය කළ යුතු මාර්ග සත්‍යය නම් මේය කියා සම්මා සම්බුදු රජාණන් වහන්සේ එදා බෝ මැඩ මුලදී ස්වයම්භූ ඥානයෙන් සාක්සාත් කර ගෙන ලොවට හෙළිකරනවාත් එක්ක බමුණු මත දෙදරා යන්ට පටන් ගත්තා.

වෙදකම හිතේ රෝග, කයේ රෝග දෙකටම මුල, නිධානය හොයල එම මුලට (රෝග නිධානයට) වෙදකම් කිරීමේ තාත්වික ක්‍රමයක්. මේ වෛද්‍යවරු සතුරෝය. වසලයෝය. කෙලසිච්ච පිරිසක්ය. යාගයකට සම්බන්ධ කරගන්ට බැරි පිරිසක් ය යන මත දෙදරා යාමට බුදු දහම හේතු වුනා.

බුදු පියාණන් වහන්සේ කොතරම් ප්‍රායෝගික ධර්මයක් දේශනා කළාද කියනව නම්, පොළොවෙහි ජීවත් වන සත්වයාට ඇතිවන අතුරු අන්තරා පිළිගත්තා. එයට ප්‍රතිකර්ම කළ යුතුයයි පිළිගත්තා. මානසික රෝග පිළිගත්තා. එයට වෛද්‍ය ක්‍රම, චිකිත්සක ක්‍රම පිළි ගත්තා. ස්වාභාවික රෝගවන උත්පත්ති, මරණ, බඩගින්න, පිපාසාව ආදී රෝග නිට්ටාවට ඒකාන්තයෙන්ම සුවපත් කරන, නිරෝධය සලසන දෙලොව සනසන බෙහෙතක් සොයා ගත්තා. බුදුරජාණන් වහන්සේගෙන් බලවතුන් විසින් නිග්‍රහ කරපු වෛද්‍ය ශාස්ත්‍රයට ලැබුනේ මහත් පිටුවහලක්. අමුතුම පනක්. මෙතෙක් මුල් බැහැගන්ට බැරිව තිබුණු ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේවටිනා සන්ධිස්ථානයක් ඇතිවුනා. වෛද්‍ය ශාස්ත්‍රයට ඉතාමත් උසස් සේවයක් කර නමක් ඇති කරගත් ජීවක වෛද්‍ය වරයාගේ උත්පත්තිය, රජවරුන්ට, සිටුවරුන්ට, සංඝයාට කරපු පුදුමාකාර වෙදකම් ගැන, බෙහෙත් හේත් ගැන ත්‍රිපිටකයේ සඳහන් වන තරම් සවිස්තර දේශනාවක් කිසිම පතපොතක සඳහන් වන්නේ නැහැ. ඒ නිසා ආයුර්වේද වෛද්‍ය විද්‍යාව ඒකාන්තයෙන්ම බුද්ධාගමේ පිටුවහලෙන් දියුණු වූ දෙයක් බව ඒ ගැන සොයන සෑම කෙනෙකු ම නතු භාවයෙන් ගරු භාවයෙන් පිළිගත යුතුයි. ඒ නිසා අද පවා වෛද්‍යවරුන් සංඝයා වහන්සේ කෙනෙකුට වෙදකම්කර මුදල් බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ මොකද ඒ සංඝයා, ඒ ධර්මය, බුදුපියාණන් වහන්සේ පහළ නොවුනා නම් වෛද්‍යවරයෙකුට පාරෙ බැහැල යන්න බැරි තත්වයක් උදාවෙලයි තිබුනෙ. ඒ අනුව බුදු දහමත්, ආයුර්වේද වෙදකමත් අතර ඇත්තේ ඉතාමත් සමීප සම්බන්ධතාවයක්. එයින් හිතාගන්න නරකයි මේ වෛද්‍ය ක්‍රමය කියන එක ඉහළින් තියන්න බුදුපියාණන් වහන්සේ පහල වුනයි කියලා. බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ සඳහන් වෙන්නෙ මේ කය විභූෂණ පාල, ලස්සනට, ඔදවත්ව, තෙදවත්ව පවත්වන පරමාර්ථය නොවෙයි. ප්‍රායෝගික ප්‍රයෝජනය සලකා කායානුපස්සනා, වේදනානුපස්සනා වශයෙන් වැඩගන්ට නම්, භාවනාවක යොදවන්ට නම් මේ කය යම් ප්‍රමාණයකට සෞඛ්‍ය සම්පන්න වෙන්ට ඕන. සමබරව පවත්වාගන්ට ඕන. ඒ නිසා බුදුපියාණන් වහන්සෙ ඒකාන්තයෙන්ම වෛද්‍ය ශාස්ත්‍රයෙන් ගන්ට ඕන උදව් පුළුවන් තරම් ගත්ත. බුදු පියාණන්

වහන්සේ මේ ලෝකයට පහළ වුනේ වෛද්‍ය ශාස්ත්‍රය දියුණු කරන්ට නොවුනත් බුද්ධ ධර්මය නිසා වෛද්‍ය ශාස්ත්‍රය ලොකු පිටුවහලකට පත්වුනා. මෙතෙක් මුල් බැසගන්ට විදියක් නැතිව ඒ පැත්තට මේ පැත්තට වැනෙමින් තිබුණු වෛද්‍ය ශාස්ත්‍රයට නව පණක් ලැබුණා.

බුදු පියාණන් වහන්සේට කලින් ලෝකයේ පහළවුන සුශ්‍රැත, වාග්භට, ධන්වන්තරී ආදී මහා පඬිවරු කය පිළිබඳ බමුණු මත බිඳ ලෝක මතයක් ඇති කරලා තියෙනවා. ශල්‍ය ක්‍රම ආදිය මතුකරල තියෙනවා. නමුත් ස්වාභාවික රෝගයන් වන උත්පත්ති, මරණ, සාපිපාසා ආදිය පිළිබඳ නිෂ්ඨා සුවයක් කල්පනා කළේ නැහැ. ඉන්ද්‍රිය දමනය, ආධ්‍යාත්මික සංවර්ධනය ගැන වැඩි විස්තර තිබුනෙ නැහැ. බුදු පියාණන් වහන්සේ අන්න ඒ කොටසත් සම්පූර්ණ කළා. ඒ සන්ධිස්ථානයේදී තමයි මේ ජීවකකෝමාරභච්ච කියන බුදු වෙදමහත්තයගෙ, උපාසක මහත්තයගෙ වෙදරාළගෙ, රාජකීය වෛද්‍යවරයාගෙ නම සඳහන් වන්නෙ. මේ ප්‍රධාන වෛද්‍යවරයාට බුදුරජාණන් වහන්සෙ නම්බු නාමයක් ලෙස දුන්නෙ 'පුද්ගල පසන්නානං හෙවත් ප්‍රසාදයට පත් වුනාවූ පුද්ගලයන් අතර අග්‍රයි, ශ්‍රේෂ්ඨයි කියල.

එදා පදුමුත්තර බුදුරජාණන් වහන්සෙගෙ කාලයේදී මීට කල්ප දස දහසකට ඉහත ඒ බුදුරජාණන් වහන්සේගෙ ශාසනයේ ඒතදග්ග පාළියෙ ගිහියෙක් 'පුද්ගල පසන්නානං' යන නම්බු නාමය ලබන දවසෙ පිරිස අතර සිටි තරුණයෙකු වූ මොහු ඒ පිරිස ඉදිරියේ තීන්දු කරගත්තා තමාට ද කවදාහරි සම්බුද්ධ ශාසනයක 'පුද්ගල පසන්නානං අග්ගො' යන නම්බු නාමය ලැබේවා කියල අධිෂ්ඨාන කළා. එසේ අධිෂ්ඨාන කරගෙන කල්ප සිය දහස් ගණනක් ගත කරනවිට මේ වෙදකම තමයි තෝරා ගත්තෙ. ඒ මොකද මේ වෙදකම තුලින් ඉතාමත් ලෙහෙසියි පුද්ගල ප්‍රසන්න භාවය ලබා ගැනීම. ඒ මොකද? මනුෂ්‍යයො කවුරුත් ලෙඩ්ඩු නිසා මේ පිළිබඳව උපහාසයට වගේ ශ්ලෝක භාෂාවෙන් කියා ඇති දේ තේරෙන භාෂාවෙන් කියනව නම්, ලෙඩ වෙච්ච කෙනෙකුට වෛද්‍යවරයා පෙනෙන්නෙ දෙවියෙක් වගේ. සනීප වේගන එනකොට වෛද්‍යවරයා යාළුවෙක් වගෙයි පේන්නෙ. ලෙඩේ සනීප වුනාට පස්සෙ පෙනෙන්නෙ ණය කාරයක් වගේ. හුඟ දෙනෙක් ලෙඩ්ඩු නිසා අන්න අර කියපු දේවත්වයෙන් සැලකීම සමාජයේ තියෙනව. නමුත් බ්‍රාහ්මණ ආගමේ කිව්වෙ මේ වගේ අහැට පෙනෙන වෛද්‍ය කෙනෙකුගෙන් කිසිම දාක ලෙඩ සනීප කරගන්න බෑ කියල. ඔවුන් කීවේ ලෝක නිර්මාණ වාදය අනුව දෙවියන්ට පමණයි, එය කළ හැක්කේ කියා. ඒ නිසා ශ්ලෝක බඳින අය උපහාසයට වගේ කියනවා.

"අහො නිර්මාණ කෞශල්‍යඃ
යේන විශ්වං විනිර්මිතං
ජගතිස්මීං සුවිපුලෙ
ස්වස්තෝ නෛකොහි ලභ්‍යතෙ"

මේ විශාල ලෝකය දෙවියන් විසින් නිර්මාණය කළයි කීම හරිම හාස්‍ය ජනකයි. මෙච්චර සත්තු මනුෂ්‍යයන් අතර එකම ස්වස්ථ කෙනෙක් නැහැ. මේ මවපු දෙවියො ලෙඩෙක් වෙන්ට ඕනෑ. දෙවියන්ගේ මේ නිර්මාණය ගැන වෛද්‍යවරු හිනාවෙන්ට පටන් ගත්තා. දෙවියො මැව්වා නම්, ලෝකය නිර්මාණය කළා නම් ඒ දෙවියො අංග සම්පූර්ණ කෙනෙක් නම් මේ මහ සෙනඟ මැද එකම එක මනුෂ්‍යයෙකුවත්, ලෙඩ නැතුව මවන්ට තිබුණා. එහෙම එකම එක කෙනෙකුවත් නැහැ.

ඒ නිසා මේ ලෝකය තුළ වෛද්‍යවරයෙකුට කරන්ට තියෙන සේවාව අනන්තයි. අප්‍රමාණයි. එවැනි කෙනෙක් පුද්ගල ප්‍රසන්න භාවයට පත්වෙනවා කියන එක අහන්ට දෙයක් නෑ.

දවසක් මෙහාට දොස්තර මහත්තයෙක් ඇවිල්ල සංඝයා වහන්සේට ප්‍රතිකාර නියම කරන වෙලාවෙදි, මට යන්ට සිද්ධ වුණා. දහයෙ කුටියෙ-අපවත් වෙච්ච නායක හාමුදුරුවො වැඩසිටි සක්මන හරහා පුස්තකාලට. නායක හාමුදුරුවො සක්මනෙන් ඇත් මැත් වෙනකම් ඉඳලා පුස්තකාලයට ගිහින් ආපහු එනවිට නායක හාමුදුරුවො මුණ ගැහුනා. "අවසරයි, ස්වාමීනි, ධර්ම කාරණාවකට මට පොතක් සොයා ගන්ට ඕනවුනා. ඒ නිසා පුස්තකාලයට ගියා කීවාම," "අද දොස්තර මහත්තය ඇවිල්ල නේද", "එහෙමයි, ස්වාමීන් වහන්ස" "සංඝයා වැඩලා දොස්තර මහත්තයගෙන් ප්‍රතිකර්ම ගන්නවද"

"එහෙමයි ස්වාමීනි"

"ඇයි ඔය නම බෙහෙත් ගන්නෙ නැද්ද"

ඒ වෙලාවෙ තිබුන කර්ම ශක්තිය අනුව මම කීව, "ස්වාමීනි, මට ලෙඩක් නැහැ" කියල.

එතකොට නායක හාමුදුරුවො ඉතාමත් උපහාසාත්මක සිනාවක් පහල කරල ඒක වැඩිය පෙන්නන්නෙ නැතිව "හා හොඳයි හොඳයි" කීව.

මට මහ සැකයක් ඇතිවුනා. උන්වහන්සෙ මට 'හා' කීවෙත් නැහැ. 'නැහැ' කීවෙත් නැහැ. නමුත් උපහාසාත්මක සිනාවක් පහල කරල 'හොඳයි' කීව. පොත් කියවන විට පසුව මට හමුවුනා බුදු පියාණන් වහන්සෙගෙ සූත්‍රයක්. යම්ම කෙනෙක් කියනවා නම් මට ලෙඩක් නැහැ කියල, එක්කෝ එයා පිස්සෙක්, උන්මන්තකයෙක් නැත්නම් ලෙඩෙක්. ඉන්න තාක් මේ ලෝකෙ ඉන්නෙ ලෙඩ්ඩු. නමුත් ලොකු ස්වාමීන් වහන්සේ මට ඒක ඇඟෙව්වෙ නැහැ. හිනාවෙලා පෙන්නුවා එහෙම කෙනෙකුට කියන්න බෑ කියලා.

ලෙඩ්ඩුන්ගෙන් පිරිච්ච මේ ලෝකයේ මේ ජීවක වෛද්‍යවරයා වගේ වෛද්‍යවරයෙක් ඉදිරිපත් වෙලා මුළු සිතින් ම මේ ලෝක ජනතාවට සේවය කරන්ට පටන් ගත්තොත් මුදලට නොවෙයි. හෙට්ටු කරල නොවෙයි. අන්න එවැනි කෙනෙකුගේ සේවය නිසා පුද්ගල ප්‍රසන්න භාවය ඇතිවෙනවයි කියන එක බොහෝම ලෙහෙසියි තේරුම් ගන්න. නමුත් එදා පැවතිච්ච ආගම් මතවාද අනුව මේ ජීවක වෛද්‍යවරයාට එදා බුදුරජාණන් වහන්සේ උර නොදුන්නා නම්, උදව් උපකාර නොකලා නම් මේ ජීවක කියන නම ඉතිහාසයට එකතු වෙන්නෙ නැහැ. ඒ බෙහෙත් හේත්වල නම් ගම් පවා අද අපට අහන්ට ලැබෙන්නෙ නැහැ. බුද්ධාගමෙන් මේ චරිතයට, වෛද්‍ය ශාස්ත්‍රයට විශාල පිටුවහලක් ලැබුණා. මේ ජීවක කෝමාරභච්ච වෛද්‍යවරයා නිසා බුදු පියාණන් වහන්සේ ප්‍රධාන සංඝයාටත් රජවරුන්ට, සිටුවරුන්ට ආදී හැමටත් විශාල සේවයක් වුනා.

නමුත් ජීවක වෙදතුමා කටයුතු කළේ වෙද කෙනෙක් වශයෙන් පමණක් නොවේ. ඊට එහාට ඇතට ගිය කෙනෙක් වශයෙන්. දවසක් මේ ජීවක වෙදතුමා ජීවක අඹ වනයේදී බුදු පියාණන් වහන්සේට වැඳ නමස්කාර කරලා අපි මාතෘකා කරපු සූත්‍රයේ එන පරිදි 1 ප්‍රශ්නය අහනවා.

"කිත්තාවතා නු ඛො භනෙත උපාසකො හොතීති" 'අවසරයි බුදු පියාණන් වහන්ස, මේ ලෝකයේ යම් ගිහි කෙනෙකු උපාසක කියන නමට ගැලපෙන්නේ කොහොමද?

අපට වුනත් හිතෙනවා උපාසක කෙනෙක් වෙන්නෙ කොහොමද? උපාසිකාවක් වෙන්ට තියෙන සුදුසුකම් මොනවද? කියන එක. අපට අද ඇතිවන ඒ ප්‍රශ්නයම එදා එතුමාට ඇති වුනා.

යම්ම කිසි කෙනෙක් යම් දිනක පටන් බුදුන් සරණ ගියා නම්, දහම් සරණ ගියා නම්, සඟුන් සරණ ගියා නම්, එදා පටන් උපාසක නමට ගැලපෙනවා කියා බුදුපියාණන් වහන්සේ සඳහන් කළා. මේ පිරිසට හිතාගන්න පුළුවන් අපි උපාසක නමට උපාසිකා නමට ගැලපෙනවද කියා. අදත් මේ පිරිස සාංඝික පූජාවට කලින් සිල් සමාදන් වීමට කලින් ඒ උපාසක භාවයේ පිහිටියා. කොහොමද? නමස්කාරය කියලා ඊළඟට මම බුදුන් සරණ යමි, දහම් සරණ යමි සඟුන් සරණ යමි යනුවෙන් තෙරුවන් සරණ ගිහින්. අපි මේ උපාසක භාවය දවස පුරාම පවත්නවාද? නැත්නම් ලාමක දේවල්වල පිහිට පතනවද කියල නිතර කල්පනා කරනව නම් උපාසක භාවය, උපාසිකාභාවය නිතර අලුත් වෙනවා. එහෙම බුදුන් සරණ යාම ජීවිතය නැති වුනත් අත් හරින්නේ නැත කියා රකින බවට පත්වෙනවා නම් ඒ උපාසක, උපාසිකාව පසුව ඊට වඩා ගරු ඊට වඩා සරු පිංකම්වල යෙදෙනව. උපාසක භාවයේ පිහිටනවා.

ජීවක වෙද මහත්තයා බුදු පියාණන් වහන්සේගෙන් උපාසක යන වචනය තේරුම් කරගත්තාට පසු දෙවෙනි ප්‍රශ්නය අහනවා.

"කිත්තාවතා පන භනෙත,
උපාසකො සීලවා හෝතීති"

'යම්කිසි උපාසක කෙනෙක්, උපාසිකාවක් සිල්වත්ය කියා කියන්ට නම් තියෙන්ට ඕන සුදුසුකම් මොනවාද?

තමන් පවරා ගත්තා වූ මේ සංවර ධර්මවල පිහිටනවා නම් එහෙම කෙනෙකුට කියන්ට පුළුවන් මම සීලවන්තයි කියා. සීලව කියන නමට ගැලපෙනවා. ඒ නිසා උපාසක භාවය ලබාගන්න ඒ අපි වෙනුවෙන් මේ දෙවෙනි ප්‍රශ්නය අහන්නෙ. උපාසක භාවයේ නතර වුනාම මේ ශාසනයෙන් ගන්ට පුළුවන් උපරිම ප්‍රයෝජන ලබාගන්ට බැහැ. ප්‍රණීත රසය ලබාගන්ට බෑ. ඒ මතුමත්තේ ඇති ඊට වඩා සරු ඊට වඩා ගරු අධි කුසල සම්පත්තියක පිහිටන්න ඕන. ඒ අධි කුසලය තමයි සීල සාමාදානය.

බුද්ධ රත්නය, ධම්ම රත්නය, සංඝ රත්නය කියන රත්නත්‍රය සරණ ගිහින්ල ඒ මතු මත්තේ පිහිටලා මේ මගේ ජීවිතයේ කවදාකවත් පණ ඇති සතෙකු මරන්නෙ නෑ. පර පණ නසන්නේ නැහැ. කවදාකවත් සොරකම් කරන්නෙ, කාමයෙහි වරදවා හැසිරෙන්නෙ, බොරු කියන්නෙ, මත් පැන් බොන්නෙ නැහැ කියල විරමනය කරන්න ඕන. ඒ විරමනය කිරීමෙන් තමයි උපාසක භාවයට ඉහළ සීලවන්ත බවට පත්වෙන්නෙ. සීලවන්ත බවට පත්වුනාම තමන්ගෙ කය වචන අංග දෙක සම්පූර්ණ වෙනව. හික්මෙනව. මහත්ම ගතියකට පත්වෙච්ච මේ මනුෂ්‍ය ලෝකයේ දෙවියන් බවට, පත්වෙනව. පවට ලැජ්ජාව භය ඇති වෙනව.

අප වගේ සිල් සමාදන් වෙච්ච ඇත්තො, උපාසක උපාසිකාවො පර පණ නසන්න හොඳ නෑ. සොරකම් කරන්න හොඳ නැහැ. කාමයෙහි වරදවා හැසිරෙන්න බොරු කියන්න හොඳ නෑ. මත් පැන් බොන්න හොඳ නෑ කියල හික්මෙනව. පවට ලැජ්ජ බය ඇතිවෙනව. එවැනි කෙනෙකුට හිතෙනව නම්, මේ ශාසනයෙ පල නෙලා ගන්ට තමන්ගෙ අර්ථ සිද්ධිය සලසාගන්ට මීට වඩා ඉහළට උපාසක වීම හොඳයි. වඩ වඩා සිල්වත්වීම අවශ්‍යයි. වඩා හොඳ වෙන්ට ඕන. හොඳ වෙලා මදි, හොඳකම පේන්ට තියෙන්ටත් ඕන කියල අපවත් වෙච්ච නායක හාමුදුරුවො කීවෙ. හොඳ වෙලා මදි, ආදර්ශයෙන් හොඳකම පේන්ටත් ඕන කියල මෙක හදපු ධම්ම නිසන්ති හාමුදුරුවො කීවෙ. ඒක ඉතින් බොහොම අමාරු වැඩක්. සිල්වත්වීම අපට අපේ අධිෂ්ඨාන ශක්තියෙන්, කුශල ශක්තියෙන්, පෙර පුණ්‍ය ශක්තියෙන්, පාරමිතා

ශක්තියෙන්, ශ්‍රද්ධාවෙන් සම්පූර්ණ කරගන්ට පුළුවන්. තමන්ගේ අර්ථ සිද්ධිය සම්පූර්ණ කර ගන්නවා කියන්නෙ අත්ථ හිත පිණිස මොනවද කළයුතු කියා සිතා කටයුතු කිරීමයි.

ජීවක වෙද මහත්තයා බුදු රජාණන් වහන්සේගෙන් ඉස්සෙල්ලා අහල දැනගන්නවා, **කොහොමද උපාසකයෙක් වෙන්නෙ** කියල.

**තෙරුවන් සරණ යාමෙන්**

ඊ ළඟට අහල දැනගන්නව **කොහොමද සීලවන්තයෙක් වෙන්නෙ** කියල.

**පංච ශීලයෙන්.**

ඊ ළඟට අහනවා, තමන්ගේ අර්ථ සිද්ධිය සම්පාදනය කරගන්ට මොනවද කරන්ට ඕන කියල.

**"කිත්තාවතා පන භන්තෙ, උපාසකො අත්තහිතාය පටිපන්නො හොති, නො පරහිතායති"**

භාග්‍යවතුන් වහන්ස, කොපමණකින් උපාසක තමහට හිත පිණිස අර්ථ සිද්ධිය පිනිස කටයුතු කරනවාද?

අනුන්ට හිත පිණිස කටයුතු නොම කරයිද?

"අත්තනා සද්ධාසම්පන්නො හොති නො පරං සද්ධාසම්පදාය සමාදපෙති"

තමා වශයෙන් ශ්‍රද්ධාසම්පන්න වෙනවා. නමුත් අනුන් ශ්‍රද්ධා සම්පත්තියෙහි සමාදන් කරවන්නෙ නෑ.

"අත්තනා සීලසම්පන්නො හොති, නො පරං සීලසම්පදාය සමාදපෙති"

තමන් සීල සම්පන්න වෙනවා. නමුත් අනුන් සීල සම්පදාවෙහි සමාදන් නොකරවයි. ඒ වගේම තමන් ත්‍යාග සම්පන්න වෙනවා. දාන දීමාදී කටයුතුවල උනන්දු වෙනවා. නමුත් අනුන් ත්‍යාගසම්පදාවෙහි යොදවන්නේ නෑ. තමන් සංඝයා දකින්න බොහොම කැමති වෙනව. අනුන් භික්ෂු සංඝයා දැක්මෙහි මෙහෙයවන්න උනන්දු නොවෙයි. තමා සංඝයා දැකල බණ අහන්න කැමති වෙනවා. අනුන් බණ අසනු කැමති වීමෙහි සමාදන් නොකරවයි. තමා ඇසූ දහම්හි අර්ථ පිරික්සයි. අනුන් ඇසූ දහම්හි අරුත් පිරික්සීමෙහි උනන්දු නොකරවයි. තමා අරුත් දැන දහම් දැන ධර්මානුධර්ම ප්‍රතිපන්න වෙයි. අනුන් ධර්මානුධර්ම ප්‍රතිපදාවෙහි උත්සාහ කරවන්නෙ නෑ. එහෙම කෙනා තමන්ට තමන් ප්‍රියයි. තමන්ගේ අර්ථ සිද්ධිය සලසාගන්න වැදගත් පුද්ගලයෙක් බවට පත්වෙනවා. මේකට කියනවා අභ්‍යන්තර ශාසනය, තමන්ගෙ පැත්ත සම්පූර්ණ කරගන්නවා කියලා.

අභ්‍යන්තර ශාසනය සම්පූර්ණ කරගත් කෙනෙක් විදියට ජීවක කෝමාරභච්ච ඒ වනවිටත් සන්තෝෂ වෙන්ට පුළුවන් තත්ත්වයක හිටියෙ. බොහොම ශ්‍රද්ධාසම්පන්නයි. බොහෝම සීල සම්පන්නයි. ත්‍යාග සම්පන්නයි. සංඝයා දකින්ට කැමතියි. බණ අහන්ට කැමතියි. බණ හිතේ දරාගන්ට කැමතියි. ධර්මය, අර්ථ, ධර්ම වශයෙන් පිරිසිඳ දකින්ට, ඒ අනුව ජීවත්වන්ට කැමතියි.

නමුත් වෛද්‍යවරයෙකු හැටියට ජීවක දැනගෙන සිටියා, මෙහෙම කෙරුවොත් ශාසනය පවතින්නේ නෑ. තමන් වශයෙන් නම් සීල සමාධි ප්‍රඥා සම්පූර්ණ කරගන්න පුළුවන්. තමන් වශයෙන් බුද්ධ ධම්ම සංඝ රත්නත්‍රය කෙරේ නොසැලෙන ශ්‍රද්ධාවක් ඇති කර ගන්න පුළුවන්. නමුත් ඒකෙන් අනුන්ට සේවයක් වෙන්නෙ නෑ. බුදුරජාණන් වහන්සෙගෙ ධර්මය ඉතාම පැහැදිලියි. අතට ගත්ත නෙල්ලි ගෙඩියක් වගේ.

ජීවක කෝමාරභච්ච දැන් හතරවෙනි ප්‍රශ්නය අහනවා.

**කිත්තාවතා පන භන්තෙ, උපාසකො අත්තහිතාය ච පටිපන්නො හොති පරහිතාය චාති"**

තමන්ගෙ අර්ථ සිද්ධියත් සලසාගෙන අනුන්ගේ අර්ථ සිද්ධියත් සලසාලන්නේ කොහොමද කියල. එතකොට බුදුරජාණන් වහන්සෙ සඳහන් කරනවා.

"යතො ඛො ජීවක, උපාසකො අත්තනාච සද්ධාසම්පන්නො හොති, පරඤ්ච සද්ධාසම්පදාය සමාදපෙති. අත්තනා ච සීලසම්පන්නො හොති පරඤ්ච සීලසම්පදාය සමාදපෙති, අත්තනා ච භික්ඛූනං දස්සනකාමො හොති, පරඤ්ච භික්ඛූනං දස්සනෙ සමාදපෙති. අත්තනා ච සද්ධම්මං සොතුකාමො හොති පරඤ්ච සද්ධම්ම සවණෙ සමාදපෙති. අත්තනා ච සුතානං ධම්මානං ධාරණජාතිකො හොති, පරඤ්ච සද්ධම්ම සවණෙ සමාදපෙති. අත්තනා ච සුතානං ධම්මානං ධාරණ ජාතිකො හොති, පරඤ්ච ධම්මධාරණාය සමාදපෙති, අත්තනා ච ධතානං ධම්මානං අත්‍ථුපපරික්ඛී හොති, පරඤ්ච අත්‍ථුපපරික්ඛාය සමාදපෙති. අත්තනා ච අත්‍ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති, පරඤ්ච ධම්මානුධම්මපටිපත්තියා සමාදපෙති. එත්තාවතා ඛො ජීවක, උපාසකො අත්තහිතාය ච පටිපන්නො හොති, පරහිතාය චාති"

බුදුන් සරණ ගිය, දහම් සරණ ගිය, සඟුන් සරණ ගිය පිරිසක්. මේ බණ අහන පිරිසට මේක සැකයක් නැහැ. සමහර විට අපේ දෙමව්පියො අපි මව් කුසේ ඉන්න කාලෙ පටන් ගැබ් පෙරහැර පවත්වනව. උපදින්ට ඉන්න දරුව පවා බුද්ධ, ධම්ම, සංඝ යන තුණුරුවන් විෂයෙහි පූජා කරනවා. ඉපදුනාට පසුව ළඟම තියෙන පූජනීය ස්ථානයට ගිහින්ල තුණුරුවන්ට දරුව කැප කරනව. බුදු රජුන්ට, ධර්මයට, සංඝයාට පූජා වේවා කියල. පුංචි කාලෙ ඉඳලම දකින දකින සංඝයාට බුද්ධ ප්‍රතිමාවන්ට අත් දෙක එකතු කරල වන්දව වන්දව මේ දරුවා හුරු කරනව. පස්සෙ තේරෙන වයසට එනවිට සතුන් මැරීම ආදියෙන් වළක්වා සීලයෙහි යොදවනවා. දුස්සීල වැඩවලින් ඉවත් කරනව. ඊට පස්සෙ තමන්ගෙ අර්ථ සිද්ධිය පිණිස කළයුතු දේවල් පිළිබඳ කරුණු කාරණා උගන්වනවා. සීලවන්ත වෙන හැටි, උපාසක වෙන හැටි කියා දෙනවා. මේ බණ අහන පිරිස අත්‍ථ හිත පිණිස තමා ශ්‍රද්ධා සම්පන්න වෙන්ට ඕන.

මේ මෑණියෝ මේ බෙහෙත් ලැයිස්තුව කියවනවිට කී පාරක් සඳහන් කළාද මේ කටයුතු මේසා විශාල පිරිසක් එකතුව කරනකොට මේ තරම් විශාල ප්‍රමාණයක් ඖෂධ සකස් කරනකොට, අවුරුදු තිහක් තරම් දීර්ඝ කාලයක් මුළුල්ලේ මේ කටයුතු කරගෙන එනවිට කොයි තරම් ප්‍රශ්න මතු වෙනවද? මොනතරම් දුෂ්කරතා මතුවෙනවද? පුංචි ශ්‍රද්ධාවකින් මේක කරන්ට බැරි බව. පුංචි ශ්‍රද්ධාවකින් මේ දේ කරන්ට පටන් ගත්තා නම් හරියට දුවිලි පාරක කටු අත්තක් ඇදගෙන යනවා වගේ, කරන්ට පුළුවන් කමක් නෑ. එක එක්කෙනා එක එක මත දිගේ දුවනව. එක එක විදියට කටයුතු කරනව. මේ මෑණියො, මේ උපාසක මහත්තය පුදුමාකාර විදියට සංඝයා විෂයෙහි පැතිරිච්ච ශ්‍රද්ධාව. ඒ වගේම ධර්මය විෂයෙහි ඇති ශ්‍රද්ධාව. ඒ වගේම සංඝයා විෂයෙහි ඇති ශ්‍රද්ධාව නිසා සාමාන්‍යයෙන් නිස්සරණ වනයට දන් දෙන්න. බණ අහන්න එන පිරිසකට වඩා මේ පිරිසෙ ඉන්න පුංචි දරුවන්ගෙ පවා විශාල සංයමයක් තියෙනවා. ඒ ශ්‍රද්ධාව නිසා. මෙන්න මේ ශ්‍රද්ධාව මේ තරම් දුරට තමන්ගෙ මේ අධ්‍යාත්මික ජීවිතයට උතුම් වෙනවය, උපකාර වෙනවය, අනුග්‍රහ දක්වනවය කියන එක අපි දැනගන්නට ඕන. 'ශ්‍රද්ධාවෙන් විතරක් මේ දේවල් කරන්ට බෑ. මේ මේ දේවල් ඕන. මේ මේ දේවල් ඕන කියල සමහරු බොහොම ලොකු අතු අල්ලන්න යනව. ලොකු වැඩ කරනවිට අර මූලික ශ්‍රද්ධාව යටපත් වෙනව. එහෙම වුනාම බොහොම ඉක්මනට අදහස් දිරාපත් වෙනව. සමහර තැන්වල වැඩ **මහා සමාරම්භක.** විශාලෙට පටන් ගන්නවා. බොහොම ඉක්මනට ඉවර වෙනවා.

නමුත් මේ වැඩපිළිවෙල දිහා බලනකොට කුඩාවට ආරම්භවෙලා **අප්ප සමාරම්භක** දවසින් දවස පිරිස වැඩිවෙලා එකතුවී සාකච්ඡා කෙරුවා. අපි බෙහෙත් පූජාවක් කෙරුවොත් නරකද? කියලා. දිගින් දිගට යනකොට ඒ මුල් උපාසක ඇත්තන්ගේ ශ්‍රද්ධා මහත්වය, ලැබිච්ච අනුග්‍රහය නිසා මහා සාරණීය පිංකමක් බවට පත්වුනා. දැන් මේ පිරිසෙ ඉන්නෙ පොඩි දරුවෙකුට පවා මහ විශාල ගැම්මක්, ප්‍රසාදයක් පහළ වෙනවා. අපත් මේක කරන්න ඕන කියන සිත පහළ වෙනවා. අපි මේකට කියනවා ශ්‍රද්ධාව කියල. තමන් වශයෙන් පමණක් ඇතිකර ගත්තා නම් මෙසේ ඉදිරියට යන්නෙ නෑ. ශ්‍රද්ධාව ඇති කල්‍යාණ මිත්‍ර පිරිසක් සමිතියක් වශයෙන් එකතු වෙලා අවුරුදු තිහක් නොකඩවා ඉදිරියට ගෙනාව මේ වැඩ පිළිවෙල. ඒ නිසයි පොඩි දරුවන්ට පවා තමන් සම්බන්ධ වෙච්ච මේ වැඩ පිළිවෙළ ඉදිරියට පවත්වාගන යන්ට ශක්තිය, ධෛර්ය ලැබෙන්නෙ. තමන්ට ඇති වෙච්ච ශ්‍රද්ධාව අනුන් සමාදන් කරවන්ට ඕන. අන්න එතකොට තමයි තමන්ගේත් අනුන්ගේත් දෙගොල්ලන්ගේම අර්ථ සිද්ධිය සම්පාදනය වෙන්නෙ. එවිටයි, **අභ්‍යන්තර ශාසනයත් බාහිර ශාසනයත් දෙකම ක්‍රියාවට නැගෙන්නෙ.** සම්පූර්ණ වෙන්නෙ. ඒ සඳහා තමන්ගෙ ශ්‍රද්ධාව පිහිටුවා ගෙන පිටතට පේන විදියට, ආදර්ශයක් වෙන විදියට ක්‍රියාව තියෙන්න ඕන. දන් දෙන්ට ඕන. සිල් රකින්ට ඕන. ශමථ විදර්ශනා භාවනා වඩන්ට ඕන. අන්න එතකොට හැදෙන දරුවන්ට පවා විශාල ශක්තියක් ඇති වෙනව.

තමන් වශයෙන් සීලයක පිහිටි කෙනෙකුට කොතරම් ආනිසංස තියෙනවද? සීලයක පිහිටි කෙනෙකුට කෙටියෙන් සඳහන් කරනවා නම් කවමදාකවත් ලෙඩ ඇඳට වැටුනහම වයස ගිහින්ල දැන් අපි මේ සඳහන් කරපු ඇටඹෙ වෙද මහත්තයා වාගෙ රෝගාතුර වුනහම, මරණ මොහොතට වැටුනහම 'අනේ අපොයි' කියල කවදාකවත් කියන්න වෙන්නෙ නෑ. ඒ මොකක් නිසාද? සීලවන්තයා පුළුවන් හැම වෙලාවකම කය, වචන දෙක සංවර කරගන්නවා. ඒ මොකක් නිසාද?

**බුද්ධං සරණං ගච්ඡාමි**<br>**ධම්මං සරණං ගච්ඡාමි**<br>**සංඝං සරණං ගච්ඡාමි**

කියල සද්ධෙය්‍යා වස්තු මත ඇදහිල්ලෙන්, සතුන් මැරීමෙන් වළකිනව. සොරකම් කිරීමෙන් වළකිනව. ඒ විදියට කායික, වාචසික වශයෙන් ව්‍යතික්කම ධර්මයන්ගෙන් වෙන් වෙනවා. සීලවන්තයාට, අනේ මට පුළුවන් කාලෙ, මුදල් තියෙන කාලෙ, තරුණ කාලෙ අසවල් අසවල් විදියෙ වැරදි අපරාධ කළා, කියල කවදාවත් අත්තානුවාද භයක් ඇතිවන්නෙ නෑ. මුස්ලිම් කෙනෙකු වෙන්ට පුළුවන්. ක්‍රිස්තියානි කෙනෙකු වෙන්ට පුළුවන්. කොයියම් ආගමක වුවත්, ස්ත්‍රී වුවත්, පුරුෂ වුවත් අන්‍යාගමිකයෙකු වුවත් සීලවන්තයෙකු විය හැකියි. කොයියම් කෙනෙකුවත් පහත් කොට සලකන්න හොඳ නෑ. ඒ නිසා **පරානුවාද භයක්** ඇතිවන්නෙත් නෑ සීලවන්තයාට. රටේ දණ්ඩ නීති තියෙන්ට පුළුවන්. සිවිල් නීති තියෙන්ට පුළුවන්. ඒ සොරකම් කරන, කයින් වචනයෙන් වැරදි කරන අයට නම් මේ නීති තදින් බලපාන්ට පුළුවන්. නමුත් සීලවන්තයාට මේ රාජ නීති ආදි කිසිවක් බලපාන්නේ නෑ. බොහොම ශාන්ත ජීවිතයක් ගත කරන්ට පුළුවන්. මා විසින් මේ මේ වැරදි කළාය කියා නැති නිසා මරණයෙන් පසු හෙලකින් පල්ලකට ඇද වැටෙන්නා සේ අපායට වැටෙයි කියන බයක් නෑ. මේ අයුරින් සීලවන්තයාට **අත්තානුවාද භය, පරානුවාද භය, දණ්ඩ භය, දුග්ගති භය** ආදී කිසි බයක් නෑ.

ඒ නිසයි මේ මැණියො සඳහන් කරන්ට යෙදුනෙ මේ වෙලාවෙ ඇටඹේ රාළහාමි මේ පින්කම දෙසට සිත් යොමුකරගෙන ඇති කියල. ඒක පුදුමයක් නොවේ. ඒක ලොකු පිහිටාධාරයක් සිතට. ඒ ගැන අහන අපටත් ලොකු අස්වැසිල්ලක්. මේ සිතුවිල්ල විශාල සැනසුමක්. ඒ සතුට සීලය නිසා. සීලය හරියට කාසියක් වගේ. කාසියක් උඩ දාපුවාම බිම වැටිල පෙරලිල යන්නෙ

නෑ එක පාරට, අර පැතලිබාවය නිසා සිටිනව. රබර් බෝලයක් නම් උඩදාපුවම උඩ පැන පැන පෙරලිලා ගිහින් හෙලක් තියෙනව නම් ඒකට වැටෙනව. සීලය පුදුමාකාර ප්‍රතිෂ්ඨාවක් ලබා දෙනව ඉන්න ඕනම තැනක හැලහැප්පීමක් නැතිව ඉන්නට. තමා වශයෙන් සීලය ආරක්ෂා කිරීම කියන්නෙ අභ්‍යන්තර ශාසනය. මේ වගේ විශාල පිරිසක් බෙහෙත් පූජාවකට හරි පිණ්ඩපාත දානයක් හරි වෙනුවෙන් යොමු කරනවා කියන්නෙ, සීලයක පිහිටුවනවා කියන්නෙ අභ්‍යන්තර බාහිර ශාසන දෙකම ආරක්ෂා කිරීමක්. එහෙම ශාසන වඩන එකනම් බොහෝදෙනාගේ ප්‍රසන්න භාවයට හේතුවනවා කියන එක අහන්ට දෙයක් නෑ.

ත්‍යාග සිත නිසා තමන් වශයෙන් දානය දෙනව. අනුන් වශයෙන් දානය දීමෙහි යොදවනවා. තමන් වශයෙන් දෙන එක ලෝභයට සම්බන්ධයි. දානය දෙන්ට දෙන්ට ලෝභය නැති වෙනව. තමන්ට ලැබෙන අනන්ත අප්‍රමාණ පින, ප්‍රසාදය මහා සන්තෝෂය 'අනේ, අනුන්ටත් මේක වේවා' කියන මහා කරුණාවෙන් තවත් පිරිසක් ඒ කටයුත්තෙහි යොදවනවා නම්, තමනුත් යෙදෙනවා නම් ඒ තුළින් තමන් වශයෙන් හා අනුන් වශයෙන් ද අභ්‍යන්තර බාහිර ශාසන දෙකම රැකෙන්ට හේතු වෙනවා. එසේම මේ දානාදි කටයුතු තමන්ගෙන් කෙළවර වෙන්නෙ නෑ. නිමි පරම්පරාවක් වෙන්නෙ නෑ. ඉදිරි පරපුර මේව දකිනව, ආදර්ශ ලබනව.

තමන් භික්ෂූන් වහන්සේ දකින්ට කැමතියි. කවුද භික්ෂූන් වහන්සේ කියන්නෙ. තමන්ට වඩා සීලයෙන් ගුණයෙන් වැඩිමහල් ඇත්තො. ඒ ඇත්තො ආශ්‍රය කරන්ට ලැබෙන එක අපට සන්තෝෂයක් වෙන්නෙ මොකද? හැමදාම අපට මේ ගෙවල් දොරවල්වල අඹු දරුවො රකිමින් ඉන්නකොට ගුණවත්කම්, සිල්වත්කම් ආදර්ශයට ලැබෙන්නෙ නෑ. අපට සිල්වත්කම් ගුණවත්කම් ඇති භික්ෂූන් වහන්සේගේ ආදර්ශය ලැබෙන්ට ඕන. ඒක බොහෝම දුෂ්කර කාරණාවක් ඒකනෙ මේ මෙච්චර දුර ගෙවාගෙන එන්නෙ. ඒ විතරක් මදි. ඒත් එක්ක නතුවෙච්ච මේ විශාල පිරිසට මේ බුද්ධ ශාසනයෙ ඉතා ප්‍රනීත කොටස වූ මේ සංඝ දර්ශනය දකින්නට සලස්සන්ට ඕන. අන්න ඒ වාගේ සාංඝික දානෙ දෙන කොට මේ සංඝයා වහන්සේලා වැඩමවල ඒ දර්ශන සම්පත්තිය ඇති වෙනව. අන්න ඒ වගේ දේවල් වලට කියනවා තමනුත් සංඝ දර්ශනය සමාදන් වෙනව. අනුනුත් සමාදන් කරවනව. එතකොට ඒ පුද්ගලයා ධර්මය දොරකඩ ළඟට ගෙනිච්චා වගේ. ඒ මොකද? වැඩිහිටියෙක් සිල්වතෙක් අපි ළංකර ගන්නෙ දැක දැක ඉන්න, ආශ්‍රය කරන්න නෙවෙයි. ඒ සිල්වතාගෙන්, ගුණවතාගෙන් තමන් කරන්නා වූ පූජාවට සාපේක්ෂව ධර්ම දේශනාවක් අහන්ට. ඒ ධර්ම දේශනාවට ඇති කැමැත්ත නිසා, ධර්මය සඳහා ඇතිවන කැමැත්ත ශ්‍රද්ධාව, ශීලය, ත්‍යාගය සංඝ, දර්ශනය කැමති කෙනාට නම් බොහොම ලෙහෙසියි. ශ්‍රද්ධාවෙන් කණ - සිත නතු කරල ධර්මය අහන්ට. නමුත් ආධුනික ඇත්තන්ට නම් එහෙම තම සිත නතු කරල අහන්ට අමාරුයි. ඒ අයට කියල දෙන්න ඕන නිශ්ශබ්ද වෙන්න. මේ වෙලාවෙ ධර්ම ගෞරවයෙ පිහිටන්න ඕන. තමනුත් ධර්මය අහන ගමන් අනිත් ඇත්තනුත් ධර්මය ඇසීමේ යොදවන්ට ඕන. එතකොට ඒක පරම්පරාවට යනවා..

ඒ වගේම අහන ධර්මයේ අර්ථය පරීක්ෂා කරන්ට ඕන. මේ ධර්මය ඉස් ඉස්සෙල්ලම අහනකොට යහපත් කල්‍යාණ ධර්මයක් වෙනව. මුල හොඳයි. ඒ වගේම දෙතුන් සැරයක් අහපු කෙනාට ඒකෙ මැද හොඳයි. එහි යෙදී ගත කරන ඇත්තන්ට උත්කෘෂ්ඨ වශයෙන් භාවනා වශයෙන් යෙදී ගතකර ප්‍රතිඵල ලබපු ඇත්තන්ටත් හොඳයි. මේ ධර්මය මුල, මැද, අග වශයෙන් යහපත් ධර්මයක් ද, කියල කල්පනා කරන්ට නම් තමන් ඇසූ ධර්මය ශ්‍රද්ධාව, ශීලය, ත්‍යාගය, ප්‍රඥාව වැඩෙන ධර්මයක් ද කියල පිරික්සන්ට ඕන. එවිට තමාගේ ශ්‍රද්ධාව, සතිය, ප්‍රඥාව ආදී ධර්ම වැඩෙන්ට පටන් ගන්නව.

තමන්ට ලැබිච්ච ඒ ධර්මයේ අර්ථ විග්‍රහ කරල විතරක් මදි. 'ධම්මඤ්ඤූ, අත්ථඤ්ඤූ' ධර්ම අර්ථ දෙකම විනිවිද දකිමින් ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි තමන් යෙදෙන්ට ඕන. වෙන විදියට කියනවා නම් ලංකර ගත්තා වූ මේ කාලයේ මේ මනුෂ්‍ය ආත්ම භාවය ඥාණ සම්පත්තිය අනුව යොදන්ට ඕන. මෙන්න මේ අවසාන ප්‍රතිඵලය සිහි කරනවා නම් මේ බෙහෙත් පූජා කරපු ඇත්තන්ට ගන්ට ආදර්ශයක් තියෙනවා.

මේ ඇත්තන්ට ශ්‍රද්ධාව පිළිබඳ විශේෂ ධර්ම දේශනා පවත්වන්ට අවශ්‍ය නෑ. සීල සම්පත්තිය ගැන විශේෂ ධර්ම දේශනා පවත්වන්ට අවශ්‍ය නෑ. ත්‍යාග සම්පත්තිය ගැනත් එහෙමයි. මේ මැණියො කියාපු විදියට මේ පමණ වූ ශ්‍රද්ධාවෙන් දානෙ දෙන වෙන පිරිසක් ඇත්දෝයි සැක සිතෙනව. අන්න ඒ තරමම ත්‍යාග සම්පත්තිය තිබෙනවා. සංඝයා දැකීමේදී දැහැත් වට්ටියක් පූජා කරල 'අනේ අවසරයි, ස්වාමීන් වහන්ස, ඔබවහන්සේලා ගමන් කරන මාර්ගයේ ප්‍රථිඵල දකින්ට උපකාර වශයෙන් අප මේ සිව්පසය පූජා කරල අප බලාපොරොත්තුවන ස්වර්ග සම්පත්තියක් නෑ. ශක්‍ර සම්පත්තියක් නෑ. රාජ සම්පත්ති, බ්‍රාහ්මණ සම්පත්ති අපට ඕන නෑ. අපට ඕන කරන්නේ මේ පංචස්කන්ධ සංඛ්‍යාත සසර දුකින් මිදෙන්ටයි' කියා කියනව.

ඕක තමයි අපට සංඝයාට ගිහියෙක් දැකල, උපාසක කෙනෙක් දැකල අපේ ශ්‍රද්ධාව වැඩෙන අවස්ථාව. ඒ තරමට සංඝ දර්ශනයට කැමතියි. මෙහෙ ඇවිත්ල මේ විහාරෙ පිඟන් ගඩොල් අල්ලන වෙලාවෙ බෙහෙත් පූජාවට මොනවද? ඕන කියල අහන වෙලාවෙ සංඝයා විෂයෙහි කිසිම වෙනස්කමක් දැක්වූවේ නැහැ. සංඝයා කෙරෙහි සම්පූර්ණ ගෞරවයෙන් කටයුතු කළා. අපි ඒක ආදර්ශයට ගන්න ඕන. වයසක ඇත්තො වෙහෙසෙනව ආදර්ශයක් දීම් වශයෙන්. ඒක හොඳයි.

ධර්ම දේශනාවට විශේෂයෙන් ආරාධනා කරනව. අපට බණ ටිකක් කියන්ට ඕන. ඒ කියන බණ නැවත නැවතත් ප්‍රයෝජන ගන්න නිසයි.

මේ වැඩිමහල් ඇත්තො මේ වගෙ මහ සභාවක කිසිම පැකිලීමක් නැතිව, කිසිම සබකෝලයක් නැතිව මේ ධර්මය නිරවුල්ව, තමන්ගෙ ප්‍රමිතිය තමන්ගෙ ප්‍රාර්ථනාව නිරවුල්ව ඉදිරිපත් කරන්නෙ.

මේක මේ ලෝකයාට හුවා දැක්වීම පිණිස පරකාස පිණිස ප්‍රසිද්ධිය පිණිස කියන කිසිම මාත්‍රාවක්වත් ගැවිලාවත් නෑ. තමන්ගෙ පරමාර්ථය හොඳට පැහැදිලි කරගෙන තියෙනව.

අපවත් වූ නායක ස්වාමීන් වහන්සෙ, මේ සඟ පිරිස දැකල, ධර්මය අහල සාරය ගත් නිසයි. අර්ථ ධර්ම ප්‍රතිවේධ කරගෙන යෙදෙන ධර්මානුධර්ම ප්‍රතිපත්තිය ගැන සිතනවිට තවත් කල්පනා කරන්ට දේවල් තියෙනව. දෙපාරක් සිතිය යුතු දේවල් තියෙනව. පසුගිය දවස්වල මෙහෙ ආපු වෙලාවෙ අප පුද්ගලිකව මතක් කරන්ට යෙදුන, මේ විදියට දානේ දෙන්ට, දානෙ අනුන් ලවා දෙව්වන්ට, සිල් සමාදන් වෙන්ට, සිල් සමාදන් කරවන්ට, ශ්‍රද්ධාවත් වෙන්ට, ශ්‍රද්ධාවත් කරවන්ට, සංඝයා දකින්ට සංඝයා දක්වන්ට, බණ අහන්ට, බණ අස්වන්ට ධර්මයෙහි අර්ථය පරීක්ෂා කරන්ට, පරීක්ෂා කරවන්ට, ඒ විතරක් මදි ටිකක් භාවනා කරන්ටත් ඕන කියල. ඒ පිළිබඳ දැන් ටිකක් සභාපති මහත්තයගෙ සිත නැමී තිබෙන බව එදා අපට දැන ගන්නට ලැබුන. නමුත් ඒක ආදර්ශමත් වෙන්ට ඕන. ඒ ගැන ක්‍රියාත්මක වෙන්ට ඕන. මේ වගේ බෙහෙත් පූජාවට සම්බන්ධවෙලා ඉන්න වයසක ඇත්තො, වයෝවෘද්ධ භාවයට පත්වෙලා, තපෝ වෘද්ධ භාවයට පත්වෙලා එහෙම ආදර්ශයකුත් ඇති කළොත්, මේකට සම්බන්ධවෙලා ඉන්න තරුණ පිරිසට මේක ඔපමට්ටමකින්, ප්‍රගතියකින් යුතුව කරගන්ට පුළුවන් වෙනව. ඒ නිසා ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි තමන් යෙදෙන්ටත් ඕන. අනුන් යොදවන්ටත් ඕන. තමන් යෙදෙන්නෙ නැතිව මේ යෙදවිල්ල බොහොම අමාරුයි.

ළඟ වාඩිවෙලා ඉන්න සංඝයාගෙන් අනුග්‍රහ ලැබෙන නිසයි, මං මේ අභීතව ප්‍රකාශ කරන්නෙ. මෙහෙම වැඩ කරන පිරිසක් දකින්ට ඉන්න එක පුංචිකොට සලකන්ට නරකයි. ඉතාමත් උතුම් කොට සලකන්ට ඕන. අපට මේ මව්වරුන්ගෙන්, සහෝදරියන්ගෙන් එහෙම ඉල්ලීමක් කරන්න බැහැ. මොකද? අපට ඒ අයට ඉඩකඩ සලසන්න විදියක් නැහැ. නමුත් ඒ වගේ භාවනා මධ්‍යස්ථාන අද අපේ රටේ ඕනැ තරම් තියෙනව. සමථ විදර්ශනා භාවනා වැඩ පිළිවෙලවල් තියෙනව. ඒවා හොයාගෙන යන්ට ඕන. හොයාගෙන ගිහින් පරීක්ෂා කරන්ට ඕන. එතන ධර්මය තියෙනවද? අර්ථය තියෙනවද? සීලය තියෙනවද? මේ ධර්මානුධර්ම ප්‍රතිපත්තියට අනුව සිල් රකින්ට භාවනා කරන්ට එහෙම තියෙනවද කියල. එහෙම යෙදුනොත් ඊළඟට එන පරම්පරාවට මේ ජීවක වෙද මහත්තය යම්ම කිසි පරමාර්ථයක් බලාපොරොත්තු වුනාද? ඒ ප්‍රශ්න ඇහීමේ පරමාර්ථය ඉෂ්ට කරදෙන්න පුළුවන් වෙනව.

ඒ නිසා මේ ධර්ම දේශනාව මේ බෙහෙත් පූජා පිංකමේ මේ සීලයේ අග්‍ර කොටස වශයෙන් මතකයේ සිහියේ තබාගන්න ඕන. මේ ධර්මයේ ඇහෙන දකින සංඝයා විසින් රකින ධර්මවල අර්ථ ධර්ම දෙක සලකා ගන්න ඕන. ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි යෙදෙන්ට ඕන. මේ වගේ පිරිසකගෙන් මේ වගේ ශ්‍රද්ධාව ඇති පිරිසකගෙන්, මේ වගේ සීලය ඇති පිරිසකගෙන් ත්‍යාගයට ගරු කරන පිරිසකගෙන්, සංඝයාට ගරු කරන පිරිසකගෙන් ධර්මය අහන, ධර්මය දරන, ධර්මය පිළිපදින පිරිසකගෙන් ඇති වුනේ නැතිනම් සමථ විදර්ශනා භාවනා කරන ඇත්තො වෙන පිරිසකගෙන් කවදාවත් බලාපොරොත්තු වන්න බැහැ.

ඒ තරම්ම මේ පිරිස තමන්ගේ සිත නමැති කුඹුර ඉඩම හොඳට පළල් කරගන්ට ඕන. බිම කොටල පෝරු ගාල මට්ටම් කරගෙන තියෙනව. දැන් ඒකෙ සරු බීජ පැළ කරන්ට ඕන. එහෙම නොවුනොත් තණකොළ, තුත්තිරි, කුඩමැට්ට ආදී වල් පැළ වැවෙනව. එක පාරක් බැරි වුනොත් අවුරුදු හතකට කෙත ඉවරයි. එහෙම වෙන්ට ඉඩ නොතබා වහ වහා මේ පුණ්‍ය ක්ෂේත්‍රයේ ශ්‍රද්ධාවෙන්, සීලයෙන්, ත්‍යාගයෙන් උනන්දු වෙච්ච මේ හිතේ එක්කෝ සමථ බීජය, නැත්නම් විපස්සනා බීජය තැන්පත් කරගන්ට, පැලකරගන්ට ඕන. එහෙම වුනොත් එදා ජීවක වෛද්‍යවරයා බලාපොරොත්තු වුනා වගේ මුළු ලෝකෙම බොහෝ පුද්ගලයන් අතර ප්‍රසන්න භාවයට පත්වෙනවා. ඒ හඬ එකක් නැර හැම එකකම නිවැරදිභාවය, ලෝකයට ප්‍රකාශ කිරීමක් වශයෙන් ජීවකතුමා බුදුරජාණන් වහන්සේගේ මේ ප්‍රශ්න ඇහුවේ. බොහෝ දෙනාට ප්‍රකාශ කරන්ට ඕන නිසයි. බුදුරජාණන් වහන්සේගෙන් මේ තරම් වටින විදියට සලකල මේ ප්‍රශ්න විසඳුවේ ජීවක වෛද්‍යවරයාට කරන විශේෂ අනුග්‍රහයක් වශයෙන් නොවේ. ලෝක ජනතාවගේ හිත සුව පිණිසයි.

මේ සුදුස්සෝ අවුරුදු ගණනක් පිණ්ඩපාත පූජාවක් කරනු ලැබූ එසේම අවුරුදු ගණනක් බෙහෙත් පූජාවක් කරනු ලැබූ මේ පිරිසට බෙහෙත්වලට සම්බන්ධ කරල ඒ වගේම ත්‍යාගයට සීලයට සම්බන්ධ කරල ජීවක වෛද්‍යවරයා සම්බන්ධ මේ වගේ දේශනාවක් කිරීමෙන් අපත් බලාපොරොත්තු වන්නේ. මූලාසනයේ වැඩ සිටින ලොකු ස්වාමීන්වහන්සේත් බලාපොරොත්තු වන්නේ මේ ඇත්තොත් මේ බුද්ධ ශාසනයේ ඉතා ප්‍රණීත කොටසක්, ලෙස දකින්ටයි. මේ ජීවිතය හමාර වෙන්ට කලින් යම්තම්වත් මේ භාවනා රසය තොල ගාල තිබ්බොත් අපෙන් වෙන්ට තියෙන සේවය සිද්ධ වුනා කියල සන්තෝෂ වෙන්ට පුළුවන්. හැමදෙනාම අධිෂ්ඨානයක් කරගන්ට ඕන මේ සකස් වීගෙන යන බුදු පෙරහැරේ මුලින් මුලින් ඉන්න ඇත්තො අනික් ඇත්තන්ට ආදර්ශ සම්පන්න වෙන්ට ඕන. එතකොට පිටිපස්සේ යන ඇත්තන්ට බොහොම ලේසියි. අපට ලොකු විශ්වාසයක් තියෙනවා මේ වැඩ පිළිවෙළ ඉදිරියට කරගෙන යයි කියල. සංඝයා වෙනුවෙන් කරන දාන කටයුතු ආදිය වුනත් නො පැකිල කරයි කියල. මොකද? මේ පිරිසට නිස්සරණ වනය අලුත් තැනක් නොවෙයි. සංඝයා වහන්සෙ වුනත් මේ පිරිසට සලකනව.

ඒ නිසා සබකෝලයක් ඇති වෙන්ට දෙයක් නෑ. දන්න අඳුනන තැන. නමුත් මේ දායකයන්ගෙ යුතුකම, මේ උපාසක මහත්වරුන්ගෙ, උපාසිකා මෑණිවරුන්ගෙ යුතුකම මේ කටයුතු ආදර්ශ සම්පන්නව ඉදිරියට යොමු කරන එක. එතකොට අපේ වෙද මහත්තයත් සතුටු වෙයි. අපි පිණ්ඩපාත දානයකින් නිස්සරණ වනය හඳුනා ගත්තා. බෙහෙත් පූජාවෙන් අපි බොහෝම සහෘද වුනා. කැපකරු දායකයන් බවට පත්වුනා. දැන් නිස්සරණ වනයෙන් මොනව හරි ගන්ට ඕන. ඉස්සෙල්ලාම මේ දෙන්ට හදන සීල, සමාධි, ප්‍රඥා ශික්ෂා වලින් පිරිසිදු කරගත් අපේ හදවත් කරඬු වගේ. ඒ නිසා ඒ ටික ගත්තොත් තමයි අපේ ගමන අංග සම්පූර්ණ වෙන්නෙ. ඒ නිසා අපි එහෙම අධිෂ්ඨාන කර ගනිමු.

මේ ජීවක වෛද්‍යවරයා බුදු හාමුදුරුවො දැක වැඳ පුදා

"කොහොමද, උපාසකයෙක් වෙන්නෙ?

"සීලසම්පන්න වෙන්නෙ කොහොමද?

"තමන්ගෙ අර්ථ සිද්ධිය සම්පාදනය කරගන්නෙ කොහොමද?"

"කොහොමද?, තමන්ට අනුන්ට දෙගොල්ලන්ටම අර්ථ සිද්ධිය සම්පාදනය කර ගන්නෙ? කියල ඇහුවෙ එතුමා තමන් ගැනම හිතල ආත්මාර්ථකාමී හැඟීමෙන් නොවෙයි. බුදු පියාණන් වහන්සේ මේ ධර්මය දේශනා කළේ ජීවක වෛද්‍යවරයා ගැනම හිතල නොවෙයි. මේ පන් දහසක් කල් පවතින බුද්ධ ශාසනයෙ පහළවන මේ වගේ විනෙය්‍ය ජනතාවක් ගැන හිතල. ඒ නිසා ඒ ධර්මය ශාසනයෙන් අවුරුදු දෙදහස් පන්සියයකට වඩා ඉකුත්වෙලා තියෙද්දිත් ආදර්ශමත්ව තම තමන් ඉදිරිපිට මේ බුදු පෙරහැරක් ඉදිරියට යද්දි අපි පමාවෙන්ට නරකයි. අවුරුදු තිහක් තුළ පිණ්ඩපාත පූජාව අවුරුදු දහහතරක් තිස්සේ කළ බෙහෙත් පූජාව භාර ගන්ට ඕන. නැවත නැවත මතක් කරගන්ට ඕන. සිහිපත් කරන්ට ඕන. මේ ගරු භාණ්ඩ, ලඝු භාණ්ඩ ඇතුළත් පූජාවන්, සෑම බුද්ධ පූජාවක්ම නිතර සිහිපත් කරගන්ඩ ඕන. ශ්‍රද්ධාවත්, එකමුතුබවත් මේ පිරිස අතර ඇති වුනා මේ පූජාවන් නිසා. එයින් ඇති වූ ජවය මේ ශ්‍රද්ධා ශක්තිය මත අපි ඊළඟ පියවර තබන්ට ඒකාන්ත අධිෂ්ඨානය ඇතිකර ගනිමු.

මෙතුවක් කල් අපි කළ පින්කම් සියල්ල සම්පිණ්ඩනය කරල ගත්විට, අපි සියල්ලෝම මේ ධර්ම දේශනය අහල, යම්තාක් ධර්ම චේතනා පහළ වුනා නම් යම්තාක් ත්‍යාග සිතුවිලි, දාන සිතුවිලි පහළ වුනා නම් ඒ සියල්ලගේම තෙද ශක්තිය අපට පහළ වේවා.

සිල් සමාදන් වෙච්ච පිරිසගෙ සීල ශක්තිය අපේ හිත තෙද ගන්වාවා.

අපවත් වූ නායක ස්වාමීන් වහන්සේ වැනි උතුමන්ගේ මධුර ධර්ම දේශනා අහන වෙලාවට හිතේ පහළ වුනා නම් යම් සමාධියක්, භාවනා චිත්තයක්, පුණ්‍ය චේතනාවක් ඇති වුනාද ඒ සියල්ලේ කුසල ශක්ති, ආධ්‍යාත්මික ධනය, ශාන්තිය තවත් ඉහළකට යා ගන්ට යෑම සියලු දෙනාටම ශක්තිය ධෛර්යයක් වේවා!

නියමිත ධර්ම දේශනාව මෙතෙකින් හමාර කරනව.

අපි මේ විදියට හිත ශ්‍රද්ධාවෙන්, සීලයෙන්, ත්‍යාගයෙන්, සංඝ දර්ශනයෙන් බණ ඇසීමෙන් බණ හිතේ දරා ගැනීමෙන්, අර්ථ පිරික්සා බැලීමෙන් අර්ථ ධර්ම වශයෙන් ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි යෙදීමාදියෙන් ද, මේ ජීවකතුමා මතු කරපු ප්‍රශ්න, බුදු රජාණන් වහන්සේ මතුකර දුන්නු පිළිතුරු අනුව කරන්ට යෙදුණු ධර්ම දේශනයෙන් මතු වූ සන්තෝෂය ඉදිරිපත්

කරගෙන, ඒ සන්තෝෂ සිතෙන් අපි මෙයට උදව් දුන්නා වූ, ගුරු හරුකම් දුන්නා වූ ගුරුවර, වැඩිහිටි සැම සියලු දෙනෙක්ම සිහිපත් කර පින් අනුමෝදනා කරමු. වචනයෙන් කී විදියට අධිෂ්ඨාන කර ගනිමු.

යම්ම සත් පුරුෂ මණ්ඩලයක්, ශ්‍රමණ පණ්ඩිත පිරිසක්, ගුරු දෙමව්පිය පිරිසක් අපට මේ වාගෙ සාරණීය පින්කම් කරන්න දැන නොදැන උදව් කළාද, ඒ සැම සියලු දෙනාම ගරු භාවනීය පිරිසක් වශයෙන් ඉන්න ඉන්න තැන්වල මේ පින්කම දැක අනුමෝදන් වෙත්වා! සාධු කියා අනුමෝදන් වෙත්වා!

සාධු! සාධු!! සාධු!!!

යම්ම පිරිසක් මේ පින්කම පිළිබඳව හෝ අප පිළිබඳව හෝ විශේෂ තරහක් නැත්නම් විශේෂ මිතුරු බවක් නැති මධ්‍යස්ථ වූ යම්ම පිරිසක් වෙත් නම් මේ පින්කම් දැක සාධු කියා අනුමෝදන් වෙත්වා. මධ්‍යස්ථ වූ සියලු සත්ත්වයෝ සුවයට පත් වෙත්වා.

මේ සත් පුරුෂ ධර්ම කළත්, අපි කාට කාටත් සුළු හෝ තරහ කාරයො ඉන්නව. එදිරිවාද කාරයො ඉන්නව. ඒ ඇත්තන්ටත් ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි යෙදීමට යෝනිසෝ මනසිකාරය පහළ වේවා!

අඩුම වශයෙන් මෙවැනි සාරණීය පින්කම් දැක සතුටුවෙලා ඒ ඇත්තන්ගෙත් කායික මානසික රෝග දුරුවෙලා ඒ ඇත්තොත් අපේ මේ ගමනට එකතුවෙලා සතුටුවෙලා පින් අනුමෝදන් වෙත්වා.

හිතවත් මැදහත් සියලු දෙනාටම මේ පින් එකාකාරව අත්පත් වේවා. අනුමෝදන් වෙත්වා'යි මෙත් සිතින්, එක හඬින් කියන්න.

'එත්තාවතා ච අමෙහ හි . . . . .'

# 17 වන බෙහෙත් පූජාව

**දිනය : 2002 ජනවාරි 14**

**ධර්මානුශාසනය : මීතිරිගල නිස්සරණ වන සෙනසුනේ කම්මට්ඨානාචාර්ය පූජ්‍ය උඩ ඊරියගම ධම්මජීව හිමිපාණන් වහන්සේ.**

ගෞරවණීය මූලාසනයේ වැඩ සිටින ස්වාමීන් වහන්සේ ඇතුළු යෝගාවචර සඟ පිරිසගෙන් අවසරයි,

දැන් මේ අවස්ථාවෙ පින්කම සඳහා පැමිණ රැස්වුන ගිහි පින්වතුන්ගෙන් වෙන්ට තියෙන ඒ කාරණා ඉදිරිපත් කිරීම, ඒවා පූජා කිරීම ආදී කටයුතු සියල්ලම බොහෝම සාර්ථකව සම්පූර්ණ වුනා. දැන් මෙතැන් පටන් තියෙන්නෙ සංඝයා වහන්සෙලාගෙ - ප්‍රතිග්‍රාහක පක්ෂයේ කටයුතුයි.

'බණ අහන වෙලාවෙදි පිරිස සිල් සමාදන් වුනා නේද?'

හොඳයි, එහෙම නම් ඊළඟ පියවර වශයෙන් තියෙන්නෙ මේ පූජාව සාංඝික කරන්න. ඒ සඳහා නමස්කාරය කියන්න.

"නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස" සාංඝික වාක්‍යය කියන්න.

"ඉමානි සබ්බ පරික්ඛාරානි
භික්ඛු සංඝස්ස දෙම"///

සාධු! සාධු!! සාධු!!!

මූලාසනයෙ වැඩ සිටින ස්වාමීන් වහන්සේගෙන් අවසරයි,

ඒ වාගේම ගෞරවනීය සංඝයා වහන්සේගෙන් අවසර ලබා ගන්නවා මේ පින්වතුන් වෙනුවෙන් කෙටි අනුශාසනාවක් පැවැත්වීම සඳහා.

පින්වතුනි,

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'///

"සාගාරා අනගාරා ච උභො අඤ්ඤොඤ්ඤ නිස්සිතා
ආරාධයන්ති සද්ධම්මං යොගක්ඛෙමං අනුත්තරං"
**(ඉතිවුත්තක පාළිය - චතුක්ක නිපාත)**

ශ්‍රද්ධා බුද්ධි සම්පන්න පින්වතුනි,

මේ අවස්ථාව වෙනකොට මේ සභාවට රැස්වෙච්ච මේ සියලු දෙනාට ම මේ රැස්වීම මොකක්ද? මේ ස්ථානය කෙබඳුද? මේ පූජා භාණ්ඩ මොනවද? කියන එක බොහොම පැහැදිලිව ප්‍රකාශ වෙන්ට යෙදුන. ඒ දැන් මීට ඉස්සර දහසය වතාවක් ම මේ පින්කම කරල අපට අද තියෙන දැනුම තමයි. ඒ නිසා අලුතෙන් විශේෂයෙන් මතක් කරන්ට දෙයක් නෑ. පිණ්ඩපාතෙ වඩින වෙලාවෙදිත්, අද දවසෙ බෙහෙත් පින්කම කරනවයි කියන පණිවිඩය අපට ලැබුණා.

ඒ ලැබුනයින් පස්සේ, ධර්ම දේශනාවෙන් පස්සෙ මම ඇවිත් අපේ ලොකු ස්වාමීන් වහන්සේට මතක් කළා,

"අවසරයි, ස්වාමීන් වහන්ස, අද ලෝලුවාගොඩ පිරිස බෙහෙත් පූජාවට ඇවිත් රැස්වෙලා ඉන්නවය" කියල. ඒ වෙලාවෙදි උන්වහන්සෙ සයනාසනයෙ වැඩ සිටියෙ. ඉතින් මං ඇහුව, 'ඔබවහන්සේට වඩින්ට පුළුවන්ද?' කියල මූනේ සන්තෝෂ හිනාවක් පැතිරිලා ගිහින්, "අනේ, ආයුෂ්මතුනි, මට නම් වඩින්ට අමාරුයි," කීව.

ඊට පස්සෙ මම ලොකු ස්වාමීන් වහන්සේගෙන් අවසර ඉල්ලුවා. ස්වාමීනි, මං ස්වාමීන් වහන්සෙගෙන් අවසර ඉල්ලනවා. කලින් සැලසුම් කරපු විදියට 12.30 ට කුටි පූජාවට සංඝයා 8 කුටියට වැඩමවල ආරක්ෂා පිරිත් සජ්ඣායනායක් කරල කෙටි ධර්මානුශාසනාවකුත් කරනව. එතනදිම බෙහෙත් පූජාවට වැඩම කරවන්ට කියල සංඝයා වහන්සේට ආරාධනා කරනව. ගිහි පින්වතුන්ට දාන ශාලාවෙ වෙනදා පරිදි අසුන් පිළියෙල කිරීම් ආදිය ගබඩාව භාර ස්වාමීන් වහන්සෙගෙ අනුශාසකත්වයෙන් කරන ලෙසට සැලසුම් කලයි" කියල කීව. ලොකු ස්වාමීන් වහන්සෙ ඒක අනුමත කළා.

ඒ අනුව දැන් අපි මේ පිරිස් දෙක එකතු වෙලා හොඳ වටිනා පින්කමක් කළා, මේ මැණියො මතක් කළා වගේ අපි දෙපාර්ශවයට සතුටු වෙන්ට පුළුවන් විදියට. දැන් අපි කුටි පූජාවකුත් හමාර කරලයි මෙතෙන්ට වැඩම කළේ.

මෙතෙන්ට ආවට පස්සෙ අපට හොඳ සංග්‍රහයක් ලැබුණ දැන් මේ කරන්ට යන්නෙ මොකක්ද කියන සම්පූර්ණ විස්තරය. මේ වගේ සෑදී පැහැදී සිටින පිරිසෑට අනුශාසනාවක් කිරීම සඳහා මම ඉතිවුත්තක පාළියෙ සඳහන් වන, විශේෂයෙන් ම මේ බුරුම රටේ විශේෂ අගයක් කරන, මෑතක ඉඳල ලංකාවෙත් ප්‍රසිද්ධ ගාථාවක් තමයි මාතෘකා කරන්ට යෙදුනෙ.

**"සාගාරා අනගාරා ච"**

අගාරය කියන්නෙ ගෙය. නැත්නම් ගෘහය කියන එකයි, එයින් අදහස් කරන්නේ මෙතන "සාගාරා" කියන කොට ගෘහ වාසීන් නැත්නම් පවුල් ජීවිත ගත කරන අය. සාමාන්‍යයෙන් කියනකොට ගිහි ඇත්තො. අපි 'අනගාර' 'අනගාරික' කියන්නෙ ගිහි ගෙය අතැරපු ඇත්තො. ගිහිගෙය අත හැරපු යම්කිසි පරිබ්‍රාජකයෙක් වෙයි නම්, ශ්‍රමණයෙක් වෙයි නම් ඒ ඔක්කෝම අනගාරිකයි.

ගාථා පදය ආරම්භ කරන්නෙ.

**"සාගාරා අනගාරා ච උභො අඤ්ඤොඤ්ඤ නිස්සිතා"**

මේ දෙ පිරිස, දෙපිරිස වෙනුවෙන් දෙ පිරිස කෙරෙහි පිහිටීම. ගිහි ඇත්තන් පැවිද්දන්ගෙ ඕන එපාකම් ගැන සලකා බැලීමෙන් සහ පැවිදි ඇත්තන් ගිහි ඇත්තන්ගෙ ඕන එපාකම් ගැන සලකා බැලීම කියන අන්‍යොන්‍ය උපකාරය.

**"උභො අඤ්ඤොඤ්ඤ නිස්සිතා"** යනුයි.

"ආරාධයන්ති සදධමමං" මේ නෛර්යානික ශ්‍රී සද්ධර්මය ආරක්ෂා කරන්න.

**"යෝගක්ඛෙමං අනුත්තරං"**

එතකොට ඒ සද්ධර්මයෙන් ලෝකයාට පූජා කරන ලද, හෙළි කරන ලද යෝග ජීවිතයේ අවසානයේ ක්ෂේම භූමිය වන අනුත්තර වූ ශාන්ත පදයට ළඟා වෙන්ට පුළුවන්. ඒ නිසා

මෙතන ගිහි පිරිසක් විසින් දහඩිය මහන්සියෙන් ශ්‍රමයෙන් හරි හම්බ කර ගත්තා වූ පිරිකර දේවල් ප්‍රධාන කලින් මතක් කර ගත්ත විදියට බෙහෙත් ප්‍රධාන පිරිකර සමූහයක් ඉතාමත්ම ශ්‍රද්ධාවෙන් ලෝකයේ සිදුවන්නා වූ ලෞකික ආමිශ ගනුදෙනුවකට වඩා වෙනස් වෙච්ච, විශාල ශ්‍රද්ධාවකින් සඟ පිරිසක් අරමුණු කරගෙන පූජා කරන අවස්ථාවක්.

ඒ අවස්ථාවේදී මේ වගේ පින්කමක මේ වගේ ශ්‍රද්ධාවක්, මේ වගේ ප්‍රමෝදයක්, මේ වගේ පිනක් පහල වෙන්ට එක පාර්ශවයකින් නොවෙයි, මේ දෙපාර්ශවයම අතර තියෙන සම්බන්ධතාවයත් දෙපිරිස දෙපිරිස කෙරෙහි ඇත්තා වූ හිත සුව සලසන ගතියක් නිසා අපට මෙතන පෙනෙනව ධර්මයේ යම් යම් කරුණු. ගෙදර ඉන්නකොට පෙනෙන්නේ නැති, එහෙම නැත්නම් තනිව භාවනා කරනකොට පෙනෙන්නෙ නැති විශාල ශ්‍රද්ධාව ආදී ධර්ම පැන නගින හැටි. ඒ නිසා මේ වගේ අවස්ථාවක දෙපාර්ශවය එකතු වීමෙන් කරගන්ට පුළුවන් වටිනා පින්කම ගැන සාකච්ඡා කරන එක හොඳයි කියල මට හිතුන.

ඉතිවුත්තක පාළියේ සඳහන් වෙච්ච මේ ගාථාව නිසා බුරුම රටේ ඉතිහාසය බොහෝම කැපී පෙනෙන වෙනසකට පත්වුනා. මේ පින්වතුන් හොඳට දන්නව ඇති ඉන්දියාවේ ධර්මාශෝක මහා අධිරාජයා ගැන. ඉස්සර චණ්ඩ පරුෂ නිසා චණ්ඩාශෝක නමින් හඳුන්වපු රජ කෙනෙක්, වශයෙන් ඉන්න වෙලාවෙදි ඒ රජ්ජුරුවන්ගෙ පැහැදීමට හේතු වූයේ නිග්‍රොධ සාමණේරයන් විසින් දේශනා කරන්ට යෙදුන වටිනා ගාථාවක්. ඊට පස්සෙ ඒ රජ්ජුරුවන්ගෙ සම්පූර්ණ අභ්‍යන්තර ස්වභාවය වෙනස් වුනා. පෞරුෂත්වය වෙනස් වුනා. ශාසනයට කැප වෙලා මුළු ලෝකෙම රජ කෙනෙකුට කරන්ට බැරි විදියේ පුදුම වෙනසක් මේ ලෝක ඉතිහාසයට කරලා දේශපාලනයයි ආගමයි එකතු කරලා වීරෝදාර රජ කෙනෙක් බවට පත් වුනා.

ඒ වගේම බුරුම රටේ හිටපු "අනවරථ" කියන රජතුමා බුද්ධාගමේ වුනත් මිථ්‍යාදෘෂ්ටිකයෙක් වෙලා හිටියෙ. ඒ කියන්නෙ මහායාන බුද්ධාගම වැළඳගෙන විශාල වශයෙන් එයට උදව් කරමින් හිටියා කියන එකයි, මොහු බොහොම බලවත් රජ කෙනෙක්. ඒ කාලයෙ බුරුමයේම ප්‍රාන්ත රාජ්‍යයක හිටිය පුංචි රාජ බලයක් ඇති රජ කෙනෙක්. එතුමා ඉතාමත්ම පිරිසිදු ථෙර වාදය රකින බොහෝම ගුණ ගරුක කෙනෙක්. අන්න ඒ රාජ්‍යයේ හිටිය "අරහං" කියන නම තියන රහතන් වහන්සේ නමක්. ඒ රහතන් වහන්සේට වැටහෙන්ට පටන් ගත්තා, මේ අනවරථ කියන බලවත් රජ්ජුරුවෝ මිථ්‍යාදෘෂ්ටිකව හුඟක් කලක් හිටියොත් මේ ශාසනයට, රාජ්‍යයට බලවත් විපතක් අහේනියක් වෙනවයි කියල. පාත්‍රයත් අරන් වැඩිය හැතැප්ම තුන් හාරසියයක ගමනක්, ඒ රාජ්‍යයට වැඩමවලා ටික දවසක් පිණ්ඩපාතෙ කරනකොට මේ රජ්ජුරුවන්ට පණිවිඩය ලැබුණා. ඊට පස්සෙ රජ්ජුරුවෝ පැහැදිලා මාළිගාවට කැඳවලා දානයක් පූජා කරලා බණක් කියන්ට ආරාධනා කළාම ඒ රහතන් වහන්සේ අප ඉහතින් සඳහන් කළ ගාථාවෙන් තමයි බණ කීවෙ. ඒ කියාපු බණෙන් පස්සෙ අනවරථ රජ්ජුරුවන්ට තමන් මෙතෙක් කරගෙන ගිය මහයාන පුද පූජා ආදියේ නිසරු බව වැටහුනා.

මේ ගුණවත් තෙදවත් හාමුදුරුවන්ගෙ බණ අහලා රජ්ජුරුවෝ බොහෝම පැහැදුනා. හරියට කාන්දමකට ඇදිල එන්නා වාගෙ. රජ්ජුරුවෝ ඒ ධර්මයට ඇදිල ගියා. මේ හාමුදුරුවන්ගෙන් අහගත්ත මොකක්ද ඔබ වහන්සේගෙ ධර්මය, මොකක්ද ඔබවහන්සෙගෙ අනුශාසනාව, මොකක්ද ඔබ වහන්සෙගෙ භාවනාව කියල. එතකොට ඒ හාමුදුරුවෝ ක්‍රමයෙන් ටිකෙන් ටික හෙමිහිට මතක් කරල දුන්න, මහරජ, ඔබතුමත් මේ බුද්ධාගමට සේවය කරන්ට, උදව් කරන්ට කියල. මේක නොවෙයි නිර්මල ධර්මය, නිර්මල ධර්මය දකින්ට නම් මේ ස්වර්ණ භූමියෙ තියෙනව පුංචි රාජ්‍යයක්. ඒකෙ ඇතුලත තියෙනව නිර්මල ධර්මය. ඒකෙ ඔය කියා පෑම්, මවා පෑම් මොකුත් නෑ. මේකෙ තමන්ගෙ ඉන්ද්‍රිය සංවර යයි සඳහන් වෙන්නෙ.

ශීල සමාධි ප්‍රඥා වශයෙන් ගුණ ධර්ම වැඩීමයි තියෙන්නෙ. මෙහෙම කියන කොට රජ් ජුරුවො බොහෝම පැහැදුනා. ඊට පස්සෙ ඒ පුංචි රාජ්‍යයට දූත මෙහෙවරක් කරලා අපට මේ ථෙරවාද ධර්මය දෙන්ට, අපට මේ ත්‍රිපිටකය දෙන්ට කියලා ඉල්ලීමක් කළා. නමුත් ඒ පුංචි රජ් ජුරුවො අකමැති වුනා. මොකද? මේ මහ රජ්ජුරුවො මහායාන නිසා ත්‍රිපිටකය නැති නාස්ති කරයි කියලා බයෙන්. ඊට පසු මේ මහ රජ්ජුරුවො පුංචි රාජ්‍යය යටත් කරලා පුංචි රජ් ජුරුවො ජීව ග්‍රහයෙන් අල්ලාගෙන ගිහින්ලා ත්‍රිපිටකය ඉතාම ගෞරවයෙන් සුදු ඇත්තු තිස් තුන් දෙනෙක් පිට තමන්ගෙ රාජ්‍යයට වැඩම කළා. ප්‍රාන්ත රජ්ජුරුවොත් ජීව ග්‍රහයෙන් අල්ලාගෙන ගිහින්ලා හාමුදුරුවරුන් එක්කරගෙන ගිහින්ලා සම්පූර්ණ බුරුම රාජ්‍යය ම පිරිසිදු ථෙරවාදී බුද්ධ ධර්මයට හැරවීම කළා. මෙසේ බුරුමයේ නිර්මල බුද්ධ ධර්මය සිදු වූයේ මේ ගාථාව නිසා. එසේම බුරුමයේ ස්වර්ණමය යුගය පහළ වූයේත් ඒ අනුවයි.

ඉතින් ඒ නිසා මේ ගාථාවේ තියෙනවා දෙ පිරිස එකතු වෙලා හරි මාර්ගයට නැවත යොමු කරවීමේ පැහැදිලි ප්‍රතිපත්තිය හෙළි කිරීමක්. ඉතින් තවත් පැත්තකින් අපිට ඒ වගේ සන්ධිස්ථානයක් දැක ගන්ට තියෙන්නෙ. අද මේ පිරිසගෙ විශාල පින්කම දකිනකොට විශාල දාන වස්තු දිහා බලනකොට මේක අහවල් පින්කමක් කියන්ට බෑ. මේක දස දාන වස්තුවලට අයත් සෑම දේකටම එකඟයි. ආඩම්බරයෙන් සඳහන් කරන්නේ ඖෂධ පූජාවක් කරනව කියල. මීතිරිගලටත් මේක ඉතිහාස ගතවෙලා තියෙන්නෙ ඖෂධ පූජාවක් කියල.

ඒ නිසා මේ සෞඛ්‍යයයි බුද්ධාගමයි අතර තියෙන සම්බන්ධතාවය, ථෙර වාදයයි මහායානයයි අතර තියෙන සම්බන්ධතාවය වගේ නිරවුල් කරල දැනගත යුතු කාරණාවක්. ඒක නිසා අපි ගිහි නොගිහි දෙපිරිස එකතුවෙලා රැකිය යුතු ආරක්ෂා කළ යුතු නියම ථෙර වාද ධර්මය පිළිබඳව ගත්ත මාතෘකාවෙදි කෙටියෙන් මා මතක් කරන්ට බලාපොරොත්තු වෙනවා මොකක්ද මේ බුද්ධාගම පැත්තෙන් ගත්තාම සෞඛ්‍ය සම්පන්නකම කියන්නෙ කියල. මීට කලිනුත් ධර්ම දේශනාවකදී මේ පිරිසට මා මේ කරුණ මතක් කරන්ට යෙදුනා.

සර්වඥයන් වහන්සෙ ලෝකෙ පහළ වෙන්ට කලින් සෑම විටකම ලෙඩක්, රෝගයක්, කරදරයක්, දුර්භික්ෂයක් එහෙම නැත්නම් ව්‍යසනයක් පැමිණිච්චාම ඒ කාලෙ ආගම් නායකයො කීවෙ, ඒ සඳහා ශාන්ති කර්ම කරන එක තමයි. බලි තොවිල් කරන එක තමයි. ඒ මොකද මේක දෙවියන් කෝපවීම නිසා ඇති වෙච්ච අපලයක්. නරක කාලයක්. ඒ නිසා පූජක පක්ෂයට කාට කාට හරි ලෙඩ වෙනකොට ලාභයි. ඒ මොකද? සත්තු ගොඩක් කපල දාන්ට ඕන. විවිධාකාර පූජා භාණ්ඩ ගෙනත්ල පූජක ඇත්තන්ට දෙන්ට ඕන. ඒ නිසා කවුරු කවුරුත් ලෙඩ වෙනකොට පූජකයින්ට ජයයි. ඒ නිසා මේ ඇත්තො කීවෙ, ලෙඩ වෙනකොට වෙන මොකක්වත් කරල හරියන්නෙ නෑ. එතකොට දෙවියන් වහන්සෙ කෝප වෙනව. යාග හෝම බලි කරන්ට ඕන. මේ විදියට සෞඛ්‍ය ක්‍රම ඔක්කොම ගුප්ත ක්‍රම තමයි තිබුනෙ. මිථ්‍යා ක්‍රම.

සර්වඥයන් වහන්සෙ පහල වුනාට පස්සෙ උන්වහන්සේ පැහැදිලිවම ප්‍රකාශ කළා. මේක බමුණු මතයක්. මේක බමුණු කුල වාදයක්. එහෙම නෙවෙයි, ලෙඩක් වුනාම බෙහෙත් කරල සනීප කරන්න පුළුවන්, ප්‍රමාණයක් තියෙනව. මේකට බමුණන්ගෙ විශාල කෝපයක් පැන නැගුනා. ඒ මොකද බමුණන්ගෙ යාග හෝම නම් බමුණන්ට විතරයි කරන්න පුළුවන්. බෙහෙත් හේත් නම් කාට කාටත් කරන්ට පුළුවන්. ලෙඩ්ඩුන්ගෙන් ලාභ සත්කාර අනික් කුලවල ඇත්තන්ටත් යනව. මේ නිසා බමුණු කුලෙන් නොවී ක්ෂත්‍රිය කුලෙන් පැවිදි වෙච්ච ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේට විරුද්ධව විශාල පෙරළියක් ඇති වුනා.

බුදු රජාණන් වහන්සෙ පහළ වීමෙන් පස්සෙ සෞඛ්‍ය සම්පන්න ක්‍රම පිළිබඳ ඉතිහාසයක් තියෙනව. බුදු රජාණන් වහන්සෙ ලෙඩක් වුනාම මේ මේ ඖෂධ ගන්න, මේ මේ ප්‍රතිකාර

ගන්න කියල සංඝයා වහන්සේලාට මතක් කරල තියෙනව. ඒවා කට පාඩම් කරගෙන ඇවිත් ත්‍රිපිටකයේ සූත්‍ර පිටකයේ හෙම සඳහන් වෙනව. බුදු රජාණන් වහන්සෙ පහළ වෙන්ට කලින් බමුණො කවදාවත් මෙහෙම ඉතිහාසයක් ගොඩ නැගෙන්ට ඉඩ තිබ්බෙ නැහැ. ඒ ගොල්ල කීවෙ, මේ වාගෙ ශාස්ත්‍ර දැන ගත්තොත් උඹලා ඒකාන්තයෙන් අපායෙ යනවා කියලයි. ඒ නිසා අපේ බෞද්ධයො දැන ගන්ට ඕන. අද ලෝකයේ යම්තාක් මේ බෙහෙත් ප්‍රතිකර්ම ක්‍රම, සෞඛ්‍ය සංරක්ෂණ ක්‍රම, ඖෂධ ක්‍රම තියෙනව නම් ඒකෙ ඒකාන්ත ශුද්ධ අයිතිය තියෙන්නෙ බෞද්ධයන්ට. මේ පිළිබඳ ඉතිහාසගත කරුණු රාශියක් තියෙනවා. ඒක අපි පැහැදිලිව තේරුම් ගන්ට ඕන.

ඉස් ඉස්සෙල්ලාම ලෝකෙ ඉස්පිරිතාලයක් ඇති කළා නම්, තිරිසනුන්ට පවා ඉස්පිරිතාලයක් ඇති කළා නම් ඒ බෞද්ධ සංකල්පය අනුව. අසෝක රජ්ජුරුවො ඒ කාලෙ සෙල් ලිපිවල ලියල තියෙනව, අසවල් අසවල් තැන්වල රෝහල්, අසවල් අසවල් තැන්වල සතුන්ට රෝහල් ඇතිකළා කියල.

මෙන්න මේ වාගෙ වෙනසක් ඇති වෙලා තියෙන කොට අද කාලෙ අපි, සමහරු ලෙඩ රෝග වුනාම බෝධි පූජා, දේව පූජා ආදී ශාන්ති කර්මත් එක්ක බෙහෙත් පිරිකර වලින් ප්‍රතිකර්මත් කරනවා. මේ ක්‍රම දෙකම එකට කරනව. මේ දෙක අතර හොඳට පැහැදිලි අවබෝධයක් නොතිබෙනව නම් අපට මේ ථෙර වාදයෙන් ගන්ට තියෙන ප්‍රධාන ඵලය ගන්ට බැරි වෙනව.

සර්වඥයන් වහන්සේ කියන්නෙ හිතේ රෝග සනීප කරන්ට, කෙලෙස් රෝග නැති කරන්ට ශ්‍රේෂ්ඨම බෙහෙත ලෝකයට ගෙනා පළවෙනිම ප්‍රධානම, ශ්‍රේෂ්ඨම නායකයා ශාස්තෘන් වහන්සේ යි. බුදු රජාණන් වහන්සේ පැහැදිලිවම දකිනවා කය නිරෝගි නැතිනම් හිතේ රෝග සනීප කරන්ට බෑ. කය නිරෝගී වීම සඳහා හිත බලපානවා. හිත නිරෝගී වීම සඳහා කය බලපානව. ඒ නිසා යම්කිසි අවස්ථාවල බෙහෙත් අවශ්‍ය වෙනව. නමුත් ඒ බෙහෙත් වලින් අපි ලෙඩ සනීප කරගෙන කය සනීප කරගෙන නැවතත් කාම භෝගි වෙනව නම්, කාමාශාවල් සම්පූර්ණ කරන්න කාම ලෝක ගත කරනව නම්, ඒක නොවෙයි සර්වඥයන් වහන්සේ අදහස් කළේ. අදහස් කරන්නෙ ලෙඩ සනීප කරගෙන කාය විවේක අරගෙන, කාය දර්ශන ඇති කරගෙන, කාය සම්බන්ධතා ඇතිකර ගෙන තමන්ගෙ හිතේ ශීල සමාධි ප්‍රඥා දියුණු කරන එකයි. ඒ නිසා සෞඛ්‍ය කියන එක බුද්ධාගමට ගැලපෙන දෙයක්ද, සෞඛ්‍යය කියන එක බුද්ධාගමට නොගැලපෙන දෙයක්ද කියල දෙපැත්තටම කථා කරන්ට පුළුවන් වෙනව. අපි විශේෂයෙන්ම මේ අරණ්‍ය සේනාසනවල ගත කරන සංඝයා වහන්සේලා නම් අපේ ප්‍රතිපත්තිය නම් - මේ කය අපි මේ ගත කරන ජීවිතය සඳහා ගන්නා ආහාර, අඳින සිවුරු, සේනාසන, බෙහෙත් ගිලන් පස කියන සිව්පසය මේ හතරම ඒකාන්තයෙන්ම එකම පරමාර්ථය. ඒ මොකක්ද? මේ සසර දුක නැතිකර ගැනීම සඳහා අන්න ඒ අදහසින්, ප්‍රත්‍යවේක්ෂාවෙන් මේ බෙහෙත් පිරිකර පාවිච්චි කරනවා නම් නා නා ප්‍රකාර ආනිසංස රාශියක් ලැබෙනවා. අන්න ඒ අදහසින් මේ පින්වතුන් මේවා පූජා කරනවා නම් සංඝයාට ලැබෙන මාර්ග ඵල නිවන් නොලැබුනාට ඒ ලැබිල සාධු කියල ලබන පින ලබාගන්ට පුළුවන්. ඒ නිසා මේ ඇත්තොත් කරන්නෙ අර සංඝයාට වෙන විදියකින් කරන්ට බැරි මේ ලෙඩ වෙච්චහම සනීප කරගන්ට පුළුවන් මේ බෙහෙත් පූජාවක් කරන එක.

ඒ වුනාට හොඳට මතක තියා ගන්ට ඕන. තමන්ගෙ රෝගයකට වෙදකම් කරන කොට හෝ සංඝයාගෙ රෝගයකට වෙදකම් කරන කොට හෝ බෙහෙත් පූජාවල් කරන කොට හෝ හිතන්ට ඕන. මේ විදියට සනීප කර කර, සනීප කර කර, සංසාරෙ මේ ශරීරය වඩන්ට

නොවේ තියෙන්නෙ. සනීප නැත්නම් සනීප කරගන්ට බෙහෙත් පාවිච්චි කරන්න ඕන. ශරීරය සනීප වුනාට පස්සෙ ඒ අවස්ථාවෙ ක්ෂණ සම්පත්තිය පාවිච්චි කරල ශීලයෙන් සාමධියෙන්, ප්‍රඥාවෙන් දියුණු කරන්ටයි. සංඝයාට මේ බෙහෙත් පූජා කරන්නෙ. ඉතින් සංඝයා මේ බෙහෙත් පාවිච්චි කරලා කරන්නෙ සංඝයාට අයිති වැඩද, නැතිනම් නරක වැඩද කියල බලන එක ගිහියන්ගෙ යුතුකමක්. මේ ඇත්තො ඒව බලල නැවත මේ මීතිරිගල නිස්සරණ වනයෙ සංඝයාට ගෙනත් පූජා කළා. සංඝයා ඒව බලල නැවත මේ ඇත්තන්ට ප්‍රති උපකාරයක් හැටියට ධර්මයක් දේශනා කරන වෙලාවෙදි මතක් කරල දෙන්ට ඕන - මේ සංඝයාගෙ ශරීරය වගේම මේ ඇත්තන්ටත් වෙනම ශරීරයක් තියෙනව. ඒ ශරීරයත් කය වශයෙන් ලෙඩ වෙනව. හිත වශයෙන් ලෙඩ වෙනව. ඒ ලෙඩ වෙච්ච කයට කවදාකවත් බෙහෙතකින් සියයට සියයක පූර්ණ සුවයක් බලාපොරොත්තු වෙන්න බෑ. හිතේ ලෙඩත් ඔය මොනම ක්‍රමයකට ගියත් බෙහෙතකින් සියයට සියයක පූර්ණ සුවයක් බලාපොරොත්තු වන්න බෑ. මේ දෙකටම සාධාරණ උත්තරය ලබන්ට නම් අපි මේ අර අනවරථ රජ්ජුරුවො තේරුම් ගත්තා වගෙ අපේ මේ නිර්මල ථේරවාද බුද්ධ ධර්මයට කැප වෙන්ට ඕන.

ගිහි පැවිදි මේ එකතු වීමේදී අපි කායික සුවයක් ලබාගෙන, දිගින් දිගට ලැබිච්ච අවස්ථාව ශීල සමාධි ප්‍රඥා වැඩීමට යොදා ගන්න ඕන. මේ ඇත්තොත් කල්පනා කරගන්නව නම් මේ සංඝයා කරනවා වගේ අපිත් එදිනෙදා ආහාර ගන්නව. ඇඳුම් පැළඳුම් පාවිච්චි කරනව. ගෙවල් දොරවල් පාවිච්චි කරනව. බෙහෙත් හේත් ගන්නව. සිව්පසය කවදවත් කාමභෝගිත්වය සඳහා නොවේ කියන්නෙ සංඝයා වහන්සේලාට විතරක් නොවේ. අපටත් මේ සංඝයා වහන්සේලා කියා දෙන මාර්ගයේ යාමට මේ පින හේතු වේවා. වාසනා වේවා කියල පතන්න. එහෙම නම් සාමාන්‍ය දානයකට වඩා මේ බෙහෙත් පූජාවේ ආනිසංස මහත් ඵලයි. මහානිසංසයි.

එහෙම නම් මේ බෙහෙත් පූජාව දීල හිස් අතින් ගෙදර යනවා නොවේ. පණිවිඩයක්, බණක්, ආදර්ශයක් හිතේ තියා ගෙනයි ගෙදර යන්නෙ. ගෙදර ගිහින් හිතනවා තවදුරටත් නැවත නැවතත් මේ වගේ පින්කම් කරන්ට. මේ වගේ පින්කම් කරන්ට ගිහියන් සංඝයා එක්ක තියන සම්බන්ධකම් සංඝයා ගිහියන් එක්ක තියන සම්බන්ධකම් ආදී වශයෙන් ඔවුනොවුනට ප්‍රත්‍යුපකාර සිදුවෙනව. ඒ සිදුවන අතර වාරෙ හොඳට මතක තියාගන්ට ඕන. සංඝයා වහන්සේලා මෙහි ඉතිහාසය කොහොමද? ථේරවාදය කොහොමද? මහායානය කොහොමද? කියල හොඳට දැනගෙන ගිහි ඇත්තන්ට කියල දෙනව. මේ වාගෙ කාරණා දැනගත්තාම ගිහි ඇත්තො ඒවා හොඳට හිතේ තබාගෙන තම තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් ජීවිතවලට සම්බන්ධ කරගන්ට ඕන.ඒ සම්බන්ධ කිරීම සංඝයාට තරම් ලේසි නෑ. ඒ මොකද? මේ ඇත්තන්ට කම්කටොලු වැඩි නිසා.

එකක් නොවේ, දෙකක් නොවේ, ක්‍රමයෙන් ටික ටික සංඝයා කරුණු කියා දෙන කොට ධර්ම දානය දෙන කොට ඒ ඒ පූජා වලදී ටිකෙන් ටික හිතට වැටිලා, ප්‍රයෝජනවත් වෙලා ක්‍රමයෙන් ටිකෙන් ටික කායික මානසික සුවය ලබාගන්ට පුළුවනි.

ඒ නිසා සංඝයා මේ බෙහෙත් පිරිකර පාවිච්චි කරනකොට යම්තාක් ප්‍රත්‍යවේක්ෂාවෙන් යුතුව පාවිච්චි කරල කායික මානසික සුවය ලබාගන්නවා. ඒ සුවය මතු මත්තේ ශමථ විදර්ශනා භාවනා වඩන්ට යොදා ගන්නවා. ඒ වගේම මේ පින්වත් පිරිස මතක තබාගන්ට ඕන. ඒ අපි ආවට ගියාට මේ බෙහෙත් පිරිකර ආදිය පූජා කරනවා නොවේ. බොහෝම දුරබැහැර ඉඳල, වෙහෙස මහන්සි වෙලා, සංඝයාගේ අනුශාසනා ඇතිව වැදගත් අය සම්බන්ධ කරගෙන කරන මේ පින්කම - මේ භාවනා මධ්‍යස්ථානයට ම එන්නෙ මොකද? මෙහි ඉන්න අය මේ බෙහෙත් පිරිකර පාවිච්චි කරන කොට අන්න අර ථේරවාදී විපස්සනා අංශයට කිට්ටු වෙනව.

මෙහෙම එන්න, මෙච්චර තැන්, නගර, හන්දි පහු කරගෙන එන්නෙ මොකද මේ ඇත්තො, මේකෙ වටිනාකම දන්න නිසයි. ඒ වගේම ඒ නිසයි අපි මේ ඇත්තො දැකපුවහම මේ විදියට කාරනා තේරුම් කරල ධර්මය දේශනා කරන්නෙ. ඒ නිසා මේ ඇත්තන්ට හැකියාවක් තියෙනව. යුතුකමක් තියෙනව. සුදුසුකමක් තියෙනවා. නැවත නැවතත් මේ පින්කම් කරනකොට තම තමන්ගේ කායික සුවයත්, ඒ කායික සුවය මත ඇතිවන ශමථ විදර්ශනා භාවනා සුඛයත් මේ ඇසුර නිසා මේ ගිහි පැවිදි සම්බන්ධය නිසා තව තවත් වැඩිවේවා කියල ප්‍රාර්ථනා කරන්න.

ඒ නිසා

"සාගාරා අනගාරාච"
ගිහි ඇත්තොත් නොගිහි ඇත්තොත්,

**"උභො අඤ්ඤොඤ්ඤනිස්සිතා"**
එකිනෙකා එකිනෙකා මත පිහිටීමෙන්,
**"ආරාධයන්ති සද්ධම්මං**
**යෝගක්ඛෙමං අනුත්තරන්ති"**

මේ යෝගක්ඛෙම වූ අනුත්තර වූ සද්ධර්මය අපි ආරක්ෂා කරනව. ඒ නිසා ඒ ගිහි ඇත්තො ගියාට තමන්ගේ යුතුකම් සම්පූර්ණ වෙන්නෙ නෑ.

අපි දෙන බෙහෙත් නිසා ලැබෙන ධර්ම දානය නැවත නැවත සාකච්ඡා කරල අපි ප්‍රතිපත්තිය ඉදිරියට ගෙනියන්ට ඕන. එහෙම නම් අපි දන්නව අපට හිතාගන්න පුළුවන් 18 වෙනි පූජාව, 19 වෙනි පූජාව, 20 වෙනි පූජාව කියල කියපුවාම. ඒ කියන්නෙ ගණනින් ඉලක්කමින් වැඩිවෙනවා වගේම මේකෙ බර සාර කම කුසල් අතින් වැඩෙනව කියන එකයි. එහෙම තමයි, අපේ අපවත් වෙච්ච ලොකු ස්වාමීන් වහන්සෙ නැත්නම් ධම්ම නිසන්ති ස්වාමීන් වහන්සේ වුනත් අපෙන් බලාපොරොත්තු වුනේ, අපේ මුල් පෙලේ දායක ඇත්තො වුනත් ඔක්කොම බලාපොරොත්තු වුනේ ඒ ටික මේ සම්බන්ධතාවයෙන්.

මේ වගේ බෙහෙත් පිරිකරවල් පූජාවෙන් ඒ ටික මතුවන මතුවන වාරෙ එකිනෙකාගෙ යුතුකම් වගකීම් තේරුම් අරගෙන අපි බෙහෙත් පූජාවෙන් නැවත නැවත හමුවුනත්, අපි එකිනෙකා ඒකාන්තයෙන්ම මේ මගින් බලාපොරොත්තු වුනේ ශමථ සුඛය, විපස්සනා සුඛය, මාර්ග පල සුඛය වශයෙන් ඒකාන්තයෙන් ම යෝගක්ඛේම නම් වූ ක්ෂේම භූමියට පත් වේවා කියන අදහස අපි ප්‍රාර්ථනා කර ගනිමු.

අද මේ ස්ථානයට, මේ භූමියට පැමිණි වේලේ ඉදල මේ තාක් කාලය තුළ පින්කම් රාශියකට ම සම්බන්ධ වෙන්ට පුළුවන් වුනා. ඒ බෙහෙත් පිරිකර සාංඝික කරල පූජා කිරීමෙන් ඒ අවුරුද්දකට සැරයක් කරන මේ පිංකමේ ප්‍රධාන අවස්ථාව සම්පූර්ණ වුනා. ඒ වාගේම ආජීව අෂ්ටමක සීලයේ පිහිටියා. ධර්ම දේශනයට ඇහුම් කන් දුන්නා. මේ ආදී වශයෙන් අපි රැස්කර ගත්තා වූ පුණ්‍ය රාශිය නිසා අප අපටත් මේ ශාසනය වශයෙන් සද්ධර්මය වශයෙන් දැක ගන්ට නුවණැස පහළ වේවා. ඒ වගේම අපට මේ වගේ සාර පින්කම් කරන්ට අපේ සිත පුරුදු කළා වූ, අත හිත දුන්නා වූ යම්තාක් සත් පුරුෂ මණ්ඩලයක් වේද, පෙනෙන වේවා, නොපෙනෙන වේව, මනුෂ්‍ය වේවා, දිව්‍ය බ්‍රහ්ම වේවා, ඒ සැම සියලු දෙනාටම ඉතාමත් ම මෛත්‍රියෙන්, මේ සංඝයාට බෙහෙත් පිරිකර පූජා කරන්නා වාගේ මේ සියලු කුසල් අනුමෝදන් කරවනවා. ඒ ඇත්තොත් අපි වගේම මේ පින් අනුමෝදන් වෙත්වා.

ඒ වගේම අපි නමින් මිය පරලොව ගිය යම්තාක් ඥාති මිත්‍ර පිරිසක් වේ නම් ඒ ඇත්තොත් මේ පින් අනුමෝදන් වෙත්වා.

ඒ අදහස් ඇතිව මේ ගාථා සජ්ඣායනා කරල පින් අනුමෝදන් කරවන්ට.

**"එතතාවතාච අමෙහහි . . . . .**
**සබෙබ දේවා . . . . සබෙබ භූතා . . . . .**
**සබෙබ සතතා . . . . .**
**"ආකාසට්ඨාච . . . . ./ / /**
සියලු දෙනාම ඤාතීන් සිහිපත් කරගන්ට.
**"ඉදං වො ඤාතීනං හොතු . . . . ."**

අද දවස පුරාම මේ ආකාරයෙන් රැස්කර ගත්තා වූ ඒ දානමය කුසල්, සීලමය කුසල්, බණ ඇසීමේ කුසල් ආදියේදී රැස්කර ගත්තා වූ කුසල් යන මේ සරුසාර කුසල් ආනිශංස වශයෙන් යම්තාක් කල් අපි භවයේ සැරිසරනවා නම් ඒ තාක් කල් කිසි කලෙකත් අසත්පුරුෂ ඇසුරක් නොම වේවා.

මේ වාගේ පින්කම් අපට මතු කර දුන්නා වාගේ, මේ වාගේ කටයුතු සැලසුම්කර මග පෙන්වනවා වාගේ උතුම් කල්‍යාණ මිත්‍ර ආශ්‍රයම මතු මත්තෙත් අපට ලැබේවා.

ඒ වගේම මාර්ග ඵල ඤානයට අවශ්‍ය වන්නා වූ ධර්මය පිළිපැදීම නමු වූ ධර්මානුධර්ම ප්‍රතිපත්තිය - තමන් විසින්ම සම්පූර්ණ කරගත යුතු යෝනිසෝ මනසිකාරය ආදී චෛතසික ධර්ම සම්පූර්ණ කරගත යුතු - ඒ මාර්ග නිවන් ඵල ලබන තෙක් අපේ ගමන් මාර්ගයේ යම් බාධක හිරිහැර තියෙනව නම් අප විසින් රැස් කළා වූ මේ පින් බලයෙන් ඒවා දුරු වේවා! අවසානයේ සියලු දෙනා විසින් ම ප්‍රාර්ථනා කරන ශාන්ත නිවන් සුව සඳහාම මේ පින් හේතු වාසනා වේවා.

"ඉමිනා පුඤ්ඤ කමෙමන . . . . ."

මේ පිරිසට දිව්‍ය මනුෂ්‍ය සැප ලැබේවා. සුවපත් වේවා, කියල මෛත්‍රියෙන් යුතුව මේ සඟ පිරිස ආශිර්වාද කරනවා.

"අභිවාදන සීලිස්ස . . . . ."

# සිත නිවන නිස්සරණ වන අරණ

## අනුග්‍රාහක මණ්ඩලය

| | | |
|---|---|---|
| 1. | මේනිස් නිවුන්හැල්ල මයා, ලෝලුවාගොඩ | 2000.00 |
| 2. | එන්. එස්. දිසානායක මිය, මැදිහේන වත්ත - ලෝලුවාගොඩ | 3000.00 |
| 3. | ඩබ්ලිව්. එම්. ටිකිරි බංඩා මයා, කටුගම්පල | 1000.00 |
| 4. | ජී. එම්. පුංචි බණ්ඩා මයා, බටපත ඇල - නාරංගොඩ | 1000.00 |
| 5. | කේ. ඉලංගකෝන් මිය, ලෝලුවාගොඩ | 1000.00 |
| 6. | සුනන්දා හෙට්ටිආරච්චි මිය, මැල්වත්ත - ලෝලුවාගොඩ | 500.00 |
| 7. | ඩී. බී. ෆොන්සේකා මිය, මීරිගම | 500.00 |
| 8. | විමලසීලි පෙරේරා මිය, මීරිගම | 100.00 |
| 9. | ඩී. ආර්. ගුණවර්ධන මයා, මැදිහේන වත්ත - ලෝලුවාගොඩ | 100.00 |
| 10. | හෙයියන්තුඩුව මැණිකේ, කඳන්ගමුව | 250.00 |
| 11. | ඇසිලින් මංචනායක මිය, ගොඩකලාන | 500.00 |
| 12. | ස්වර්ණා කහගල්ල මිය, මීරිගම | 100.00 |
| 13. | අයි. පී. පොඩිමැණිකේ මිය, කහටපිටිය | 100.00 |
| 14. | අයි. එල්. පොඩි මැණිකා මිය | 100.00 |
| 15. | එච්. එම්. රංජනී මිය, මැල්වත්ත | 200.00 |
| 16. | එල්. කමලාවතී මිය, නාරංගොඩ | 100.00 |
| 17. | අයි. ආර්. නන්දාවතී මිය, ඇටඹෙ | 100.00 |
| 18. | එස්. ඒ. තිලකරත්න මයා, ඇටඹෙ | 100.00 |
| 19. | ඩබ්ලිව්. ඒ. ජෝන් බණ්ඩා මයා, කටුලම්පල | 100.00 |
| 20. | සිරිසේන ලියනගේ මයා, ඇටඹෙ | 200.00 |
| 21. | ආර්. ඒ. චන්ද්‍රාවතී මිය, ඇටඹෙ | 200.00 |
| 22. | ඒ. පී. ගුණදාස මයා, ලෝලුවාගොඩ | 100.00 |
| 23. | සෝමපාල ජයවර්ධන මයා, හමන්ගල්ල | 100.00 |
| 24. | එල්. පී. ගුණදාස ලියනගේ මයා, හිරිවල | 100.00 |

| | | |
|---|---|---|
| 25. | පී. එච්. විජේසෙන මිය, මුගුරුගම්පල - මීරිගම | 100.00 |
| 26. | ආර්. ආර්. අයි. කේ. කරුණානායක මිය, පන්නල ජාතික පාසල | 100.00 |
| 27. | එම්. ඩී. සෝමලතා මිය, පන්නල ජාතික පාසල | 100.00 |
| 28. | එච්. එම්. ජී. ඒ. හේරත් මිය, පන්නල ජාතික පාසල | 100.00 |
| 29. | පී. ඒ. එස්. ප්‍රියන්තා මිය, පන්නල ජාතික පාසල | 100.00 |
| 30. | එන්. එල්. දිසානායක මිය, අඹන්පිටිය - කෑගල්ල | 250.00 |
| 31. | ජේ. ආර්. රන්දෙණිය මිය, මල්ලෑහැව - කල්එළිය | 100.00 |
| 32. | ඩී. ඥානවතී මිය, ලෝලුවාගොඩ | 100.00 |
| 33. | ආර්. හෙට්ටිආරච්චි මිය, තලහේන | 100.00 |
| 34. | ඒ. එම්. ජයසේකර මිය, ගොඩකලාන | 100.00 |
| 35. | එස්. ඒ. එමලින් නෝනා මිය, ගොඩකලාන | 100.00 |
| 36. | මිලිනෝනා මිය, ගොඩකලාන | 100.00 |
| 37. | මාග්‍රට් නෝනා මිය, ගොඩකලාන | 100.00 |
| 38. | ඩී. ආර්. සෝමාවතී මිය, ලෝලුවාගොඩ | 100.00 |
| 39. | අයි. පී. පොඩි මැණිකේ මිය, කහටපිටිය | 200.00 |
| 40. | ජේ. එම්. සෝමාවතී මිය, ලෝලුවාගොඩ | 100.00 |
| 41. | කේ. ටී. ඒ. විමලාවතී මිය, මැල්වත්ත | 100.00 |
| 42. | කේ. පී. නන්දාවතී මිය, කුරුඳුවත්ත | 100.00 |
| 43. | යූ. පී. සුමනාවතී මිය, කුරුඳුවත්ත | 100.00 |
| 44. | සුමනාවතී හේරත් මිය, කුරුඳුවත්ත | 100.00 |
| 45. | සුජාතා ආරියවතී මිය, නාල්ල | 100.00 |
| 46. | කමලා එච්ජින් නෝනා මිය, මැල්වත්ත | 100.00 |
| 47. | මියුරින් රානි වයලට් මිය, මැල්වත්ත | 100.00 |
| 48. | ඩබ්ලිව් තිලකාවතී මිය, නාල්ල | 500.00 |
| 49. | පී. ඒ. පොඩි මැණිකේ මිය, ගොඩකලාන | 100.00 |

❖❖❖ ❖❖❖ ❖❖❖

# ආශ්‍රිත ග්‍රන්ථ


1. **පිරුවානා පොත් වහන්සේ.**
   *පූජ්‍ය අත්තුඩාවේ සිරි රාහුල ස්ථවිරයන් වහන්සේ*
   සමයවර්ධන - කොළඹ 10.

2. **ශ්‍රාවක - ශ්‍රාවිකා චරිත.**
   *පූජ්‍ය කිරිඇල්ලේ ඤාණවිමල ස්වාමිපාදයන් වහන්සේ.*
   ශාස්ත්‍රෝදය යන්ත්‍රාලය - රත්නපුර.

3. **මජ්ඣිම නිකාය - 2**
   *බුද්ධ ජයන්ති ත්‍රිපිටක.*

4. **අඞ්ගුත්තර නිකාය - 1, 2, 3, 4**
   *බුද්ධ ජයන්ති ත්‍රිපිටක.*

5. **කුඩුම්බිගල තපෝවනය**
   *ගරු එල්ලාවල මේධානන්ද ස්ථවිරයන් වහන්සේ.*
   *සබරගමු ඉතිහාසය හා පුරා විද්‍යා පර්යේෂණ ආයතනය.*

6. **නිමලව ආරණ්‍ය සේනාසන ඉතිහාසය.**
   *නිමලව ආරණ්‍ය සේනාසනාරක්ෂක සමිතිය.*
   ශ්‍රී දේවී ප්‍රින්ටර්ස්.

7. **සංයුක්ත නිකාය.**
   *බුද්ධ ජයන්ති ත්‍රිපිටක*

8. **ධම්ම පදට්ඨ කතා.**
   *ශ්‍රී සිද්ධාර්ථ ධම්මානන්ද හිමි*
   රත්නාකර යන්ත්‍රාලය.

9. **පින් රැකෙන මහිම.**
   *මීතිරිගල නිස්සරණ වනය*

10. **ධම්ම පදය.**
    *බඹරැන්දේ සිරිසීවලී හිමි.*

11. **ඛුද්දක නිකාය.**
*බුද්ධ ජයන්ති ත්‍රිපිටක.*

12. **අමා බින්දු.**
*සිරි නැණරම් මාහිමි ගුණ සමරුව*
*ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාව.*

13. **A FAREWELL TRIBUTE**
*German Dharmaduta Society*

14. **THE NECESSITY FORPROMOTING BUDDHISM IN EUROPE**
*Ven. Bhikkhu Bodhi*

15. **ඉතිවුත්තක පාළිය.**
*කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ.*

16. **ලොව තරණය කළ අපූරු වෙළෙන්දා.**
*බුදුසරණ - 2000. 02. 26*
*ටී. බී. දිසානායක*

17. **අභිධර්මය.**
*චිත්ත කාණ්ඩය.*
*චම්පා බස්නායක.*

## පසුවදන

**සාගාරා අනගාරාච - උභො අඤ්ඤඤ්ඤ නිස්සිතා**
**ආරාධයන්ති සද්ධම්මං - යොගක්ඛෙමං අනුත්තරං**

සිත නිවන නිස්සරණ වන අරණ නමින් සංග්‍රහ වුන මෙම කෘතිය ගම්පහ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක ථෙරවාද බෞද්ධ ආයතන දෙකක් සම්බන්ධ කෙටි නමුත් රසවත් ඉතිහාසය හා අප්‍රසිද්ධ නමුත් ඍජු ප්‍රතිපත්ති වල පැවති සමීප සමාන්තර තාවයන්ද එහිලා කෙරෙන-කෙරුන කටයුතුද සිංහල පාඨකයාට ඉදිරිපත් කරන්නේ හැකි සංඥාව කුළු ගන්වමිනි. මෙහි පසුවදන නමින් සටහනක් තබන ලෙසට ග්‍රන්ථ සංස්කාරක වරිය විසින් කරන ලද ආරාධනාව අනුව මෙසේ පාඨක ඔබ අමතන්නේ එම හැකි සංඥාවටම රුකුල් දීමක් වශයෙනි.

මීතිරිගල නිස්සරණ වනය මෙහි එක් පාර්ශව කරුවකු ලෙසටත්-ඇටඹේ-ලෝලුවාගොඩ නිස්සරණ වන දාන දායක සමිතිය අනෙක් පාර්ශව කරුවා ලෙසටත් මෙතෙක් වසර තිස්පහකටත් අධික කාලයක් පැවැත් වූ සම්බන්ධතාව තුලින් ප්‍රකට වන්නේ අපවත් වී වදාළ මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේගේ පුණ්‍ය සෘධියයි. පුණ්‍ය මහිමයයි. ඊට පසුබිම සකස් කර දුන්නේ අපවත් වී වදාළ පූජ්‍ය මීතිරිගල ධම්ම නිසන්ති ස්වාමීන් වහන්සේයි. මේ පසුවදන් ලියන අපි ඊට යා උනේ බොහොම මෑතකදීයි.

අපවත් වී වදාළ මාහිමිපාණන් වහන්සේ පෞද්ගලිකව මෙන්ම පොදුවේත් දැරූ අදහස වූයේ මෙම නිස්සරණ වනයේ කටයුතු එදා මෙන්ම නිරවුල්ව-පිවිතුරුව අපට උරුම ථෙරවාද විපස්සනා භාවනාව ඉදිරිපත් කරගෙන හැකිතාක් දුරට මත්තට පවත්වාගෙන යෑමයි. මාහිමිපාණන් වහන්සේ අපවත් වී වසර දහයකටත් වඩා ගත වී ඇති අදත් එම උතුම් අභිලාෂයට අනුව කටයුතු සිද්ධ වෙනවාද නැද්ද යන්න නිස්සරණ වනවාසී අපටත් සමස්ථ ලෝකයටත් දැන ගත හැකි වන්නේ මේ ලෝලුවාගොඩ සහ ඇටඹේ මීතිරිගල නිස්සරණ වන දාන උපස්ථායක සමිතිය වැනි ආයතන අප කෙරෙහි දක්වන ආකල්ප-ඇවතුම්-පැවතුම් මඟින්ය. ඒවා අපගේ පිළිබිඹුව දක්වන කැඩපතයි. එම නිසා මෙවැනි ශක්තිමත් ආයතන සුපුරුදු වාර්ෂික දාන-මහා ඖෂධ දාන පවත්වන අතර වාරයේම, ඊට අමතරව නිස්සරණ වනයේ කටයුතුවල ඇතුල් පැත්ත-පිට පැත්ත සම්බන්ධයෙන් යම්කිසි පිරිහීමක්-සංකරවීමක් සිදු වේදැයි විමසිලිවත් වීමත් නොපිරිහෙලා කළ යුතු වේ. එසේ කෙලෙසීමක්, සංකර වීමක්, ගරා වැටීමක් වැටහෙනවා නම් මාහිමිපාණන් වහන්සේට කරන ගෞරවයක් සේ සලකා ඒවා මෛත්‍රී පෙරදැරිව පෙන්වා දීමටත්, ඉන් නොනැවතී නිසි මගට යොමු කරදීමටත් උනන්දු විය යුතු බව මෙහිලා මතක් කිරීම සුදුසු යැයි හඟිමි.

එමෙන්ම මෙවන් සංග්‍රහයකට නිස්සරණ ප්‍රතිපදා නම් වන පරිච්ඡේදය ඇතුලත් කිරීමෙන්ද, ධර්ම දේශනා පැවැත්වීමෙන්ද නිස්සරණ වනය බලාපොරොත්තු වන්නේ මෙවැනි සමිති සාමාජිකයන්ටත් නිස්සරණ ප්‍රතිපදා හඳුන්වා දී දිනෙන්-දින වඩ-වඩාත් සීල, සමාධි, ප්‍රඥා ප්‍රතිපදාවන්ට කිට්ටුකර ගැනීමය. මෙය නිස්සරණ වනයේ වගකීම ලෙස හඟිමු.

මෙලෙස අන්‍යොන්‍ය ලෙස වගකීමෙන් කටයුතු සම්පාදනය කරන්නේ නම් අපගේ මෙම සත් සංගමය එළඹෙන හෙට දිනදී ගම්පහට පමණක් නොව සකල ශ්‍රී ලංකාවටත් සමස්ථ බෞද්ධ ලෝකයටත් ථෙරවාදී සාරධර්ම පිළිබඳ ආදර්ශවත් සේවාවක්කිරීමට අවස්ථාව කිසිම බාධාවකින් තොරව සුරැකිව ඇති බව මෙය කියවීමෙන් ඔබට වැටහෙනු ඇත. අපවත් වී වදාළ මාහිමිපාණන් වහන්සේ, නිස්සරණ වන නිර්මාතෘ පූජ්‍ය මීතිරිගල ධම්මනිසන්ති ස්වාමීන් වහන්සේ වැනි අනගාරික උත්තමයන්ද-ලෝලුවාගොඩ සහ ඇටඹේ මීතිරිගල නිස්සරණවන දාන උපස්ථායක සමිතියේ මුදුන් මුල් වැනි වූ අභාවප්‍රාප්ත සී. හෙට්ටිආරච්චි මහත්මයා, ඇටඹේ එච්. එම්. පී. කරුණාතිලක රාළහාමි, සාමවිනිසුරු කුලසේකර රත්නායක මහතා ඇතුළු අගාරික ආදී කතෘවරුන් මෙන්ම දැනට ක්‍රියාත්මක සත් පුරුෂ මණ්ඩලයන්ද මෙමගින් ලැබුවා වූද-ලබන්නා වූද ප්‍රමෝදය අනල්පය. මත්තටත් මේවා පවත්වාගෙන යන අයට මෙයින් ලැබෙන ආදර්ශයත් පුංචි නැත. මෙතුවාක් රැස්කරගත් කුසල් බෙලෙන් මේ නම් සඳහන් කළ සියලු දෙනාටමත් නම් වශයෙන් සඳහන් නොකලත් මේවායින් සැනසුන අයටත් මේ සත්පුරුෂ සංසේවනය අමා මහ නිවන් පිණිසම වේවායි පතන්නේ, මෛත්‍රියෙනි.

*උඩර්රියගම ධම්මජීව භික්ෂුව*
නිස්සරණ වනය,
මීතිරිගල.